This is a digital copy of a book that was preserved for generations on library shelves before it was carefully scanned by Google as part of a project to make the world's books discoverable online.

It has survived long enough for the copyright to expire and the book to enter the public domain. A public domain book is one that was never subject to copyright or whose legal copyright term has expired. Whether a book is in the public domain may vary country to country. Public domain books are our gateways to the past, representing a wealth of history, culture and knowledge that's often difficult to discover.

Marks, notations and other marginalia present in the original volume will appear in this file - a reminder of this book's long journey from the publisher to a library and finally to you.

Usage guidelines

Google is proud to partner with libraries to digitize public domain materials and make them widely accessible. Public domain books belong to the public and we are merely their custodians. Nevertheless, this work is expensive, so in order to keep providing this resource, we have taken steps to prevent abuse by commercial parties, including placing technical restrictions on automated querying.

We also ask that you:

+ *Make non-commercial use of the files* We designed Google Book Search for use by individuals, and we request that you use these files for personal, non-commercial purposes.
+ *Refrain from automated querying* Do not send automated queries of any sort to Google's system: If you are conducting research on machine translation, optical character recognition or other areas where access to a large amount of text is helpful, please contact us. We encourage the use of public domain materials for these purposes and may be able to help.
+ *Maintain attribution* The Google "watermark" you see on each file is essential for informing people about this project and helping them find additional materials through Google Book Search. Please do not remove it.
+ *Keep it legal* Whatever your use, remember that you are responsible for ensuring that what you are doing is legal. Do not assume that just because we believe a book is in the public domain for users in the United States, that the work is also in the public domain for users in other countries. Whether a book is still in copyright varies from country to country, and we can't offer guidance on whether any specific use of any specific book is allowed. Please do not assume that a book's appearance in Google Book Search means it can be used in any manner anywhere in the world. Copyright infringement liability can be quite severe.

About Google Book Search

Google's mission is to organize the world's information and to make it universally accessible and useful. Google Book Search helps readers discover the world's books while helping authors and publishers reach new audiences. You can search through the full text of this book on the web at `http://books.google.com/`

27245.7.5

Bound
JAN 28 1898

Harvard College Library

FROM THE FUND OF

CHARLES MINOT
(Class of 1828).

Received 20 Jun, 1898

McNAMEE
Binder
CAMBRIDGE MASS

Digitized by Google

Digitized by Google

Digitized by Google

Digitized by Google

Digitized by Google

අලගියවන්න මොහොට්ටාල නමැති කිවිඳු විසින් විරචිත

කුසජාතක කාව්‍යය.

රාජකීය ආසියාතික සමාගමේ සමාජිකයෙක්වූද, ලංකාණ්ඩුව විසින්
පිළිගන්නාලද සිංහල ව්‍යාකරණ ග්‍රන්ථයෙහි හා ඥානාදර්ශය නමැති
සඟරාවෙහි කර්තෘවූද, රෙජිස්ට්‍රාර් ජනරල් කන්තෝරුවේ
භාෂාපරිවර්තක ධුරන්ධර

ඒබ්‍රහම් මැන්දිස් ගුණසේකර මුදලිතුමා විසින්

ලිපිදෝෂාපහරණයෙන් ශුද්ධකොට, භාවසන්න,
ව්‍යාකරණ ලක්ෂණ, එළු කුසජාතක වාසගම, ඒබැව් නේපාල
යන දෙරටෙහි පවතින කුශජාතක කථාව, ගැටපදවිවරණ ආදී
ඉතා ප්‍රයෝජනවත් කාරණ රාශියක්ද යොදා සකස්කරණලදී.

කොළඹ
විජයරත්න සහ සමාගම විසින් අච්චුගසා ප්‍රසිද්ධකරණලදී.

KUSAJÁTAKA KÁVYAYA,

A Poem composed by the great Poet Alagiyawanna Mohottala.

Revised and Edited, with a literal Paraphrase, Grammatical and Explanatory Notes, Glossary of all difficult Words, and various other useful Information,

BY

Abraham Mendis Gunasekara,
Interpreter Mudaliyar of the Registrar-General of Ceylon,
Member R. A. S. (Ceylon Branch), Author of the Comprehensive
Grammar of the Sinhalese Language, and Editor of *Jnanadarsaya*
(a Monthly Magazine.)

COLOMBO, CEYLON:
Wijayaratna & Co.
1897.

මිල රු. 1 ශ 50. PRICE Rs. 1 50.

Digitized by Google

27245.7.5

8 31/37

HARVARD COLLEGE
JUN 20 1898
LIBRARY.

Minot fund.

Digitized by Google

පටුන.

	පිට.
උපන්‍යාසය (සිංහලෙන්) -	iv—ix
එම (ඉංග්‍රීසියෙන්)	x—xiv
වැරදි සහ අඩුපාඩු -	xv—xvi
පදගත සන්නවල ස්වභාව හා භාවසන්න පදගත සන්නවලට හරවණ ක්‍රමයද දැක්වීමට උදාහරණ	xvii
කාව්‍යය - -	1—67
භාවසන්නය - - -	68—140
කාව්‍යය පිළිබඳ වෙනස් පාඨ	141—150
කාව්‍යයේ වෘත්ත - -	151
ව්‍යාකරණ ලක්ෂණ ආදිය -	151—170
එළු කුසජාතක වාසනම -	171—197
ටිබැට් කුසජාතකය -	198—203
නේපාල කුසජාතකය -	204—208
ගැටපද විවරණය -	209—261
සිහිකටයුතු කවි - -	262—263

Table of Contents.

	page.
Preface in Sinhalese -	iv—ix
Do. in English -	x—xiv
Errors and Omissions -	xv—xvi
Examples of Verbatim Paraphrase and the mode of constructing it out of the Literal Paraphrase - -	xvii
Text of the Poem -	1—67
Literal Paraphrase -	68—140
Various Readings of the Text	141—150
Metres of the Verses . -	151
Grammatical and Explanatory Notes - . - -	151—170
Sinhalese Prose Version of Kusa Jataka - -	171—197
Tibetan Version of Kusa Jataka	198—203
Nepalese do. do.	204—208
Glossary of Difficult Words (with explanations in Sinhalese and English -	209—261
Memorable Verses -	262—263

Digitized by Google

Digitized by Google

අසමත් පූජ්‍යාචාර්ය
වස්කඩුවේ අභිනවාරාමාධිපති
පවරනේරුත්තිකාචරිය මහාවිභාවි රාජගුරු
සුභූති නායක ස්ථවිර ස්වාමිපාදයන්වහන්සේ
ලංකාවේ අමරපුර නිකායේ
නායක පදවියට හා
(සියම් දේශයෙහි ඔටුන්නටද හිමිකාරයෙක්වූද, කලක් එහි යුවරජ තනතුර දැරුවාවූද,
එංගලන්ත, රුෂියා, ජර්මණී ආදී බලවත් අණ්ඩුවල මහාරාජාධිරාජාදීන්ගෙන්
නොයෙක් තනතුරු පුදපඬුරු රංපදක්කම් ආදිය ලැබුවාවූද,
නානා ශාස්ත්‍ර ප්‍රවීණ
ප්‍රිස්ඩන් චුම්සායි නම්වූ ප්‍රසිද්ධ ක්ෂත්‍රිය රාජකුමාරයන්වහන්සේට
ආචාර්යව, එම කුමාරයානන් තමන්වහන්සේ සමීපයෙහි මහණ
උපසම්පදාකරගැණීම හේතුකොටගෙණ ප්‍රීතිමත් සංඝසභාව විසින්)
රාජගුරු තනතුරටද පත්කිරීම
සිහිපත්කරණු සඳහා
උන්වහන්සේට
මෙම පොත
එය සකස්කලාවූ මාවිසින්
අතිගෞරවාදරයෙන් ඔප්පුකරණලදී.

RESPECTFULLY DEDICATED

To The Right Reverend

Pavaranerutikachariya-Mahavibhavi

Waskaduve Subhuti,

The Great Oriental Scholar and Member R. A. S. (Ceylon Branch),
in respectful commemoration of his appointment as
"NAYAKA" ('HIGH PRIEST') OF THE AMARAPURA (Burmese) SECT IN CEYLON,
and of his investment by the said Sect with
THE TITLE OF "RAJAGURU" ('ROYAL PRECEPTOR')
in honour of his becoming Spiritual Teacher to

Prince Prisdan Choomsai

of SIAM on the occasion of His Royal Highness entering the rank a Buddhist Monk,

By his Pupil in Oriental Languages,

The Editor.

Digitized by Google

Digitized by Google

උ ප න්‍යා ස ය .

---o---

එළුව හෙවත් අමිශ්‍ර සිංහලභාෂාව ඉගෙණගණු කැමැත්තන්ට ඉතා ප්‍රයෝජනවත්වූ කුසදාකව හෙවත් කුශජාතක කාව්‍යය සන්නස නිසාව ලබාගැණීම මේකල්හි දුෂ්කරබව දුටු මම එය භාවසන්නයකින් හා වෙනත් බොහෝ ප්‍රයෝජනවත් කරුණුවලින්ද යුක්තකොට සුලභකිරීමෙන් ලෝකයාට වැඩසිදුකරමියි සිතා ඒ ගැණ උත්සාහදැරීමට කැමතිවීමි. මෙය ඉතා විවේකමදවූ කාලයකදී කරණලද්දක් නමුත් මගේ ඒ අදහස මුදුන්පැමිණේයයි ප්‍රාර්ථනාකරමි. මේ පොත කියවන සත්පුරුෂ ජනයා විසින් එහි මගේ ප්‍රමාදදියෙන් සිදුවූ දොස් දක්නා ලැබේනම් එවා කරුණාවෙන් මාවෙත දන්වා එවනුමැනවි.

මේ කාව්‍යයට මාවිසින් යොදනලද කරුණු එහි අර්ථආදිය මනාව අවබෝධකරගැණීමට හා ඒ පිළිබඳ නොයෙක් දේ දැන ඉගෙණගැණීමටද හේතුවේ. ඒ කරුණු මොනවාද යනු මීට (ii පිටේ) යොදනලද පටුනෙන් වහා දැනගතහැක්කේය. පදගත සන්න ආධුනිකයන්ට හෙවත් අලුත ඉගෙණගන්නවුන්ට නොමැනවැයි සලකා භාවසන්නයක් යෙදීමි. එය වනාහි පදගත සන්නයක් කිරීමට පිටිවහල්වෙන පරිද්දෙන් ගලපනලද්දකි. එහි කාව්‍යයේ වචන හා සම්බන්ධ නැති අර්ථ සම්පූර්ණකිරීමට යොදනලද වචන ඔරහන් ලකුණුතුල බහා තබනලදී. එසේ කරණලද්දේ පදගත සන්නයක් කරණු කැමැත්තන්ගේ පහසුව සඳහාය. ආධුනිකයන් විසින් මේ භාවසන්නය නොබලා අගට යොදනලද ගැටපදවිවරණයේ උපකාරයෙන් කවි සන්නකිරීමට උත්සාහ කළයුතුයි. එසේ නොහැකිවූකල්හි ඒ සන්නය වරක් කියවා එහි සාමාන්‍ය අදහස හිතේ දරාගෙණ සන්නකිරීම යුතුවේ. මේ ක්‍රමයෙන් සන්න කිරීමේ හා වචනවල අර්ථ දැනීමේද ශක්තිය මනාව වර්ධනයවෙයි. භාව සන්නය ආදියෙහි ඇත්තාවූ සියලු ගුරු වචනවල අර්ථ ගැටපදවිවරණය බලා දැනගතයුතුයි. තවද xvi පිටේ යොදාතිබෙන ශුද්ධපත්‍රයේ දක්වනලද අශුද්ධ ස්ථාන පොත භාවිතකරන්නට මත්තෙන් පිළියම් කටයුතුවේ. එසේ නැතහොත් අශුද්ධ ස්ථානලඟ ඒවා මතක්වීමපිණිස යම්කිසි ලකුණක් (පැන්සලෙන් හෝ තීන්තෙන්) කොට තැබියයුතුය.

Digitized by Google

මේ පොතේ කෙලවරභාගයට යොදනලද ටිබැට් කුශජාතකය මහාවස්තු අවදානනම්වූ ටිබැට්රටේ දහම් පොතකින්ද, නේපාල කුශ ජාතකය කංග්‍යූර් නමැති නේපාලරටේ දහම් පොතින්ද ගන්නාලද් දැහුය. ඒ රට දෙකේ පවතින බුද්ධාගම මෙරට බුද්ධාගමට කොතරම් වෙණස්ද යනු අවබෝධකරගැණීමට මේ එකම ජාතක කථාවට සිදුවී තිබෙන පෙරළිය ප්‍රමාණවෙයි.

මේ කාව්‍යයේ මධුර කෝමලත්වය හා භාෂාවේ ලිහිල්බවගැණ කල්පනාකරණකල සිංහල භාෂාවේ වෙන කිසිම කාව්‍යයකට දෙවෙනි නොවේයයි සිතිය හැකිය. එහි උතුම්කම සලකා එක් කලක් මෙ රට දැන් පවතින ඉංග්‍රීසි ආණ්ඩුව විසින් සිංහල ඉගෙණගන්න සිවිල් නිලධාරින් විසින් භාවිතාකටයුතු පොතක්ලෙස නියමකර තිබුණේය. මෙහි ඇතුලත්කරණලද කථාවස්තුවනම් ජාතකපොතේ සත්තති නිපාතයෙහිවූ පළමුවෙනි නොහොත් පන්සියපණස් ජාතක අතුරෙන් 534 වෙනි ජාතකයවේ. ලෝකප්‍රසිද්ධවූ කියැවීමට ඉතා මිහිරිවූ සිත්පිණවන මේකථාව කියවීමට ඇසීමට සියලුදෙනා ආශාවෙති. එහි අනර්ඝතාවය වැටහුණු ලංකාවේ සිවිල් නිලධාරියෙක්ව විසූ තොමස් ස්ටීල් නම මහතා විසින් එය ඉතා පැසසියයුතු ලෙසින් ඉංග්‍රීසි කාව්‍ය භාෂාවට නගා ඒව වැදගත් කරුණු රාශියක්ද යොදා ක්‍රිස්තු වර්ෂ 1871 දී එංගලන්ත යේදී මුද්‍රණයකරවා ප්‍රසිද්ධකරණලද්දේය. මේ ජාතකයෙන් උගන්වන උපදේශය ගෘහ හෙවත් වාසගම එළි ජාතකපොතේ මෙසේ දක්වාතිබේ, ඒනම් —

"ක්ලේශ වසඟව නොපවතුව, මේ මාතුගාමයෝ නම් පව්බුවූ සත්ව කෙනෙකැයි ඔවුන් කෙරෙහි පිළිබඳ සිත් හැර ශාසනයෙහි ඇලී වාසයකරව; ස්ත්‍රීන් කෙරෙහි පිළිබඳ සිත් නිසා තේජස්වූ උන් පුරාණයෙහි නුවණැත්තෝ තේජසින් පිරිහී නොයෙක් වැසනයට පැමිණියාහුවේද."

ප්‍රභාවතී නිසා කීර්තිමත් ප්‍රධාන නරපතියෙක්ව විසූ කුශරජතුමා විඳි දුක් හා අවමාන මෙතෙකැයි කටයුතුවේ. 'විරෝච' නම්වූ අශ්වාරූඪ මාණික්‍යය ලැබීම, විසුලු මුහුණ අනාවරණවීම, සත්රජදරුවන් හා යුද්ධකොට

Digitized by Google

ජයගෙණ ප්‍රභාවතී ද නැවත ලබාගෙණ කීර්තිමත් බවට පැමිණීම යන කරුණු කුශරජානන්ගේම පුණ්‍යානුභාවයෙන් සිදුවූ බවද මෙහිදී සැලකියයුතුයි.

මේ කාව්‍යයට පුරාණ සන්නයක් ඇතිබවක් නොපෙණේ. මුද්‍රණයකොට ප්‍රසිද්ධකරණලද පළමුවෙනි පදගත සන්නය ක්‍රිස්තු වර්ෂ 1857 දී ගාල්ලුදිස්ත්‍රික්කේ කොස්ගොඩ ගණේගොඩැල්ලේ විහාරාධිපතිව වැඩවිසූ ජිනවංස ආචාර්‍ය්‍ය පඤ්ඤාසාර ස්ථවිරයන්වහන්සේ විසින් ලියනලද්දකි. ඒ සන්නය තුන්වාරයක් මුද්‍රිතවිය. ඊටපසු ඒ සන්නයට අනුව කරණලද සන්නයක් දෙවරක් මුද්‍රණයවීතිබේ. මේ සන්න පොත් දැන් ඉතා දුර්ලභය. සන්නය නැතුව ක්‍රිස්තු වර්ෂ 1891 දී මුද්‍රිත කවි පොතක් පමණක් දැන් සුලභව තිබේ. පළමු සඳහන්වූ සන්නයට යොදනලද ප්‍රාරම්භ වාක්‍යය සහ අවසාන කවි පඞ්ක්තියද මෙහි ix වෙනි පිටේ යොදනලදහ.

මේ රචනාව කවරෙකු විසින් කවර කලක කුමක් නිසා කරණලද්දේද යනු එහිම ප්‍රකාශවතිබේ. එය කළ ශක වර්ෂ 1532, යන කාලය ක්‍රිස්තු වර්ෂයෙන් 1610 අවුරුද්දට සමය. එහි 19 වෙනි කවියේ ප්‍රකාර සීතාවක අගනුවරකොට ලඞ්කා රාජ්‍යයකල පළමුවෙනි රාජසිංහ රජතුමාගේ අමාත්‍යයෙක්වූ අනන්තනායක මැතිඳුගේ භාර්‍ය්‍යාවූ මැණික් සාමිගේ අයදුමෙන් එය රචනාකරණලද්දයි පෙණේ. මෙසේ එහි කියනලද්දේ නමුත් කාව්‍යය කිරීමට හේතුව අනිකක්යයි මුඛපරම්පරානුගත කථාවක්ත් පෙණේ. ඒ කෙසේදයත් :—කාව්‍ය කර්තෘවූ මුකවෙට්ටිතුමාගේ එක් බාලසහෝදරියක් සමාන කුලයක පුරුෂයෙකුට දීගදෙනලද්දීය. ඕ තොමෝ ස්වකීය පුරුෂයාගේ ගෙදර වසන්නී ස්වල්ප දවසක් යන අතර ඈ අවකල්ක්‍රියාවේ හැසුරුණු අලජ්ජී (විළි නැති) ස්ත්‍රියක් බව එතෙම දැනගත්තේ ඈගේ දෙමව්පියන් වෙතට ගෙණවුත් භාරදී ඇගෙන් වෙන්වෙනු කැමතිව නෑදිමසිලන්ට ගෙණයායුතු කැවුම් පෙවුම්ආදිය සම්පාදනයකොට පෙට්ටිවල දමා ගෙන්වාගෙණ භාර්‍ය්‍යාවත් කැටුව ගොස් නෑදිමසිලත් දැක ඈ ඔවුන් සමීපයෙහි රඳවා තමාගේ හිතේ අභිප්‍රාය නොහඟවා නැවත ස්වකීය නිවසට ආවේය. ඔහුවිසින් වනාහි කිසිවෙකුට නොදන්වා විල්ලනැති කැතිකොටයක් එක් කැමපෙට්ටි

යක දමනලද්දේය. ඉක්බිති එ පෙට්ටියෙහි තිබුන කැතිකොටය දැ
මූකවෙටිතුමාගේ දෙමව්පියෝ එහි අදහස නුදුටුවාහු එ බව මූකවෙටි
මාට දැන්වූවාහුය. එහෙත් ගමට ගොස් එනවායකියා ගිය ඒ පුරුෂ
නැවත නා බැවිනුත් වෙන කරුණු නිසාත් ඒ විල්ලනැති කැතිකොටය
පෙට්ටියේ දැමීමේ අදහස කිවිඳුට වැටහීගියේ අඹු සැමි දෙදෙනා සමගි
කරණු සඳහා එතෙම මේ කාව්‍යය රචනාකෙළේලු. එය නිමවා එ
පුරුෂයාවෙත යවනලදින් එතෙම එහි "දදුන් කිවිඳුන්ගෙන" යනා
තමණ්ට ගැලපෙන කවි දැක ඉතා සතුටුව තම භාර්‍යාව කෙරෙහි පැ
තුන අමනාපය සංසිඳුවාගෙණ ඈ නැවතත් තමාගේ ගෙදරට අඬග
සාගෙණ ගියේලු.

ලංකාවේ පුරාණ සිරිය උතුමන්ගැණ සෑහෙණතරම කරුණු දැන
ගැණීමට පොත්පත් සුලභව නොතිබීම කනගාටුවීමට කරුණකි. ඒ
රෝප ආදී බටහිර දේශවල උපන් මෙබඳු ව්‍යක්ත කිවිවරුන්ගැණ
කරුණු දක්වා ලියාතිබෙන විශාල පොත්ගැණ කල්පනාකරණකල මේ
අතින් අපට ඇතුවතිබෙන දුප්පත්කමගැණ අප ලජ්ජාවිය යුතුමය. මේ
අපේ මූකවෙටිතුමාගේ ජීවිතකථාවගැණ දැනගණ්ට ලැබිතිබෙන ශබ්ධකාර
හිතවූ කරුණු ඉතාම සවල්පවේ. මොහොට්ටාල හෙවත් මූකවෙටි යන
නාමය ඔහු විසින් දරුවාවූ ලේකම්දුරය නිසා ව්‍යවහාරවූයේයයි සිතිය
හැකිය. ඔහුගේ පියා 'ස්වප්නමාලය' නම්වූ පොත කල ධර්‍මධ්වජ (හෙ
වත් දහම්දජ) නම්වූ පඬිතුමාගේවී. මේ පඬිතුමා හිස්වැලිගම හෙවත් හි
ස්වැල්ල යන ගමේ වාසයකලබැවින් අපේ කිවිඳු උපන්නේත් ඒ ගමෙහිය
යි සිතියහැකිය. ඒ නම වනාහි 340 දෙනෙකුගෙන් පමණ යුත් ජනග
හණයක් ඇති දැන් 'හිස්සැල්ල' යයි යන නමින් හීනාකෝරළේ ගගබො
ඩපත්තුවේ පිහිටි ගමයයි කල්පනාකළහැක්කේය. එතෙම ගොයිවංශ
යේ කෙනෙකැයි කියති. ක්‍රිස්තු වර්ෂ 1634 සිට 1684 දක්වා ලක්දිව රජ
කළ දෙවෙනි රාජසිංහ මහරජතුමා විසින් එවකට ලංකාවේ මුහුදුබඩ
පලාත් අනුශාසනාකල ලන්දේසි හෙවත් ලංසි ආණ්ඩුවේ ඉල්ලීමපිට
පත්කරණලදුව මේ කිවිඳු විසින් දැනට 'ලංසිතෝම්බුව' යයි ප්‍රකට ලේ
කම්පොත එකී ලංසි ආණ්ඩුව බාරේ තිබුන පලාතේ සඬ්වාරණයකොට

Digitized by Google

කරණලද්දේය. මේ ලේඛම්පොත කරණ කාලයේදී හයදෙනෙක් දක්
ා මරණ දඬුවමට පත්කිරීමටතරම් බලය ලැබ සිටියබවද ඒ බලය ස
හර ස්ථානවලදී භාවිතාකළබවද කියති. මේ වැඩේ යෙදීසිටින කාල
යේදී 'අලගියා' නමැති පඳුවෙකුගෙන් තම විචාළතැන 'අත් මේය' කි
ා අහංකාරයෙන් හා මුකවෙට්ටිතුමාට අගෞරවයෙන්ද උත්තරදුන්නිසා
ුගේ කකුල්දෙක ලංකර ඇදතලද පුවක්ගස් දෙකක ඉස පහතට එල්ලෙ
ීට බැඳ නස්දෙකක් බැමම කපාහැරීමෙන් ඌ දෙපලුව ගාට දුම්මෙව්බවද
කියති. ඔහුවිසින් සැවුල්අස්න හෙවත් කුක්කුට සන්දේශය, සුභාෂි
තය, නීතිසාරය, මහානටන, ප්‍රංගිනටන, දහම්සොඬජාතක කාව්‍යය,
ශ්‍රීගුණරතනමාලය, දුශ්ශීලවත යන පොත්ද කරණලදදෑහුය.

ඔහු විසින් මරණාසන්නයේදී මේ කවිය කියනලදූයි කියති:—

කාත් නැතෙයි නොසිතන්න මරුව මගෙ පුරබ ලේ
මාත් මගේ වග දන්නෝ මා නොදමති කැ ලේ
මාත් ගතිම්නම් යම රජුගෙන් බිය මරු නි ලේ
තාත් තගේ අඹු නැන්දත් නටවම් දොර පි ලේ

මේ කවිය මෙසේද කියනු ලැබේ:—

කාත් නැතැයි නොසිතන්න මරුවෙ මගෙ පෙළබ ලේ
මාත් මගේ තතු දන්නෝ මා නොදමති කැ ලේ
මාත් ගතිම්නම් යම රජුගෙන් බිය මරු නි ලේ
තාත් තගේ අඹුවත් ගෙණ නටවම් දොර පි ලේ

1896 දෙසැම්බර් මස 1 දින
කොළඹදීය.

ඒ. මැන්දිස් ගුණසේකර.

Digitized by Google

පඤ්ඤාසාර ස්ථවිරයන්වහන්සේගේ සන්නයේ ප්‍රාරම්භ වාක්‍යය:—

නම ශ්‍රීඝණාය.

——o——

ප්‍රවරගම්භීරාති මනෝරම්‍ය ශබ්දාර්ණවාවිලෝලිත ඥානපඞ්කජෝපශෝභිත අලඞ්කාරවන්ත මුකවෙට් කවීන්ද්‍රයා විසින් විරචිත බෝධිසත්ව චරිතාඛ්‍ය කුසජාතක කාව්‍ය මිණිරුවනෙහි අපි ප්‍රභාකදම්බය මා විසින් තැණපමණින් ප්‍රකාශකිරිම හේතුකොට ගෙණ උත්පාත නෛරුක්තික නයැති පණ්ඩිතයාණ්ට ප්‍රයෝජන මිදුමුන් අවිඥාත සුව භාෂා නෛරුක්තියන්ගේ කණ්ඨාලඞ්කාරකිරීමෙන් බෝධිසත්ව චරිතයෙහි චිත්තප්‍රසාද දන්වා සනමොක් සුවයට හේතු උපදවනු සඳහා "තිත් ගහදුරු" යනාදි කාව්‍යයන්ගේ අපි කථනයට ප්‍රාරම්භකෙරෙම්.

එම සන්නයේ අවසානයට යොදනලද කවි:—

1 ගාලු කෝරල තුලෙහි යස පඩිවරුන් නිතියෙන් ඇසුරු කල ව ර
නිමල මාහැඟි විපුල දන පිරි සැදූනි නෙත දන විසූ සිතපු ර
පතල සොඳ තුඟු යසැති කොස්ගොඩ නම්න් යුත් මෙ ගමෙහි ගරුත ර
තෙදන රුපු එබී මැඩපු නරණිඳු විසින් දුන් මිහ ඇමති තනතු ර

2 පවර යස හර දිගඹ උර සැදු විපුල සවිසිරි සපිරි ගුණ නැ ණ
සතර විජ් කුල තිලක පුරු තද තෙදහ විකුමැති කෙසර විලසි න
පතල ලක තුළ වසත සිංකුල දනන් ගැමටම පලමුවෙනි ව න
විජය සිරි වැඩි විකුම් නායක මිහ මුදලිතුම කරවු සතොසි න

3 මුනිඳු පිළිබිඹු සැය බෝතුර සුසැදු උවිඳුගේ රුචිනි දු ල්ලේ
පසිඳු ගේ පෙල සතරදිග රැඳි පවුරකින් යුත් වත් සිය ල්ලේ
තෙපිඳු වර දම් රතන නම් ඇති විසූ සිතපුර නිතිනි තු ල්ලේ
පැලඳු මිහිකත ලෙසට මුතුහර බැබලි වෙහෙරෙහි ගණෙගොඩැ ල්ලේ

4 කැන්දු කිත් සිරි බරණින් සිල්මිණි සැරසී වැජඹුනු විලස තරි න්දු
නන්දු තිස්සයි නම් යුත් තෙරවර සිරිපද සෙවණෙහි පැවිදුව න න්දු
බන්දු සුත පෙම් වැස යලි දිරනද යතිඳුන් සිරිමත් නද අරවි න්දු
චින්දු දම්රස සිත්ලෙස වසතා පැණසර යති නම් ම විසි න්දු

5 පවර සුගතිඳු වසිනි දෙදහස් සිවු සියක්වූ මෙම ව සේ
පතර දිනකර පැමිණ එළු රැස සවෙනි වත ගුරු දින ය සේ
අජර මර මොක් සැපත ලබනට මෙ කවු අත්මිණි රුවන සිත සේ
සතර අනුබැති සිහිනි විමසා කෙලෙම් මෙහි පින් ගණිවු සතො සේ

Digitized by Google

PREFACE.

"KUSAJÁTAKA KÁVYA."

THE want of an annotated edition of this celebrated classical poem, acceptable to all classes of readers, especially beginners and foreign students of the Sinhalese language, as well as the scarcity of copies of the editions which have been brought out from time to time with paraphrases, has induced me to undertake this edition. I sincerely hope that, though prepared amidst other literary engagements, it will, like my Comprehensive Grammar of the Sinhalese language, greatly facilitate the task of the beginner and the student of that language and at the same time create an interest in its study. The table of contents given on page ii will show to some extent the scope and nature of the contents of this edition. I have purposely avoided giving a verbatim paraphrase, which is generally appended to poems of this kind, such paraphrases being always misused by beginners, but I have added a literal paraphrase, which, with the help of the glossary at the end explaining all the difficult words, will enable the reader, with a little profitable exertion, to convert it into a verbatim one. (*Vide* p. xvii)

This poem has passed through six printed editions, five of which were with verbatim paraphrases and the other without any paraphrase. The first verbatim paraphrase was written in 1857 by a learned Buddhist Monk of Kosgo*d*a in the Galle district called Jinawansa *A*ch*a*rya Pann*a*s*a*ra, and this, accompanied by the text, has passed through three editions. The preamble and the concluding verses of his paraphrase are reproduced in this edition on page ix. An English metrical translation of the poem was written by Mr. Thomas Steel, late of the Ceylon Civil Service, and published in England in 1871 by Messrs. Trübner & Co. under the following title:—"An Eastern Love Story. Kusa Jataka, a Buddhist Legend: Rendered for the first time into English verse from the Sinhalese Poem of Alagiyavanna Mohottala." This translation which was accompanied by explanatory notes and other valuable matter greatly enhanced the importance of the poem and enabled the English reader to learn the charming story embodied in it. It was published at six shillings and, I believe, copies of it are still sold by Messrs. Kegan Paul, Trench, Trübner & Co., Limited, London.

Digitized by Google

Like most other authors who flourished in this country in early times, very little is known of the author of *Kusajataka Kavya.* "Mohottala" or "Mukaveti" affixed to his name designates his office, that of registrar held by him under the Dutch Government, or as usually applied "Secretary or writer to the household of a native chieftain of high rank." His father, Dharmadvaja, who was himself a poet and a man of great learning, was a native of Hisvælla, a village which may be identified with the modern Hissælla in Gangaboda Pattu of the Sina Korale, which according to the Census of 1891 contained 310 inhabitants. It is possible that Alagiyavanna was born here and received his education under his father. Having received his appointment from king Rajasinha ii (1634—1684 A. D.) at the instance of the Dutch Government, he travelled in various parts of the maritime districts of Ceylon which were then under that government and collected materials for the compilation of the valuable government record known as the Dutch "Tombu." It is said that he was invested with much authority and had the power to sentence to death a number of persons not exceeding six at a time and that accordingly a "low caste" man named Alagiya who on being asked for his name impertinently replied "that is the same as your own" was ordered by him to be put to death by his two legs being tied to the trunks of two adjoining arecanut palms brought together by ropes which were afterwards cut asunder, so that the man's limbs were torn in two by the receding force of the two trees.

Alagiyavanna was also author of the following works:—*SævulAsna* alias *Kukkuta Sandesaya* (cock's message), *Subhashita* (moral maxims), *Nitisaraya* (moral laws), *Makuhatana* (on the wars between the Portuguese and the Sinhalese), *Parangihatana* (on the wars between the Dutch and the Sinhalese), *Dahamsonda Jataka* (a poetical version of a Buddhist Birth Story), *Munigunaratnamalaya* (on Buddha's virtues), *Dussilavata* (on misconduct of Buddhist monks.)

He is said to have repeated a stanza offhand while on his death bed in which he threatened the angel of death that, if he should at any time succeed to his post, he (the poet) would make the angel and his wife dance on the outer verandah of their house, meaning that he would bring them to the situation in which he then was. This stanza is cited on page viii (*Supra*). The dates of his birth and death are not known. His poem under consideration, according to its concluding stanza, was composed in the year 1532 of the Saka Era which corresponds to 1610 A. D.

Digitized by Google

This poem, according to its 19th stanza, was written at the request of a pious and learned lady named Mænik Sami, wife of Attanayaka, a minister of Rajasinha I (1581—1592 A. D.) who made Sitavaka his seat of government. According to a tradition current in certain parts of this Island, the purpose of the composition was to effect a reconcilliation between his sister and her husband who had discarded her on the ground of suspected misconduct on her part. It had the desired effect. The poem, after completion, was sent to the poet's brother-in-law, who by perusing it learnt the ways of men and women and the vicissitudes of human life and accepting the advice contained in such stanzas as No. 618 * he forgave his wife.

The work occupies a high place in Sinhalese poetry. In point of elegance and clearness of style it will compare favourably with any work of its kind in the language. It is the first of the three principal 'poetical works recommended to students of classical Sinhalese, the other two being *Guttila Jataka Kavya* and *Kavyasekhara* (subject: Senaka Jataka) which latter is by the learned Buddhist monk Sri Rahula, who was principal of Vijayabahuparivena, a famous College which existed at Totagamuva in the Galle District, and who may be called the Shakspeare of Ceylon. For these reasons the Government of Ceylon by notification dated 1st July 1868 prescribed Kusajataka Kavya as a text-book for the Ceylon Civil Service Examinations.

The subject of the poem is the story of King Kusa embodied in the Buddhist Birth Story called *Kusajataka* (Elu, *Kusadi*) which is the 531th of the 550 Jatakas or Stories of the birth of Buddha previous to his last birth as Prince Siddharta. This story is very popular in all Buddhist countries and is often read for the sake of the pleasant and ludicrous incidents which it relates. It was narrated by Buddha himself in the course of a sermon preached to his monks, with special reference to one of them who had formed an unlawful attachment to a woman. It was intended to show him the evil consequence of such

---

* "*Great Kings of old, with virtue graced, nor took to heart nor chid*
The faults that poor benighted folks or little children did;
And women's faults and poets' faults (were never visited
With punishment severe at all, but gently checked and chid)."

[From Steel's Translation.]

Digitized by Google

lust. The story relates how a young prince named Kusa, born with a very ugly and deformed face, the result of sin committed in a previous birth, had decided on that account to retire from the world and pass his life as an ascetic after the death of his father who was the Emperor of India; how after repeated requests from his parents he consents out of regard for them to marry a princess, if one could be found in the likeness of a golden image which he cast and sent to them; how the image is carried about and exhibited in various parts of India, and how at last a princess who far excelled the image in beauty is found. Kusa's parents visit the princess' parents and tell them that it was a custom in their country for a new married couple to avoid each other's sight until they be blessed with a child—an invention of Kusa's mother by which to conceal her son's ugliness from the princess. Prabh*a*vati, for that was the princess' name, consenting to act in conformity with the alleged custom, they conduct her to their country and marry her to their son. Prabh*a*vati afterwards sees Kusa (who had before this been represented by his younger brother, an extremely handsome youth, at one of the occasions when one persisted in seeing the other), and, finding that her husband was very ugly and had a face horrible to look at, detests him and thereafter goes away to her parents together with her retinue never to return. Kusa who had succeeded his father in the kingdom on the consummation of his marriage, entrusts the affairs of the state to his mother (whom he trusted more than his father or brother) and goes in disguise as a harper to the city of Prabh*a*vati's father, called Madu, to bring her back, and tries, without making his identity known to others, various means of obtaining access to her. At one time he engaged himself as a servant to the chief potter who supplied pots and pans to the royal household, at another time as servant to the chief basket-maker who supplied the royal household with baskets, fans, and other wicker-works, again as servant to the chief florist who supplied the king and the royal family with flowers, garlands, and chaplets, and lastly as a cook in the royal kitchen. He gets only one opportunity of holding a conversation with her, and even that under very peculiar and unfavourable circumstances After a period of seven months during which he worked like a menial, was very poorly clad, and lived on the coarsest of food, he despairs and resolves on returning to his kingdom, Sakra, king of gods, who at a time when Kusa's parents were childless gave them Kusa and his brother, at once becomes aware of this resolution and sends seven

letters purporting to be from king Madu, Prabhavati's father, to seven princes (who had before solicited her hand) stating that Prabhavati had left Kusa and returned home and proposing to them to marry her, each of the seven princes, unaware of the others receiving similar letters, arrives in Madu's city and learns that fact from each other with indignation and threatens Madu with war, if Prabhavati is not given to him; Madu bewildered at this strange occurrence and finding no way to appease the princes and save his kingdom, decides on cutting up his daughter into seven parts for having caused all this trouble by leaving Kusa, and giving each prince a part. Prabhavati hears of this and reveals as the last resource of her escaping death that her husband was employed in the kitchen. Madu first and Prabhavati afterwards go to Kusa, who was at the time washing some cooking pans, and implore his pardon. Kusa readily pardons them, puts on a royal dress and on an elephant with Prabhavati behind him starts to take the seven princes who were besieging the city. He takes them captive and brings them before Madu who requests Kusa, as the chief of all, to deal with the princes as he pleases, Kusa pardons them and marries the younger sisters of Prabhavati, seven in number, to the seven princes respectively, who highly rejoiced at their good fortune thank Kusa and depart for their kingdoms with their wives. Kusa showed much dexterity and heroism in subduing the princes, and Sakra, who was highly pleased with his conduct, presented him with an octagonal ruby,* by virtue of which and by the expiation of his sins he lost the ugliness and deformity of his face and became very handsome and was ever since much liked by Prabhavati. He at last returned to his kingdom with his wife and spent the remainder of his life there in great prosperity. At the close of the sermon the monk in question destroyed all lustful thoughts and attained a spiritual status. This is only a very brief summary of the story.

The translations of the Tibetan and Nepalese versions of this Jataka, which are now for the first time placed before the Ceylon public, will show how vastly different those versions are from the Ceylon one. If a simple story such as this could have undergone such vast changes, how much more should the tenets themselves be found to vary in the three countries!

Colombo,
1st December, 1896.

A. Mendis Gunasekara.

* Vide footnote † on p. 212.

Digitized by Google

වැරදි සහ අඩුපාඩු
Errors and Omissions.

[අ.=අධෝලිපි. දෙ.=දෙවෙනි තීරය. f.=footnote.]

පිට.	පෙළ.	අශුඩ.	ශුඩ.
3	දෙ. 12	කුදු	කුළු
5	දෙ. 11	යහනමෙතයි	යහණමෙතයි
6	17	තුළ	තුල
7	79 වෙනි කවියට පහළින් 'පළමුවෙනි සග නිමි' යනු යොදනු.		
7	20	හුනු	හුණු
7	අ. 3	'එකතුල—එක්, අතුල' යනු හැරදමනු.	
11	7	කලට	කලට
11	දෙ. 10	තරනිඳු	තරණිඳු
12	1	මුලු	මුළු
12	21	වැනෙමින	වැණෙමින
16	5	සතර	සතර
16	18	පවසමින	පවසමින
16	දෙ. 9	එපුවත	ඒ පුවත
17	9	ගෙන	ගෙණ
17	12	යවමිණ	යවමින
17	දෙ. 15	කිසෙවක්	කිසවක්
20	7	දිගු	දිගු
21	14	'තුඟුතුල්—තුඟු, අතුල්' යන අධෝලිපිය යොදනු.	
22	15	වනත්	වණත්
23	අ. 1	කුවරියක්	කුමරියක්
24	දෙ. 6	කුමරු	කුමරි
26	දෙ. 19	බැදි	බැඳි
34	20	කණවැත්දුම්	කණවැන්දුම්
46	14	තෙලසින	තොලසින
47	22	සමග	සමග
49	දෙ. 22	බැලමක්	බැල්මක්
61	14	තෙපල	තෙපලා
61	දෙ. 14	කළ	කල
62	5	දුලි	දුළි
68	13	සොඬකුමාරයාය	සොඳකුමාරයාය
69	4	සෝපුලාවූ	සුපුලාවූ
73	21	ප්‍රදලනය	ප්‍රදරණය
74	12	ප්‍රසාඩනය	ප්‍රසාදනය
74	15	ක්‍රුතා	කෘත
75	12	ප්‍රවාර්ජිත	ප්‍රව්‍රජිත
75	14	පුඤ්ජනය	පිඤ්ජනය
76	22	උස්වූ මහත්වූ 'උත්තුඞ්ගතරවූ' කියාද අර්ථ කියගැනේ.	
76	22	දනසාය (යන මෙයින්)	දනගෙනෙත්
77	2	ශවිත	ශශ්විත
82	අ. 1	ආභය	අභය
83	11	ගර්න	ගණී
90	18	භසන	අසන
99	12, 21	ආදී තැන්වල 'මනෝකලාවූ' යනු 'මනඃකලාවූ' විය යුතුයි.	
105	5	ශෝභමානවූ	ශෝභාමානවූ
115	11	ප්‍රස්කබලිතව	ප්‍රස්ඛලිතව
117	1	කරණකල්හි	කලකල්හි
117	8	කියන්නීය	කියන්නේය
119	25	කාලයක	කාලයක්
120	18	ජ්‍යෝත්‍රනකොට	ජේත්‍රනකොට
120	20	කථනයකල	කථනයකරණ
123	11	අවිදූර	අවිදූර
128	14	මෙයකාරයෙන්	මොයාකාරයෙන්

Digitized by Google

පිට.	පෙළ.	අශුද්ධ.	ශුද්ධ.
123	ඉ. 6	ඥ	ඤ
124	2	හයශෙදනාම	හශෙදනාම
125	6	සූක්‍ෂමවූ ශත්‍රු	සූක්‍ෂමවූ ශෛත්‍ර
125	17	ශත්‍රු	ශෛත්‍ර
126	6	පුරශුව	පරශුව
127	23	සූර	ශූර
132	25	සූර	ශූර
152	2	සමහරු මෙබඳු ස්ථානවල සබද පොව නම් විබත යෙදේයයි සලකති.	
158	21	1634 සිට 1684	1581 සිට 1592
153	21	දෙවෙනි	පළමුවෙනි
161	32	එරුෂ	පරුෂ
174	6	කියැවුත්	කියවී
174	7	යණ	යන
174	19	පැවිණියෝය	පැමිණියෝය
179	4	ඉඳිරියේ	ඉදිරියේ
181	33	කියවී	කියව
195	ඉ. 8	පතාක	පතාකා
199	17	සඞ්ඛයක්	ශඞ්ඛයක්
200	14	වැසියෝ	වැසියන්
212	ඉ. 7 f.	Sigiri	S*æ*giri
218	දෙ. 8	‘දිව්‍යලෝකයේ ගඞ්ගාව: celestial river’ වෙනුවට ‘අහසෙහි බසිනු ලබන (හිමාලය පර්වතය අසල) එක් ගඞ්ගාවක්: a river flowing by the Himalaya mountain’ යනු යොදනු.	
214	9	සමීපව, ළඟ: near.	අරක්කැමිව: as cook
221	29	ගබ පෙලහර	ගබ පෙරහර
222	33	යජුෂ්	යජුස්
222	35	Yajush	Yajus
226	17	ජගත්‍රය	ජගත්ත්‍රය
240	දෙ. 21	සකන්ධකුමාරයා	ස්කන්දකුමාරයා
241	දෙ. 13	‘භය සහ උන්මාදය: fear and madness or insanity’ වෙනුවට ‘භය කාරණකොටගෙණ උමතුවීම: insanity caused by fear’ යනු යොදනු.	
246	16	‘යුවරාජයා’ යන්නට ‘දෙවෙනි රාජයා’ යන අර්ථයද යෙදේ. ‘යුවරාජයා’ also means ‘viceroy.’	
249	5	‘ලොවුතුරා’ යනු ‘ලෝකස්වභාව ඉක්මවා සිටි’ කියාද අර්ථ කියහැකිය.	
249	18	‘ලෝහජලය’ යනු ගින්නෙන් තදලෙස උණුවූ වතුර’ කියාද ගතහැකියි. ‘ලෝහජලය’ may be taken to mean also ‘water heated to a very high degree.’	
257	30	‘සාමන්ත’ යනු ‘අවට’ කියාද අර්ථ කියහැකිය. ‘සාමන්ත’ also means ‘surrounding.’	
257	දෙ. 14	දේවතා	තාපස
258	20	සිහ පඤ්ජර කාවාටය	සිහ පඤ්ජර කවාටය
260	දෙ. 8	‘ඉතා’ යනු අර්ථ මුලට යොදනු. Insert the word ‘very’ before the meanings.	

‘මද්‍රරාජයා,’ ‘මද්‍රනරේන්ද්‍රයා’ යන පදවල ‘මද්‍ර’ යනු ‘මද්‍ර’ විය යුතුය.

Digitized by Google

පදගත සන්නවල ස්වභාව හා භාවසන්න පදගත සන්නවලට හරවන ක්‍රමයද දැක්වීමට උදාහරණ.

29 වෙනි කවියට:—රතදරිණි, රත්නාබර කරණකොටගෙණ; නාලිය, නාග පල්ලව (ආකාරවූ); ගමනින්, ගමන කරණකොටගෙණ; නාලිය සඳිසි, ඇතිනියන් වැනිවූ; එ පුර, ඒ නගරයෙහි; සරණ, හැසිරෙන්නාවූ; ලිය, කාන්තාවක්; කවුරු නම්, කවරෙක් නම්; වණලිය, වර්ණනාකොට ලීමෙහි; හැකි වෙති, පොහොසත් වෙද්ද?

310 වෙනි කවියට:—මිහිලොල්, මධු ලෝලයන්ගේ; නද, නාද (නමැති); මීපුරු, මධුරවූ; ලිය, ලයාන්විතවූ; ගී නද, ගීතිකා නාදයෙන්; යුතු, යුක්තවූ; තද, සන්තුෂ්ටවූ; කොවුලන්, කෝකිලයන්ගේ; ශබ්ද, ශබ්ද (නමැති); පස තුරු ඝොස, පඤ්ච තූර්‍ය්‍ය නාදයෙන්; සපිරු, සම්පූර්ණවූ; මද නල, මන්ද මාරුතයෙන්; සල, චලිතවූ; ලිය, ලතා (නමැති); ලීය රැඟුමැති, ස්ත්‍රීන්ගේ නෘත්‍ය ඇත්තාවූ; මද රද, අනඞ්ගයාගේ; රඟ හල අසුරු, නෘත්‍ය ශාලාව වැනිවූ; සොඳුරු, සුන්දරවූ; උයනට, උද්‍යානයට; වැද, ප්‍රවිෂ්ටව.

641 වෙනි කවියට:—තාර, තාරකාය; කොඳ, කුන්දය; සඳ, චන්ද්‍රයාය; හර, (මුක්තා) හාරය; හර ගිර, කෛලාස පර්වතය (යන මේවා හා); සදිසි, සාදෘශ්‍යවූ; යස, කීර්තිය; දස දෙසෙහි, දශ දිශාවෙහි; පුරමින, පූරණයකරමින්; විරසිරි, වීර්‍ය්‍ය (නමැති) ශ්‍රීකාන්තාව; උරදර කර, හෘදයෙහි ධාරණයකොට; යුද දිනු, යුද්ධයෙන් ජයග්‍රහණයකළාවූ; කුස රජතුමා, කුස රාජෝත්තම තෙම; නොලසින, අනලස්ව; රුපුරජුන් සත්දෙන, ශත්‍රුරාජයන් සත් දෙනා; නැර අල්වා, (අත්) නොහැර අල්ලාගෙණ; පිටිතල හයා, හස්තය පසුකොට; බැඳ රැගෙණ, බන්ධනයකොට හැරගෙණ; තම මයිල්, තමාගේ මාතුලවූ; මදුරදුට, මද්‍ර රජයාහට; බාරකරදී, භාරකොට දානයකර; සතොසින, සන්තෝෂයෙන්; මෙ ලෙසින්, මේ ප්‍රකාරයෙන්; කියයි, කථනයකරයි.

Digitized by Google

කුසජාතක කාව්‍යය.

:(※):

නමෝ මුනි සරණ.

1 තිත් ගනඳුරු මිතු රැ
විතෙත දන කුමුදු නිසයු රැ
ගුණ මිණි මහ සයු රැ
වඳිම් මුනිඳුනුමත් තිලෝ ගුරැ

2 සව් කෙලෙස් මුලුපු ට
බුදුව මොක් සිරි පලකො ට
දෙසූ සව් ලෙව්හ ට
අනයි සදහම් වඳිම් හැම වි ට

3 බඹ සුර නර මුදු න්
සිඹ සිරි පා කමල දු න්
පින් කෙත් ගුණ බදු න්
වඳිම් මහ සඟ ලොවට සෙත දුන්

4 සත් අත් සක් සක ත්
වත් අත් තිනෙක් බරනෙ ත්
පත් මත් තලත් ඝ ත්
සෙත් කෙරෙත් සත් ලොවට මෙ පුගත්

5 මුනි සරණ මුදුන ත
මනොවිලා දහම් සවණ ත
විජය සිරි නායක ථා
සඳු පිළිමෙන ශොභා නම් ගු ත

6 නරනිඳුගෙන් මහ රැ
ලත් මඟ ඇමති තනතු රැ
වෙලඳ කුල පිවිතු රැ
සේපාල අදිකාරි නම් ග රැ

7 මැති සඳුට මිත්බි රි
රුසිරෙන් දෙවඟනක ස රි
රස බසැති සුසිරි රි
උබය කුලයෙන් සදිසි සක කිරි

8 රිවිකුල කොත් පබ ද
රජසිහ රජුගෙ මනාන ද
සිරි පද සෙවණැ සො ද
වැඩුනු සැපසේ සව් ඉසුරු වි ද

9 යසසිත් ලොව පසි ඳු
අන්තනායක මැතිස ඳු
සුරතුර වැලඳි මු ඳු
සුපුල් ලෙල රන් ලතාවක් බ ඳු

10 කුලඟන තලලැ සැ ඳු
ශොභාකුම් තිලකෙව් පිරිසි ඳු
දිලෙන වරඟින මු ඳු
දැමිණිසාමි නාමයෙන් පරසි ඳු

---

(1) ඝනඳුරු—ඝන, අඳුරු. මුනිඳුනුමත්—මුනි, ඉඳු, උතුමත්. (5) මුදුනත—මුදුන්, අත. සවණත—සවන්, අත. (6) නරනිඳුගෙන්—නරන්, ඉඳුගෙන්. (7) බසැති—බස්, ඇති. (10) කුලඟන—කුල, අඟන. තිලකෙව්—තිලක, එව්. වරඟින—වර, අඟින.

Digitized by Google

11 ඝන රුවන් චෙතැ නිදෙ ස
සපිරි සැදූහැති මෙ දිගැ ස
විසාකාවන් මි ස
වෙතින් සරිවෙයි කාවිරු දිය කුස

12 රකින තම බිජු ව ල්
කිරළ සෙමරෙව් හැම ක ල්
පොහො දවසැ අට සි ල්
රකී නිති පිරිසිදුවැ පන් සි ල්

13 සිත සවණත සැප ත
මුනි දම් මඟ සඟන ඹෙව ත
සලසාලයි සත ත
එයින් මුත් සරි කවිද මෙ දිය ත

14 සිරි රති පළමු වෙ න
සැක හැරැ මවා බලමී න
යලි ලොවැදුරු විසි න
මවාලූ වැනි රුසිරු මෙතලු න

15 වනත් ගං හෝ පැ න
නොයනෙව් සිදු වෙරළ පැ න
මහත් වුව ඉසුරෙ ණ
උඩගු නොවැ දවසරී නුවණි න

16 නිසි සිතුරුවන ම න
නිල් මිණි යුගය දෙ නුව න
මැණික් සාමී ය න
නම යෙදෙයි මේ ලඳට එ බැවින

17 එළු මගද සකු බ ස
ශුත් පොත් කීයත මෙ දිගැ ස
පද සඳ නැත ඕ ස
අතරදුරු නොසිටී මොවුන් බස

18 නිල් මිනුල දෙව් ව න්
නැමි බැම සුරිඳු සැව් ව න්
නිසි පිරි සදෙව් ව න්
පතළකුළුණෙන් ලොවට මව්වන්

19 මෙ කුලඹ සිතු පැහැ ද
බුදුන් පෙර සිරිතක් සො ද
ඈසියපි සිතින් සැ ද
කෙලෙත් ආරාදනා මන න ද

20 සුගතිඳු ගුණ ගැඹ ර
ම කියමි ඝතන වැරසැ ර
මදුරු දළිනෙක ව ර
සුනෙර විදිනට නැත් කරණයු ර

21 ම කියන මෙ පදරු ත
දුරු කර දොසක් ඇතහො ත
මුනිසඳු ගුණ මහ ත
අසව් වියතුනි නමා සවණි ත

22 ලොවැ සියලුම සැප ත්
සැපත් තැන් මෙන් සිරි ග ත්
දඹ දිව් තල මිහ ත්
සැවැත් නම් වී පුරෙක් යහප ත්

---

(11) සැදූහැති—සැදූහැ, ඇති. දිගැස—දිගු (or ග්), ඇස. (12) සෙමරෙව්—සෙමර, එව්. (13) සවණත—සවන්, අත. (14) ලොවැදුරු—ලොව, ඇදුරු. (15) නොයනෙව්—නොයන, එව්. දවසරී—දවස්, අරී (17) දිගැස—දිග් (or ගු), ඇස. අතරදුරු—අතර, අදුරු. (18) සුරිඳු—සුර, ඉඳු. සදෙව්—සඳ, එව්. (19) ඈසියපි—ඈසි, අපි (20 සුගතිඳු—සුගත්, ඉඳු. දළිනෙක—දළින්, එක. කරණයුර—කරණ, අයුර. (21) පදරුත—පද, අරුත. සවණත—සවන්, අත.

Digitized by Google

23 සව් සිරි පිරි එ පු ර
වටතරු රැඳි ගැඹර ත ර
අගල පිළි මිණිමු ර
සිටිත් තා සුර ගෙද පුර හිමිත ර

24 එහි පහ මුදුන බ ද
ලෙලෙන රන් දද නල වැ ද
ළිඹි කුළු හිසැ සො ද
කෙළින වැනි සිදඟනෝ හැම සද

25 මිණි බිතු ගෙවත දිගැ ස
රඟන පිළිබිඹු දිසි ලෙ ස
සුරඟනවුන් සැද ස
පුරැඳුකරණෙව් රැඳුම් එකලෙ ස

26 පහන කොත් මිණි රු ස
වැදූ රන් තරිඳු මැද ස ස
බෝසත් සස දව ස
රුපැසි ගිරරැස් මැදවපැනිලෙස

27 ගනබ නිලුපුල් ස ර
රණකුසු මුතු පබලකු ර
සක් රණ දම් තිස ර
ලකල් රණළිය සරති එ තුවර

28 වත ගෙත කමළුපු ල
දුවන් වැලිතල පැහැදු ල
එපුර ළිය තුඩු වි ල
සරති සලෙලුන් තුවන් මිහිලොල

29 රතදරිණි නාළිය
ගමනින් සදිසි නාළිය
එ පුර සර ණාළිය
නාවුරු නම් හැකිවෙති ව ණාළිය

30 හස තණ්දුවර ගෙ ති
බමර බැම පුල් සර ව ති
නිල් සෙවෙල් වරලැ ති
එ පුර විල් කල්බඳුන් එකපු ති

31 උදුල දළ තොක වැ ල
ගන රන් පොරොදු විදු ලෙ ල
මද වැසි පොද වත ළ
සරණ ගන කුලු වැන්න ගජරළ

32 නර වර සුනෙර දු ල
ඇමති ගණ කුල ගිරි පෙ ළ
පුර කිරණවැ නැබ ල
විසුළ රළ පෙළ වැන්න හය රළ

33 සුදු සිඳු යොදනල ද
රන් දද නැගු මත න ද
එ පුර රිය සක් න ද
පැත්රු පවත් දිගත විනිවි ද

34 ජය ගත් අසුර සෙ න්
විකුමෙන් සදිසි මහසෙ න්
දිනා නෙක රුපු සෙ න්
එ පුර හැසිරෙසි තුමුල බළසෙන්

(24) සිදඟනෝ—සිද, අඟනෝ. (25) දිගැස—දිගු (or ග්), ඇස. සුරඟනවුන්—සුර, අඟන, දවුන්. කරණෙව්—කරණ, එව්. (26) පහන—පග, අන. තරිඳු—තරු, ඉඳු. (27) ගනබ—ගන, අබ. නිලුපුල—නිල්, උපුල්. රණකුසු—රන්, අකුසු. පබලකුර—පබල, අකුර. (28) කමළුපුල—කමල (or ළ), උපුල. පැහැදුල—පැහැ, උදුල. (29) රතදරිණි—රත්, අදරිණි. (30) තණ්දුවර—ගන (or න්), ඉඳුවර. වරලැති—වරල, ඇති. එකපුති—එක්, අපුති. (32) කිරණවැ—කිරි, අණවැ. (33) දිගත—දිග්, අත. (23) මිණිවුර—මිණි, අවුර.

Digitized by Google

35 සුරපුර යුත් පබ ද
එ නුවර සව් ඉසුරු වි ද
කොසොල් රජ මින ත ද
නිරතර මැජඹෙ සක් දෙවිඳු ලෙ ද

36 රජ දම් නුබ සසි ඳු
සපැමිණි මෙ රජ පුත් ස ඳු
ගුණ අම රසින් මු ඳු
උදම් කළෙ සව් සතුන් පෙම් සිඳු

37 වදන් අම රසි නා
ගුණ මිණි තිළිනු රළි නා
මෙ නරවර දිය නා
වැජඹි මනු නය වෙරළ නො පැ නා

38 මෙ රජ තෙද තල වැ ද
රුපු රජ අයිලැවිලැ සෙ ද
යස දුම සෙත විහි ද
මිඳු රුපු කල් වරල් එත බ ද

39 පුවතර මෙ රජ මි ණි
විකුම් සබ වස විතර ණි
රජ දහමින් පොර ණි
සතරඟවති කොට රකී සිය පණි

40 තෙසක් සිව්පායෙ න
සතහ දසරජදහම් න
සිව්සඟරා වති න
සතන් රැකැ පවතිය සතානි න

41 එ නිරිඳු ගෙන් මිහ රු
ලත් අනගි සිවු තන තු රු
යස දස දිගතැ පි රු
අයෝපිඩු සිවුනුමා පින් ස රු

42 සිව් පණස් කෙළ ද න
වියදම්කරු ගණන් ද න
කරවූ නිසි ලෙසි න
පතර තුඟු පහ පෙළින් බබල න

43 බිගු පෙළ මුවෙන් ග ත්
සුවඳ මල් තුරු පෙළ යු ත්
දෙව්රම් නම් මහ ත්
බිජී වෙහෙරෙක් බඹ ලොවෙක පු ත්

44 බඹ සුර නර උරි ඳු
මුනිඳුට පිදූ පැහැ වි ඳු
නව මිණි කිරුළු බ ඳු
දිලෙන් රන් මිණි කොත් පහග සැ ඳු

45 මහ සඟ ගණගෙ ඉ ඳු
සතර පිරිසිදු සිල් ක ඳු
විලස සතරතැ සැ ඳු
දිලේ පිළිමිණින් සිව් පව්රකු ඳු

46 රිවි තරිඳු සුවන ස
එක විට පහළවූ ලෙ ස
පහග කොත් මිණි රැ ස
වැදූ එකාලුවෙව් වෙහෙරඹර කු ස

(35) දෙවිඳු—දෙව්, ඉඳු. (38) අයිලැවිලැ—අයිල්, ඇවිලැ. (40) සිව්පායෙන—සිව්, උපායෙන. සතහ—සත්, අඟ. (41) නිරිඳු—නර, ඉඳු. අනගි—අන්, අගි. දිගතැ—දිග්, අතැ. සිවුනුමා—සිවු, උනුමා. (43) ලොවෙක—ලොව්, එක. (44) උරිඳු—උර, ඉඳු. මුනිඳුට—මුනි, ඉඳුට. පහග—පහ, අග. (45) සතරතැ—සතර, අතැ. පව්රකුඳු—පව්රක්, උඳු. (46) තරිඳු—තරු, ඉඳු. පහග—පහ, අග. එකාලුවෙ—එක්, අලුවෙ. වෙහෙරඹර—වෙහෙර, අඹර.

Digitized by Google

47 සඳඟව් නද වත ළ
නිල්මිණි පහ මුදුනැ ඳු ල
රන් දද පවනඹ ළ
දුන ගනැයි සඳදෙයි ගෙ සිකි කැ ල

48 වඳිනා ලෙස සමනැ ස
පැමිණෙන බඹ අමර රැ ස
වියන් සිතියම් ලෙ ස
දිලේ හැම වර වෙහෙරඹර කු ස

49 බඹ අමර නර නා
කිරුළු මිණි රැස් තොයි නා
දෙව් සරණැති ම නා
වසන වර ඒ වෙහෙර සව නා

50 එක් දිනෙක පිය ක රැ
සිල් මිණි අඳ නිඳනැ ඳු රැ
පින් කෙත් ගුණ ගැඹු රැ
සුපිළිපන් මහ සඟන ජන් ස රැ

51 දිමුත් මිණි කැවසි න්
ගඳ ගජ පෙළක් විලසි න්
එ තම තම නිවෙසි න්
නික්මවුන් හැඳැ පෙරව වෙසෙසි න්

52 විහිදෙන මිණි ප බා
පලගෙහි මුතු දැල් ල බා
ජයගත් සුර ස බා
දම්සබා අබතුඹරෙහි සසෝ බා

53 සං සුන් මෙවිමින් න දැ
මහළු පිළිවෙල නො විහි දැ
බුදු ගුණෙහි පිළිව දැ
මියුරු රස බස් පවසමින් ඉ දැ

54 කම් රසෙහි පිය ලී
සන්තෙහි වූ උකට ලී
මහණෙකුගෙ නෙප ලි
පහලවිය ඒ සබෙහි එක ලී

55 බඹ විමනෙව් උදු ල
මහ ගඳකිළිතුලෙහිනු ල
යහනතෙහි නි කස ල
මුනිඳු වැඩ හිඳ ලොවට සෙත්ක ළ

56 එ පවත් තතු ලෙසි න
දිව සවණතින් අසමි න
නැගී සිටැ සමවති න
සරණ දෙරණත තබත වෙසසි න

57 පලා නැගී දෙරණ ත
සත් බුමු පියුම් මුදුන ත
තබා යුග සරණ ත
මුනිඳු වැඩ හිට පින් සිරින් යු ත

58 රඳු තෙත් ලා ර ස
බඹවද කුසුම් පට ලෙ ස
දෙපට අඳනා ය තො ස
වඩා තෙ මඬුලු වසා නිසි ලෙ ස

---

(47) පවනඹල—පවන්, අඹළ. (48) සමනැස—සමන්, ඇස. වෙහෙරඹර—වෙහෙර, අඹර. (49) සරණැති—සරණ, ඇති. (51) නික්මවුන්—නික්ම, අවුන්. (55) උමනෙව්—උමන්, එව්. කිළිතුලෙහිනුල—ඍලි, අතුලෙහි, අතුල. යහනතෙහි—යහන්, අතෙහි. (56) සවණතින්—සවන්, අතින්. දෙරණත—දෙරණ, අත. (57) දෙරණත—දෙරණ, අත. මුදුනත—මුදුන්, අත. සරණත—සරණ, අත. මුනිඳු—මුනි, ඉඳු. (52) පලගෙහි—පල, අගෙහි.

Digitized by Google

59 තුඟු කසුන් ගිරි ර ද
වට වොරැඳි විදුලිය ලෙ ද
පවී දෑ මත න ද
දෙ පට සරිකොට එ මතු පිට බැ ද

60 සැදෑ වෙලකින් සුර ත්
වසනෙව් තරිඳු පැහැ ප ත්
නුග පලවන් දිමු ත්
සුගත් සිවුරෙන් වසත බුදු ග ත්

61 සතොස කර සුර න ර
මුනිඳු සිරුරෙන් පැහැ ස ර
ස වණක් රැස් පත ර
මෙසේ නික්මුනි දිගත අලුත ර

62 විලසින් කලිඳු ග ග
ඉඳු නිල් ඉඳුවරන් ර ග
සුනිල් රැස් දස දි ග
පැතිර නික්මුනි වසා සුරම ග

63 උතුරු සිඳු තුල පැ න
මෙර විලිහව ගියා මෙ න
රන්වන් රැස් සොබ න
දිවි සක්වල ගිරි හිසින් පැ න

64 පිලුම්රා මිණි ර ග
සඳැ වෙල පබල සිඳු ර ග
බඳුවද කුසුම් ර ග
සුරත් බුදු රැස් දිවි දස දි ග

65 දවහත් තරු සිරි ණ
කිත යුගෙහි කිරි සිඳු මෙ න
සුදු බුදුරැස් සොබ න
දිවි මුලු සක්වල තවර මි න

66 සපැමිණි බුදු පුද ට
බඹ සුරණගෙව් පැහැකො ට
බුදුරැස් වන් මද ට
දිවි සක්වල ගලින් පිටත ට

67 ලොවැති හැම පැහැයෙ න
කල සිතුයම් පටක් ගෙ ණ
විදහා පානමෙ න
දිවි පබසර කැලුම් හැම තැ න

68 කිම්ද වා පොලොවෙ හි
උලැගිවැ වැදී බවගෙ හි
පැතිරී දස දිගෙ හි
අසිරි බුදු රැස් දිවි ස වගෙ හි

69 එ සදෙසි මුනි දියැ ස
රන් ගිරි ලෙණතුලෙහි වැ ස
නිකුත් සී රජු ලෙ ස
සුවඳ ගඳකිළිතුලෙන් එළිබැ ස

70 තරු පිරිවරණ ල ද
සරා සඳ මඬලක් ලෙ ද
දම් සබෙයි සභ මැ ද
සැදූ අස්නෙහි මුනිඳු වැඩ හි ද

---

(60) වසනෙව්—වසන, එව්. තරිඳු—තරු, ඉඳු. (61) මුනිඳු—මුනි, ඉඳු. දිගත—දිග්, අත. (66) සුරණගෙව්—සුරන්, අග, එව්. (67) ලොවැති—ලොව, ඇති. (68) බවගෙහි—බව, අගෙහි. (69) දියැස—දිය, ඇස. ලෙණතුලෙහි—ලෙණ, ඇතුලෙහි. කිළිතුලෙන්—කිළි, ඇතුලෙන්. (70) මුනිඳු—මුනි, ඉඳු.

Digitized by Google

71 මහණෙනි මෙ තන ට
අප ඊමට පලමුකො ට
කි පුවතක් පලකො ට
උයන්නුදුසි වදහලේ සඟන ට

72 එ තෙපුල් අම රසි න
තෙත් මහ සඟන අතුරෙ ණ
යතිඳෙක් ගුණ නාදි න
සෙබෙන් නැඟි සිටැ සෙමෙන් අවුදි න

73 පසඟ ඔබමින් බි ම
මුනි සඳුව වඩමින් පෙ ම
මුනුලත් යුග පිසු ම
මුදුන් මලසනැ පුදු මනර ම

74 හිමි සඳිනි පව් නැ සු
නො කියනු ලෙස මෙ ඔබ දෙ සු
දෙ තිසක් කතා මු සු
දෙයක් නොම පැවසුමු තුසුදු සු

75 ඔබ සස්න පැවි දී
වෙමින් පිළිවෙතැ නොමයෙ දී
කම් රසයෙහි බැ ඳී
තපෝ ගුණයක් සිතේ නොරැ ඳී

76 සස්නෙහි වෙම්තල ස
ගුණ දම් නසා මුළු පි ස
වසන මහණෙකු දෙ ස
පවස පඩිසා උනිඳු සබ කු ස

77 ඉති යති සැලකර ත්
අසමින් මුනි කුළුණු සි ත්
බෝසත්හුද පෙර ත්
ලදුන් වෙතැ වඩවමින් ලොබ සි ත්

78 නො කටයුතු මෙහෙ කො ට
දුඹ දුක් විඳ නිසරු කො ට
යලි සිතැඟි සිදු තො ට
පැමිණියෝයසි මහත් යසස ට

79 ඉති මෙපද පවස න
අසනු ලොබකර එ සිරි න
එ යති සඳ අසදි න
මුනිඳු සඳ දුක්වී ඉකුත් ව න

80 දඹ දිව් තල උතු මි
සව් සිරි සපිරී නොව හි මි
මලල දෙස මනර මි
වීය නුවරෙක් කුසාවතී න මි

81 පිළිමිණි පවුර ල ග
බබලන දිය අගල ර ග
ගත ඝර බඹුරි ර ග
කෙලෙස වට හුනු වැත්ත සුර ග ඝ

82 නෙතු මුව කුසුමුදු ල
කරදර සරණ නව ද ල
පුන් තන අඹා ප ල
එපුර ලිය කප් ලියන් එකතු ල

(72) යතිඳෙක්—යති, ඉඳෙක්. (73) පසඟ—පස්, අඟ. මුනුලත්—මුනුලු, අත්. මලසනැ—මලැ, අසනැ. (76) වෙම්තලස—වෙමින්, අලස. (78) සිතැඟි—සිත(or ත්), ඇඟි. (79) මුනිඳු—මුනි, ඉඳු. (82) කුසුමුදුල—කුසුම්, උදුල. කරදර—කර, අදර. එකතුල—එක්, අතුල.

Digitized by Google

83 සඳුන් පළු ත   නවා
ඝිම වන පෙතින් එ   නවා
සලෙලු ගිම් උ   නවා
නැවත කෙළි දෙලෙසි ලොබ ද   නවා

84 කනා ලිය සිරි   ණා
ජණ ගෙවුයන් කෙළි   නා
මනා පුර ලිය   නා
විනා තතනා විනා කෙ ව   ණා

85 වතිනි සරි ඉ   න් දූ
රුසිරෙන් දල තිදු   න් දූ
සදිසි පුර ල   න් දූ
සඳලු තලවල කෙළිති ප   න් දූ

86 සතරත විහිදි අ   තු
කුසුම පලු පල රස යු   තු
තුඟු තුරු පෙල දිමු   තු
සැදුනු එපුරෙහි නෙක උයන් වතු

87 රැඳි ඉවුරු ඉඳුනී   ල්
සරණ රණ හස මිහිලො   ල්
සිහිලඹ පිරි නිම   ල්
පතැස් පොකුණෙන් සැදුනි සුවිස   ල්

88 දව හය කුර ග   සි ත්
දුබ වසන නැගි මෙරද   සි ත්
නොතැවී රිවි රැ   සි ත්
එපුර සලෙලෝ සරති සතො   සි ත්

89 රහසඟ විලඟ ක   ර
සතර පය සුපිහිටි ද   ර
දකුණු දල තුඟුත   ර
කලණ මත ගජ සරති එනුව   ර

90 නිය පඳුරන් පුව   ළ
පලම්න් ගජන් කුඹුත   ල
උරිරුඟ තවර ත   ල
කෙසර පෙළ වැනි සරණ හස ර   ළ

91 රන් දද පලඟ ලෙ   ල
මුදුන රන් කොත් සුලක   ල
යහන් සැදි සුදතු   ල
පමණ නො කළැකි එපුර රිය පෙ   ළ

92 අතැ ලෙලවි නන් ව   ග
කවසන් බැඳු සියල   ඟ
වැර සැර මහ සෙන   ග
නිතර හැසිරෙයි එපුර වේ ම   ග

93 ගජ හය රිය සෙන   ග
ගොස පැතිර ඝොස් දස දි   ග
පස තුරු ගොස සම   ග
එපුර ගුම් ගති පුගනැ සිදු ර   ඟ

94 සිතැ දුසිරිත පැහැ   ර
සව් සත කළ පිණින් පෙ   ර
වැජඹෙයි එපුර ව   ර
ඔකාවස් නම් රජෙක් පුවත   ර

---

(84) ගෙවුයන්—ගෙ, උයන්. (85) සඳලු—සඳ, අලු. (86) සතරත—සතර, අත (87) සිහිලඹ—සිහිල්, අඹ. (89) රහසඟ—රහස්, අඟ. (90) උරිරැඟ—උරිරු, ඇඟ. (91) පලඟ—පල, අඟ. සුදතුල—සුද, අතුල. කළැකි—කළ, ඇකි. (92) ලෙලවි—ලෙල, අවි. සියලඟ—සියල් (or ලු), අඟ. (93) පුගනැ—පුග, අතැ.

Digitized by Google

95 සසි කෙමි වලා ද ල
උළු රිළු කෙසර පෙළ දු ල
ඔනු යස ගෙස් කම ල
බිජී පුබුදුව මෙ මුලු දිය වි ල

96 සැඩ කර වෙසි දිනි දු
මසින් මස අඩුවෙවයි ඉ දු
නල වැද සැලෙයි සි දු
එසින් උවමෙක් කොද මෙ රජ බ දු

97 මොනු තෙදග රුපුන ද
වැද පෙණුනි නල සිලු ලෙ ද
මතුද රුපඹුන් හ ද
පිවිසැ දිසි තොත රතෙව් විනිවිද

98 මොනු බුජග සිරිම ත්
රැඳි කග රාහු බලව ත්
රුපුන් තෙදු රිවිග ත්
මතුද ගති උන් යසස් තරිදු ත්

99 රජ සුවරජ ඇම ති
දනන් සමගින් නුවණැ ති
විමසා ලොව රකි ති
එසින් එ නිරිදු සරි කෙනෙක් නැ ති

100 විහිදෙන මිණි කිර ණ
පැලඳි මානැගි අබර ණ
සිපි වැසෙනි තරු ණ
සුරඝනන් ලෙස දිලෙන සකල ණ

101 පුරඝන රුසිරු ස රු
සොලොස් දහසක් පිරිවැ රු
සීලවති නම් දු රු
බිසව කර අගබිසෝ තනතු රු

102 කුළුණු ගුණයෙන් හ ද
සත රැක මව් පියන් ලෙ ද
රජ දහම පිළිපැ ද
එ රජ එ නුවර රජකරණ ස ද

103 පින් සිරි යුතු නොම ද
එ බිසෝ ලදුන් හට සො ද
මතු සත රකින ලෙ ද
නැති බැවින් දරු කෙනෙක් මනන ද

104 හිතාහිත සත වෙ ත
පතල කරුණ මෙත් සි ත
දනගත් ලොව සිරි ත
සියල් සතරෙහි හසල නැණ යු ත

105 සිත් සත් ගුණ සපි රු
රජ යුවරජ ඇමතිව රු
නුවරුන් සමග ස රු
ඇතුළු නුවරට පිවිසැ නොවතු රු

106 සිට හල දොර ල ගා
යුග කො, සිදු ගොස ර ගා
සියලු දන සම ගා
මෙපුර නසිනෙයි කිවුය මොර ගා

(96) දිනිද—දින, ඉදු. (97) තෙදග—තෙද, අග. රුපුනද—රුපුන්, අද. රුපඹින්—රුපු, අඹුන්. රතෙව්—රතු, එව්. (98) බුජග—බුජ, අග. තරිදු—තරු, ඉදු. (99) නුවණැති—නුවණ, ඇති. නිරිදු—නර, ඉදු. නැති—න, ඇති. (100) මානැඟි—මන, ඇඟි=අඟි. සුරඝනන්—සුර, අඟනන්. (101) පුරඝන—පුර, අඟන. (103) නැගි—න, ඇති. (104) හිතාහිත—හිත, අහිත. (105) නොවතුරු—නොව, අතුරු (නොහොත්) නො, අතුරු.

Digitized by Google

107 එයසා නර පව ර
සිව් මැදුරු කව්ළුව හැ ර
බලමින් සිට එ ව ර
මෙමෙස් පැවසී තෙපුල් පැණි සර

108 රජ දනමට වෙණ ස
නැතිව අප අත කිසි මෙදු ස
රට නැසෙයි යන බ ස
කිමෙක පවසනු මෙ අප අබිය ස

109 රජු මෙ ලෙස පවස ත
මැතිවරු කිව්ය මෙ පුව ත
මතු රකිනට දිය ත
ඔබට නිසි දූ දරු කෙනෙක් නැ ත

110 එ බැවින් මෙ නුවර ට
අන් නිරිඳුන් පැමිණී වි ට
නස්නෙය මතු මෙ ර ට
එයින් මොරගා කීමු මෙ ඔබ ට

111 රජු එ පවත අ සා
දරු ලබන තැනු විම සා
කියවයි කී ති සා
ඇමැතිගණ සැලකළේ මෙ ලෙසා

112 කිම් සඳිනි පුවත ර
රදනා ඔබ ඇතුළු පු ර
සුළු තළඟනන් ව ර
ගල මැතවී රුකා වලින් දුරුකර

113 උන් සැම අතුරෙණු ත්
දරු උපතක් නො ලදමෙහා ත්
අග මෙහෙසිනිය මු ත්
ගල මැතවී පුරඟනන් අනිකු ත්

114 ඔවුන් සැම අතුරෙ ණි
පිණැති කෙනෙකුන් කුසයෙනි
උපත් කෙනෙකුන් ගෙ ණි
රට රකිමු කිව් නැණැති සැම දෙ න

115 එ බස සිත රඳ වා
නො මද දරු පෙම් බඳ වා
පුරඟන නො මද වා
ගලේ රජ රුකවලින් මුද වා

116 මැතින් කී විලසි න
සොළොස් දහසක් වරඟ න
උනුන් දෙස යන මෙ න
දෙවා අවසර නිරිඳු නො ලසි න

117 මෙලෙස කර නෙක තැ ත්
ඔවුනතුරෙන් එකියකු ත්
නොලදින් දරු උප ත්
මැතින් සහ ඒ නුවර අනිකු ත්

118 පුර වැසියෝ එ ක ළ
රුස්ව අවුදින් නො පැකි ළ
සිට නිරිඳු වාස ළ
කළෝ පෙර සේ මහත් කොලහ ළ

---

(107) එයසා—එ, අසා. නැතිව—න, ඇතිව. (109) නැත—න, ඇත. (110) නිරිඳුන්—නර, ඉඳුන්. (112) තළඟනන්—තළ, අඟනන්. (113) අතුරෙණුත්—අතුරෙන්, උන්. පුරඟනන්—පුර, අඟනන්. (114) පිණැති—පින්, ඇති. නැණැති—නැණ, ඇති. (115) පුරඟන—පුර, අඟන. (116) වරඟන—වර, අඟන. උනුන්—උන්, උන්. නිරිඳු—නර, ඉඳු. (117) ඔවුනතුරෙන්—ඔවුන්, අතුරෙන්. එකියකුත්—එකියක්, උත්. අනිකුත්—අනික්, උත්. (118) නිරිඳු—නර, ඉඳු.

Digitized by Google

119 එයසා රජ එවි ට
මෙ තොප හැම කී විලස ට
පුරඟනන් පිටත ට
හැරත් නෙක රැකවලින් පහකො ට

120 උන්ගෙන් එකියක ට
පමණ වත් දරු උපක ට
කරුණක් නූ කල ට
ඉතින් කටයුතු දේ කියව් ම ට

121 මෙසේ රජු පවස ත
අසමින් එපුර වැසි ස ත
පුරඟනගෙන් සම ත
මදක්වත් පින් කළ කෙනෙක් නැ ත

122 එ බැවින් දරු උප ත
මොවුන් කුස විමෙක් නැ ත
මතු රකින ලෙස ස ත
දරු ලබන වෙන උපදෙසක් ඇ ත

123 පිරිසිදු කුලෙළති යු ත්
සිත තුළ පිරි කුළුණුමෙ ත්
දස දෙස පතළ කි ත්
මහරු මෙහෙසුන් තනතුරට ප ත්

124 කොද කැකුළු වන් ද ත්
රත ලවනත පබල ප ත්
මඳ මඳ හසිති යු ත්
උවනනින් දන මන නුවන් ග ත්

125 සීලවති නම් යු ත්
අගබිසෝ ලඳ සිරිම ත්
සාලමොන් මින් පිට ත්
දරු ලැබෙයි කිම් දනෝ නැණව ත්

126 ඔවුන් කී බස සා
නරනිඳු සඳ එ විග සා
ලොවට වැඩ පිණි සා
බිසව මිණි අබරණින් සර සා

127 වෙන්ව සුරණිඳු ගෙ න්
බසිනා ලියෙව් ස ස ගෙ න්
දරු ලබනුව ඇ ගෙ න්
පිටත් කළෙ රජ බිසව රජ ගෙ න්

128 සොවගින් තැවෙමින් සිටි සඳ එ දිගැ ස
ඇයනන් ගුණ සිල් මහිමෙන් එ විග ස
සුරිඳුන් පඹුපුල් සලසුන් සිසිල ස
තොමදින් හුණුවිය රත් ය වටක් ලෙ ස

---

(119) එයසා—එ, අසා. පුරඟනන්—පුර, අඟනන්. (120), නූ—නු, උ=වූ. (121) පුරඟනගෙන්—පුර, අඟනගෙන්. නැත—න, ඇත. (122) නැත—න, ඇත. (124) ලවනත—ලවන්, අත. උවනනින්—උවන්, අනින්. (126) බසසා—බස්, අසා. නරනිඳු—නරන්, ඉඳු. (127) සුරණිඳුගෙන්—සුරන්, ඉඳුගෙන්. ලියෙව්—ලිය, එව්. (128) සොවගින්—සො, අගින්. දිගැස—දිගු, ඇස. සුරිඳුන්—සුර, ඉඳුන්. පඹුපුල්—පඹු, උපුල්. සලසුන්—සල්, අසුන්. සිසිලස—සිසිල්, අස.

Digitized by Google

129 සහස් නෙතින් සක් මුළු ලොව බලමි න
කුකුස් සිතින් සිටි එ බිසව දකිමි න
තිදස් පුරෙන් මහු ඇගෙ කුසැ උපදි න
මෙසෙස් සුරන් දෙදෙනෙක් දුක දිවැසි න

130 පලමුව වැද බෝසත් සුර විම නා
මෙද වනුව වෙනා දෙව්යෙකුවත් සොබ නා
නරලොව එ බිසව කුස මනා සද නා
උපදුව වදහලෙ පියකරු බසි නා

131 සුරරද බස සිය මුදුනෙන් පිළිගෙ ණී
ඔහු පද නිය රැස් ගඟතුළැ ගිලෙමි ණී
සිමිස ද වදහල ලෙස කුසැ බිස වු න
පිළිසිද ගණිමුව් ක්ව් සුර එ දෙදෙ න

132 එපවත් අසමින් වඩමින් සිත තො ස
දිවගත් අතුරුදහන් සර එ විග ස
දුටුසත් නෙත් සිත් පිළිකුල් වස ලෙ ස
විදුරත් ගති මෙ ලෙසින් ඔබ ලත් මෙ ස

133 යුගනෙත් සපිරි සබ සහ සදුලු ත්
කොපුලත් ඇකිලි වැගිරි කට ද ත්
ජරපත් බමුණෙකු විලසින් දුක් ප ත්
එමහත් සුර රජ සබයට විය ප ත්

144 මනෝනන්දනවූ කුශ තෘණ (ද) සුදුසුවූ දිව්‍ය වස්ත්‍රයක් ද දිව්‍ය සුගන්ධ විහිඳෙන්නාවූ ඒ චන්දන සාරයක් ද කොකනද වීණාව සහ පාරිජාත පුෂ්ප ද ශක්‍ර (දිව්‍ය) රජතෙම මහේසිකාවට දානයකොට පියාස සන්තෝෂකොට,

145 තේජෝමහිමයෙන් මේ ලෝකයට (ගැර) ගෙණ අවුත් (ඒ) කාන්තාව (එනම්, මහේසිකාව) රජයා හා සමග එක යහණවට ප්‍රාප්තකොට සුන්දරවූ පාදයෙහි මාපට ඇඟිල්ලෙන් භූමිය පිරිමද්දනයකොට ඒ ක්ෂණයෙහි සත්‍රෘෂ්ටවූ දුරකෝත්පත්තිය දානයකොට ගමනයකෙළේය.

ද්විතීය සර්ගය සමාප්තයි.

---

(139) සප්තාහය—සප්ත, අහය. සුරේන්ද්‍රයන්—සුර, ඉන්ද්‍රයන්. (144) මනෝනන්දනවූ—මන, නන්දනවූ. (145) තේජෝමහිමයෙන්—තේජඃ, මහිමයෙන්. දුරකෝත්පත්තිය—දුරක, උත්පත්තිය.

146 ඒ (නාභිපරාමර්ශනයකල) කාලයෙහි බුද්ධාඞ්කුර චාරිත්‍රයෙන් යුක්තවූ අපගේ මහා බෝධිසත්වතෙම දිව්‍ය පුරයෙන් ආගමනයකොට ශ්‍රීමත්වූ ඒ මහේෂිකාවන්ගේ කුක්ෂියෙහි ජනිතවූයේය.

147 ඒ ක්ෂණයෙහි රජතෙම පිබිදී යහණෙවෙහි නිසලකළාවූ මහේසිකා උත්නමිය දර්ශනයකරමින් සිත්හි ප්‍රේමයෙන් තන්වූ පරිද්දෙන් කාරණ ප්‍රතිපුච්ඡනයකළේය.

148 දරුවන් ලබා ආගමනයකරණ පරිද්දෙන් රජ ගෘහයෙන් නිෂ්ක්‍රාන්තවූ තැන් පටන් ඒ ස්ථානයට එන තුරුම තමන්ට ප්‍රවෘත්තවූ තත්වය ප්‍රකාශකරමින්,

149 ශක්‍ර දේවේන්ද්‍රයාගෙන් ලද්දාවූ කුශ තෘණ ආදිය ද දක්වා දරුක ලාභයවූ බව ද ශ්‍රීමත්වූ මහේසිකාව රජහට කී කල්හි,

150 (ඒ) ශ්‍රවණයකොට සන්තෝෂවූ නරෝත්තමතෙම ශ්‍රමණ බ්‍රාහ්මණයන් රැස්කොට අප්‍රමාණව දන පරිත්‍යාගකරමින් සුදුසුවූ පරිද්දෙන් ගර්භ ප්‍රතිහාර්‍ය්‍ය කරවූයේය.

151 ස්වාමියාගේ ප්‍රේම (නමැති) ක්ෂීර සාගරයෙහි ඕජෝවර්ධනයකරන්නාවූ සෞම්‍යවූ පූර්ණ චන්ද්‍ර රශ්මිය මෙන් දෘශ්‍යමානවූ ඒ ස්ත්‍රීතොමෝ මනෝනන්දනවූ ගර්භ දෑම ලක්ෂණය ධාරණයකළාය.

152 සකල ශරීරය ශ්වේත මලානිකවී දවසින් දවස ඉඟපිය වර්ධනයවෙමින් පයෝධරාග්‍රය නීල වර්ණව මුහුණ හාසමග නේත්‍ර යුග්මය මැලවුනේයි.

153 ඒ ස්ත්‍රීතොමෝ මේ ප්‍රකාරයෙන් වාසයකොට දශෛකොණ මාසය පිරුණු කල්හි මුහුණෙහි රූප ශ්‍රී මඳවූ මහ පින් ඇත්තාවූ සුන්දරවූ පුත්‍රයෙකු ප්‍රසූතකළාය.

154 මහා භාග්‍යවූ ඒ කුමාරයාහට කුස කුමාරය (යි) නාම ස්ථාපනයකොට සුලභවූ සකලෛශ්වර්‍ය්‍යයෙන (යුක්තව) පුත්‍ර ප්‍රේම වර්ධනයකොට ප්‍රලෝභකොට වර්ධනයකළාහුය.

155 ඥාන ප්‍රබුද්ධ ඒ කුමාරයා පියවර නගා ඇවිදිනා කල්හි දෙව්යෙක් දිව්‍ය පුරයෙන් අවුත් මනෝනන්දනවූ ඒ මහේසිකාවන්ගේ කුක්ෂියෙහි උත්පත්තිව,

---

(146) බුද්ධාඞ්කුර—බුද්ධ, අඞ්කුර. (149) දේවේන්ද්‍රයාගෙන්—දේව, ඉන්ද්‍රයාගෙන්. (150) නරෝත්තම—නර, උත්තම. (151) ඕජෝවර්ධනයකරන්නාවූ—ඕජඃ, වර්ධනයකරන්නාවූ. මනෝනන්දනවූ—මනඃ, නන්දනවූ. (152) පයෝධරාග්‍රය—පයඃ, ධර, අග්‍රය. (153) දශෛකොණ—දශ, ඒක, ඌණ. (154) සකලෛශ්වර්‍ය්‍යයෙන්—සකල, ඓශ්වර්‍ය්‍යයෙන් (155) මනෝනන්දනවූ—මනඃ, නන්දනවූ.

Digitized by Google

156 ප්‍රබද්ධවූ මේඝ ගණයකින් නිෂ්ක්‍රාන්තවූ චන්ද්‍ර මණ්ඩලයක් පරිද්දෙන් ප්‍රසන්නවූ මාතෘ කුක්ෂියෙන් මනෝනන්දනවූ කුමාරතෙම ප්‍රසන්න ලෝකය දර්ශනයකොළේය.

157 ශෝභාසහිතවූ ඒ කුමාරයාහට ජයම්පති කුමාරය යන නාම ස්ථාපනයකොට මහෝත්සවයෙන් පුත්‍ර ප්‍රේමයෙන යුක්තව සන්තෝෂයෙන් වර්ධනකළාහුය.

158 ආකාශයෙහි සූර්ය චන්ද්‍රයන් ලෙසින් ඒ දෙදෙනා නිසිවූ පරිද්දෙන් වර්ධනව සොළොස් අවුරුද්දට සම්ප්‍රාප්තව තුන් ලොවට ඇසක් (වැනිවූ) කුස කුමාරතෙම විජෘම්භමාන වූයේය.

159 ශිල්ප ශාස්ත්‍ර (නමැති) සාගරයෙහි (පර) තීරය තීක්ෂණවූ ඥානාග්නියෙන් දර්ශනය කොට වයඃ ප්‍රාප්තවූ ඒ කුමාරයා දර්ශනයකොට සන්තුෂ්ටවූ මනෝඥවූ ජනෘ නරේන්ද්‍රතෙම,

160 ශරීර ලක්ෂණයෙන් සන්තුෂ්ටවූ (නොහොත්, ශරීර ලක්ෂණයකරණකොටගෙණ තෘප්තවූ අද්විතාම්බිකාව වැනිවූ) අග්‍ර මහේෂිකාව (නමා) සමීපයට කැඳවා අමෘතාකාර වූ වචනයෙන් මනෝනන්දනයකොට මෙයාකාරයෙන කීයේ:

161 තම තොපගේ ජ්‍යෙෂ්ඨ කුමාරයාට දිව්‍යාඞ්ගනාවක් විලාසයට දක්‍ෂමානවූ ජනනී සන්තුෂ්ටවූ රාජ දුහිතෘවක් අරගෙණ අග්‍ර මහේෂිකා උසස් කොට,

162 රාජ්‍ය ශ්‍රීය විඳිනයකරණ පරිද්දෙන් ඒ කුමාරයාට ප්‍රකාශකරමින් හිමිස්වාමෙගෙණ විශාම අභිෂේකකරවයි නරේන්ද්‍රතෙම සන්තෝෂයෙන වදාළේයි.

163 මහේෂිකා උපන්නම්ය ඒ (කථාව) ශ්‍රවණයකොට මුඛයෙන් ප්‍රාණයක් ලද්දියක් මෙන (සතුටුව) නිරන්තරයෙන් සමීපයෙහි සිටිනාවූ මිහිරිවූ සුන්දරවූ ස්වාමෝචිත වචන කථනයකරන්නාවූ,

164 ප්‍රකටවූ කාන්තාකරන්නියකට නරේන්ද්‍රයාවිසින් කියනලද ඒ වචනය නත්වූ පරිද්දෙන් උද්ග්‍රහණයකරවා ස්වකීය කුමාරේන්ද්‍රයාගේ අභිමුඛයට හැරියාය.

165 ඒ (කාර්යානකාරිනිතොමෝ!) ගමනයකොට කුමාරයා දර්ශනයකොට ශ්‍රීපාද තල වන්දනා නමස්කාරකොට එක් පාර්ශ්වයක ස්ථානයකොට නොවලනා නත්වූ විලාසය සැලකළාය.

---

(156) මනෝනන්දනවූ—මනඃ, නන්දනවූ. (159) ඥානාග්නියෙන්—ඥාන, අග්නියෙන්. නරේන්ද්‍ර—නර, ඉන්ද්‍ර. (160) අද්විතාම්බිකාව—අද්විතී, අම්බිකාව. අමෘතාකාරවූ—අමෘත ආකාරවූ. මනෝනන්දනය - මනඃ, නන්දනය. මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (161) දිව්‍යාඞ්ගනාවක්—දිව්‍ය, අඞ්ගනාවක්. (162) නරේන්ද්‍ර—නර, ඉන්ද්‍ර. (163) ස්වාමෝචිත—ස්වාමි, උචිත. (164) නරේන්ද්‍රයා—නර, ඉන්ද්‍රයා. කුමාරේන්ද්‍රයාගේ—කුමාර, ඉන්ද්‍රයාගේ.

Digitized by Google

166 ඒ ප්‍රවෘත්තිය ශ්‍රවණයකොට විහාර මුනුබුරන් පුත්‍රාවූ මා සමීපයෙහිදී මගේ සිතාමෙවකුගේ ඉඳුමක් නැත්තේය; එසේහෙයින් ගෘහ වාසයෙන් මේ මට කාමක් නැත්තේය.

167 සුන්දරවූ මාතා පිතෘ දෙදෙනා ජීවත්වසිත්තා තාක්ම මෙහි වාසයකොට පසුව ලෝක ප්‍රසිද්ධවූ තපසට ගමනයකරමියි මනෝනන්දනවූ කුමාරතෙම කථනයකෙළේයි.

168 කුමාරයාවිසින් කථනයකරනලද්දාවූ මේ ප්‍රවෘත්තිය ඒ කාන්තාව මහේසිකාවට ප්‍රකාශකළකල්හි (ඒ) මහේසිකාව නොනැවතී ගමනයකොට රජහට කී කල්හි (ඒ රජහුගේ) චිත්තය අසන්තුෂ්ටව,

169 මෙ ආකාරයට වාරයෙන් වාරයෙහි පිය රජහුවිසින් කථනයකරනලබන කාරණය (හෙවත් පණිවිඩය) නොකෙළේත්නාව අනාදර වෙයසි කල්පනාකොට උතුම්වූ ඒ කුමාරයා,

170 මේ දවස්හි උපදේශයෙහින් මා නොවරහි ශ්‍රේෂ්ඨය නැති කරමියි මාතා පිතෘන්ගේ චිත්තය නොව ඉක්මතිව තපසට යමියි සිතට ගෙණ,

171 සුවර්ණ කාරක මාතීය ජානනයකොට ලෝකයා අතරෙහි ප්‍රසිද්ධව වාසයකරන්නාවූ ඒ නගරයෙහි සුවර්ණකාර ජ්‍යෙෂ්ඨයා එම දවස්හි (තමා) සමීපයට කැඳවාලමින්,

172 මේ දෙනලද්දාවූ කාඤ්චන ග්‍රහණයකොට දිව්‍ය කුමාරියක් පරිද්දෙන් සුවර්ණ රූපයක් කරගෙණ ආගමනයකරවයි ප්‍රකාශකොට සිට ඒ (පරනාඑවා) පිටත්කරමින්,

173 බෝධිසත්වයන් ද එ දවසම තමන්ගේ ආනුභාව බලයෙන් දිව්‍යාඞ්ගනාවක් පරදවන්නාවූ සුන්දරවූ සතවූ රන්රන් රූපයක් කරමින්,

174 උතුම්වූ වස්ත්‍ර අඳිනාදනයකරවා හස්තයෙහි (ද) ශ්‍රීවයෙහි (ද) ආභරණ බඳමින් ශ්‍රී යහන් ගබඩාව ඇතුලෙහි රන්රන් රූපය ස්ථානයකරවමින් වාසයකරණකල්හි,

175 බඩාලා ද ඒ දවස්හි තමන් විසින් නිමවනලද ශෝභනවූ රන්රන් රූපය ග්‍රහණයකොට අවුත් සන්තෝෂයෙන් දක්වූයේය.

176 දිප්තිමත්වූ රන්රන් රූපය දර්ශනයකොට මා විසින් කරණලද රූපයක් ඇත්තේය; ශ්‍රී යහන් විමානය ඇතුලෙහි නිරීක්ෂණයකොට (ඒ) (සැර) ගෙණ එවයි බෝධිසත්වයාවිසින් කීහෙයින්,

---

(167) මනෝනන්දනවූ—මන, නන්දනවූ. (169) අනාදර—අ (නොහොත් අන්, අදර.
(173) දිව්‍යාඞ්ගනාවක්—දිව්‍ය, අඞ්ගනාවක්.

Digitized by Google

177 ස්වර්ණකාර ජ්‍යෙෂ්ඨයා ගමනයකොට බබලන්නාවූ කාඤ්චන රූපය දක්නය කොට මහාබෝධිසත්වයන්ගේ පුණ්‍ය බලයෙන් පහළවූවාවූ දිව්‍යාඞ්ගනාවක (සේ) විස්මයකරමින්,

178 මහා සත්වයාණන්ගේ සමීපයට ආගමනයකොට ශ්‍රීමත්වූ අග්‍ර මහේෂිකා වන්නීකාවෝ හුදකලාවම වැඩසිටිත්; එසේහෙයින් විමානයනුලට නො පැමිණ ආගමනයකෙළෙමි.

179 ඒ ස්වර්ණකාරයා පාද තලයට නමස්කාරකොට මෙයාකාරයෙන් සැලකළ කල්හි, දේව, මහේෂිකාවක් නොවෙයි, කාඤ්චන රූපයම (වෙයි), පැතිලීමක්නොව (ඒ) (හැර) ගෙණ එව.

180 මෙයාකාරයෙන් කියමින් ඒ රත්රන් රූපය ගෙන්නවා ගෙණ ශාටකාභරණයෙන් සරසා ශෝභනවූ යෝග්‍යවූ රථයක ස්ථාපනයකරවමින්,

181 මෙ බඳුවූ රූප ශ්‍රීයෙන් යුක්තවූ සුදුසුවූ රාජ දුහිතෘවක් ලද්දේවීනම් මහේසිකා ප්‍රාප්ත කෙරෙම්ය කථනයකොට මාතෘ මහේසිකාව සමීපයට යැව්වේය.

182 ත්‍රිදශයෙන් බැස්සාවූ දිව්‍යාඞ්ගනාවක් මෙන් දිලියෙන්නාවූ රත්රන් රූපය හැරගෙණ ගොස් මහේසිකාවන්ට දක්නයකරවා සිට ගෙණ කුමාරයන්ගේ අභිප්‍රාය තත්වූ පරිද්දෙන් කීවාහුය.

183 මහේසිකාවන් විසින් ප්‍රකාශකරණලද වචනය ශ්‍රවණයකොට අනලස්ව අමාත්‍යයන් රැසිකොට අමෘත වැනිවූ රසවත්වූ ප්‍රිය වචනයෙන් සභා මධ්‍යයෙහි මෙ ආකාරයෙන් ප්‍රකාශකරයි:

184 මහත් පින් ඇත්තාවූ අපගේ කුමාරේන්ද්‍රයා ශක්‍රයා විසින් දෙනලද ප්‍රසිද්ධවූ එකෙනෙක්ය; ඒ භාවයෙන් මෙ රත්රන් රූපය වැනිවූ රූප ශ්‍රීකරණකොටගෙණ සියලු ලෝකයෙහි ප්‍රසිද්ධවූ,

185 ශෝභමානවූ නිර්මලවූ රාජ දුහිතෘවක් යෝග්‍යවූ විවාහ මඞ්ගල්‍ය කෙරෙමින් ප්‍රභාවෙන් ගැවසිගත්තාවූ ශ්වේතින් උජ්ජවලිතවූ මහාතල්‍යවූ සිංහාසන ප්‍රාප්තකොට,

---

(177) දිව්‍යාඞ්ගනාවක—දිව්‍ය, අඞ්ගනාවක. (178) විමානයනුලට—විමානය, අනුලට. (179) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (180) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. ශාටකාභරණයෙන්—ශාටක, ආභරණයෙන්. (182) දිව්‍යාඞ්ගනාවක්—දිව්‍ය, අඞ්ගනාවක්. (184) කුමාරේන්ද්‍රයා—කුමාර, ඉන්ද්‍රයා. (185) සිංහාසන—සිංහ, ආසන.

Digitized by Google

186 මෙසේත් මතු සමස්ත ලෝකය රක්නාපිණිස පින් ඇත්තාවූ අපගේ කුමාරයා හට සන්තුෂ්ඨවූ සිත් පිණවන්නාවූ ස්ත්‍රියක් නොයෙක් දේශවල අන්වෙෂණකරණ පරිද්දෙන්,

187 විශිෂ්ටවූ මේ රත්රන් රූපය හැරගෙණ ගොස්න් සවස් වරුවෙහි ජනයා රැස්වන්නාවූ අනාසිස්වූ තැනෙක්හි සකස්වූ පරිද්දෙන් ස්ථාපනයකොට අහක්වෙමින් නොපෙණී ස්ථාපනයකල කල්හි,

188 මනඃකල්‍යවූ ප්‍රභා ප්‍රාප්තවූ මේ රූපයට එක සමානවූ ස්ත්‍රියක් ඒ නගරයෙහි ඇතිනම් අසවලාගේ දුහිතෘවෙද්දෙහෝයි ප්‍රකාශකරත්ය; රසවත්වූ ඒ වචනය ශ්‍රවණයකරමින්,

189 සුන්දරවූ ඒ ජනයත් දර්ශනයකොට ප්‍රසන්නව පණ්ණාකාර පිණිස රත්රන් රූපය ද මනෝඥවූ මාඞ්ගල්‍යය නිශ්චයකොට හෘදය පිරුණාවූ සන්තොෂයෙන් නොරඳ ආගමනයකරව ;

190 මෙයාකාරයෙන් විසේෂ විභාග කියාපෙන්වා යන්නාවුණ්ට ස්ථානාන්තර දී විචිත්‍රවූ ඝනවූ රත්රන් රූපය දූතයකොට නගරයෙන් දේශාන්තරයට ඇරියාහුයි.

191 අමාත්‍ය ජනයා මහේසිකාවන්විසින් කියනලද්දාවූ වචනය ශ්‍රවණයකොට ඝනවූ රත්රන් රූපය ශාටකාභරණයෙන් සජ්ජිතකරමින් බබලන්නාවූ සුදුසුවූ රත්රන් දෝලාවකින් ග්‍රහණයකොට වහාම නගරයෙන් නගරයට ප්‍රවිෂ්ටවෙමින්,

192 බොහෝ සෙයින් නොයෙක් ජන සමූහයා රැසිවන්නාවූ කූප තීර්ථය පානීය තීර්ථය ආදී ස්ථානවල රත්රන් රූපය ස්ථාපනයකරවා ඒ සියල්ලන් අහක්වෙමින් නොපෙණෙමින් ස්ථාපනයකළ කල්හි,

193 රැසිවූ ජනයා විශිෂ්ටවූ ඒ රත්රන් රූපය දර්ශනයකොට ත්‍රිදශපුරයෙන් බැස්සාවූ දිව්‍යාඞ්ගනාවක් හැර මේ රූපයට සමානවන්නාවූ අන්‍යවූ මනුෂ්‍ය ස්ත්‍රියක් නැත් ඉත්‍ය (යි) මේ වචනය කීකල්හි රත්රන් රූපය ඒ ස්ථානයෙන් හැරගෙණ,

194 හස්ති අශ්ව රථ පාබල්‍යය (යි යන) සේනාවෙන් යුක්තවූ පෘථිවි තලයට දිව්‍ය ලෝකය බැස්සාක් මෙන් ඓශ්වර්‍ය්‍යයෙන් (යුක්තවූ) මද්‍ර රටෙහි ශෝභමානවූ සාගල (නම්) නගරයට ප්‍රවිෂ්ටවූවාහුය.

---

(190) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (191) ශාටකාභරණයෙන්—ශාටක, ආභරණයෙන්. (193) දිව්‍යාඞ්ගනාවක්—දිව්‍ය, අඞ්ගනාවක්.

Digitized by Google

195 ඒ කාලයෙහි ඒ රජ්ජුහට ඒකාකාරයෙන් ජාතකවූ නිර්මලවූ දුහිතෘන් අට දෙනාගෙන් වැඩිමහළුව සිටියාවූ අලඞ්කෘතවූ අසඞ්කලිතවූ ප්‍රභාවතී නම්වූ කාන්තා තොමෝ සියලු රූප ලක්ෂණයෙන් ජනයන්ගේ සිත් ආලයකොට දෘශ්‍යමානවූවාය.

196 ව්‍යක්තයෙනි, තීරයක් දර්ශනයනොකරනලද්දාවූ ගම්භීර ඇත්තාවූ මහාසමුද්‍රයෙන් (ජල) බිඳුවක් ග්‍රහණයකොට සත්වයාහට පෙන්වන්නාක් මෙන් ඒ කාන්තාවගේ ලක්ෂණය ස්වල්පයක් කථනයකරමි: අමෘතයක් පරිද්දෙන් ශ්‍රවණ වනු (නමැති) භාජන විවරයෙන් පානයකරව්.

197 මයූරයෙකුගේ පිඤ්ඡ කලාපයක් මෙන් නිරන්තරයෙන් භ්‍රාජිතවන්නාවූ ඒ (කාන්තාවගේ) පුෂ්ප ධූමයෙන් උජ්ජ්වලිතවූ කේශකලාපය සෑම කල්හි දිලියෙන්නාවූ විද්‍යුත්කාන්තිය නොරවනාවූ විරාජමානවූ නීලවර්ණවූ මේඝකූට ශ්‍රීය ජනයාගේ චිත්තය ග්‍රහණයකොට ප්‍රකාශකෙළේයි.

198 නොයෙක් (ලක්ෂණවූ) රූපයෙන් දෘශ්‍යමානවූ ශ්‍රීවන්තවූ ඒ කාන්තාවගේ නතිකර භ්‍රෑයුග්මවැලෙන් යුක්තවූ පටුවූ ලලාටය මේඝකූටයකින් පාර්ශ්වයක් සඤ්ජනනවූ කලඞ්කය පතිතවූ ප්‍රභා ප්‍රාප්තවූ ශශාඞ්ක මණ්ඩලය පරිද්දෙන් භ්‍රාජමානවෙයි.

199 ඝන නීලවූ ධ්වජ යුග්මයක් බැන්දාවූ රත්රන් යෂ්ටියක් බඳුවූ මනෝඥවූ ඒ කාන්තාවගේ නන්දනීයවූ බැම (හා) නාසිකාව දික්වූ නීලවර්ණවූ පත්‍ර යුග්මයකින් සෑම කල්හි සජ්ජිතවූ තරුණවූ රත්රන් රම්භා පෝතකයක ශ්‍රීයාව ලද්දේය.

200 රූප ශ්‍රීයෙන් ලෝකාග්‍රවූ ශෝභනවූ ඒ කාන්තාවගේ ඉන්දීවර (හා) ඉන්ද්‍රනීල මාණික්‍යාකාරයෙන් දිලියෙන්නාවූ නන්දනවූ දික්වූ නීලවර්ණවූ ප්‍රභා සාරවූ නේත්‍ර යුග්මය (කෙසේද) ශරීර ශ්‍රී (නමැති) ගඞ්ගාවෙහි ක්‍රීඩාකරන්නාවූ මත්ස්‍ය යුග්මයකි.

201 ප්‍රභා ප්‍රාප්තවූ තොල් (නමැති) පත්‍ර පඞ්ක්තියෙන් උජ්ජ්වලිතවූ දෘශ්‍යමානවූ දන්ත (නමැති) මකරන්දයෙන් (යුක්තවූ) නිර්මලවූ සුගන්ධ ඇත්තාවූ ජනයාගේ නේත්‍ර කාන්ති (නමැති) භෘඞ්ග සමූහයාවිසින් ලෝභකොට සේවනයකරනලද්දාවූ ඒ කාන්තාවගේ මුඛය පද්මයක ශ්‍රීයාව ග්‍රහණයකෙළේය.

202 ප්‍රසන්නවූ කපෝල ස්ථලයට ප්‍රතිබිම්බ ප්‍රාප්ත කල්හි නිරන්තරයෙන් විභූෂණව සතරක් මෙන් පෙණෙන්නාවූ කර්ණවල විරාජමානවූ සුන්දරවූ ස්වර්ණ තාඩඞ්ක යුග්මය අනඞ්ගයාගේ රථචක්‍ර සතරට බඳුවූ විලාසයෙන් දිලියෙයි.

(195) ඒකාකාරයෙන්—ඒක, ආකාරයෙන්. (198) ශශාඞ්ක—ශශ, අඞ්ක. (200) ලෝකාග්‍රවූ—ලෝක, අග්‍රවූ. මාණික්‍යාකාරයෙන්—මාණික්‍ය, ආකාරයෙන්.

Digitized by Google

203 ත්‍රිනේත්‍රකාන්තාව ජයග්‍රහණයකළාවූ රූපශ්‍රී ඇත්තාවූ ඒ කාන්තාවන්(හා) සමාන වයසකාවූ ප්‍රධාන කාන්තාවක් ලෝක ත්‍රයෙහිම නැත්වෙනිවම නැත්තේය කියා බ්‍රහ්මයාවිසින් ඇඟිලියක් මෙන් වලි ත්‍රයය රඤ්ජිතවූ ශ්‍රීවය සැම කල්හි භ්‍රාජිතවන්නේයි.

204 පුෂ්පචාපයාගේ මස්තකයෙහි මකාවසජ්ජිතකළාවූ ප්‍රභා ප්‍රාප්තවූ මුලාවූ චම්පක පුෂ්ප දාම වැනිවූ ඒ (කාන්තාවගේ) කෝමල හස්තය නොකඩව කාන්තිමය න් යුක්තවම සමයින්නාවූ දිලියෙන්නාවූ විද්‍යුද්දාම යුග්මයක ශ්‍රී සාරය ග්‍රහණයකෙළේයි.

205 සදාකල්හි මත්ත හස්ති කුම්භ විලාසයෙන් දෘශ්‍යමානවූ (ඒ ප්‍රභාවතිකාන්තාව ගේ) තරුණවූ උස්වූ අතුල්‍යවූ ප්‍රභාවෙන් නන්දනීයවූ පයෝධර යුග්මය සාටුවයසුතුවූ අභිනව මාණික්‍ය දාමය වැනිවූ රන්රන් සූත්‍රයෙන් බඳිනලද්දාවූ අනඞ්ගරාජයාගේ අභි ෂේකයෙහි සුවර්ණ කුම්භවල ශ්‍රිය ලද්දේය.

206 මේ ලෝකයට අවතීර්ණවූ ශෝභමානවූ දිව්‍යාඞ්ගනාවක් මෙන් රූප ශ්‍රියෙන් බබලන්නාවූ ඒ කාන්තාවගේ අකලඞ්කවූ ඝනවූ රන්රන් පෝරුවක් මෙන් දෘශ්‍යමා නවූ පෘෂ්ඨය දර්ශනය කළ කල කල්හි ජනයන්ගේ චිත්ත සන්තෝෂ වර්ධනයකරවයි.

207 චිත්ත ප්‍රීණනයකරවන්නාවූ ඒ (කාන්තාවගේ) .ශරීර (නමැති) වෘක්ෂ මස්තකයට අනඞ්ගයාගේ සිත්වූ පරිද්දෙන්ම නැඟීමට මෙන් වසාරජ (නමැති) යෂ්ටිය නාභි ආවා ටයෙහි සිටුවමින් මහාබ්‍රහ්මයාවිසින් වලි ත්‍රය (නමැති) සැරපට බැන්දාක් මෙනි.

208 ත්‍රි මද (ගලිත) හස්තීන්ගේ කුම්භස්තලාකාරවූ මනෝඥවූ ඒ කාන්තාවගේ හෘද යෙහි ජීරුණවූ උස්වූ අතුල්‍යවූ පයෝධර යුග්මය නිරන්තරයෙන් උද්වහණයකොට කෘශවූවාක් මෙන් (තිබෙන) කෘශවූ මධ්‍යප්‍රදේශය (කෙසේද) අනඞ්ගයාගේ ධනු මුෂ්ට්‍යා කාරයෙන් පැහැදිලිව දිලියෙයි.

209 ලෝකවාසීන්ගේ නේත්‍ර (නමැති) මත්ස්‍ය සමූහයාවිසින් සැම කල්හි ක්‍රීඩාකර න්නාවූ යෞවන (නමැති) ගඞ්ගාවෙහි ප්‍රභා සාරවූ වැලි තලාව වැනිවූ සකල ශ්‍රියෙන් පරිනවූ ඒ කාන්තාවගේ ජඝන ප්‍රදේශය සුවර්ණ කර්තනයෙන් කරණලද රථ ච ක්‍රය (හා) ඒකාකාරයි.

210 හස්ති ශුණ්ඩාව (හා) කෙසෙල්කඳ (ද) ජයග්‍රහණයකොට විරාජමානවූ ශ්‍රීමත්වූ ඒ කාන්තාවගේ ශෝභමානවූ ඌරු යුග්මය මදයෙන් මත්වූ සල්ලාලජන (නමැති) හස්තීන් බන්ධනයකොට රඤ්ජමානවූ ප්‍රභා ප්‍රාප්තවූ දිලියෙන්නාවූ රත්රන් ස්තම්භ දෙකක්ය.

(204) විද්‍යුද්දාම—විද්‍යුත්, දාම. (205) පයෝධර—පයඃ, ධර. (206) දිව්‍යාඞ්ගනාවක්—දිව්‍ය, අඞ්ගනාවක්. (208) කුම්භස්තලාකාරවූ—කුම්භඃ, තල, ආකාරවූ. පයෝධර—පයඃ, ධර. මුෂ්ට්‍යාකාරයෙන්—මුෂ්ටි, ආකාරයෙන්. (209) ඒකාකාරයි—ඒක, ආකාරයි.

Digitized by Google

211 සකල රූපලක්ෂණකරණකොටගෙණ දිව්‍යාප්සරාවක් මෙන් බබලන්නාවූ ඒ කාන්තාවගේ චිත්ත ප්‍රීණනයවන්නාවූ ජානු යුග්මය (කෙසේද) මහත්වූ උත්තර සාගරයෙන් නැංගාවූ ශෝභාසම්පිතවූ නිර්මලවූ නොමැකෙන්නාවූ බුබුළු දෙකක්ය.

212 ශෝභමාන රූපලක්ෂණයෙන් බබලන්නාවූ ඒ කාන්තාවගේ මනෝරම්‍යවූ නිරන්තරයෙන් සවර්ණ මයුරරාජයෙකුගේ ග්‍රීවය මෙන් දිලියෙන්නාවූ අප්‍රමාණ කාන්ති ඇත්තාවූ සශ්ලිෂ්ටවූ ජඞ්ඝා යුග්මය දකින්නාවූ සත්වයන්ගේ චිත්ත නේත්‍ර වශීවා කාරවයි.

213 ඉන්ද්‍රනීලමාණික්‍යාභරණ (නමැති) භෘඞ්ග ජාලවර්ගයින් වටකරණලද්දාවූ ප්‍රභාවෙන් දිලියෙන්නාවූ රක්තාඞ්ගුලි (නමැති) පත්‍ර පංක්තියෙන් මනාවඅලංකෘතවූ රාජ කාන්තා (නමැති) හංසාඞ්ගනාවන්විසින් සේවනයකරණලද්දාවූ ඒ (කාන්තාවගේ) පාද තල විකසිත රක්ත පද්ම ශ්‍රිය ප්‍රකාශකෙළේයි.

214 අප්‍රතිමත්වූ අතිරක්තවූ ඔෂ්ඨ (නමැති) ප්‍රවාලාඞ්කුර (ඇති) මහත්වූ ගණ්ඩ ඝැටි කුම්භ වැනිවූ ලයෙහි පිරුණාවූ පයෝධර (ඇති) ඒ කාන්තාවගේ ශරීර ශ්‍රිය නිරීක්ෂණය කරනොත් වර්ණනාකරනොත් ශක්‍රයා (හෝ) අනන්තයා හැර කවරනු සමර්ථ වේද්ද?

215 එකල්හි රත්රන් රූපය හැරගෙණ ඒ (සාගල) නගරයට ප්‍රාප්තවූ අමාත්‍යවරයෝ ඒ රජයාගේ පුෂ්කරිණී තීරයෙහි ඒ රත්රන් රූපය සිටුවමින් ස්ථානයකාල කල්හි,

216 සූඛියා හසනපමිතයට ප්‍රාප්තකල්හි ප්‍රභාවතිය නහවනුපිණිස රත්රන් (කලගා) රිදී කල (හැර) ගෙණ පැන්පිණිස ස්ත්‍රීහු අට දෙනෙක් සන්තෝෂයෙන් ආගමනයකරණකල්හි,

217 අප්‍රතිමත්වූ ඒ කුමාරිකාවගට ක්ෂීර මාතෘ ස්ථානාන්තරයට පැමිණියාවූ කුදුවූ ශරීරයෙන් යුක්තවූ මහළු ස්ත්‍රී ද ඒ (ස්ත්‍රීන් අට දෙනා) සමග ආගමනයකොට,

218 මනෝඥවූ රත්රන් රූපය දර්ශනයකොට ප්‍රභාවතිය යන චිත්තයෙන් යුෂ්මත් නැනැත්තිය මේ ස්ථානයට නුඹකලාව කුමක්පිණිස ආවාදැයි කියා රෝෂයෙන්,

219 නරකොට හසනය නගා අයෝග්‍යවූ චිරුළුවචන කියා මා නාශකලා යුතුදැයි කියා කන්ඇස් පිටට (හෙවත්, කපෝලපාර්ශ්වයට) ගැසුවාය.

220 ඇත්තාවූ තත්වය දැනනොගෙණ රත්රන් රූපයට පහරක් දෙනයකොට බොහෝව හසනය රිදී මහළුවූ ඒ කුදුස්ත්‍රීතොමෝ මෙසේකාරයෙන් ප්‍රකාශකරන්නීය:

---

(211) දිව්‍යාප්සරාවක්—දිව්‍ය, අප්සරාවක්. (213) මාණික්‍යාභරණ—මාණික්‍ය, ආභරණ. රක්තාඞ්ගුලි—රක්ත, අඞ්ගුලි. හංසාඞ්ගනාවන්—හංස, අඞ්ගනාවන්. (214) ප්‍රවාලාඞ්කුර—ප්‍රවාල, අඞ්කුර. පයෝධර—පයඃ, ධර.

Digitized by Google

221 මාගේ දුහිතාවය සි ශඞ්කා කොට රත්රන් රූපයකට ප්‍රහාර දානයකොට හ
සනාවට වෙහෙසද වූයේය. ඛේදය! අදදිනයෙහි මට සතුරක් වූයේය.

222 ඇවිසින් මේ ප්‍රකාරයට කථනයකළකල්හි මන්ත්‍රී ජනයෝ එලියට බැසලා සි
ත්හි සන්තෝෂ වර්ධනයකරමින් නිශ්චයකොට කාරණ විචාළාහුය.

223 මේ රත්රන් රූපය සමානවන්නාවූ අන්‍යවූ කුමාරිකාවකුන් ඇත්නිද? තත්වූ
පරිද්දෙන් මේ අපහට කීයේවිනම් යහපත්වන්නේයයි යාච්ඤාකරමින් කීවාහුය.

224 එ කල්හි ඒ වචන ශ්‍රවණයකොට ඒ (මන්ත්‍රී ජනයන්ගේ) සිත්හි සැක දුරු
කොට රස වචනයෙන් බලවත්ව ඒ කුජ්ජාවූ මැහැල්ලිස්ත්‍රීතොමෝ මෙසාකාරයෙන් ප්‍රකා
ශකරන්නීය:

225 මේ ජම්බුද්වීපතලයෙහි ප්‍රසිද්ධවූ මද්‍ර රටෙහිවූ සාගල නගරයෙහි බොහෝ බලඇ
ත්තාවූ මහා නරේන්ද්‍රයාහට ප්‍රභාවතී (යන) නාමයෙන් දිලියෙන්නාවූ දුහිතාවක් ඇ
ත්තීය.

226 ඒ ස්ත්‍රිය සතර රියන් ගෘහ කුක්ෂියට ප්‍රවිෂ්ටව ඉඳිනා කල්හි මාණික්‍ය ප්‍රදීප
ගණනක් නැගු පරිද්දෙන් අන්ධකාර රාශිය දුරුවන්නේය.

227 යෝගෑවූ උතුම චන්දන සුගන්ධය ශරීරයෙන් නික්මෙන්නේය; මනෝනන්දනයවූ
උත්පල පුෂ්ප සුගන්ධය ඒ (කාන්තාවගේ) සුන්දරවූ මුඛ ගන්ධයෙන් ප්‍රවෘත්තවන්නේය.

228 ඒ කුමාරිකාව වාසයකරණ ස්ථානයෙහි අන්‍යවූ රාජ කුමාරිකාවෝ ඇත්තෝන
මුදු රූප ශ්‍රීයෙන් නොම දිලියෙත්ය (ඒ කුමක් මෙන්ද යත්) සූර්යයාගේ අභිමුඛයෙහි
තබනලද (නොහොත්, දල්වනලද) ප්‍රදීප මෙනි.

229 ඉනාමච්චවූ මේ කනක රූපය ඈ සමීපයට ග්‍රහණය කොට ගියේවිනම් දිව්‍යා
ඞ්ගනාවකට සමාන කළාවූ වානරධේනුවක් මෙන් මේ නොපෙනට සිතෙන්නේය.

230 තාරකාවලින් පරිවෘතකරණලද්දාවූ ශරත් (කාලයෙහි) චන්ද්‍ර මණ්ඩලයක් මෙන්
පරිවාර ස්ත්‍රීන්ගේ මධ්‍යයෙහි ප්‍රභාවතීය (යන) නාමය ඇත්තාවූ රාජ කාන්තාවනොමෝ
දිලියෙත්නීය.

231 ප්‍රභාවතියගේ රූපලක්ෂණ ප්‍රබන්ධය අමාත්‍යයන්හට කී කල්හි චන්ද්‍ර රශ්මිය ප්‍රවි
ෂ්ටවූ කිරි මුහුද මෙන් චිත්ත සන්තෝෂ වර්ධනයකරමින්,

---

(224) මෙසාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (225) නරේන්ද්‍රයාහට—නර, ඉන්ද්‍රයාහට.
(227) මනෝනන්දනවූ—මනඃ, නන්දනවූ. (229) දිව්‍යාඞ්ගනාවකට—දිව්‍ය, අඞ්ගනාවකට.

Digitized by Google

232 යහපත්වම මවිටවිවූ රත්රන් රූපය ගෙණ රජ මඳුරයට ප්‍රවිෂ්ටවෙමින් තමන් සිටින්නාවූ තන්වය රජයාහට සැලකරණ පරිද්දෙන් අග්‍ර අමාත්‍යෝත්තමයාහට කථාය කළේය.

233 එකල්හි ඒ මන්ත්‍රීන්ද්‍රයා ගමනයකොට නරේන්ද්‍රයාහට මස්තකයෙහි බද්ධාඤ්ජලිව නමස්කාර කරමින් ස්ථානයකොට ඒ තන්වය සුපුසුමකොට සැලකළ කල්හි,

234 රජතෙමේ ඒ තන්වය ශ්‍රවණයකරමින් ඒ ආගමනයකළාවූ මන්ත්‍රීන් අට දෙනාහට බහුමාන වර්ණනයකරවමින් සමීපයට කැඳවා දර්ශනයකරවා ගෙණ,

235 පෘථිවීශ්වරවූ නරේන්ද්‍රයාගේ සැප දුක් විචාරා (ඊට) අනුරූපව සාරවූ මන්ත්‍රීන් අනිත් තමාගේ සමීපයට සම්ප්‍රාප්තවූ විශේෂිතාග විචාළේය.

236 දස දහසක් යොදුන් (ඇත්තාවූ) ජම්බුද්වීප තලයෙහිවූ සකල නරේන්ද්‍රයන්ටම මස්තක ප්‍රාප්තවූ ඔක්කාකවංස නරේන්ද්‍රයාහට පුරේන්ද්‍රයාටසිත් දෙනලද්දාවූ,

237 ඥාන (නමැති) නෞකාවෙන් සකල ශිල්ප (නමැති) මහා සාගරයේ පරතීරය දක්නාකළාවූ සිංහනාදයෙන් ප්‍රකාශවූ කුස කුමාරයාය යන නාමයෙන් ප්‍රසිද්ධවූ,

238 උදාරවූ ඒ කුමාරයාහට ඔබවහන්සේගේ කුමාරිකාව මහේෂිකා කොට ගැණීම නිශ්චය කොට රන්රන් රූපය පණ්ණාකාරකොට (හැර) ගෙණ ආමහ.

239 ඒ (අමාත්‍යයන් විසින්) කියනලද වචන ශ්‍රවණයකොට අමුතුවෙන් අභිෂේකයක් ලද්දෙකුමෙන් චිත්තයෙහි සන්තෝෂය සමුත්පන්නකොට ඒ දවස්හි මහත්වූ රජ ප්‍රතිපූජනයෙන්,

240 තමන්ගේ කුමාරිකාවහට රන්රන් රූපය පණ්ණාකාරකොට (හැර) ගෙණ ඒ ආගමනයකළාවූ මන්ත්‍රිවරුන්හට බොහෝවූ සකලෛශ්වර්‍ය්‍යය ප්‍රදානයකරමින් ගෞරවකොට,

241 ජම්බුද්වීපයට අග්‍රප්‍රාප්තවූ ඔක්කාකවංස නරේන්ද්‍රයාහට ද අනේක වූ පණ්ණාකාර බන්ධනයකොට මෛත්‍රී ප්‍රකාශ වර්ණනයකරවමින් පිටත්කළේය.

තෘතීය සර්ගය සමාප්තයි.

242 මන්ත්‍රී ජනයා නික්ම ආගමනයකොට සියක් යොදුන් මාර්ගය පසුකරමින් කිසිත් දුකක් නොවමින් සන්තෝෂයෙන් කුසාවතී නගරයට ප්‍රවිෂ්ටව,

---

(233) මන්ත්‍රීන්ද්‍රයා—මන්ත්‍රී, ඉන්ද්‍රයා. නරේන්ද්‍රයාහට—නර, ඉන්ද්‍රයාහට. බද්ධාඤ්ජලිව—බද්ධ, අඤ්ජලිව. (235) පෘථිවීශ්වරවූ—පෘථිවී, ඊශ්වරවූ. නරේන්ද්‍රයාගේ—නර, ඉන්ද්‍රයාගේ. (236) නරේන්ද්‍රයන්ටම—නර, ඉන්ද්‍රයන්ටම. නරේන්ද්‍රයාහට—නර, ඉන්ද්‍රයාහට. පුරේන්ද්‍රයා—පුර, ඉන්ද්‍රයා. (240) සකලෛශ්වර්‍ය්‍යය—සකල, ඓශ්වර්‍ය්‍යය. (241) නරේන්ද්‍රයාහට—නර, ඉන්ද්‍රයාහට. අනේක—අන්, එක.

Digitized by Google

243 ඉක්ෂ්වාකුවංශ නරෝත්තමයා සමග අග්‍ර මහේෂිකා උත්තමිය (ද) දර්ශනයකොට අභිවාදනයකොට ආදරකොට ආ හිය කාරණ විශේෂවිභාග කථනයකළාහුය.

244 ඒ (අමාත්‍යයන්විසින්) කියනලද්දාවූ වචනයට නරේන්ද්‍රයාගේ චිත්තය සන්තෝෂ වෙමින් සේනාව පරිවාර කොට විවාහ මංගල්‍යයපිණිස යාමට සජ්ජිතව,

245 පඤ්චාඞ්ගික (තූර්ය) ඝෝෂා කරවා නභෝමාර්ග ඡත්‍ර ධ්වජයෙන් ඡාදනයකොට අග්‍රමහේෂිකාව සමග රජතෙම නිෂ්ක්‍රාන්තව අන්තර මාර්ග ගෙවා ආගමනයකොට,

246 යුගාන්තයෙහි චණ්ඩ මාරුත ප්‍රවිෂ්ටව ඵල ග්‍රහණයකළාවූ සමුද්‍රයක් පරිද්දෙන් අමන්දවූ මහ සෙනග හාසමග ඒ සාගල නගර සමීපයට ප්‍රාප්ත කල්හි,

247 එ දවස්හි මද්‍ර නරේන්ද්‍රතෙම චතුරඞ්ගිනී සේනාව සමග ඉදිරි මාර්ගයට ආගමනයකොට චිත්තයෙහි සම්පූර්ණවූ ආදරයෙන් කැඳවාගණිමින්,

248 රාජ මන්දිරයට ප්‍රවිෂ්ටව ශුභ්‍රව තීවෘත ආස්තරණයකළාවූ මාණික්‍යාසන මධ්‍යයෙහි ඒ රජයා නිසීදනයකරවා නරේන්ද්‍රයාහට ආදරකොට උත් කල්හි,

249 සන්තෝෂවූ ඒ සීලවතී මහේෂිකාතොමෝ කීප දවසක් වාසයකොට විශේෂවූ තමන්ගේ ස්වාමියාහට ප්‍රභාවතිය දර්ශනයකාරණ අභිප්‍රාය කීවාය.

250 එම කල්හි ඒ ප්‍රවෘත්තිය මද්‍ර රජයාහට කියා යවූකල්හි එ ලෙසින් නැන්ද මාමා දක්නාපිණිස ප්‍රභාවතියහට කියා යැවූවේය.

251 සුන්දුරුවූ කල්ප වෘක්ෂවල මස්තකයෙන් නික්මුණාවූ රන්රන් ලතාවක් මෙන් (ද) නිර්මලවූ හංසාඞ්ගනාවන් මධ්‍යයෙහි (යන්නාවූ) ස්වර්ණ හංස වධූවක් මෙන් (ද) අලංකෘතවූ තාරකා පරිවාරයෙන් ගමන් ගන්නාවූ (පූර්ණ) චන්ද්‍රයෙක් මෙන් (ද) මහත්වූ කරේණුකාඞ්ගනාවක් පරිවාරකළාවූ ඇතින්නියක් මෙන් (ද),

252 රන්රන් (ආභරණ හා) මාණික්‍යාභරණ (හැර) ගෙණ ධාරණයකරමින් නොයෙක් සහවෘද්ධීන් (හා) කිරිමවුන් (ද) සමග මනොඥවූ ගුණ (ඇති) ප්‍රභාවතීතොමෝ එම දවස්හි (සිට) ප්‍රීණනාවී නැන්ද මාමා (යන දෙදෙන) දර්ශනයකොට සවනයකළ කල්හි,

---

(243) නරෝත්තමයා—නර, උත්තමයා. (244) නරේන්ද්‍රයාගේ—නර, ඉන්ද්‍රයාගේ. (245) පඤ්චාඞ්ගික—පඤ්ච, අඞ්ගික. නභෝමාර්ග—නභස්, මාර්ග. (246) යුගාන්තයෙහි—යුග, අන්තයෙහි. (247) නරේන්ද්‍ර—නර, ඉන්ද්‍ර. චතුරඞ්ගිනී—චතුර්, අඞ්ගිනී. (248) මාණික්‍යාසන—මාණික්‍ය, ආසන. නරේන්ද්‍රයාහට—නර, ඉන්ද්‍රයාහට. (251) සුන්දුරුලුවූ—සු, උන්දුරුලුවූ. හංසාඞ්ගනාවන්—හංස, අඞ්ගනාවන්. කරේණුකාඞ්ගනාව—කරේණුකා, අඞ්ගනාව. (252) මාණික්‍යාභරණ—මාණික්‍ය, ආභරණ.

Digitized by Google

253 නැන්දා මාමා (යන) ඒ දෙදෙනා ප්‍රභාවතියගේ අමන්දවූ රූපශ්‍රිය සවනීය අක්ෂියෙන් නිරීක්ෂණයකොට ඉතා සන්තෝෂව මෙයාකාරයෙන් සිතූහ:

254 ඒ ආකාරවූ මුහුණින් යුක්තවූ අපගේ කුමාරතෙම මේ (ප්‍රභාවතියවිසින්) දක්නය කළහොත් ඔහුගේ සමීපයෙහි නොරැඳෙන්නීය; (එහෙයින්) නැවතද කුමක්කරමුද්දැයි චින්තනයකොට,

255 තීක්ෂණ ඥානයෙන් යුක්තවූ සීලවතී නම්වූ රාජ කාන්තාතොමෝ බලවත්වූ උපදේශයක් යෝජිතකොට පරීක්ෂාකොට මේ චාරිත්‍රය කියන්නීය:

256 අපගේ රාජ පරම්පරාවෙහි පූර්වයෙහි සිට මෙසේ පැවතඑන්නාවූ චාරිත්‍රයක්ය: (ඒ කවරක්ද යත්) කුමාරයෙකුට උචිතවූ සමාන කුලයෙන් යුක්තවූ කුමාරිකාවක් ග්‍රහණයකළ කල්හි,

257 පුත්දරවූ ඒ කුමාරිකාවනට දරුගර්භයක් පිහිටන තෙක් දවල් දවස අනරෙහි ඒ කුමාරතෙම ඒ කාන්තාවනට නොපෙණෙමින්,

258 රාත්‍රී දවස්හි සමහිව සූර්යෝදයට ප්‍රථමයෙන් යනාවෙන් නැගිට යාම (යන යමක් අද්ද) මෙන අපගේ වංශයෙහි පැවත එන්නාවූ චාරිත්‍රයකි.

259 ඒ භාවයෙන් ප්‍රභාවතිය ඔම් චාරිත්‍රය පරිද්දෙන් පවතිනම් නිශ්චයකොට විචාරවයි කියා මද්‍ර නරේන්ද්‍රයාගේ සමීපයට (පණිවුඩ) යැවූවේය.

260 (මද්‍ර) රජතෙම ඒ ප්‍රවෘත්තිය ශ්‍රවණයකොට තමාගේ දුහිතෘ උත්තමියට ප්‍රකාශකොට යහපතැයි කී හෙයින් නැන්දා මාමා (දෙදෙනාට) අතලස්ව කථනයකළේය.

261 ඒ වචන (නමැති) අමෘත රශ්මියෙන් සන්තෝෂ සිත් (ඇත්තා)වූ ඒ (නැන්දා මාමා) දෙදෙන ප්‍රේමයෙන් මද්‍ර රජයාහට අප්‍රමාණවූ යහපත් ප්‍රිය වචන දන්යකරමින්,

262 ඒ කාලයෙහි ප්‍රභාවතිය (හැර) ගෙණ මහත් ප්‍රතිහාර්‍ය්‍ය කරවා පට්පාටියෙන් මාර්ගාන්තරය ගෙවා නමනයකොට කුසාවතී නගරයට පැමිණ,

263 බන්ධනාගාරවල මනුෂ්‍යයන් (ද) පඤ්ජරවල පක්ෂීන් හාසමග දැමලින් බන්ධනයවී සිටියාවූ චතුෂ්පාද සමූහයන්ද එම කාලයෙහි මුක්තකළාහුය.

---

(253) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (259) නරේන්ද්‍රයාගේ—නර, ඉන්ද්‍රයාගේ. (262) මාර්ගාන්තරය—මාර්ග, අන්තරය. (263) බන්ධනාගාරවල—බන්ධන, ආගාරවල. චතුෂ්පාද—චතුර්, පාද.

Digitized by Google

264 රන්රන් රිදී කලස් නාළිකේර පුෂ්පයෙන් සජ්ජිතකොට ලාජ පඤ්චම පුෂ්ප සේවනයකොට උභය පාර්ශ්වයෙහි ධජ ශ්‍රී මාණික්‍ය තෝරණ සජ්ජිතකොට,

265 දිව්‍ය පුරයක් ලෙසින් තමන්ගේ උපන්වූ නුවර සජ්ජිතකොට තූර්ය ඝෝෂා කරවා සන්තෝෂවෙමින් රජ ගෘහයට ප්‍රවිෂ්ටව,

266 උතුම්වූ කුස කුමාරයාහට විවාහ මඞ්ගල්‍යය ද සිද්ධකොට මන්ත්‍රි සේනාවන් රැස්කොට ඒ නගරයෙහි රජ ඓශ්වර්‍ය්‍යය භාරකොළේය.

චතුර්ථ සර්ගය සමාප්තයි.

267 මාතෘ උත්තමියගේ නියෝගයෙන් දැවිල් දවසෙහි අදෘශ්‍යමානව ප්‍රභාවතී දේවිය භාසමාන රතී (නම් දිව්‍යාඞ්ගනාව හා) අනඞ්ගයා පරිද්දෙන් (පඤ්ච කාම) ශ්‍රිය වින්දනයකරයි.

268 මේ (කුස) රජයාගේ තේජස් මහිමයෙන් ප්‍රභාවතී (දේවියගේ) සුන්දරවූ වක් ත්‍රයෙන් නිකුත්වන්නාවූ කාන්ති සමූහය සූර්‍ය්‍ය දර්ශනයකළාවූ ඛද්‍යෝතයකු මෙන් අදෘශ්‍ය (නොහොත්, අන්ධකාර) වේද.

269 මනෝනන්දනවූ කුස නරේන්ද්‍රතෙම බොහෝවූ රජ ඓශ්වර්‍ය්‍යයෙන් (යුක්තව) කාව්‍ය නාටක ගන්ධර්ව රසය වින්දනයකොට ස්වල්ප දවසක් ඉක්ම ගිය කල්හි,

270 මාතෘ මහේසිකාවගේ අභිමුඛයට ප්‍රවිෂ්ටව සැප දුක් විචාරා දැවල්දිනයක සුදු සුඩු පරිද්දෙන් ප්‍රභාවතිය දර්ශනයකරණ අධ්‍යාශය ඥාපනයකරවූයේය.

271 ඒ වචන ශ්‍රවණයකරමින්ම තොපගේ මනෝඥවූ මහේසිකාවහට දුරක ගර්භ යක් වන තෙක් දිවසභාගයෙහි දර්ශනයකිරීම ප්‍රාර්ථනානොකළ මනාය.

272 එ පරිද්දෙන් කථනයකරණකල්හි ද ප්‍රභාවතිය දර්ශනයකරණු කැමැත්තෙන් අනිවර්තිතවන බැවින් ඉක්බිත්තෙන් බිසවතොමෝ මෙයාකාරයෙන් ප්‍රකාශකරන්නීය:

273 රජ වේශය හැර ඊක්ෂණයෙහි හස්ති ගෝපකයන්ගේ මධ්‍යයට වැදී සුඹුත්නු සිටිය කල්හි එ කල්හි සුන්දරවූ ප්‍රභාවතිය ග්‍රහණයකොට එම්ද කියා,

274 ලේලි සමග හස්ති ශාලාභ්‍යන්තරයට ප්‍රවිෂ්ටවෙමින් මඞ්ගල්‍ය හස්තියා දර්ශනය කරමින් සන්තෝෂයෙන් ගමණයකිරීමපිණිස නික්මුනු කල්හි,

---

(267) දිව්‍යාඞ්ගනාව — දිව්‍ය, අඞ්ගනාව. (269) මනෝනන්දනවූ — මන, නන්දනවූ. නරේන්ද්‍රතෙම — නර, ඉන්ද්‍රතෙම. (270) අධ්‍යාශය — අධි, ආශය. (272) මෙයාකාරයෙන් — මෙ, ආකාරයෙන්. (274) ශාලාභ්‍යන්තරයට — ශාලා, අභ්‍යන්තරයට.

Digitized by Google

275 කුස රජතෙම අභිමතයෙන් හැසි ගෝපකයන්ගේ මධ්‍යයෙහි ස්ථානයකොට ඇත් බෙට්ටකින් ප්‍රභාවතියගේ පෘෂ්ඨයට තදින් (පහරක්) ගැසුයේය.

276 ඒ (ප්‍රභාවතී) කාන්තාතොමෝ ඒ ප්‍රහාරය වැදී සනිඳිධවූ කෝපයෙන් (යුක්ත ව) භ්‍රමණයවී, බලා, තාහට අදද්වයැයි අපගේ ස්වාමියාහට කථනයකොට කරන්නාවූ වධය නිරීක්ෂණයකරව.

277 ඒ (ප්‍රභාවතිය) විසින් මෙයාකාරයෙන් කී කල්හි සීලවතී නම් මහේෂිකාව ද බොහෝසේ කෝපවූ නැනැත්තියක් මෙන් ඕහට තරකොට සහබ්ධ බඩවචන කථනයකොට,

278 සකල හැසි ගෝපකයෝතුමු සම් කාලයෙහි පණත්නොවූදෙය කරත්ත; ඒ භාවයෙන් ඔවුන්ගේ චඤ්චලය නිරීක්ෂාකිරීම ඉතාමහත්වූ නිසිවූ ගුණයක.

279 මෙයාකාරයෙන් ප්‍රකාශකොට යෙහෙළනිය සහසා විදැහ කෝෂය වර්ජිතයකරමින් රජ මන්දිරයට ප්‍රවිෂ්ටව වාසයකරණ කල්හි,

280 ඒ (කුස) රජතෙම පූර්වයෙහි පරිද්දෙන් මැනියන්ගේ සමීපයට ආගමනයකොට ප්‍රභාවතිය දර්ශනයකිරීමපිණිස ලෝභිවූ බව ඒ කල්හි දැන්වූයේය.

281 මාතෘ උත්තමීතොමෝ ඒ (වචන) ශ්‍රවණයකරමින් අශ්ව ගෝපක වේශයක් ග්‍රහණයකරමින් සිටිවයි (කියා) ප්‍රකාශකරමින් ඒ ප්‍රභාවතිය කැඳවාගෙණ ආගමනයකොට,

282 අශ්ව ශාලාභ්‍යන්තරයට ප්‍රවිෂ්ටව අශ්වයන්ගේ නාම ප්‍රතිපුච්ඡනයකොට (හෙවත්, විචාරා) සන්තෝෂයෙන් යෙහෙළනියන් සමග නික්මී එනකල්හි කුස නරේන්ද්‍රතෙම පූර්වයෙහි මෙන්,

283 අශ්ව වර්චසක් ග්‍රහණයකොට තරව පෘෂ්ඨයට ගැසුහෙයින් කෝපවූ ඒ බිසවුන් ප්‍රිය වචන කියමින් සහනයකොට,

284 සීලවතී (නම්) රජ කාන්තාව සුන්දරවූ යෙහෙළිනිය සමග රජ භවනයට පැමිණ වාසයකොට බොහෝදාවූ දවසක් වාසයකරණ කල්හි,

285 දිව්‍යාඞ්ගනාවක් මෙන් ශරීර ලක්ෂණයෙන් බබලන්නාවූ සිත් පිණවන්නාවූ ශෝභමානවූ ප්‍රභාවතී කාන්තාතොමෝ පූර්ණ සාරවූ තමාගේ ස්වාමියා දැක්මට ලෝභයෙන් නැන්දනියහට ප්‍රිය වචනයෙන් කීවාය.

---

(277) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (279 මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (282 ශාලාභ්‍යන්තරයට—ශාලා, අභ්‍යන්තරයට. නරේන්ද්‍ර—නර, ඉන්ද්‍ර. (285) දිව්‍යාඞ්ගනාවක්—දිව්‍ය, අඞ්ගනාවක්.

Digitized by Google

286 ඒ (සීලවතී) දේවියවිසින් ඒ ප්‍රවෘත්තිය ශ්‍රවණයකරමින් මේ පුෂමත් (ශබ්දවාච්‍යනැතැත්තිය හට) දූරකෝත්පත්තියක් වන නාක් තමාගේ ස්වාමියා දැනීමට අපගේ රාජ වංශයට සුදුසු නැත්තේයයි කියමින්ස්ටද්දීත් ඒ (තීම) චිත්තයට ග්‍රහණය නොකොටම,

287 ප්‍රභාවතීතොමෝ! තමාගේ ස්වාමියා දශීනයකිරීමපිණිස ලෝභයෙන් දෙවනු ද යාච්ඤාකරමින් ප්‍රකාශකළෙහයින් ඒ (ප්‍රභාවතියගේ) චිත්තය රස මිශ්‍රවූ වචනයෙන් පිණනයකරවා පසුවද (නොහොත්, ආයෙත්) ඒ (ශීලවතී) මහේසිකාතොමෝ මේ (මතුකියන) ප්‍රකාරයෙන් කථනයකළාය.

288 ශෝභමානවූ ඓරාවණ හස්තිරාජයාට ආරූඪවෙමින් සුදර්ශන වීථි මධ්‍යයෙන් ආගමනයකරන්නාවූ (ශක්‍ර) දිව්‍ය රාජයා මෙන් ගජේන්ද්‍රයාට ආරූඪවෙමින් සෙට දවස්හි ආගමනයකරන්නාවූ ස්වාමියා දශීනයකොට චිත්තය සැනසේවයි කථනයකරමින්,

289 අනඞ්ගයාගේ විලාසයෙන් රූප ශ්‍රීකාරණකොටගෙණ බබලන්නාවූ ශෝභමාන වූ ඒ ජයම්පතී කුමාරේන්ද්‍රයාගේ ශරීරය ආභරණයෙන් මනෝනන්දනකොට සජ්ජිත කොට විශේෂයෙන් උස්වූ මඞ්ගල්‍යහස්තියාගේ පෘෂ්ඨයෙහි හින්දවා,

290 ශ්‍රීමත්වූ කුස රජයා දුක්පත් වේශයෙන් නොනානකොට සිටින්නාවූ ගැනි ගෝපකයෙකු මෙන් මඞ්ගල්‍ය හස්තියාගේ පශ්චිමාසනයෙහි හිඳුවමින් ඒ මහත්වූ චතුරඞ්ගිනී සේනාවන් පරිවාරයෙන්,

291 සමුද්‍ර ඝෝෂාව මෙන් පඤ්ච තූර්‍ය්‍ය නාද කරවා පිරිවර සහිතව නගර ප්‍රදක්ෂිණ කොට ආගමනයකරණකල්හි රාජ විමානාභ්‍යන්තරයෙහි සීහ පඤ්ජරයෙහි දොර හැරලා ප්‍රභාවතී කාන්තාතොමෝ ඒ විචිත්‍රය නිරීක්ෂණයකරමින්,

292 මේ අස්මත් (ශබ්දවාච්‍යනැතැත්තිහට) සුදුසුවූ සුන්දරවූ ස්වාමියෙකු ලද්දෙමියි සන්තොෂවෙමින් ඒ මහේසිකා කාන්තාව සිටිය කල්හි රජයාහට පස්සෙහි ඇත්ගොවුවෙකු පරිද්දෙන් ඇත්තාවූ කපටවූ ඒ කුස රජයා චිත්ත සන්තොෂ වර්ධනයකරමින්,

293 දුඹුළුවූ රෞද්‍රවූ සතුරු මෙන් (ද) ඉසලා දැ ගියාවූ මහත්වූ ප්‍රූපයක් මෙන්ම අති කාලවණිවූ රැවුල නැත්තාවූ නාසය කුඩාවූ මුහුණින් උගුළු විසුළු දක්වමින් සිබාව වණමින්,

---

(286) දූරකෝත්පත්තිය—දූරක, උත්පත්තිය. (288) ගජේන්ද්‍රයාට—ගජ, ඉන්ද්‍රයාට. (289) කුමාරේන්ද්‍රයාගේ—කුමාර, ඉන්ද්‍රයාගේ. මනෝනන්දන—මනඃ, නන්දන. (290) පශ්චිමාසනයෙහි—පශ්චිම, ආසනයෙහි. චතුරඞ්ගිනී—චතුර්, අඞ්ගිනී. (291) විමානාභ්‍යන්තරයෙහි—විමාන, අභ්‍යන්තරයෙහි.

294 මද නැකතට ඇති යවාසිව්ය බැවින් (සීලවත්) මහේසිකාවතොමෝ සන්තෝෂයෙන් ප්‍රභාවතී සමීපයට ආගමනයකොට තමාට ඔබින්නාවූ ශෝභමානවූ රූප ශ්‍රී ඇත්තාවූ ස්වාමියා දකිනයකලා දූස් ප්‍රිය වචනයෙන් කීවාය.

295 ඒ මහේසිකා උත්තමියවිසින් බොහෝසෙයින් මෙයාකාරයෙන් ප්‍රකාශකරණ කල්හි තමාගේ චිත්තයෙහි අභ්‍යන්තරවූ කුකුස් සම්පූර්ණකොට (මෙසේ විචාරන්නීය:) මෑතයෙන් යුක්තවූ නොතික්ම සිටියාවූ හස්ති ගෝපකයා කවරකාරණයක් පිණිස රජයාගේ සමීපයෙහි හින්දවූයේදැයි,

296 ශබ්දකාවෙන් කථනයකරමින් සිටියාවූ ප්‍රභාවතියගට (කියන්නී) නරේන්ද්‍රයානට රක්ෂාවරණයපිණිස පසු අස්සෙන් ප්‍රවිෂ්ටව උන්නාවූ එක් හස්ති ගෝපකයෙකැයි කියමින් ඒ (ප්‍රභාවතියගෙන්) චිත්තය ප්‍රීණනයකොට මහේසිකාවන් ගමනයකළ කල්හි,

297 යෝග්‍යවූ පුත්‍ර ප්‍රේමයෙන් ඒ තමන් ඇතිකළාවූ ජායාව ලෙසින් නිරන්තරයෙන් සමීපයෙහි සිටින්නාවූ කුබ්ජිය වනා රහසෙයින් ආමන්ත්‍රණයකොට ප්‍රිය වචනයෙන් මෙයාකාරයෙන් ප්‍රකාශකරන්නීය:

298 නී ගමනයකොට එක් ප්‍රදේශයක සැඟවීයකොට නිරීක්ෂණයකරමින් හස්තාරූඪවෙමින් උන්නාවූ දෙදෙනා අතුරෙන් නරේන්ද්‍රයාන් මේ (තැනැත්තේ) යයි ජානනයකොට අනලස්ව ආගමනයකරවයි මහේසිකාවන්විසින් කී කල්හි කුබ්ජස්ත්‍රීතොමෝ මේ ප්‍රකාරයෙන් කීවාය:

299 ස්වල්පයකින් මේ වචන ඔබවහන්සේ කී ප්‍රමාණයෙන් උත්වහන්සේ වෙනස් කොට මම කවර ආකාරයකින් ජානනයකොට එම්ද? ඔබගේ ඥානයෙන් වෙන අන්‍ය කාරණයක් කිව්වොත් ඒ (කාරණයෙන්) රජයා මේ (තැනැත්තේ) යයි ජානනයකොට අප්‍රමාදව ආගමනයකරම් (යි කීවාය).

300 ඒ (කුබ්ජියවිසින්) මේ වචන තත්වූ පරිද්දෙන් ප්‍රකාශකළ කල්හි හස්තියාගෙන් ප්‍රථමකොට සේනා මධ්‍යයෙහි බැස්ස තැනැත්තේ රජයායයි මේ (කාරණයෙන්) ජානනයකොට ආගමනයකරවයි මහේසිකාඋත්තමිය ක් හෙයින් ඒ (කුබ්ජ) ගොස් විමංසනයකොට බලා සිටින කල්හි,

301 හස්තාමලකයක් මෙන් පර චිත්ත විජානනයකරන්නාවූ මහාබෝධිසත්වතෙම ඒ ප්‍රවෘත්තිය ඥානයෙන් ජානනයකොට ඇගේ විපතය රස මිශ්‍ර වචනයෙන් ප්‍රීණනය කරවා ප්‍රභාවතියගට නො කියවයි ප්‍රකාශකළහෙයින්,

---

(295) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (296) නරේන්ද්‍රයානට—නර, ඉන්ද්‍රයානට. රක්ෂාවරණය—රක්ෂා, ආවරණය. (297) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (298) හස්තාරූඪ—හස්ති, ආරූඪ. නරේන්ද්‍රයන්—නර, ඉන්ද්‍රයන්. (301) හස්තාමලකයක්—හස්ත, ආමලකයක්.

Digitized by Google

302 දිව්‍ය රජහු මෙන් ආභරණයෙන් සජ්ජිතව ලක්‍ෂණයෙන් යුක්තවූ උස්වූ මනෝනන්දනවූ ගජේන්ද්‍රයාගේ පෘෂ්ඨාසනයෙහි හිඳ ප්‍රථමකොට රජහු බැන්නේය, මාගේ ඇසින් දක්නාලෙකෙනෙකුම් (යි) කුදියවිසින් ප්‍රකාශකළ කල්හි,

303 ඒ (කුදියවිසින්) බොහෝසෙයින් ප්‍රකාශකළාවූ මුසා වාදය ඒ තමන්විසින් අසන ලද වචනය (යි) දැනනොගත්බැවින් නිශ්ශඞ්කාවෙන් සත්‍යයයි අදහාගෙණ මහේසිකාව සන්තෝෂයෙන් සැසිදී උන් කල්හි,

304 යහපත්වූ ඓශ්වර්‍ය්‍යකරණකොටගෙණ ලෝකයට දිව්‍ය රජයාවිසින් ප්‍රකාශකළාවූ දිශාන්තයෙහි සර්වඥයිකළාවූ සත විධ තේජාග්නියෙන් යුක්තවූ ප්‍රසිද්ධවූ ගම්භීරවූ සිංහනාදයෙන් යුක්තවූ කුස නරේන්ද්‍රෝත්තමයනව මනෝඥවූ මාතෘ මහේසිකාව රදන්නාවූ රජ විමානයට වැදී,

305 ශරත් චන්ද්‍රයා බඳුවූ අතිනිර්මල වක්ත්‍රයෙන් බබලන්නාවූ දිව්‍යාඞ්ගනාවක් (හා) සමානවූ ශරීර ශ්‍රීයෙන් නිරන්තරයෙන් දෘශ්‍යමානවූ මනෝකල්‍ය ගුණයෙන් යුක්තවූ ප්‍රභාවතී නම් මහේසිකාව දුවල්දවස දක්නටතරඟු කැමැත්ත අමාත්‍යයක් (හා) සමාන වචනයෙන් කීයේය.

306 මනෝනන්දනවූ ඒ මහේසිනා උත්තමියවිසින් ඒ ප්‍රවෘත්තිය ශ්‍රවණයකොට ඉතා තීක්‍ෂණ ඥානයෙන් වෙන් වෙන්වූ උපාය විමංසනයකරමින් ප්‍රභාවතිය හැරගෙණ පරිවාරයෙන් උද්‍යානයට ආගමනයකෙරෙව්, නේත්‍ර යුග්මය පුර දක්නයකොට සංසිඳෙවයි ප්‍රකාශකළහෙයින්,

307 ඒ කල්හි කුස නරේන්ද්‍රෝත්තමයා උද්‍යානයට ප්‍රවිෂ්ටව මඞ්ගල්‍ය පුෂ්කරිණියෙහි කණ්ඨ ප්‍රමාණවූ ජලයට බැස මහත්වූ නෙළුම් පත්‍රයකින් හිස ඡාදනයකරමින් සුන්දුලූවූ පද්මයකින් මුහුණ ඡාදනයකොට සිටිය කල්හි,

308 රත්රන් කර්මාන්ත කළාවූ නිර්මලවූ සනින්ධවූ ශාටක අව්ඡාදනයකරවා සුවර්ණ දාමය සමන මාණික්‍යාභරණයෙන් ශ්‍රීවය සරහා නන්ද (නම්) දිව්‍යාඞ්ගනාව වැනිවූ මනෝකල්‍යවූ ප්‍රභාවතිය කැඳවාගෙණ උද්‍යාන ක්‍රීඩාවපිණිස පිටත්වි,

---

(302) මනෝනන්දනවූ—මනෝ, නන්දනවූ. ගජේන්ද්‍රයාගේ—ගජ, ඉන්ද්‍රයාගේ. පෘෂ්ඨාසනයෙහි—පෘෂ්ඨ, ආසනයෙහි. (303) නිශ්ශඞ්කාවෙන්—නිඃ, ශඞ්කාවෙන්. (304) දිශාන්තයෙහි—දිශා, අන්තයෙහි. තේජාග්නියෙන්—තේජෝ, අග්නියෙන්. නරේන්ද්‍රෝත්තම—නර, ඉන්ද්‍ර, උත්තම. (305) දිව්‍යාඞ්ගනාවක්—දිව්‍ය, අඞ්ගනාවක්. (306) මනෝනන්දනවූ—මනෝ, නන්දනවූ. (307) නරේන්ද්‍රෝත්තමයා—නර, ඉන්ද්‍ර, උත්තමයා. සුන්දුලූවූ—සු, උන්දුලූවූ. (308) මාණික්‍යාභරණයෙන්—මාණික්‍ය, ආභරණයෙන්. දිව්‍යාඞ්ගනාව—දිව්‍ය, අඞ්ගනාව. මනෝකල්‍යවූ—මනෝ, කල්‍යවූ.

Digitized by Google

309 ශාඛෝද්‍යානවල දෙපාර්ශ්වයෙහි වසනුන පැළව කම්පාකරවා මන්ද මන්දව ආගමනයකරන්නාවූ වාතය යෙහෙළියකගේ සමව විඥාපනයකොට ශරීර ශ්‍රී ඝර්ම මෝචනයකරවා පඤ්චාධික (තූර්ය) නාදය ශ්‍රවණයකරමින් ජනයන්ගේ චිත්ත ප්‍රීණනයකොට වීථි මාර්ගය පසුකරමින්,

310 මධුලෝලයන්ගේ නාද (නමැති) මධුරවූ ලයාන්විතවූ ගීතිකා නාදයෙන් යුක්තවූ සන්තුෂ්ටවූ කෝකිලයන්ගේ ශබ්ද (නමැති) පඤ්ච තූර්ය නාදයෙන් සම්පූර්ණවූ මන්ද මාරුතයෙන් චලිතවූ ලතා (නමැති) නර්තකීන්ගේ නානාභාව ඇත්තාවූ අනඞ්ගයාගේ නාට්‍ය ශාලාව වැනිවූ සුන්දරවූ උද්‍යානයට ප්‍රවිෂ්ටව,

311 නීලවර්ණ මේඝ (සමාන) පැහැය ඇත්තාවූ කුරවීක සමූහයා යෙක්ත අම්බිකා වත් හාසමින මධුරම්බුයෙන් වර්ණනාවත්නාවූ රස ජලය පානය කොට නෘත්‍ය රාවයෙන් (යුක්තව) වෘක්ෂ මස්තකයෙහි දූතකරන්නාවූ නන්දනීය නාදය (කෙසේද) ආකාශයෙහි ඒ ප්‍රභාවතී (දේවියගේ) ස්තුති ගීතිකා කථනය කරන්නාක් මෙනි.

312 ඒ උද්‍යානයෙහි ලතා (නමැති) කාන්තාවන්විසින් වෘක්ෂ (නමැති) ස්වාමීන් ආලිඞ්ගනයකරමින් ලෙලදෙන්නාවූ ශාඛා (නමැති) හස්තයෙන් ශාඛාග්‍ර (නමැති) පුත්‍රයන් ග්‍රහණයකොට සුපුෂ්පිතවන්නාවූ තරුණපල්ලව (නමැති) ඕෂ්ඨවලින් යුක්තව පුෂ්ප (නමැති) මුඛයෙන් භෘඞ්ග නාද (නමැති) සුරතල් වචනයෙන් නලවන්නාක් වැන්නේය.

313 චම්පක, නාග, කෝසඹ, ආම්‍ර, ජම්බූ (යන) වෘක්ෂ පංක්තීන්ගෙන් දිළියෙන්නාවූ චිත්ත ශ්‍රවණ ප්‍රීණනයකරවන්නාවූ භෘඞ්ග නාදයෙන් යුක්තවූ ශරීරයේ ශ්‍රම මෝචනයකොට සුගන්ධ ඇත්තාවූ මාරුතය හමන්නාවූ ශෝභනවූ ඒ උද්‍යානය අනන්තයා හැර කවරකෙනෙක් වර්ණනාකෙරෙද්ද?

314 ශෝභමානවූ මද්‍ර රජහුගේ දුහිතෘව තන්හි තන්හි ක්‍රීඩාකොට ඇවිදලා මල් පොකුරු කඩමින් සකල ශරීරයෙහි මන්ද මන්දව ස්වේද බින්දු ජනිතවූහෙයින් පුෂ්කරිණී අභ්‍යන්තරයට ප්‍රවිෂ්ටව ප්‍රසන්නව මුඛ ධෝවනාර්ථීව හස්ත පද්මයෙන් ජලය ග්‍රහණයකරණකල්හි,

315 ශෝභමානවූ කුස නරේන්ද්‍රයා තම මුවය (යි) ප්‍රකාශකොට වසාගෙන සිටියාවූ පෙනුම් පත්‍රය පහකොට උදක රාක්ෂසයෙකුගේ විලාසයෙන් මහත්වූ සිංහ නාදකොට මහේෂිකාවන්ගේ කෝමලවූ හස්තය ස්ථිරකොට ග්‍රහණයකළ කල්හි,

---

(309) ශාඛෝද්‍යානවල—ශාඛ, උද්‍යානවල. පඤ්චාධික—පඤ්ච, අධික. (311) මධුරම්බුයෙන්—මධුර, අම්බුයෙන්. (315) නරේන්ද්‍රයා—නර ඉන්ද්‍රයා.

Digitized by Google

316 එම කාලයෙහි විකාරවූ මුහුණ දක්නාකරමින් මහත් යක්ෂයෙක් මාගේ හස්තය තදකොට ගත්තේයයි භයදෙයෙහි ශෝකාග්නි රශ්මිය ජ්වලිතකරවමින් බාෂ්පජල වගුරුවා ඉකිබිඳ රෝදනයකරමින්,

317 මාරුත සම්ප්‍රාප්තවූ වල්ලිවූ ස්වර්ණ ලතාවක් විලාසයෙන් ශරීරයත් කම්පාකරමින් දශ දිශාවෙහි වැණෙමින් වැණෙමින් වක්ත්‍රය ද නේත්‍ර යුග්මය ද කෝමල හස්තයෙන් ඡාදනයකරමින් මහත්වූ දුඃඛයෙන් යථානයකොට මේ (මතු කියන) ආකාරයෙන් විලාපකලාය:

318 ඝෘණාය අතිශයෙන් මිරිවූ කපෝලසතලයෙහි රැවුල තොමසිටියාවූ දූ කියාවූ පූපයක් වැනිවූ මුහුණකරණකොටගෙණ ජල රාක්ෂයෙකුගේ විලාසය (ඇත්තාවූ),

319 මෝහට කල්යවා ඉද මේ ලැබෙත්තාවූ සම්පත්තියට වඩා අපගේ මාතෘ පිතෘන්ගේ සමීපයට ගමන යහපතැයි ස්ථිරකොට සිතා,

320 මාගේ හස්තය ඇල්ලූවාවූ යම් තැනැත්තෙක් කුස රජයා නම් ඒ දවසේහිට අද දක්වා මෙ මාහට වෙසෙනයකෙලේ මේ (තැනැත්තේය යි) කල්පනාකරමි.

321 පුරුදු හුවූ දීගයට (වැසීමෙන්) පුරුදුවූ නතවැත්දූම මාහට යහපතැයි ඥානය ඇත්තාවූ ජනයෝ නිශ්චයකොට පූර්වයෙහි සිට ප්‍රකාශකලාහුය යි මෙමසේ),

322 චින්තනයකරමින්ම එම කල්හි තමයා එක්ව ආවාවූ පරිවාරජනයන් (අත්) නොහැර කැන්දාගෙණ ස්වකීය නගරයට යාමට නික්මුනාවූ කල්හි,

323 එම දවස්හි ඒ ප්‍රවෘත්තිය තත්වූ පරිද්දෙන් මාතෘ මහේසිකාතොමෝ ජානනයකොට පුත්‍රවූ කුස රජ්ජානව අප්‍රමාදව ප්‍රකාශකරමින් (පණිවිඩ) යවමෙය.

324 (කුස) රජතෙම ඒ වචනය ශ්‍රවණයකොට මේ ගමන වැලැක්වුවහොත් ප්‍රභාවතී කාන්තාතොමෝ දුඃඛයෙන් පැළීලා මැරුණේවිනම් නරකැයි චින්තනයකරමින්,

325 බල වික්‍රම තේජස් ප්‍රකාශකොට ප්‍රභාවතිය අපගේ නගරයට ග්‍රහණයකොට අවුත් කල්ප සීමාවට (හෙවත්, කල්පාන්තයදක්වා) අස්මත්කුලගේ කීර්ත්තිය ජගත්‍රයට පතුරුවමි (යි),

326 මෙයාකාරයෙන් චින්තනය ස්ථිරකොට ඒ ආවාවූ පරිවාරජනයන් සමග ස්වකීය නගරයට ගමනයකරණ පරිද්දෙන් ඒ (ප්‍රභාවතියට) දුකින අවකාශ දෙනයකෙලේයි.

පඤ්චම සර්ග සමාප්තයි.

---

(318) කපෝලසතලයෙහි — කපෝල, තලයෙහි. (326) මෙයාකාරයෙන්—මෙම, ආකාරයෙන්.

Digitized by Google

327 මනෝඥවූ ඒ මහේසිකා උත්තමීතොමෝ නගරයෙන් නික්ම ශීඝ්‍රව මාර්ගාන්තරය ක්ෂේපණයකරමින් ස්වකීය නගරෝත්තමයට සන්තෝෂයෙන් ප්‍රවිෂ්ටව,

328 ප්‍රභාවතී කාන්තාතොමෝ අධිකවූ භක්ති ප්‍රේමය බන්ධනයකොට මාතාපිතෘ දෙදෙනාගේ ශ්‍රී පාදය අභිවාදනයකොට සිත්වූ පරිද්දෙන් ඇත්තාවූ තත්වය කට්‍ය යකොට වාසයකරන්නීය.

329 ප්‍රසිද්ධවූ කුස නරේන්ද්‍රයාගේ වක්ත්‍රය විකාරවූ කාරණය ද ප්‍රභාවතී මහේසිකා උත්තමිය ඒ රජයා කෙරෙහි නොකමැතිවූ ආකාරය ද (මෙසේය):

330 පූර්ව කාලයෙහි ඒ (කුසරජ හා ප්‍රභාවතිය යන) දෙදෙනා පින් (කමක්) කොට ප්‍රාර්ථනාකළ පරිද්දෙන් මේ ස්ථානයෙහි ඵලය ලද්දාවූ භාවය, ව්‍යක්තයෙන්, ශ්‍රවණ මධ්‍යය නමිතකොට ශ්‍රවණයකරව.

331 පූර්වයෙහි බාරාණසී නගර සමීපයෙහිවූ සකලෛශ්වර්‍ය්‍යයෙන් සැරවූ ග්‍රාමයක එක (මාතෘ) කුක්ෂියෙහි හොත්තාවූ උතුම්වූ මනෝරම්‍යවූ කෙළෙඹි (පුත්‍ර) යෝ දෙදෙනෙක් (ඇත්) වූවාහුය.

332 උජ්වලිතවූ ඒ (කෙළෙඹි පුත්‍රයන්) දෙදෙනා අතරෙන් කුස මහීපාලතෙම බාල වන්නේය; ඒ කාලයෙහි ඒ ග්‍රාමයෙහිම මනෝකාන්තවූ ලක්ෂණ ඇත්තාවූ කුමාරිකාවක්තොමෝ වූවාය.

333 වැඩිමහළු කුමාරයාහට ඒ කාන්තාව සරණකොට (නැර) ගෙණ වංශ චාරිත්‍ර ලෙසට ඒ (දෙදෙනා) සැපවූ පරිද්දෙන් කල්යවන කල්හි,

334 බාලවූ කුමාරයාහට සිඳිමපිණිස ගෘහයක් නැතිහෙයින් ජ්‍යෙෂ්ඨ කුමාරයාහට වෙණස්නොවී ප්‍රවෘත්තිතව සිද (එක්) දවසක කාරණාවක්පිණිස,

335 ඒ (කෙළෙඹි පුත්‍රතා) වනාන්තරයට ගියකල්හි අතිරස කැවුම් උයා ප්‍රථම කොට අනුභවකරමින් ඔහට ද කොටසය වෙන්කරලා තැබුවාහුය.

336 එ කල්හි භික්ෂාටනයකොට වැඩියාවූ ප්‍රත්‍යේක මුනි උත්තමයෙක්හට වෙන් කොට තැබුවාවූ කැවුම් ඒ කාන්තාතොමෝ සන්තෝෂ වර්ධනකරමින් පූජාකළාය.

---

(327) මාර්ගාන්තරය—මාර්ග, අන්තරය. නගරෝත්තමයට—නගර, උත්තමයට. (329) නරේන්ද්‍රයාගේ—නර, ඉන්ද්‍රයාගේ. (331) සකලෛශ්වර්‍ය්‍යයෙන්—සකල, ඓශ්වර්‍ය්‍යයෙන්. මනෝරම්‍යවූ—මනඃ, රම්‍යවූ. (332) මනෝකාන්තවූ—මනඃ, කාන්තවූ. (336) භික්ෂාටනය—භික්ෂා, අටනය.

Digitized by Google

337 එම කාලයෙහි ප්‍රත්‍යෙක මුනිතෙම සුදුසුකොට ඒ කැවුම් ප්‍රතිග්‍රහණයකොට ම දක් නැත්හි වැඩිය කල්හි වනාන්තරයට ගමනයකළාවූ ඒ (කෙළෙඹි පුත්‍රයා) ආගමනයකොට ගෘහයට වන්නේය.

338 එ කල්හි තොපවිසින් ලද්දාවූ කැවුම් කොටසය මනෝඥවූ ප්‍රත්‍යෙක මුනි උතුමෙකුට පූජා කෙළෙම්, පිය ගණිවද (ඒ) ස්ත්‍රියවිසින් ඒ (කෙළෙඹි පුත්‍රයා හට) කී කල්හි,

339 ඒ ප්‍රවෘත්තිය ශ්‍රවණයකොට තොප දෙදෙනා කැවුම් අනුභවකොට අපගේ කොටසය දානයකොට හැරියාහුද්දැයි බොහෝසේ කෝපව,

340 ශීඝ්‍රව දුනුබදවා ගොස් ප්‍රතිග්‍රහණයකොට වඩින්නාවූ පසේබුදුරජානන්වහන්සේගේ පාත්‍රාභ්‍යන්තරයෙහි ගසනාය බහමින් කැවුම් (හැර) ගෙණ ඒ (කෙළෙඹි පුත්‍රයා) ඒ ස්ථානයෙහිම සිටිය කල්හි,

341 ඒ ස්ත්‍රීතොමෝ තමාගේ නිවාසයෙන් පිටත්ව නොලස්ව ඒ ස්ථානයට ආගමනයකොට ඒ තතුවය තමන්ගේ ඇසින් දර්ශනයකොට දුක්ව ශීඝ්‍රව මැනියන්ගේ සමීපයට ගමනයකොට,

342 සුරක්ෂිතව තැබුවාවූ අභිනව ඝෘත ඝටයක් (හැර) ගෙණ අවුත් මුනීන්ද්‍රයාගේ පාත්‍රය සම්පූර්ණකොට පූර්ණවන්නවූ ඒ කාන්තාතොමෝ මෙයාකාරයෙන් ප්‍රාර්ථනාකරන්නීය.

343 මේ පුණ්‍ය තේජානුභාවයෙන් උපන් උපන් තන්හි නොවැරදී හීණවූ කුලයක නොයිපදී මනෝඥවූ උත්තමවූ වංශයක උත්පන්නව,

344 ලාඤ්ජන ප්‍රවිෂ්ට නුවූ ශරත්කාලයෙහි සම්පූර්ණවූ චන්ද්‍ර මණ්ඩලයක් පරිද්දෙන් ව්‍යාප්තවන්නාවූ කාන්ති සමූහය (ඇත්තාවූ) විතත සශෝභාවූ මුහුණින් යුක්තවෙමින්,

345 දෘශ්‍යමානවූ දිව්‍යාඞ්ගනාවක් පරිද්දෙන් දර්ශනයකළාවූ ජනයන්ගේ චිත්ත නේත්‍ර බන්ධනයකොට සුන්දරවූ රූප ශ්‍රීයෙන් යුක්තව නිරන්තරයෙන් සකලෛශ්වර්‍ය්‍යය විඳනයකොට දිලියෙම්වා.

346 දුර්ජනයන්ගෙන් දුරුවී සත්පුරුෂජනයන් කෙරෙහි මිත්‍රව ගුණයෙන් (හා) ඥානයෙන් ගම්භිරව වංශ (නමැති) විමානයට ප්‍රදීපයක්ව දිලියෙම්වා,

---

(338) මනෝඥවූ—මනඃ, ඥවූ. (340) පාත්‍රාභ්‍යන්තරයෙහි—පාත්‍ර, අභ්‍යන්තරයෙහි. (342) මුනීන්ද්‍රයාගේ—මුනි, ඉන්ද්‍රයාගේ. මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (343) තේජානුභාවයෙන්—තේජඃ, ආනුභාවයෙන්. මනෝඥවූ—මනඃ, ඥවූ. (345) දිව්‍යාඞ්ගනාවක්—දිව්‍ය, අඞ්ගනාවක්. සකලෛශ්වර්‍ය්‍ය—සකල, ඓශ්වර්‍ය්‍ය.

Digitized by Google

347 පුදුපුවූ උතුම් චන්දන සුගන්ධය මනෝනන්දනවූ ශරීරයෙන් නික්මේවා, සුන්දරවූ මුඛ ගර්භයෙන් උත්පල පුෂ්ප සුගන්ධය නිෂ්ක්‍රාන්තවේවා.

348 ප්‍රතිපත්තියෙහි යුක්තවූ පසේබුදුරජානන්වහන්සේගේ චරණ වන්දනායකොට මෙයාකාරයෙන් ප්‍රාර්ථනාකොට ඒ ක්ෂත්‍රිය පාර්ශ්වයක සංවාසයකල කල්හි,

349 ඒ පසේබුදුරජානන්වහන්සේගේ සමීපයෙන් පූ පැහැර ගෙණ, එ තැන්හිම සිටියාවූ ඒ (කෙළෙඹිපුත්‍රයා) ද ඒ කාන්තාවවිසින් ප්‍රාර්ථනාකළාවූආකාරය ස්වකීය ඇස්සයෙන් අවලෝකනයකොට,

350 ඉක්බිතිව ඒ පසේබුදුරජානන්වහන්සේට තමන්විසින් ගන්නාලද පූ පූජාකොට භක්ති ප්‍රේමයෙන් නමස්කාරකොට මෙයාකාරයෙන් ඵලය ප්‍රත්‍යක්ෂකොට ප්‍රාර්ථනාකරයි.

351 මේ කළාවූ පුණ්‍යානුභාවයහේතුකොටගෙණ අස්මත්ශබ්දවාච්‍යතෙම අනාගතයෙහි උපන් උපන් තන්හි අප්‍රමාණවූ සකලෛශ්චර්‍ය්‍යය ලබා ජම්බුද්වීපයට විශේෂයෙන් අග්‍ර රජනිව,

352 ඝනබද්ධවූ තේජසින් යුක්තවෙමින් මා විසින් කරනලද්දාවූ ගම්භීරවූ නාදය සිංහ නාද විලාසයෙන් දශ දිශාව විනිර්විද්ධනයකොට නිෂ්ක්‍රාන්තවේවා.

353 රූප ශ්‍රීයෙන් යුක්තවූ මේ කාන්තාව ශත යෝජන (ස්ථාන) යක උත්තීර්ණවුත් ශක්තියෙන් ග්‍රහණයකොට අවුත් අම්බිකා ස්ථානාන්තරයට ප්‍රාප්ත කෙරෙම්වා.

354 මේ ආකාරයෙන් පින්කොට එන ස්ථානයෙහි සිට ප්‍රාර්ථනාකළහෙයින්ම කුස (රජයා හා) ප්‍රභාවතී (දේවිය යන) දෙදෙනා විශේෂයෙන් යෝග්‍යවූ රාජ වංශයෙහි උත්පන්නව,

355 ප්‍රත්‍යේකමුනීන්ද්‍රෝත්තමයාගෙන් කෝපසහිතව පූප (උදුරා) ගත්හෙයින් කුස නරේන්ද්‍රයාගේ වක්ත්‍රය ඒ පාපයකාරණකොටගෙණ විකාරවූ භාවය ජනනයකරව.

356 ප්‍රභාවතී මහේසිකා උත්තමීතොමෝ තේජසින් යුක්තව කුස නරේන්ද්‍රයාහට කැමති නොවූ භාවය ද එ දවස්හි ප්‍රාර්ථනාකළායැයි (කියා) නොවරදවා ජනනයකරව.

---

(347) මනෝනන්දනවූ—මනෝ, නන්දනවූ. (348) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (351) පුණ්‍යානුභාවය - පුණ්‍ය, අනුභාවය. සකලෛශ්චර්‍ය්‍යය—සකල, ඓශ්චර්‍ය්‍යය. (355) නරේන්ද්‍රයාගේ—නර, ඉන්ද්‍රයාගේ. (356) නරේන්ද්‍රයාහට—නර, ඉන්ද්‍රයාහට.

Digitized by Google

357 (ලොල්) තැටියක් මෙන් නභඃකුක්ෂියට යෝජනාන්තරප්‍රෝච්ඡිතවූ භූමියෙහි ම් සත් (එකයි) නොරැඳුන්නේය. එ පරිද්දෙන් පච්පිත් රාශිය (ද) ප්‍රාර්ථනාකළ පරිද්දෙන් සිඬ්ඩිම (ද) නියමය.

ෂෂ්ඨ සර්ග සමාප්තයි.

358 කෝභමානවූ ප්‍රභාවතිය සඛීය පරිවාර (ජනයන්) හැරගෙණ ස්වාමියාහට දුඃඛ දනයකරමින් තමන්ගේ නගරයට ගමනයකළා මෙන් එ දවස්හි දිවාකරතෙම නාම රස වනය සඞ්කුචිතකොට ස්වකීය රශ්මින සමග අපරපර්වතයට සම්ප්‍රාප්ත වූයේය.

359 ප්‍රභාවෙන් දිලියෙන්නාවූ උතුම්වූ දිනේන්ද්‍ර ස්වාමියා වියෝග වෙමින් ලෝභ කොට අපර දිශා (නමැති) අම්බිකාව නරා ගමනයකල භාවයෙන් එ කල්හි තටා කාම්බිකාව තාමරස (නමැති) හසන තලයෙහි පත්‍ර (නමැති) අඞ්ගුලි පඞ්ක්තිය සඞ්කුචිතකොට භෘඞ්ග (නමැති) මාණික්‍යාවලිය ගලවනකල්හි,

360 ක්ෂීරසාගරයතෙම පෑම්ණියාවූ පූර්ණ චන්ද්‍ර කාන්තියෙන් සන්තුෂ්ටවිය; කෝකිලයන් විසින් දනයකර ඥුලබන්නාවූ නාදය සථාන සථානවලට ඇසෙන්නේය; මන්ද මාරුතය පුෂ්ප රේණු ග්‍රහණයකරමින් විහිද් එන්නේය; අනඞ්ග තෙම වාදයකරමින් යුඬය පිණිස ප්‍රාප්තවෙයි.

361 සර්ව කාලයෙහි ස්වභාවයෙන් දිව්‍යාඞ්ගනාවක් මෙන් දිලියෙන්නාවූ මනෝඥවූ ප්‍රභාවතී කාන්තාවගෙන් වියෝගීව බොහෝවූ කාලයක් ඉකුත්වගිය කල්හි (හෘදය) දුකට පැමිණ ඒ බෝධිසත්ව (වූ) කුස රජතෙම හුදකළා යානාවෙහි හිඳගෙණ,

362 අමෘත රසයක් මෙන් මනාපවූ වචන ඇත්තාවූ විශේෂ ගුණයෙන් යුක්තවූ කුස නම් (වූ) ඒ පෘථිවි පාලතෙම ඇසට නිද්‍රානොලබා (චිත්ත) තාප වර්ධනකරමින් මේ (මතුකියන) ප්‍රකාරයෙන් දුඃඛ මිශ්‍රවූ විලාප ප්‍රකාශකරයි.

363 නභඃ ප්‍රාප්තවූ චන්ද්‍රයා යුගාන්තයෙහි සූර්යයා මෙන් දිලිහී ගියේය; යහණවෙහි අතුරණලද්දාවූ පුෂ්ප පත්‍ර කටු වැනි වූයේය; ප්‍රිය කාන්තාවන්විසින් දනයකරන්නාවූ නාත්‍ය (හා) ගීතිකා නොම සන්තෝෂ වූයේය; ප්‍රභාවතී නැත්තාවූ මේ රාජ විමානය ඇතුල සිස්වූයේය;

---

(359) දිනේන්ද්‍ර—දින, ඉන්ද්‍ර. තටාකාම්බිකාව—තටාක, අම්බිකාව. මාණික්‍යාවලිය—මාණික්‍ය, ආවලිය. (361) දිව්‍යාඞ්ගනාවක්—දිව්‍ය, අඞ්ගනාවක්. (363) යුගාන්තයෙහි—යුග, අන්තයෙහි.

Digitized by Google

364 නිර්මලවූ මුහුණින් විරාජමානත්තාවූ ස්නිග්ධව සෞම්‍ය කාන්ති (ඇත්තාවූ) සුන්පුල්ලාවූ ජඞ්ගමවූ ස්වර්ණ ලතාවක් මෙන් දිලියෙන්නාවූ අලංකාරවූ උතුම්වූ ප්‍රභාවතී රාජ දුහිතෘව හා සමග එක යානාවෙහි ලැයීම කවර කාලෙක්හි ලැබෙන්නේද?

365 ශීතලවූ සෞම්‍යවූ චන්ද්‍රයා සූර්යයා මෙන් බබලයි; කෝකිල නාදය හංසයන්ගේ හඬ මෙන් ඇසෙයි; අලංකාරවූ ප්‍රභාවතී සමග නොමවාසයකොට මේ කාලයෙහි මේ මාගේ චිත්තය කොයි ආකාරයකින් නලවම්ද?

366 ඉතානිල්වූ නේත්‍ර (නමැති) ඉන්දීවර (ඇත්තාවූ) හාස (නමැති) හංසයන් (ඇත්තාවූ) වක්ත්‍ර (නමැති) පියුම් (ඇත්තාවූ) මහත්වූ පයෝධර (නමැති) හංසයන් (ඇත්තාවූ) ප්‍රභා (නමැති) ජලයෙන් සම්පූර්ණවූ ප්‍රභාවතීගේ නිර්මලවූ මනඃකාන්තාවූ ශරීර (නමැති) තඩාගයෙහි කවර කාලයක නිමග්නව ලෝල වර්තනකරමින් ක්‍රීඩාකරම්ද (යි කියා විලාපකීයේය).

367 අනාගත (කාල) යෙහි සකල සත්වයන් භයානකවූ සංසාර සාගරයෙන් ගොඩ නගන්නාවූ බුද්ධත්වය ලබන්නාවූ පුරණලද පාරමිධර්ම ඇතිව ද ප්‍රභාවතිය වෙත්වූ ගෙහින් හුදකලාවම යානාවෙහි ඉඳ මහා (බෝධි) සත්වතෙම තැවුනාවූ ආකාරය අස්මත් තෙම කවර ප්‍රකාරයකින් කථනයකරම්ද?

368 දිව්‍යාංගනාවන් මෙන් නොයෙක් වේශ ග්‍රහණයකරමින් අප්‍රමාණවූ නාටක ස්ත්‍රීහු අනේක අනේකවූ ගීත නෘත්‍ය දර්ශනයකරවා මහා බෝධිසත්වයන්ගේ චිත්තය පොලඹාගන්ට නොහැකිව භිත්තියෙහි අඤ්ජනයකලාවූ චිත්‍ර කර්මයක්මෙන් කරබාසිටියහ.

369 සූර්ය වංශයට තිලකයක්වූ සශෝභනවූ කුස නරේන්ද්‍රතෙම ඒ රාත්‍රි දිනය අනන්ත කල්පයක් මෙන් ඉකුත්කරමින් රශ්මිය පතුරුවා පද්ම වනය ප්‍රබෝධකොට සූර්යයා පූර්ව පර්වත මස්තකයෙන් උද්ගතවූ කල්හි,

370 භූපාධිපතිවූ උතුම්වූ ගුණයෙන් සාරවූ කුස නරේන්ද්‍රතෙම තැවුනාවූ චිත්තයෙන් (යුක්තව) ප්‍රියකටයුතුවූ ඒ (ප්‍රභාවතී) කාන්තාව කල්පනාකොට අනඞ්ගයාගේ දුන්නෙහි තපුරුවූ පඤ්ච බාණය වැදී මහාර්තිවූ වියෝග(දුඃඛ)යෙන් කීප දවසක් පසුකොට,

371 ශෝභාසහිතවූ මහා සත්වෝත්තමතෙම ඒ දිනයෙහි ප්‍රාතඃකාලයෙහි ප්‍රභාවතිය ගෙණ එන මෙන් සාගල නගරයට ගමනයකරමින් චින්තනයකරමින්,

---

(364) සුන්පුල්ලාවූ—සු, උත්පුල්ලවූ. (366) පයෝධර—පයඃ, ධර. (368) දිව්‍යාංගනාවන්—දිව්‍ය, අඞ්ගනාවන්. (369 නරේන්ද්‍ර—නර, ඉන්ද්‍ර. අනන්තකල්පය—අනන්ත, කල්පය. (370) භූපාධිපතිවූ—භූප, අධිපතිවූ. නරේන්ද්‍ර—නර, ඉන්ද්‍ර. මහාර්තිවූ—මහා, ආර්තිවූ. (371) සත්වෝත්තම—සත්ව, උත්තම.

Digitized by Google

372 තේජෝවික්‍රමය ප්‍රකාශකොට මේ මාගේ චිත්තාභිප්‍රාය සිඬකොට මේ නගර යට ආගමනයකරණ තෙක් සියලූ මේ රාජ්‍ය ඓශ්වර්‍ය්‍ය ධාරය නියමකරලා,

373 මාගේ පිතෘ රාජයාහට හෝ සහෝදරවූ කුමාරෝත්තමයාහට හෝ මේ රාජ්‍ය ඓශ්වර්‍ය්‍යය දානයකෙළේවිනම් පසුව ගැණීම දුෂ්කර වන්නේය.

374 එසේහෙයින් මාතෘ උත්තමිය වාසයකරන්නාවූ රාජ විමානාභ්‍යන්තරයට ප්‍රවිෂ්ට වෙමින් නමස්කාරකොට පාර්ශ්වයක ස්ථානයකොට මිහිරි වචනයෙන් මෙයාකාරයෙ න් ප්‍රකාශකරයි.

375 මහත්වූ චතුරඞ්ගිනී සේනාව රඤ්ජිතවූ දිව්‍ය පුරය (හා) ඒකාකාරවූ කුසාවතිය (යි) නම් ලද්දාවූ මේ උතුම් නුවරෙහි සමෛශ්වර්‍ය්‍ය සම්පත්තිය,

376 මෙ ඔබවහන්සේවිසින් බාරවී ගෙණ මේ අස්මත්ගුරුවිසින් ප්‍රභාවනී සිසව ද ල බාගෙණ මේ (නගරයට) එනතුරු රාජ්‍යකරව (යි) ශෝභනවූ වචනයෙන් ප්‍රකාශකරයි.

377 මාතෘ මහේසිකාතොමෝ ඒ (කථාව) ශ්‍රවණයකොට සත්‍රීත්ගේ මායා කියා නො නවතින නිසා මාගීයට සුදුසුවූ රස භෝජන සජ්ජිතකොට,

378 රත්රන් තලියක බහමින් මහා (බෝධි) සත්වයන්ගේ අතෙහි තබමින් ගොසි න් සැපවූ පරිද්දෙන් ආගමනයකරවයි කියා ආදරයෙන් අවසර දුන් කල්හි,

379 ඒ (කුස රජ) තෙමේ මාතෘ මහේසිකාවට තුන් වාරයක් ප්‍රදක්ෂිණකොට ආද ර බහුමාන කොට නමස්කාරකොට සිටගෙණ මෙයාකාරයෙන් කීයේය:

380 මනෝරම්‍යවූ මාතෘ උත්තමියෙනි, අස්මත්තෙම සැපයෙන් ගුත්නෙම්විම්නම් වහා ආගමනයකොට දක්නයකරම්යි කියා ශ්‍රී යහන් ගෘහයට ප්‍රවිෂ්ටවම,

381 පඤ්චායුධයෙන් සජ්ජිතව මාණික සහස්‍රයකුත් ග්‍රහණයකොට පසුම්බියක ප්‍රක්ෂේ පකොට මහාර්ඝවූ කොකනදවර්ණව සනනයෙන් ග්‍රහණයකොට,

---

(372) තේජෝවික්‍රමය—තේජඃ, වික්‍රමය. චිත්තාභිප්‍රාය—චිත්ත, අභිප්‍රාය. (373) සහෝ දරවූ—සහ, උදරවූ. කුමාරෝත්තමයාහට—කුමාර, උත්තමයාහට. (374) විමානාභ්‍යන් තරයට—විමාන, අභ්‍යන්තරයට. (375) චතුරඞ්ගිනී—චතුර්, අඞ්ගිනී. ඒකාකාරවූ—ඒ ක, ආකාරවූ. (379) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (380) මනෝරම්‍යවූ—මනඃ, රම්‍යවූ. (381) පඤ්චායුධයෙන්—පඤ්ච, ආයුධයෙන්. මහාර්ඝවූ—මහා, අර්ඝවූ.

Digitized by Google

382 නගරයෙන් නිෂ්ක්‍රාන්තවෙමින් පස්වාසක් යෝජන ස්ථානයවූ මාර්ගය අනලස්ව පසුකරගෙණ ගොසින් දුවල(මිලාව)ට භෝජන (කෑම) නිෂ්පාකරමින්,

383 (ශේෂව) තිබුනාවූ පස්වාසක් යෝජනය ද වහා පසුකරගෙණ ගොසින් සායාන්ණ (කාලය) වීමට පූර්වයෙහි ඒ දවසෙහි ඒ සාගල නගරයට ප්‍රවිෂ්ටවූයේය.

384 මහා (බෝධි) සත්වයන්වහන්සේගේ තේජසනරණකොටගෙණ ප්‍රභාවතී මහේසිකාව නිසලංකාරාවූ ආසනයෙහි හින්ද නොහැකිව කම්පාවන්නාවූ රත්රන් ලතාවක් පරිද්දෙන් ඉඳිනය.

සප්තම සර්ගය සමාප්තයි.

385 සලාභනාවයට පැමිණි වීථි මධ්‍යමයෙහි බැස වඩින්නාවූ ජගද්නායකවූ මහා (බෝධි) සත්වයන්වහන්සේ මැහැල්ලි කාන්තාවක්තොමෝ දකිනයකොට සන්තෝෂයෙන්,

386 එ සල්ලි තෙතාදර භක්ති ප්‍රේමය වර්ධනයකොට කැඳවාගෙණ නොසිත් ස්වකීය ගෘහයට පාදයල වත්‍ය ධෝවනයකොට පූජදරවූ ආසනයක නිෂ්දනය කරවා,

387 රසවත් මාංස ඒකෘතියෙන් යුක්තවූ රසවත්වූ භක්ත ව්‍යඤ්ජන පවතනයකොට බෝධි සත්වයන්වහන්සේට අනුභවකරවා ඒ කාන්තාතොමෝ සන්තෝෂ චිත්තය (ඇති) වෙමින් ස්ථානකලාය.

388 මහා සත්වෝත්තමතෙම එ දවස්හි ඒ රත්රන් තලිය හා සමග මාණක සහ සූය ගෙණ දූතයකරමින් ඇගේ චිත්තය ප්‍රසන්නකොට ගෙණ,

389 පඤ්චායුධය සිත්වූ පරිද්දෙන් ඒ ගෘහයෙහි සුරක්ෂිතව ස්ථාපනයකරමින් මායන්නාවූ ගමනක් ඇත්තේය (යි) කියා තොකරද විණාව හස්තයෙන් ග්‍රහණයකොට,

390 හස්ති ශාලාභ්‍යන්තරයට ප්‍රවිෂ්ටව හස්ති ගෝපකයන් සමග ස්ථානයකොට මෙමානව ලැගීමපිණිස ස්ථානයක් ලද්දෙව්තාව,

391 මේ පුෂ්මන්නු සන්තුෂ්ටකරමින් විණා නාදය කරමිය යි වචනයෙන් මධුරකොට කථනයකළහෙයින් ඔවුන් සැම දෙනා (ද) ප්‍රසන්නව ස්ථානයක් සහ තෘණ රාශියක් දු ස් කල්හි,

---

(385) ජගද්නායක - ජගත්, නායක (386) තෙතාදර—තෙත, ආදර. **(389, පඤ්**චායුධ—පඤ්ච, ආයුධ. (390) ශාලාභ්‍යන්තරයට—ශාලා, අභ්‍යන්තරයට.

Digitized by Google

392 ඒ තෑණ ගෙණ භූමියෙහි අතුරා (දිසින්) සමහරක් හිසට ලා නින්ද්‍රා ග්‍රහණය කොට හිද නැගිටලා තමාගේ ශරීර ශ්‍රීමය ස්වල්පයක් පහකොට,

393 මනෝරමවූ (කොනකද) වීණාව ග්‍රහණයකොට මධුරවූ සප්ත ස්වරය ආරෝපණයකරමින් නගරාභ්‍යන්තරයට ඇසෙන පරිද්දෙන් දිව්‍ය ගන්ධර්වයෙකු පරිද්දෙන් වාදනයකාරණ කළෙහි,

394 ප්‍රභාවතී මහේසිකා උපහාමිනොමෝ යානාවෙහි සන්තර්පිතව ඉදු (වීණා) නාදය ශ්‍රවණයකොට පරීක්ෂාකොට අන්‍ය ගන්ධර්වයෙකුගේ වීණා නාදයක් නොවන්නේය.

395 මේ මා උදෙසා ගෙණ සන්නාහනවූ කුස රජෝත්තමතෙම මේ ස්ථානයට සම්ප්‍රාප්තවූයේය (යි) සිතාගෙණ නියමය දැනගෙණ සන්තර්පිතවූවාය.

396 ප්‍රාතඃ කාලයෙහි වීණා නාදය ශ්‍රවණයකොට මදු රජනූවසින් විමංසනයකරණ කල්හි ස්වාමිපුත්‍රතෙම ඒ ක්ෂණයෙහි ඒ ස්ථානය හැර ආගමනයකොට ඒ ගෘහයෙන් ආගාර නිෂ්ඨාකොට,

397 සඳ කල්හි රජ ගෘහවලට බඳුන් සම්පාදනයකරන්නාවූ කුම්භකාර ජ්‍යේෂ්ඨයා දර්ශනයකරමින් ඒ මහා (බෝධි) සත්වතෙම මෙ වචනය කීයේය:

398 ආචාර්යයෙනි, පුරුමන්පුරුගේ සමීපයෙහි වාසයකොට නිරන්තරයෙන් තන්දනීය වූ භාජන සංපාදනයකොට දී අවසාතික්‍රමණයකරවය යි කියා එකෙණෙහි ඒ (කුම්භකාර ජ්‍යේෂ්ඨයා)ගෙන් අවසර ගෙණ,

399 මැටි ඇදලා පදම්කොට වලන් කර්මාන්තයට ඉඳගෙණ එක් වාරයක් චක්‍රය දැමූ කල්හි සූර්ය්‍යා මුදුනට එන තුරුම භ්‍රමණයවූකල්හි,

400 ප්‍රභා ප්‍රාප්තවූ රූපාරෝපණයකොට ප්‍රභාවතිය දර්ශනයකරමිසි සිතාගෙණ මහා (බෝධි) සත්වතෙම අධිෂ්ඨානකොට යෝග්‍යවූ කුඩා මහත් වලන් ද සාදා,

401 පදමට පුලුස්සමින් කුම්භකාර ජ්‍යේෂ්ඨයාහට දැක්වූ කල්හි ඒ (කුඹල් දෙටුවා) සන්තෝෂ වර්ධනයකරමින් වලන් නද බැඳගෙණ රජමන්දිරයට ගොස්,

402 රජහට දර්ශනයකළ කල්හි ඒ නරේන්ද්‍රතෙම සන්තෝෂවෙමින් නිසිවූ පරිද්දෙන් මේ භාජන කළතැනැත්තේ කවරෙක්දැයි මාහට මෙකාලයෙහි කියව(යි කීයේය).

---

(393) මනෝරමවූ—මනා, රම්‍යවූ. නගරාභ්‍යන්තරයට—නගර, අභ්‍යන්තරයට. (395) රජෝත්තම—රජ, උත්තම. (396) ස්වාමිපුත්‍ර—ස්වාමි, පුත්‍ර. (398) අවසාතික්‍රමණය—අවස, අතික්‍රමණය. (400) රූපාරෝපණය රූප, ආරෝපණය. (402) නරේන්ද්‍ර—නර, ඉන්ද්‍ර.

Digitized by Google

403 නරේන්ද්‍රයාණ්සින් කියනලද වචනයට මාගේ අන්තේවාසික එකෙක් නිසිවූ පරිද්දෙන් මෙ භාජන කෙළේය (යි කියා) ඔහුවිසින් නරේන්ද්‍රයාණහට කීහෙයින්,

404 සන්තුෂ්ටවූ ඒ වචන ශ්‍රවණයකරමින් ඒ (අනවැසි තැනැත්තා) තාගේ ආචාර්‍ය්‍ය ප්‍රමාණයට වන්නේය; (එහෙයින්) ඔහට මේ රත්රන් දී සුදුසුකොට ඉගෙණගනිව යි කියමින්,

405 කුම්භකාර ජ්‍යෙෂ්ඨයාහට රත්රන් සහස්‍රය දානයකරමින් සන්තෝෂකොට සුදුසුවූ මෙ භාජන සමූහය අපගේ දුහිතෘණන්ට ක්‍රීඩාකරණ පරිද්දෙන් දානයකරව (යි කීයේය.)

406 එ දවස්හි රජහුගේ නියෝගයෙන් කුම්භකාර ජ්‍යෙෂ්ඨතෙම ඒ භාජන ගෙණ බිසෝවරුන්ට වෙන් වෙන්ව බෙදනකල්හි මහා (බෝධි) සත්වයන්වහන්සේගේ අධිෂ්ඨාන බලයෙන්,

407 මහා (බෝධි) සත්වයන්වහන්සේගේ රූපශ්‍රීය ද ප්‍රභාවතියගේ යෝග්‍යවූ ස්වරූපය සමග කුදියගේ ශරීර ලක්‍ෂණ ද ආරෝපණයකොට කළාවූ යහපත්වූ යෝග්‍යවූ භාජන,

408 ප්‍රභාවතියට දානයකල කල්හි තමන්ගේ නේත්‍ර යොමුකොට අවලෝකනයකරමින් මහා (බෝධි) සත්වයන්විසින් කරණලද්දැයි දැනගෙණ මේ භාජන මේ මාහට ප්‍රයෝජන නැත්තේය (අහක) දමව (යි කියා),

409 මෙයාකාරයෙන් කියා තානට කැමතිවූ අන් තැනකට දානයකරව යි ප්‍රකාශකලාවූ වචන ශ්‍රවණයකරමින් මෙයාකාරයෙන් නැගනියෝ සක්දෙන පීඩාකරත්ය :

410 මේ තීගේ ස්වාමිවූ කුස නරේන්ද්‍රයාණ්සින් නිමවනලද්දාවූ වලත්දැයි ප්‍රකාශකොට චිත්තයට බෝහෝසෙයින් පීඩාකළේද තත්වූ පරිද්දෙන් නොමකීවාය.

411 රාජයාගේ කරුණා ලද්දාවූ කුම්භකාර ජ්‍යෙෂ්ඨතෙම තමාගේ ගෘහයට වැදී ඒ ක්‍ෂණයෙහි කාර්ෂාපණ සහස්‍රය හැරගෙණ ගොස් මහා සත්වයාට දුන් කල්හි,

412 ඒ රත්රන් ඔහටම දානයකොට අස්මත්හට මෙහිම ඉදගෙණ ප්‍රභාවතිය දකිනායකිරීමට නොයෙදෙන්නේය යි චින්තනයකොට සිත්කළාවූ කුස නරේන්ද්‍රතෙම ආගමනයකොට,

413 තාල වෘත්ත ගෙතියම්කරන්නාවූ නලකාරුවාගේ සමීපයට පැමිණ ඔහට අන්තේවාසිකවෙමින් ඒ කර්මාන්ත නිෂ්පාදනයකොට පැවැත්තාවූ පරිදි ද,

---

(403) නරේන්ද්‍රයා—නර, ඉන්ද්‍රයා. (409) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (410) නරේන්ද්‍රයා—නර, ඉන්ද්‍රයා. (412) නරේන්ද්‍ර—නර, ඉන්ද්‍ර.

Digitized by Google

414 මාලාකාරයාගේ සමීපයට පැමිණ සිතගෙණ ඔහුගේ සමීපයෙහි හිඳගෙණ බොහෝවූ මාලා කර්ත්තනකොට දානයකරමින් දවස් යවා පැවැත්තාවූ පරිද්දෙ ද,

415 වෙණස්වූයේ කරණලද කර්මාන්ත මිසක් පටිපාටිය ඒකාකාර වන්නේය; එසේ හෙයින් කුම්භකාරයාගේ ගෘහයෙහි වාසයකොට පැවැත්තාවූ ආකාරයද් (කියා) තත් වූ පරිද්දෙන් ජානනයකරව.

416 තේජෝග්නියෙන් යුක්තවූ කුස නරේන්ද්‍රතෙම මෙයාකාරයෙන් තත්හි තත්හි ඇවිද ප්‍රසන්නව (ප්‍රභාවති) හිසව දර්ශනයකිරීමට අලබ්ධව තැවි තැවී හිඳ,

417 මහාරජයාගේ මුලුතැන් ගෙයි නිරන්තරයෙන් මුලුතැන් ධුරය කරන්නාවූ ජ්‍යෙෂ්ඨයන් සමග ප්‍රතිපන්නව මෙයාකාරයෙන් කාලාතික්‍රමණය කරණ කල්හි,

418 සූප ශාස්ත්‍රයෙහි ප්‍රකාශකලාවූ පරිද්දෙන් දිව්‍ය භෝජනයක් මෙන් ආහාරය පචනයකරණකල්හි නරේන්ද්‍රයාගේ සිත්වූ පරිද්දෙන් පැවත එන්නාවූ ඒ අරක්කැමි උත්තමතෙම (එක්) දවසෙක්හි,

419 (රාජ) භෝජනය පචනයකොට බාජ බන්ධනයකොටගෙණ ඒ රාජ ගෘහයට අතලස්ව ප්‍රාප්තව සන්තෝෂයෙන් රජයා සිත්වූ පරිද්දෙන් නිසිදකායකරවා සුදුසුවූ පරිද්දෙන් භක්ත කෘත්‍යය නිඨාකළකල්හි,

420 එම කාලයෙහි මහා (බෝධි) සත්වතෙම තොලස්ව මිශ්‍රවූ අස්ථිමාංස රාශියක් ග්‍රහණයකොට අමෘත රසයක් මෙන් රස (ඇති) කොට පචනයකොට සුදුසුකොට සුගන්ධ ඇත්තාවූ ධූමය දුන්නේය.

421 ඒ රජතෙම ඒ (මාංසයෙහි) සුගන්ධය ආඝ්‍රාණයකරමින් මේ කාලයෙහි මුලුතැන්ගේ ඇතුලෙහි අන්‍ය කිසි මාලුවක් ඇත්තේදැයි (කියා) විචාලහෙයින් ඒ (අරක්කැමි තෙම) මෙයාකාරයෙන් කථනයකරයි:

422 සියලු මෙහෙකරුවන්විසින් අනුභවකරණ පරිද්දෙන් ඇටයෙන් මිශ්‍රවූ මාංසයක් ලැබ අපගේ අන්තේවාසිකයෙක්තෙම ග්‍රහණයකොට ඒ ස්ථානයෙහි පචනයකරමින් සිටියේයයි,

---

(415) ඒකාකාර—ඒක, ආකාර. (416) තේජෝග්නියෙන්—තේජඃ, අග්නියෙන්. නරේන්ද්‍ර—නර, ඉන්ද්‍ර. මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (417) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. කාලාතික්‍රමණය—කාල, අතික්‍රමණය. (418) නරේන්ද්‍රයාගේ—නර, ඉන්ද්‍රයාගේ. (421) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්.

Digitized by Google

. 423 ඔහු විසින් කියනලද්දාවූ ඒ වචන ශ්‍රවණයකරමින් නිශ්ශබ්දකාව අතිශයින් ප්‍රසන්නවූ අමෘතයක් ලද්දාක් මෙන් තමාගේ සිතට කල්පනාවී හා ගමනයකොට ශීඝ්‍රව (හැර) ගෙණ එවසි කීයේය.

424 ඒ (සූපකාරයා) ක්ෂණයකින් නොනැවතී ගමනයකොට ඒ භෝජන රසය (හැර) ගෙණවුත් දුන්කල්හි රජතෙම බොහෝසෙයින් චිත්ත ලෝභයකොට සන්තෝෂයෙන් මුඛාභ්‍යන්තරයෙහි තැබූකල්හි,

425 සප්ත සහස්‍රයක් රස සනාථ සම්පූර්ණව සකල ශරීරයෙහි ප්‍රස්තරිතව රසයෙන් ඉතිරී සිටියහෙයින් ඒ නරෝත්තමතෙම මෙසාකාරයෙන් කථනයකෙළේය:

426 වහා මේ රත්රන් සහස්‍රය දානය කොට ඔහුගේ චිත්තය ප්‍රසන්නකරවමින් මේ කාලය පටන් මේ අපවිසින් අනුභවකරන්නාවූ භොජනය සුදුසු පරිද්දෙන් පචනය කරවාගෙණ,

427 තා විසින් මේ අපහට ගෙණ (වුත්) දෙව; ශෝභමානවූ අපගේ සියලු දැසි දාසින්ට භෝජනකත් ගෙණ දෙව (යි කියා) ඔහට කථනයකරවයි රජයා සූපකාරයා හට කීහෙයින්,

428 ඒ (අරක්කැමියා) මහා (බෝධි) සත්වයන් කරා ගමනයකොට රත්රන් සහස්‍රය ද අතට දී ඒ ප්‍රවෘත්තිය සුදුසුකොට කථනයකලහෙයින් එකල්හි සන්තෝෂ චිත්ත වර්ධනයකරමින්,

429 ඒ ස්වර්ණ සහස්‍රය ඒ (අරක්කැමියාහට) දානයකරමින් බොහෝසෙයින් චිත්ත සන්තෝෂ වර්ධනයකරවමින් අධ්‍යාශය මස්තක ප්‍රාප්තවූහෙයින් දුන් මාගේ ඇසින් (ප්‍රභාවතී) කාන්තාවන් දර්ශනයකරමියි,

430 (මෙසේ) චින්තනයකොට ශ්‍රේෂ්ඨවූ මහා (බෝධි) සත්වතෙම සූර්‍ය්‍යයා උදාවීමට ප්‍රථමකොට නැගිටලා නිදි ගැට හැරලා රසවත් කොට භක්ත ව්‍යඤ්ජන සම්පාදනය කොට,

431 රජයාහට වෙනින් මුලුතැන්කදක් දානයකොට අරක්කැමියා හරිමින් ඔහුවුන් හට බෙදන්නාවූ මුලුතැන් කද කරේ තබාගෙණ,

432 දූලි (හා) කුණින් වැකුනාවූ ශරීරයෙන් (යුක්තව) සූපකාරයෙකු මෙන් එදවස්හි මහා (බෝධි) සත්වතෙම ගමනයකොට ප්‍රභාවතියගේ ගෘහ වාරයට ප්‍රවිෂ්ටවූයේය.

---

(423) නිශ්ශබ්දකාව—නිඃ, ශබ්දකාව. (424) ගෙණවුත්—ගෙණ, අවුත්. මුඛාභ්‍යන්තරයෙහි—මුඛ, අභ්‍යන්තරයෙහි. (425) නරෝත්තම—නර, උත්තම. මෙසාකාරයෙන්—මෙ, ආකාරයෙන්.

Digitized by Google

433 මහේසිකාවතොමෝ ඒ (මහා බෝධි සත්වයන්වහන්සේ) දශීතාහකාරමින් ජම්බුද්වීපයට අග්‍ර රජන් වූ කුස රජතෙම මේ මා උදෙසා ලෝභයෙන් මේ ස්ථානයට ආගමනයකොට,

434 දුශායන්විසිත්වන් කරණුකොලබත්තාවූ මුළුතැන් කෑම් අදිමින් වෙහෙසෙයෙත් යේය: එහෙයෙයින් මාවිසින් කාලයක්වන් සුඛයෙන් කථාකොටකොටම වාසයකළමනාහ,

435 මේ (කාන්තාවතන්) චින්තනයෙහි මේ අස්වන්නු කෙරෙහි ප්‍රේමය ඇතෙයි යනු විජානනයකොට මේ නරේශ්‍රතෙම මේ (ස්ථානයෙහි ම) මියත් අතික් දිශාවකට ශ මනයකොනෙකරේමය.

436 එහෙහෙයින් ගෙනම්බ බඩකොට නිස්සාරකොට මවන ප්‍රකාශකොට කෙකීය නගරයට ගමනයකරවමියි චින්තනයකොට ඒ කාමවමහාමෝ මෙනාකාරයෙන් කියන්නීය:

437 කුස නරේන්ද්‍රයාණෙනි, මහත්වූ කුසාවතී නගරයෙහි සම්පත්තිය අත්හැර මේ නුවරට ආගමනයකොට දුශායානුසිත්වයන් කාටුනුතුවූ මෙහෙවරකොට,

438 සූපකාරයන්ගේ මඩුයෙහි රෑ දවල්හි දර (හා) පැන් අදිමින් (භෝජනය) පචනයකොට (අමුත්තු) කත් ඇදලා මේ ඔබවහන්සේ මේ දුක් විඳිනනේ කුමක්පිණිස ද?

439 දග්ධ ප්‍රූපයක් ආකාරයට විකාර වක්ත්‍රයෙන් යුක්තාවූ මේ කොඩු සෙකිණීයක් වැනිවූ එක් ස්ත්‍රියක් අග්‍ර මහේසිකා කොට,

440 එවිනුවූ කුසාවතී නගරයෙහි සකලෛශ්වය්‍යීය විඳිනයෙහිරිමපිණිස මේ නගර අභ්‍යන්තරයෙහි රැඳිමකොටකොට වාඩිකාරකවූ මාගේ වචන ශ්‍රවණයකොට ශීඝ්‍රව ගමනයකරව.

441 ස්වාමිනී, ඔබවහන්සේ තොපමණ දවසක් තමුන් මේ (නගරයෙහි) වාසයකළේ තමුන් විකාරවූ වක්ත්‍රයකින් යුක්තවූ මේ ඔබවහන්සේ ගානමාය අපගේ වාසකයිවීමක් නැත්තේය.

442 ඒ නැවතෙන් මේ (නුවර) නොසිට කුසාවතී නම් නගරයට ගමනයකරව්ව කී යනලද වචනයට ඒ මහා (බෝධි) සත්වතෙම මෙනාකාරයට ප්‍රකාශකළේය:

---

(435) නරේශ්‍ර—නර, ඉන්ද්‍ර. (436) නිස්සාර—නිඃ, සාර. මෙනාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (437) නරේන්ද්‍රයාණෙනි—නර, ඉන්ද්‍රයාණෙනි. (440) සකලෛශ්වය්‍යීය—සකල, ඓශ්වය්‍යීය. නගරාභ්‍යන්තරයෙහි—නගර, අභ්‍යන්තරයෙහි. (442) මෙනාකාරයට—මෙ, ආකාරයට.

Digitized by Google

443 නීලවර්ණවූ මේඝ කූටයන් සමානවූ මෘදුවූ දීර්ඝවූ ප්‍රභා ප්‍රාප්තවූ කේශකලාපය ක් (ඇත්තාවූ) ජනයාගේ චිත්ත නේත්‍ර ග්‍රහණය කළාවූ වස්ත්‍රාභරණකොටගෙණ පූර්ණ චන්ද්‍ර මණ්ඩලයේ ශ්‍රියාව ග්‍රහණයකළාවූ,

444 සුවර්ණ හංසයන් වැනිවූ පයෝධර ද්වය උද්වහනයකොට කෘශව ගියාක් මෙන් සිත්වූ මධ්‍යප්‍රදේශයෙන් විරාජමානවූ ශෝභාසහිතවූ ප්‍රභාවතී නම්වූ කාන්තාවෙනි,

445 තීගේ මනෝනන්දනවූ රූප ශ්‍රීය සෑම කල්හි දක්නායකිරීමපිණිස වූයේනම්, අමන්දවූ දිව්‍ය ලෝක සම්පත්තිය ශත සහස්‍ර ගුණයෙන් එයට මදවන්නේය.

446 තී කෙරෙහි නිරන්තරයෙන් බැඳුනාවූ ලෝභ (ආමැති) අතිශයෙන්ඝෝරවූ ඝනාන්ධකාරයෙන් අස්මත් ශබ්දවාච්‍යයාහට මාර්ගය නොපෙණෙන්නේය; එසේහෙයින් කුසාවතී නගරයට ගිය නොහැක්කෙමි;

447 (එහෙයින්) ප්‍රිය දේහිණියෙනි, යුෂ්මත්නැනැත්තියගේ රූප ශ්‍රීය සෑම කල්හි දක්නායකිරීම පිණිස වූයේනම් අස්මත්ශුළිසින් ලද්දාවූ රාජෛශ්වර්‍ය්‍යය ඛේල පිණ්ඩය ක් ප්‍රමාණකොට ද නොසලකමි (යි කීයේය).

448 ප්‍රභාවතීතොමෝ ඒ වචන ශ්‍රවණයකොට තේජසින් යුක්තවූ කුශ රාජෝත්ත මයාවිසින් මේ මාගේ ශයනය (අල්වා) ගන්නේවීනම් වැලැක්වීමපිණිස හැක්කාවූ කෙ නෙක් ලෝකයෙහි නැත්තේය.

449 මෙමාකාරයෙන් කල්පනාකරමින් තරකොට වාරය පිදහනයකොට ශ්‍රී යහන්හි දිලියෙන්නාවූ දිව්‍යාඞ්ගනාවක් විලාසයෙන් සයනයකළාය.

450 එ දවස්හි මහා (බෝධි) සත්වෝත්තමයා අනලස්ව ඒ (මුළුතැන්) කද (හැර) ගෙණගොස් කුමාරිකාවන් සත් දෙනාගේ භෝජන නිෂ්ඨාකරවා භාජන (හැර) ගෙණ,

451 ප්‍රභාවතීයහට එයින් කොට්ඨාසයක් ගෙණැවිත් දුන් කල්හි ඒ (කොට්ඨාසය) කුදුස්ත්‍රීයහට දෙමින් ඒ (කුදිය විසින්) ලද්දාවූ ඒ කොට්ඨාසය තොමෝ අනුභවකරමින්,

452 තේජසින් යුක්තවූ කුශ නරේන්ද්‍රයා මේ පුර ප්‍රවරයට මා නිසා ප්‍රාප්තවූ භාවය කාහටවත් කථනයනොකරවයි කියා කුදියහට ද තර්ජනයකළාය.

(444) පයෝධර—පයඃ, ධර. (445) මනෝනන්දනවූ—මනඃ, නන්දනවූ. (446) ඝනාන්ධකා රයෙන්—ඝන, අන්ධකාරයෙන්. (447) රාජෛශ්වර්‍ය්‍යය—රාජ්‍ය, ඓශ්වර්‍ය්‍යය. (448) රාජෝ ත්තමයා—රාජ, උත්තමයා. (449) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. දිව්‍යාඞ්ගනාවක්—දිව්‍ය, අඞ්ගනාවක්. (450) සත්වෝත්තමයා—සත්ව, උත්තමයා. (451) ගෙණැවිත්—ගෙණ, ඇවිත්. (452) නරේන්ද්‍රයා—නර, ඉන්ද්‍රයා.

Digitized by Google

453 මනෝඥනවූ මහා (බෝධි) සත්ත්වයන්වහන්සේ ඒ (නගරයෙහි) වාසයකරමින් ඉන්නා භාවය කුදු නාසමග ඔහුවුන් හැර අන් කිසි කෙනෙක් නොදන්නේය.

454 මෙයාකාරයෙන් දිවසාතික්‍රමණයකරණ කාලයෙහි ජගද්නායකවූ මහා(බෝධි)සත්ත්වයන්වහන්සේ මහේෂිකා චන්ද්‍රිකාව දක්නායකරණ ලෝභයෙන් අප්‍රමාණවූ ශෝකාග්නියෙන් තප්තව,

455 මා කෙරෙහි ඒ මහේෂිකා උදාසමියගේ චිත්තයෙහි ස්නේහය ඇති නැති භාවය විමසනයකොට නිශ්චයෙන් ජානනයකොට වාසයකරමිය(යි) කල්පනාකොට (එක්) දවසෙක්හි මහා(බෝධි)සත්ත්වතෙම,

456 භෝජන සම්පාදනයකරමින් (හැර) ගෙණ ගොස් රාජකුමාරිකාවන් සත් දෙනාගේ භෝජනය න්‍යායාකාරවාලමින් ඉක්මනිව කද බැදලා කරෙහි තිබාගෙණ,

457 තන්හි තන්හි ප්‍රස්ඛලිතව පතිතව මිරිකි මිරිකී අඩි ඔබමින් (ප්‍රභාවති) මහේෂිකාවගේ ගෘහ වාරයෙහි කෙදිරිගාමින් වැටී හොත්තේය.

458 (ඒ ප්‍රභාවති) රාජමහේෂිකාව ඒ ප්‍රවෘත්තිය දක්නායකොට සකල ජම්බුද්වීපයට නායකවූ ජගදග්‍රවූ කුස නරේන්ද්‍රතෙම මේ මා උදෙසා (ගණ) ආගමනයකොට දුක් විඳින්නේය.

459 මේ ස්ථානයෙහි ප්‍රවිෂ්ටව මළේවිනම් මේ මාගේ ජීවිතය නැසීමට දෙවෙනිවූ අන්‍ය වරදක් නැත(යි) සිතා (ප්‍රභාවති) දේවිය ද ගෘහයෙන් නිෂ්ක්‍රාන්තව,

460 ඒ මහාකල්‍යාණතොමෝ ආගමනයකොට වස්ත්‍රවල කොනින් නමිතව ස්ථානයකොට මහා (බෝධි) සත්ත්වයන්වහන්සේගේ ප්‍රාණ වාතය ඇති නැති(යන),භාවය අවලෝකනය කරණ කල්හි,

461 මහා (බෝධි) සත්ත්වයන්වහන්සේ ඒ කල්හි මුඛයෙහි කෙළ පුරාගෙණ ඉදලා ඵේණ පිණ්ඩයක් ආකාරයට ප්‍රභාවතියගේ මුඛ පද්මයට ගැසුයේය.

462 එම කාලයෙහි මහේෂිකා උත්තමිතොමෝ තමන්ගේ විමානාභ්‍යන්තරයට ප්‍රවිෂ්ට වෙමින් වාරය ආලාපයන් ජිහිතකොට මෙයාකාරයෙන් ක්‍රෑරධාරීවූ වචන කියන්නීය:

---

(453) මනෝඥනවූ—මනඃ ඥනවූ. (454) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. දිවසාතික්‍රමණය කරණ—දිවස, අතික්‍රමණයකරණ. ජගද්නායකවූ—ජගත්, නායකවූ. ශෝකාග්නියෙන්—ශෝක, අග්නියෙන්. (458) ජගදග්‍රවූ—ජගත්, අග්‍රවූ. නරේන්ද්‍ර—නර, ඉන්ද්‍ර. (462) විමානාභ්‍යන්තරයට—විමාන, අභ්‍යන්තරයට. මෙයාකාරයෙන් මෙ, ආකාරයෙන්.

Digitized by Google

463 යම්තැනැත්තෙක්තෙමෙ විකාරවත්ව ඉදගෙණ රූපශ්‍රී ඇති ස්ත්‍රීන් ප්‍රාර්ථනාකෙරේ නම් ඔහට බොහෝවූ අවැඩක්ම මිසක් වැඩියක්වූයේ කවර කාලයකත්හිද?

464 (හිත්තෙත) රත්වූ (ද) රත්හුවු (ද) යකඩ දෙක සම්බව පෑහීමක් නැත්තේය; ඒ භාවයෙන් විරක්තවූ (ද) රක්තවූ (ද) [නොවුන්, (රාග නමැති ගින්නෙන්) රත්හුවූ(ද) රත්වූ(ද)] දෙදෙනාගේ සම්බන්ධ ඉදිමක් නැත්තේය.

465 විකාර මුහුණින් යුක්තවූ තොපවිසින් අපගේ ප්‍රාර්ථනාකිරීම නොමුහුනුවත්තේය; හැසග (නිද) ගිනි (ගා) ජලය පරිද්දෙන් දුරින් දුරුවෙලාම වාසයකරමමැයි.

466 ඒ භාවයෙන් මේ (ස්ථානයෙහි) නොසිට ස්වල්පයක්වත් (කාලය) පසුනොකොටම කුසාවතී නගරයට ගමනයකරවයි (කියා) ඒ බෝධිසත්වයන්වහන්සේට කී කල්හි,

467 ඒ ප්‍රවෘත්තිය ශ්‍රවණයකරමින්ම චිත්තය ස්වල්පයක්වත් කෝප නොවී මගේ සිතාව කෙරෙහි ලෝභ බන්ධනයකොට නැවත ද මෙයාකාරයෙන් වචන ප්‍රකාශකරයි:

468 නී කෝපයෙහිතවූවාද අපගේ චිත්තයට සන්තෝෂය වඩිනෙවෙහි; (ඒ කුමක් මෙන්ද යත්) සූර්‍ය රශ්මිය දක්නාකල්හි තඩාගවල නොයෙක් පද්ම ප්‍රබෝධවන්නේය (එමෙනි).

469 එහෙයින් නීගේ රූප විලාසය නිරීක්ෂණයකොට ප්‍රිය වචන ඇසීමෙන් (වෙද) ශරීර ස්පර්ශය නොලද්දේවී නමුත් ඒ ප්‍රමාණයකින්ම චිත්තයෙහි සන්තෝෂය පෝෂණයවේ.

470 තත් භාවයෙන් බාහ්‍යයට ගමනයනොකොට මේ (නගරයෙහි) කාලාතික්‍රමණය කොට ඉදිමියෙහි නිශ්චයකොට ඒ බෝධිසත්වතෙම මහේසිකාවට ප්‍රකාශකොළේය.

471 කියවීතොමෝ ඒ (වචනය) අසමින් මේ (කුසරජතා) මේ ස්ථානයෙන් පිටිදැක්මිය කල්පනාකොට තමාගේ ඥානයෙන් උපාය යෝජනාකොට මෙයාකාරයෙන් කියන්නීය:

472 පුණ්‍යවත්හුවිසින් මා ප්‍රාර්ථනාකොට ආගමනයකොට මෙහි වාසයකොට කරණලබන්නාවූ උත්සාහය සම්බන්ධවූ ග්‍රීෂ්මයෙහි විහිංසාව දූලකින් සුලං බඳන්නාක්මූ මෙන්.

473 මෙ පමණ කාලයක් පසු කොට ඔබවහන්සේවිසින් මා ප්‍රාර්ථනාකොට විඳනයකරන්නාවූ දුඃඛය (නම්) මාංස ලෝභිවූ කොක්පැස්සියෙන් සමුද්‍රය සිඳදන තුරු බලා ඉන්නාක් මෙනි.

---

(467) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (470) කාලාතික්‍රමණයකොට—කාල, අතික්‍රමණයකොට. (471) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්.

474 ඒ මහේසිකා උත්තමාවන්විසින් මෙආකාරයෙන් ශපථ බැඳවූ වචන කථාකරන ලද කල්හි ද ප්‍රසිද්ධවූ මහා බෝධිසත්ත්වතෙම සාමිඥාණකොට ලෝක බන්ධනයකොට මේ වචන කියන්නේය:

475 ජම්බුද්වීපයට අග්‍රවූ රාජ්‍ය සම්පත්තිය අත්හැර නි කෙලෙස් අමසඳවූ සෙත්න යෙත ඇවිදින් මම පමණ කාලයක් වාසයකරමින්,

476 ශ්‍රීමත්වූ මේ ජනයෙන් මෛත්‍රී කොලවරින් බැලීමක් හෝ සුදුසුවූ ප්‍රිය වචනයක් හෝ චිත්ත සන්තෝෂ වර්ධනයකරමිය කොලද්දෙමිය.

477 එයින් එකක් ලැබුණු කල්හි අතිශයින්මහත්වූ රාජ්‍ය ශ්‍රී ලද්දාක් මෙන් සතුටු ව එ කල්හි ගමනයකරමි; කොලදනොත් ප්‍රාණ වාතය යන්නෙයිමිකුඹුන් ගමිනාය යනා කරමි (යි කීයේය).

478 ඒ (බෝධිසත්ත්වයන්වහන්සේ) මෙආකාරයෙන් කථාකලකල්හි ඒ කාරණයෙනි මහේසිකා උත්තමාවෝ මුසා වාදයක් කියා අකලන්ව මේ (කුමාරජන්ම) පිළිදකිමිය විශ්වාසයකොට,

479 ලෝකයට ස්වාමිවූ ස්වාමිපුත්‍රයාණෙනි, නිමිති දත්තවුන් රැස්කොට මේ නුඹවහන්සේට මහේසිකාව ඉදිමට යම් කාලයක අප්‍රමාණවූ වාසනාවක් ඇත්තියනට යෙදේ ශෙ (කියා),

480 එආකාරයෙන් විචාල කල්හි (ඒ නිමිත්ත පාඨකයෝ) මෙආකාරයෙන් ප්‍රකාශ කළාහුය: (ඒ කෙසේදයත්) සප්ත කාර්යයකට ජේදනයකලද මේ නි ක) ඒ රාජ යාගය් (එකතුව) ඉදිමක් නොයෙදෙන්නේය.

481 ඒ (නිමිත්ත පාඨකයන්විසින්) මෙආකාරයෙන් කථාකලනෙයින් ද අන්‍ය කාරණා දක්වාකරණලද බැවින ද ඔබවහන්සේගේ ඉන්ද්‍රිය විකාරවූබැවින් ද මට මාගේ ජීවිතාන්තය (දක්වා ඔබවහන්සේ සාසම්භ) වාසයකිරීමක් නැත්තේය.

482 ඒ මහේසිකාවන්විසින් කියනලද වචනයට මහා බෝධිසත්ත්වතෙම මෙආකාරයෙන් කියන්නේය: (ඒ කෙසේද, භද්‍රමෙනි, මා එතකාවූ කාලයෙහි නිමිත්තපාඨකයන් රැස්කොට විචාලෙමි,

(474) මෙආකාරයෙන්—මෙ, ආකාරයෙන්. (478) මෙආකාරයෙන්—මෙ, ආකාරයෙන්. (479) ස්වාමිපුත්‍රයාණෙනි—ස්වාමි, පුත්‍රයාණෙනි. (480) එආකාරයෙන්—එ, ආකාරයෙන්. මෙආකාරයෙන්—මෙ, ආකාරයෙන්. (481) මෙආකාරයෙන්—මෙ, ආකාරයෙන්. ජීවිතාන්තය—ජීවිත, අන්තය. (482) මෙආකාරයෙන්—මෙ, ආකාරයෙන්.

Digitized by Google

483 ශ්‍රීමත්වූ ප්‍රභාවතී දේවීනහට) ඔබවහන්සේ හැර අන්‍ය ස්වාමියෙක් නැත්තේය (සැකියා) නිශ්චයකොට ප්‍රකාශකළාහුය; එසේහෙයින් මේ මා කෙරෙහි තද මානය හැර,

484 ඉන්දීවරාකාරවූ නේත්‍රාභරණකොටගෙණ සනිග්ධවූ බාලීමෙන් (හා) මන්දහාසයෙන් (ප්‍රභාව) මේ මාගේ දිශාව නිරීක්ෂණයකොට යෝග්‍ය පරිද්දෙන් සුන්දරවූ වචනයක් දානයකළමනාත්,

485 එ කල්හි අනලස්ව ගමනයකරමි; එම ආකාරයට (වචනයක්) නොලද්දේවීනම් සූපකාර කර්මාන්ත කොට මේ (නගරයෙහිම) ඉඳිමියයි මහේසිකාවට කීවේය.

486 මහා(බෝධි)සත්වයන්වහන්සේවිසින් මෙසේ කීකල්හි සුන්දරවූ ප්‍රභාවතී තොමෝ (ඒ කථාව) ශ්‍රවණයකරමින් මේ (නගරයෙහි) වාසයකෙළේනමුත් ගමනයකෙළේනමුත් මේ මාහට ඒ තැනැත්තාගෙන් ප්‍රයෝජනයක් නම් නැත්තේයයි,

487 චින්තනයකොට ගෘහයට ප්‍රවිෂ්ටව ස්ථිරකොට වාරණයෙහි අඳුලු ලාගෙණ ශ්‍රී යහණාවට නැගිලා අවාඞ්ගනාවක් විලාසයෙන් සන්තර්පිතවූවාය.

488 ඒ නතුවය ස්වකීයාක්ෂියෙන් දර්ශනයකොට චින්තාය ශෝකාග්නියෙන් තප්තවෙමින් හද කරේ තබාගෙණ වනා මුහුනැත් ගෙට ප්‍රවිෂ්ටවෙමින්,

489 ස්වකීය හස්තයෙන් වතුර ඇද භාජන සෝදා තවමින් ගින්න නොනිවමින් තබා ප්‍රථමයෙන් ආදර භක්තියෙන් නැගිටලා,

490 ප්‍රාතඃකාලයෙහි කැඳ (හා) අවුලුපත් ද රැ දැවල් හතන ව්‍යඤ්ජන (ද) සමග බා ඥා භෝජ්‍යය ද සුරක්ෂිතකොට පවනයකොට මුහුනැත් කත් බැලා,

491 අනලස්ව (හැර) ගෙණගොස් සියවුන්ගේ භෝජනය නිෂ්පාකරවමින් දවසක්පාසා මෙයාකාරයෙන් බෝධිසත්වයන්වහන්සේ ශෝකාග්නියෙන් (ප්‍රභාව) වාසයකරණ කල්හි,

492 ශ්‍රීමත්වූ ප්‍රභාවතී කාන්තාව රඤ්ජමානවූ සන්තුෂ්ටවූ රාජ උමාසනයෙන් ආගමනයකොට කුදුය යන්නී දර්ශනයකරමින් ආමන්ත්‍රණයකොට මහා (බෝධි) සත්වතෙම මේ ප්‍රවෘත්තිය ප්‍රකාශකරයි:

(484 ඉන්දීවරාකාරවූ—ඉන්දීවර, ආකාරවූ. (487) අවාඞ්ගනාවක්—අවා, අඞ්ගනාවක්. (488) ස්වකීයාක්ෂියෙන්—ස්වකීය, අක්ෂියෙන්. ශෝකාග්නියෙන්—ශෝක, අග්නියෙන්. (491) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. ශෝකාග්නියෙන්—ශෝක, අග්නියෙන්.

Digitized by Google

493 ශ්‍රීකාන්තාවගේ ශ්‍රියාමෙන් දිලියෙන්නාවූ ශෝභනවූ ප්‍රභාවතී (කාන්තාව) දර්ශනයකොට මේ තී එසින් නමස්කාරකොට සිටගෙණ මේ මාසයක් එළිනුලබන්නාවූ දුඃඛය කථනයකොට,

494 ප්‍රභා ප්‍රාප්තවූ රූප ශ්‍රී ඇත්තාවූ ඒ (ප්‍රභාවතීකාන්තාවගෙන්) සිත් පිණවන්නාවූ බැලීමක්වත් කර්ණරසායනවූ රස වචනයක්වත් මේකාලයෙහි මාහට ප්‍රේමන් නැතැත් තිය එසින් යෝජිතකළහොත්,

495 සන්තුෂ්ටවූ කුසාවතී නගරයට පැමිණි දවස්හි මේ තීගේ චිත්තය සන්තෝෂකරවා කුදුබව නොපෙණෙන්නාවූ පරිද්දෙන් අප්‍රමාණවූ අනර්ඝවූ මාණික්‍යාභරණයෙන් සජ්ජිතකරම්(යි),

496 මහා(බෝධි)සත්වයන්වහන්සේවිසින් මෙසාකාරයෙන් කී කල්හි ඒ කුදු(ගැත්)තොමෝ සන්තෝෂයෙන් චිත්තය පිණා වහා රජ භවනයට ප්‍රවිෂ්ටව ගැබඳලා කැලිතස ල(අරත්)දමමින්,

497 ශෝභනවූ සුන්දරවූ ප්‍රභාවතී කාන්තාව (තමන්ගේ) සමීපයට ප්‍රිය වචනයෙන් ආමන්ත්‍රණයකොට මිටි ආසනයක හිඳුවමින් කුද්තොමෝ යහපත්වූ උච්චාසනයක නිසද්‍යයකොට,

498 ඝන නීලවර්ණවූ [නොහොත්, වලාකුළක් (මෙන්) නිල්පැහැය (ඇත්තාවූ] දිගීවූ කේශකලාපය මෝචනයකොට නිය ගාලා ආකූලය හැර සමකොට තමන්ගේ හිසින් උකුණෙක් හැරගෙණ ජීහුව (ප්‍රභාවතී) බිසවගේ ශීර්ෂයෙහි බහමින්,

499 (හැර) ගෙණ බිසවගේ අතෙහි ස්ථාපනයකරමින් සුකුමාරවූ තීගේ දීප්තිමත්වූ ශීර්ෂයෙහි ඌකාමෙකුගේ මහත්වය අවලෝකනයකරව (යි) මේ ආදිවූ වචන කථනයකොට පසුව,

500 සකල ජම්බුද්වීපයෙහි නරේන්ද්‍රයන්ගේ මස්තකවල චරණ (නමැති) පද්ම යුග්මය මනාකොටසජ්ජිතකළාවූ සූර්‍ය්‍යවංශයට කොතක් (බඳුවූ) කුස නරෝත්තමතෙම හුදකළාවෙමින් මේ නගරයට ආගමනයකොට,

501 ප්‍රමාණාතික්‍රාන්ත කාලයක් මේ (නගරයෙහි) වාසයකොට සූපකාරයන්ගේ මධ්‍යයට ප්‍රවිෂ්ටව තනිකර මේ තී දර්ශනයකරණ පරිද්දෙන් සෑම දවස්හි මේ දුක් විඳින්නේය.

---

(495) මාණික්‍යාභරණයෙන්—මාණික්‍ය, ආභරණයෙන්. (496) මෙසාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (497) උච්චාසනයක—උච්ච, ආසනයක. (500) නරේන්ද්‍රයන්ගේ—නර, ඉන්ද්‍රයන්ගේ. නරෝත්තම—නර, උත්තම. (501) ප්‍රමාණාතික්‍රාන්ත—ප්‍රමාණ, අතික්‍රාන්ත.

Digitized by Google

502 එක කාලයෙහි (එක්) දවසක් ලැග්ගාවූ ස්වාමියෙක් පීඩාවට පැමිණිකල්හි ඒ (ස්වාමීන්ගේ) දුඃඛය දුර ලූවාවූ ප්‍රමාණයක් නැත්තාවූ කාන්තාවෝ මේ ලෝකයෙහි ඇත්තාහුය.

503 එහෙයින් මනෝඥවූ කුසරජහුගෙන් සෙසක ශ්‍රී ලබ්ධම කල්‍යවා වාසයකොට මේකාලයෙහි ඒ (කුස රජහු) සම්බන්ධවූ මේ දුඃඛයට හැරලා චිත්තය දුඃඛකොට සිටීම යුතුද?

504 ශෝභමානවූ ප්‍රසිද්ධවූ ඒ නරේන්ද්‍රයාහට ආදරයෙන් දිවසාතික්‍රමණයකොට සිත් වූ පරිද්දෙන් ස්ත්‍රීරත්නයෙන් අමන්දව සකලෛශ්වර්‍ය්‍යය විඳිනයකොට ධර්මයෙන් (සුක් තව්) සිටිවයි කීකල්හි,

505 ඒ (ප්‍රභාවතී) කාන්තාතොමෝ ඒ වචන ශ්‍රවණයකරමින්ම ගින්නක් මෙන් චිත්තයෙහි කෝපය වර්ධනයකරවමින් ඒ ස්ථානයෙන් නැගිට සිටියාවූ ආකාරය ස්ථාන වාසීවූ කුදු(ස්ත්‍රීතොමෝ) දර්ශනයකරමින්,

506 එ කල්හි මහේෂිකාවූන්ගේ ග්‍රීවය අල්ලා ඇදගෙන ගෘහාභ්‍යන්තරයට දුක් පකරමින් රැගෙනගිය සිරකොට වාරය ඇදලා කුදීතොමෝ පිටතට වැද සිටියෙහින්,

507 ඈ සිටියාවූ ආකාරය දර්ශනයකරමින් ගින්නක් මෙන් ක්‍රෝධසහිතබව වර්ධනය කරමින් සැපිත්තියක් මෙන් කෝපවෙමින් මෙසාකාරයෙන් සම්බන්ධ වචන කියන්නීය:

508 නපටවූ ලජ්ජා නැති වචන කියන්නාවූ තීගේ කුදුභාවය ප්‍රහාර දානයකොට මිරී කරලා ජිහ්වාව ජත්කාරීන් පිටතට ඇදලා දර්පය ශූන්‍යකොට ජෙෂ්ඨයකොට පහකර වම්‍ය කීවාය).

509 ඒ මහේෂිකා උත්තමියවිසින් මෙසාකාරයෙන් කථනයකරණකල්හි ඒ කුදීතො මෝ වාරය ඇදලා අභීතව ස්ථානයකොට කුස රජහුගේ බොහෝවූ ඓශ්වර්‍ය්‍ය හා සමඟ අවවාද වචන කියන්නීය:

510 මහත්වූ ඒ දිව්‍ය පුරය (හා) එක සමානවූ අතරක් නැත්තාවූ, ඓශ්වර්‍ය්‍ය සාර යෙන් දිලියෙන්නාවූ දීප්තිමත්වූ ඒ රජහුහට සමාන බල (ඇත්තාවූ) අන්‍ය රජෙක් කොම පෘථිවි තලයෙහි ඇත්තේද?

---

(503) මනෝඥවූ—මනඃ, ඥනවූ. (504) දිවසාතික්‍රමණය—දිවස, අතික්‍රමණය. සකලෛශ්වර්‍ය්‍යය—සකල—ඓශ්වර්‍ය්‍යය. (506) ගෘහාභ්‍යන්තරයට—ගෘහ, අභ්‍යන්තරයට. (507) මෙසාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (509) මෙසාකාරයෙන්—මෙ, ආකාරයෙන්.

Digitized by Google

511 හස්තිසේනාව(ද) අශ්වසේනාව(ද) රථසේනාව(ද) පාබලසේනාව ද දාසි දාසයන් (ද) ගවයන්(හා) මී සරක් ද මාණික්‍ය මෞක්තික ආභරණ(යන) නොයෙක් වස්තු ඒ (කුස) රජයාගේ මෙ පමණකැයි (කියා) සීමාවක් නැත්තේය.

512 මහත්වූ මේ ජම්බුද්වීපයෙහි රාජ සමූහයා අනර්ඝවූ පණ්ණාකාර (හැර)ගෙණවුත් දැනායකරමින් අප්‍රතිමවූ ජගද්ගුරුවූ ඒ (කුස) රජහුගේ චරණයෙහි නඛ රශ්මි (නැමැති) ගඞ්ගාවෙහි නිමග්නවෙත්ය.

513 ප්‍රතිමල්ලවූ නරේන්ද්‍රයන්ගේ කර්ණයෙහි (කිත්තෙත්) රත්වූ සූක්ෂ්ම අයඃශූල හෙළණයක් මෙන් ගර්ජිතවූ සිංහ නාදය(හා) ඒකාකාර (නාදය) සකල දශ දිශාන්තයෙහි නික්මෙන්නේය.

514 මෙයාකාරවූ ඓශ්වර්‍ය්‍යමත්වූ නරේන්ද්‍රයෙක් නී උදෙසා විඳින්නාවූ දුඃඛය නිත්‍යයෙන් දක්නානොට කොට මොලොක් නොවන්නාවූ නීගේ හෘදය පමණක් යකඩ ගලක්ය.

515 ඒ භාවයෙන් මාගේ වචනය ශ්‍රවණයකරමින් ස්වල්පයකුත්ම අලස නොවී ඒ රජහු කෙරෙහි ස්නේහයකොට සුදුසුවූ පරිද්දෙන් ධර්මයෙන් (යුක්තව) ඉඳිවයි(කියා),

516 බෝහෝවූ මේ වචන කී කල්හි ඒ කාන්තාතොමෝ ක්‍රෝධසහිතව ශ්‍රවණය කරමින් ඒ කුදය භයගන්වාලමින් මෙයාකාරයෙන් සම්බන්ධ බලවූ වචන කීවාය:

517 මා හැර (අන් කෙනෙක්) නැත්තේය(යි) ගරු මාත්‍රය කොට මාහට ප්‍රේම වචනයක් නොකියන්නීය; නීහට ස්වාමි දුහිතෘවක් ඇති භාවය බාහ්‍යයට වත්මනම්වීම් නම් දක්වම්(යි කීවාය).

518 එ කල්හි බුජ්ජස්ත්‍රීතොමෝ ඒ වචන ශ්‍රවණයකොට ගස්සාලා රණ ස්ථිර කොට ඇදලා පසුමූසාරූඇතිව භය නැතිව සිටගෙණ කෝපව මෙයාකාරයෙන් කියන්නීය:

519 රූප ලක්ෂණ ඇත්තෙම්ය(යි කියා) දපී (ඇති)වෙමින් ප්‍රවෘත්ති ජානනය නොකොට මෙ වචන නිවිසින් කෝපව කොපමණ ක්‍රියේවීනමුත් මම ද එයට උපාය ජානනයකරම්.

---

(512) ජගද්ගුරුවූ—ජගත්, අග්‍රවූ. (518) නරේන්ද්‍රයන්ගේ—නර, ඉන්ද්‍රයන්ගේ. ඒකාකාර—ඒක, ආකාර. (514) මෙයාකාරවූ—මෙ, ආකාරවූ. නරේන්ද්‍රයෙක්—නර, ඉන්ද්‍රයෙක්. (516) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (518) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්.

Digitized by Google

520 කුස නරේන්ද්‍රතෙම ඊ සඳහා මේ නගරයෙහි විඳින්නාවූ පීඩාව මේ කාලයෙහි තිගේ පිතෘ රජයාහට කියා අප්‍රමාණවූ අකීර්තිය කරවමි(යි),

521 ඒ බුජ්ජයන්ත්‍රීතොමෝ සහබ්බ බබවූ වචන කීහෙයින් කණ්වල ලෝහ ජලය පති තවූවාක් මෙන් හිතියෙන් හෘදය කම්පාවෙමින් කම්පාවෙමින් දුඃඛයෙන් මේයාකාරවූ දීනවචන කියන්නීය:

522 නැතැයි ශූන වචනයක් නොකියමින් රුව් රුව්වූ දෙශ ගෙණ දෙමින් නිරන්තරයෙන් දූතිතෘ ප්‍රේමය විඳිනයකරවමින් සොඳින් ඇතිකළාවූ මෑනියෙනි කියා,

523 කුස රජයා මේ (නගරයෙහි) වාසයකරන්නාවූ ප්‍රවෘත්තිය අපගේ පිතෘ මහ රජයාවිසින් ශ්‍රවණයකළහොත් ඒ ක්ෂණයෙහි භූමියෙහි ගසනලද හසනය නොවරදින්නාක් මෙන් මේ මාහට විපත්තියක් වන්නේය.

524 සන්තෝෂවූ රස මිශ්‍ර වචන කියමින් බුජ්ජයන්ත්‍රිය සංසිඳවමින් රජ මන්දිරාභ්‍යන්තරයට ප්‍රවිෂ්ටව කුතුහලවෙමින් ශෝකනවූ ප්‍රභාවතී නානනාතොමෝ වාසයකරන්නීය.

525 මේ අපගේ බෝධි සත්වෝත්තමතෙම ප්‍රභාවතිය ප්‍රාර්ථනාකොට ලෝභ බන්ධන කොට බොහෝවූ තදවූ දුඃඛය විඳනයකොට සත් මාසයක් ඉකුත්ව ගිය කල්හි,

526 කාවුකාහාරය අනුභවකිරීමෙන්(ද) සතවූ කාන්තුවූ වෑයනු අවිජාදනයකිරීමෙන්(ද) නිද්‍රෝපගත නොවී හිඳීමෙන්(ද) චින්තාය තැවීමෙන්(ද) ඉතා දුර්වලව,

527 මේ අපගේ බෝධිසත්වයන්වහන්සේ මේ කාන්තාවගෙන් මාහට ප්‍රයෝජන නැත්තේය(යි) දුඃඛ ලෝභ චිත්තය දුරුකොට හැර මේ අපගේ මාතෘ පිතෘන් සමීපයට ගමනයකරමි(යි කියා) කල්පනාකළකල්හි,

අෂ්ටම සර්ගය සමාප්තයි.

528 දාන පාරමිතාව පූරණ්නාවූ අනාගතකාලයෙහි සර්වඥව ජිනාණ සම්පත් දෙන්නාවූ කුස රජුගේ පුණ්‍ය බලයෙන් සුරේන්ද්‍රයාගේ පාණ්ඩුකම්බල (ශෛලා)සනය උෂ්ණ වූයේය.

---

(520) නරේන්ද්‍ර—නර, ඉන්ද්‍ර. (521) මෙයාකාරවූ—මෙ, ආකාරවූ. (524) මන්දිරාභ්‍යන්තරයට—මන්දිර, අභ්‍යන්තරයට. (525) සත්වෝත්තම—සත්ව, උත්තම. (526) කාවුකාහාරය—කාවුක, ආහාරය. (528) සුරේන්ද්‍රයාගේ—සුර, ඉන්ද්‍රයාගේ. ශෛලාසනය—ශෛල, ආසනය.

Digitized by Google

529 ශක්‍රදේවේන්ද්‍රතෙම සහස්‍ර දිව්‍යාක්ෂිකරණකොටගෙණ මේ මනුෂ්‍යලෝකය අව ලෝකනයකරමින් ප්‍රභාවතී (දේවිය) නොලැබ උත්කණ්ඨිතවූ මහා(බෝධි)සත්‍වයන්වහන්සේ දක්නායකරමින්,

530 සහස්‍රාක්ෂියාවිසින් ඒ ක්‍ෂණයෙහිම මද්‍ර රජහුවිසින් ලියවනලද පරිද්දෙන් සත් තෝණවූ ශාසනපත්‍ර සාදමින් සප්ත නරේන්ද්‍රයන්ගේ දේශ දේශයට යවත්ය

531 දිව්‍යාඞ්ගනාවක් මෙන් දිලියෙන්නාවූ සශෝභනවූ ප්‍රභාවතී (නම්වූ) මාගේ දුහිතෘව කුස රජයාගෙන් වියෝගීව ඇවිදින් මේ නගරයෙහි වාසයකරමින් හිඳින්නීය.

532 ඒ භාවයෙන් විනා ආගමනයකොට ප්‍රභාවතී කාන්තාවන් හැරගෙණ [illegible] සප්ත නරේන්ද්‍රයන්ට මේ ශාසන පත්‍ර ලේඛනයකොට යවූ කල්හි,

533 නරේන්ද්‍රෝත්තමයෝ සත් දෙන ඒ ශාසනපත්‍ර දක්නායකොට සත්තෝණයෙන් චතුරඞ්ගිනී සේනාව (හැර)ගෙණ ආගමනයකොට සාගල නගරයට අවිදූර ස්ථානයක,

534 අනෝන්‍යයන් දක්නායකරමින් ආවාවූ කාරණ ප්‍රතිප්‍රශ්නයකරමින් ප්‍රභාවතිය නිසාය කියන්නාවූ වචනය ශ්‍රවණයකරමින් (රජදරුවෝ) සත් දෙනා කෝපව,

535 එකම දුහිතෘව උදෙසා(ගෙණ) මොනාකාරයෙන් අස්මත්‍ය සත් දෙනෙක් ගෙන් වූයේය දැ කියා මද්‍ර රජයාහට කෝපසහිත වෙමින්,

536 අප සප්ත නරේන්ද්‍රයන්හට ප්‍රභාවතී මහේසිකාව හෝ දානයකරව, නැතහොත් යුධ හෝ කරව(යි) මේ ආකාර පණිවිඩ පත්‍ර ලියා හැරියකල්හි,

537 මද්‍රරජතෙම ඒ (වචන) ශ්‍රවණයකරමින් අමාත්‍යවරයන් රැස්කරමින් තත්වූ පරිද්දෙන් ප්‍රකාශකොට සියලු මන්ත්‍රී ජනයෝතුමු මෙයාකාර කීවාහුය:

538 මාර සේනාවක් පරිද්දෙන් ප්‍රාකාරෝද්දප උල්ලඞ්ඝනයකොටගෙණ මහා සේනාව හාසමග ඒ රජයෝ සත් දෙනා මේ නගරයට පැමිණෙමින්,

539 අපගේ සේනාව සමග මේ නගරය විනාශකිරීමට ප්‍රථමකොට ප්‍රභාවතී මහේසිකා උපතාමිය (මේ නගරයෙන්) හැරියහොත් මැනවැයි නියමකොට කීවාහුය.

[illegible] දේවේන්ද්‍ර—දේව, ඉන්ද්‍ර. දිව්‍යාක්ෂි—දිව්‍ය, අක්ෂි. (530) සහස්‍රාක්ෂියා—සහස්‍ර, අ[illegible] නරේන්ද්‍රයන්ගේ—නර, ඉන්ද්‍රයන්ගේ. (531) දිව්‍යාඞ්ගනාවක්—දිව්‍ය, අඞ්ගනාවක්. (532) නරේන්ද්‍රයන්ට—නර, ඉන්ද්‍රයන්ට. (533) නරේන්ද්‍රෝත්තමයෝ—නර, ඉන්ද්‍ර, උත්තමයෝ. චතුරඞ්ගිනී—චතුර්, අඞ්ගිනී. (534) අනෝන්‍යයන්—අන්‍ය, අන්‍යයන්. (535) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (536) නරේන්ද්‍රයන්හට—නර, ඉන්ද්‍රයන්හට. (537) මෙයාකාර—මේ, ආකාර. (538) ප්‍රාකාරෝද්දප—ප්‍රාකාර, උද්දප.

Digitized by Google

540 රජතෙම ඒ ප්‍රවෘත්තිය ශ්‍රවණයකොට එක රජෙකුට දුන්නකල්හොත් අන්‍ය රජයෝ හයදෙනාම කෝපවෙත්ය; එහෙයින් මේ කාරණය සුන්දර නොවේය.

541 ජම්බුද්වීපයට අග්‍ර ප්‍රාප්තවූ කුස රජහු (අත්) හැර මේ ස්ථානයට ආවාවූ ඵලය ප්‍රත්‍යක්ෂ කොට ප්‍රභාවතී දේවියනට විපාක දැනයකරවා,

542 සප්ත ඛණ්ඩයක් කොට ඡේදනයකොට රජවරුන් සත් දෙනාහට දෙනයකොට මේ නගරයට ප්‍රාප්ත උපද්‍රවය දුරුකරමි(යි) නරේන්ද්‍රතෙම සේනාවට කීයේය.

543 රජහු විසින් මෙනාකාරයෙන් කථනයකළාවූ වචන ඒ ක්ෂණයෙහි රජ භවනාභ්‍යන්තරයෙහි ප්‍රසිද්ධව සිය බැවින් දාසි දාසයෝ ශ්‍රවණය කොට මහත් ශෝකයෙන්,

544 ප්‍රභාවතියගේ සමීපයට ගමනයකොට හඬමින් වැදලා දේහය චුම්බනයකොට සිතට භය ගෙණ කීමෙන් නැගනියන් සත් දෙනා භාසමාන නික්ම ආගමනයකොට,

545 ශෝභනවූ ප්‍රභාවතී කාන්තාතොමෝ මාතෘ මහේසිකාව වාසයකරන්නාවූ රජ භවනය ඇතුළට වදිමින් මරණ භයට පැමිණෙමින් තැවෙමින්,

546 චණ්ඩ මාරුත ප්‍රවිෂ්ටවූ තරුණ පත්‍රයක් මෙන් හෘදය වෘතුව කම්පාවෙමින් නැගනියන් භාසමග ප්‍රභාවතීතොමෝ මෙසාකාරයෙන් දුඃඛ ශෝක වචන කියන්නීය:

547 ශෝභමානවූ මද්‍ර රජයාහට ජාතකාව නුඹවහන්සේගේ කුක්ෂියෙන් දුක් රහිතව ප්‍රසූතවූ මම නැගනියන් භාසමඟ ක්‍රීඩාකොට වැඩී මෙකාලයෙහි මාහට එකලාව ගමනක් වූයේය.

548 සුන්දරවූ නීලකණ්ඨයෙකුගේ පිඤ්ඡ කලාපයක විලාස(ඇත්තාවූ)දර්ශනය කරන කරණ ජනයන්ගේ චිත්ත නේත්‍ර සන්තෝෂ වර්ධනයකරවන්නාවූ ඒකාන්තවූ මාගේ හිස කෙස්වැටිය මන්ද කාලයකින් යක්ෂ භූත පිශාචයෝ ආකර්ෂණය කොට කෝට සිඳලත්ත.

549 නිරන්තරයෙන් දර්ශනයකළාවූ ජනයන්ගේ චිත්ත සන්තෝෂ වර්ධනයකරවන්නාවූ සම් කාලයෙහි අඩ චන්ද්‍රයා මෙන් භ්‍රාජිතවන්නාවූ තරුණවූ සුන්දරවූ සන්තෝෂවූ පටුවූ මාගේ ලලාටය, මාතෘ වන්දිතාවෙනි, නුඹවහන්සේ කවර කලෙක්හි දර්ශනයකරන්නෙහිද ?

(542) නරේන්ද්‍ර—නර, ඉන්ද්‍ර. (543) මෙනාකාරයෙන්—මෙ, ආකාරයෙන්. භවනාභ්‍යන්තරයෙහි—භවන, අභ්‍යන්තරයෙහි. (546) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්.

550 සුදුසුවූ පරිද්දෙන් දිලියෙන්නාවූ නීලෝත්පල (මෙන්) අප්‍රභිමත්වූ නේත්‍ර කර ප්‍රාප්තව සිටියාවූ කාණි පුනලය ද දක්නා කෙලෙකෙල්නි සත්නෝෂ වර්ධනයකරන්නාවූ මාගේ නේත්‍ර යුග්මය ද අද දවස්හි, කවුඩන් (හා) උකුස්සෝ උත්පාටනයකොට අනුභවකරත්ය.

551 නිරන්තරයෙන් දුටුවාවූ ජනයන්ගේ චිත්ත ප්‍රීතිකරන්නාවූ සුන්දරවූ ස්වර්ණ ඝංශ යන් (මෙන්) අප්‍රතිමත්වූ අතිශයන්පිරුණාවූ පයෝධර යුග්මය නොයෙක් භයානක වේශයෙන් වඩක්නෙම ආගමනයකොට රෞද්‍රවූ ක්‍රූරමුඛවූ ශත්‍රුයෙන් වෙන්කරලා සිඳිත්ය.

552 මෘදුවූ දිලියෙන්නාවූ සුන්පුලුලවූ අතිරක්තවර්ණවූ පද්මයක් මෙන් සුන්දරවූ ශෝභනවූ දීර්ඝාඞ්ගුලියෙන් අප්‍රතිමත්වූ යශපත්‍රනයනය ග්‍රහණයකොට අනුභවකරන ලෝභයෙන් පසිඳු (භූමියට) බැස වැද්වුවෙන් ග්‍රහණයකොට ආකාශ කුක්ෂියට සියාසරන්නේය.

553 භයානකවූ නොයෙක් උකුස්සන් (හා) ගිජුලිහිණියෝ ද සිත පිරුණාවූ ලෝභයෙන් ඉකිලීලා ආගමනයකොට මාගේ අතුණු බාහු භාහමුග බඩවැල ද තීක්ෂණවූ නඛයෙන් (හා) වැද්වුවෙන් ද (හැර) ගෙණ ආකාශයට නැගෙත්ය.

554 මහත්වූ ඝනවූ ස්වර්ණ කදලි ස්කන්ධ මෙන් බබලන්නාවූ ශෝභමානවූ ශෝභාවූ මාගේ ඌරු යුග්මය ද නොයෙක් රාක්ෂසයන් හා යක්ෂ සේනාවෝ ආගමනයකොට භූමිය දෙකොණින් ලේ වගුරුවමින් අනුභවකරත්ය.

555 සප්ත සේනාවකුත් (හැර)ගෙණ යුධ ප්‍රාප්තවූ රජවරු සත් දෙනාහට දෙන මෙන් මාගේ අප්‍රතිමත්වූ හස්ත පාද ග්‍රීව දේහ පයෝධර යුග්මය ද මුවහතින් යුක්තවූ ශත්‍ර බහා සිඳිත්ය.

556 දක්නාය කරණ කාරණ ජනයන්ගේ චිත්ත බඩකරවන්නාවූ අනඞ්ගයාගේ දුනුමිට මෙන් ශ්‍රාප්තවන්නාවූ සශෝභනවූ ලක්ෂණ ඇත්තාවූ මාගේ සිහින්වූ මධ්‍යප්‍රදේශය අද (දවස්හි) කවර මාර්ගයක යන්නේදෝහෝයි නොදනෙන්නේය.

557 ප්‍රභාවතී (නම්වූ) රාජ දුහිතෘ කාන්තාතොමෝ මෙසාකාරයෙන් විරහ ශෝකය කථනයකරමින් ඉකිගසා රෝදනයකරමින් මාතෘ මහේසිකාවට වන්දනයකොට කොට ලීලෝපේතවූ ස්වර්ණලතාවක් විලාසයෙන් සථානයකල කල්හි,

නවම සර්ගය සමාප්තයි.

---

(550) නීලෝත්පල—නීල, උත්පල. (551) පයෝධර—පයඃ, ධර. (552) සුන්පුලුලවූ—සු, උත්පුලුලවූ. දීර්ඝාඞ්ගුලියෙන්—දීර්ඝ, අඞ්ගුලියෙන්. (555) පයෝධර—පයඃ, ධර. (557) මෙසාකාරයෙන්—මෙ, ආකාරයෙන්.

558 මෙම රජ්ජුරුවන්ගේ නියෝග ලද්දාවූ රෞද්‍රවූ රාක්ෂසයෙක් වැනිවූ මහත්වූ වධක තෙම රක්තවූ පුෂ්පයෙන් පිලන්ධනයකොට අතිශයින් රක්තවූ වස්ත්‍ර ප්‍රච්ඡාදන යකොට,

559 රක්තවූ අඞ්ගරාගය ගල්වා මුද්ගරය (හැර) ගෙණ ග්‍රීවයෙහි අමෝරා ක්‍රූරධාරී (බස්) කථනයකරමින් ප්‍රමාණයක් නැත්තාවූ සුරාව කුක්ෂිය පූරණයකොට පානයකරමින්,

560 අතිරක්තවූ නේත්‍ර භ්‍රමණයකරවා පුරශුව (හා) මස් ලොඹුවත් (හැර)ගෙණ ඝාතක වේෂයෙන් යුක්තව වහා ඇවිදින් රාජ භවනයට පැමිණි කල්හි,

561 තරුණවූ සුන්දරවූ ඒ ප්‍රභාවති (දේවිය) චණ්ඩ මාරුත ප්‍රාප්තවූ තරුණ පත්‍රයක් පරිද්දෙන් හෘදය වස්තුව කම්පිතව මරණ භය ප්‍රාප්තවෙමින් සිටිය කල්හි,

562 මාතෘ මහේසිකාවතොමෝ (ඒ) දර්ශනයකොට චින්තය දුඃඛිතවෙමින් නොනැව ති මද්‍ර රජයාගේ සමීපයට ගමනයකොට චරණය නමස්කාරකොට මෙයාකාරයෙන් දන්වන්නීය :

563 ස්වාමීනි, තුම්බවහන්සේට දුහිතෘවූ ප්‍රභාවති කාන්තාව මෙම කාලයෙහි සප්ත ඛණ්ඩයකට ඡේදනයකොට සප්ත නරේන්ද්‍රයන්හට දානයකිරීම සතාදැයි,

564 විචාලාවූ ඒ (රජ) මහේසිකාවට නරේන්ද්‍රතෙම මෙයාකාරයෙන් කථනාකරයි : මහත් සේනාව (හැර) ගෙණ යුද්ධාපේක්ෂීය සම්ප්‍රාප්තවූ මේ රජයන් සත් දෙනාහට,

565 ඒ (ප්‍රභාවතිය) සප්ත ඛණ්ඩයක්කොට සමානකොට බෙදා දීලා මිසක් අන්‍යොන් ප්‍රද්වේෂයක් කොට මේ (රජවරුන්ගේ) සඟණයකරවීම දුෂ්කරය.

566 ලත්තාවූ කුස නරේන්ද්‍රයාගේ රූප ශ්‍රිය මන්දයයි පහකොට තමාගේ රූපලක්ෂණය පෙරදැරි කොට ආවාවූ විපාකය ලෝකයට ප්‍රකාශකොට,

567 සප්ත ඛණ්ඩයක් කොට ඡේදනයකොට ඒකසමානකොට බෙදා දීලා ඒ (රජ වරුන්ගේ) චිත්ත සන්තුෂ්ට කොට මේ නගරය රක්ෂාකරවි(යි) නරේන්ද්‍රතෙම ප්‍රකාශ කළේය.

568 මහේසිකාවතොමෝ රජහුවිසින් කියනලද්දාවූ වචනය ශ්‍රවණයකරමින් දුක් වැඳි නැවෙමින් ප්‍රභාවතියගේ සමීපයට ගොසින් රෝදනයකරමින් විලාපකියා මෙයාකාර යෙන් කියන්නීය :

---

(562) මෙයාකාරයෙන් — මෙ, ආකාරයෙන්. (563) නරේන්ද්‍රයන්හට — නර, ඉන්ද්‍රයන් හට. (564) නරේන්ද්‍ර — නර, ඉන්ද්‍ර. මෙයාකාරයෙන් — මෙ, ආකාරයෙන්. (565) අන්‍යොන් ප්‍රද්වේෂයක් — අන්‍ය, උපද්වේෂයක්. (566) නරේන්ද්‍රයාගේ — නර, ඉන්ද්‍රයාගේ. (567) නරේන්ද්‍ර — නර, ඉන්ද්‍ර. (568) මෙයාකාරයෙන් — මෙ, ආකාරයෙන්.

Digitized by Google

569 නිර්ණිත්මින්ගේ වචනය නොඇසුවාවූ අයට එන්නාවූ ශෝභන වූ කාලාතික්‍ර මණයන්නොකරවා මේ ග්‍රන්ථයෙන් සංක්ෂේප අර්ථයෙන් අභිධානකෙලෙමුව.

570 ප්‍රවරවූ විභූම දස්වා කීර්ති (නමැති) (මුක්තා) හාරය දිශා (නමැති) අම්බිකාවන් ගේ කණ්ඨයෙහි සජ්ජිතකළාවූ මෙ සකල ජම්බුද්වීපාභ්‍යන්තරයෙහි රජයන්ගේ මස්තක වල සජ්ජිතකළාවූ පාද පද්ම (ඇති),

571 සූර්‍ය වංශ (නමැති) තාමරසවනයට සන්තුෂ්ටි ජනනකළාවූ (හෙවත්, ප්‍රබෝධක ළාවූ) සූර්‍යයා වැනිවූ උතුම්වූ කුසාවතී නගරයෙහි ප්‍රසිද්ධවූ ඉක්ෂ්වාකුවංශ නරේන්ද්‍රයා හට,

572 ගුණරත්නකෝටිගෙණ සම්පත්විභූතිම නානාප්‍රකාරණකොටගෙණ කල්පද්‍රුම යක්වූ වංශයට ශ්‍රේෂ්ඨවූ ජනිතවූ උතුම්වූ ඒ නරශ්‍රේෂ්ඨයාගේට ජාතවූ,

573 චතුෂ්ෂෂ්ටි ශිල්ප උද්ග්‍රහණයකළාවූ ඒකචාරි සිංහයාගේ නාදයෙන් යුක්තවූ ජග දභ්‍යන්තරයෙහි ප්‍රස්තරිත කීර්ති (ඇත්තාවූ) උතුම්වූ පුණ්‍යවන්තවූ කුස රාජෝත්තමයා,

574 රූප ශ්‍රී මදයයි කියා අත්හැර තීගේ රූප (ලක්ෂණයට) අභිකාමාන්තයකො ට් අප්‍රගේ වචනය අනුස්මරණයකොකොට අවුදින් වේශවණ්ණ නරයා ලැබුව සකපත්ය.

575 ඒ (කුස) රජයාහට ජාතකකොට ශ්‍රියාවෙන් හරිතවූ පුත්‍රයෙක් ප්‍රසූතකලහො ත් මේ පුණ්මත්තව මේ ලෝකාභ්‍යන්තරයෙහි නරේන්ද්‍රයාගෙනකෙනාගුරුයානක්නෝ වද ?

576 සප්ත සේනාවක් ග්‍රහණයකොට යුඩයපිණිස බෝසෝර්සයින් එයසිකිස් කියා මේ යුණ්ඩත්තෑනැත්තිය (ගැර)ගෙණ යන පරිද්දෙන් සම්ප්‍රාප්තවූ නරේන්ද්‍රෝත්තම යෝ සත් දෙනා,

577 මේ කාලයෙහි මේ නගරයෙහි උතුම්වූ කුස නරේන්ද්‍රතෙම ඇත්හෙව් නම් කණ්ඨයෙහි සිංහනාද පතිතවූ මත්ත හස්තිනු මෙන් වන මාර්ගයෙහි ධාවනයකරත්ය.

578 මෙයාකාරවූ සූර වීර්‍ය ශක්තියකින් යුක්තවූ රාජෝත්තමයෙක් අත්හැරලා මේ උතුම්වූ නුවරට ආගමනයකොට පුණ්මත්තෑනැත්තියට අද (දවස්හි) මරණප්‍රාප්තවූයේය. බෙදයි !

---

(569) කාලාතික්‍රමණය—කාල, අතික්‍රමණය. (570) වීපාභ්‍යන්තරයෙහි—වීප, අභ්‍යන්ත රයෙහි. (571) නරේන්ද්‍රයාහට—නර, ඉන්ද්‍රයාහට. (578) චතුෂ්ෂෂ්ටි—චතුර්, ෂෂ්ටි. ජග දභ්‍යන්තරයෙහි—ජගත්, අභ්‍යන්තරයෙහි. රාජෝත්තමයා—රාජ, උත්තමයා. (575) ලෝ කාභ්‍යන්තරයෙහි—ලෝක, අභ්‍යන්තරයෙහි. නරේන්ද්‍රයෝ—නර, ඉන්ද්‍රයෝ. අනේකා දර—අනේක, ආදර. (576) නරේන්ද්‍රෝත්තමයෝ—නර, ඉන්ද්‍ර, උත්තමයෝ. (577) න රේන්ද්‍ර—නර, ඉන්ද්‍ර. (578) මෙයාකාරවූ—මේ, ආකාරවූ. රාජෝත්තමයෙක්—රාජ, උත්තම යෙක්.

579 මේ වචන ද අසා කුස රජහුගේ ඓශ්වර්‍ය්‍ය බොහෝසෙයින් ඔබයට සහන නොවන පරිද්දෙන් (ප්‍රභාවතී) මහේසිකාව සමග කථනයකොට රෝදනයකළාය.

580 ප්‍රභාවතී (කාන්තාතොමෝ) ඒ (වචනය) ශ්‍රවණයකරමින් සුඛී බංකුට මන්‍යත යන්මු කුස නරේන්ද්‍රතෙම අස්මත්තැනැත්තිය නිසා ආගමනයකොට මේ ස්ථානයෙහි ඉද්දත්යයි කීවාය.

581 මාතෘ චන්ද්‍රිකාතොමෝ ඒ වචන ශ්‍රවණයකොට, ප්‍රභාවතියෙනි, තිට විශේෂයෙන් අනලස්ව මරණය ආසන්නවූ නිසා ප්‍රලාප දොඩන්නීදැයි කීවාය.

582 ප්‍රභාවතී (දේවීතොමෝ) ඒ වචනය ශ්‍රවණයකොට නොවැලකී ශඩ්කා නොවී ජම්බු ද්වීපයට නායකවූ කුස නරේන්ද්‍රයා දර්ශනයකොට චින්තා ශඩ්කාව හරිවයි කියත්තීය.

583 මේ ප්‍රකාරයෙන් ප්‍රභාෂණයකොට මාතෘ මහේසිකාව අඬගගෙණ උඩුමහල් ප්‍රාසාදයට ගමනයකොට විශේෂයෙන් මෙයාකාරයෙන් සැලකුණු කීවාය.

584 කුසකාරයෙකු විලාසයෙන් දූලි කුණු ව්‍යාප්තවූ ශාකුණුශෙත්‍රාන්තුව අර වලත් සෝදන්නාවූ තැනැත්තා කුස රජයාය(යි) නී සැල්හි,

585 ඒ (මාතෘ මහේසිකා) කාන්තාතොමෝ ඒ වචනය ශ්‍රවණයකොට බොහෝසෙයින් දුහිතෘවට කෝපසහිතව චණ්ඩාල කුලයක උපන්නී (ද එසේ) නුවූවහොත් අඩුකුලයක උපන්නී (දැයි කියා),

586 මෙසේ මාතෘ කාන්තාවවිසින් නීකල්හි සොඳුරුවූ රූප ශ්‍රී ඇත්තාවූ ප්‍රභාවතී(දේවී)තොමෝ අමෘතාකාරවූ රසවත් වචනයෙන් මෙයාකාරයෙන් දනුමැති වචන දන්වන්නීය:

587 අඩුවූ කුලයක ද නොමවෙම්; චණ්ඩාල දුහිතෘවකුත් නොවෙම්; මාගේ ස්වාමිවූ කුස නරේන්ද්‍රයාගේ සකලෛශ්වර්‍ය්‍ය සම්පත්තිය මම ද අනුභවනයකරම්,

588 චතුර් වේද ශාස්ත්‍රය ජානනයකළාවූ විංශති සහස්‍රයක් බ්‍රාහ්මණෝත්තමයෝ රසයෙන් මිශ්‍රවූ සුදුසුවූ ආහාරය ඒ රජ භවනයෙන් සෑම දවස් හි ලබත්ය.

---

(580) නරේන්ද්‍ර—නර, ඉන්ද්‍ර. (582) නරේන්ද්‍රයා—නර, ඉන්ද්‍රයා. (583) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (586) අමෘතාකාරවූ—අමෘත, ආකාරවූ. මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (587) නරේන්ද්‍රයාගේ—නර, ඉන්ද්‍රයාගේ. සකලෛශ්වර්‍ය්‍ය—සකල, ඓශ්වර්‍ය්‍ය. (588) බ්‍රාහ්මණෝත්තමයෝ—බ්‍රාහ්මණ, උත්තමයෝ.

Digitized by Google

589 ධරණියෙහි සප්තාඞ්ගයකින් ප්‍රතිෂ්ඨිතවූ යුඞයෙහි ශත්‍රූන් භේදකොට ජයග්‍රහණයකළාවූ විංශති සහස්‍ර ප්‍රමාණවූ නලවාණසහිතවූ මත්ත හස්ති සේනාවෝ හැසිරෙත්ය.

590 ඒ නගරයෙහි විථි මාර්ගයෙහි පෘථිවිය ආක්‍රමණකළාවූ පඤ්චාඞ්ගයක් (ඇත්තාවූ) ක්ෂීරසමුද්‍රයෙහි තරඞ්ගවල කාන්තිය ඇත්තාවූ සඤ්චාරණයකරන්නාවූ අප්‍රමාණවූ තුරඞ්ග සේනාවෝය.

591 මස්තකයෙහි සුවර්ණ ශෘඞ්ගයෙන් සජ්ජිතකළාවූ ප්‍රභාප්‍රාප්තවූ සුවර්ණ ධ්වජාරෝපණයකරණලද්දාවූ විංශති සහස්‍රයක් රථ ද ග්‍රහණයකොට ඒ නගරයෙහි රථ සේනාවෝ සඤ්චාරණයකරත්ය.

592 නිසාභේරි(යයි නම් ඇති බෙර ද) තම්මැට්ට(යයි නම් ලද එකැස්බෙර ද) පෘෂ්ඨයෙහි බන්ධනයකොට කිඞ්කිණීක පට්ටියෙන සජ්ජිතකළාවූ ශෘඞ්ගයට රත්රන් වලලු බඳිණලද්දාවූ ප්‍රමාණාතික්‍රාන්තවූ වාහන සමූහයක් (ද) ඇත්තේය.

593 සුදුසු ලක්ෂණ ඇත්තාවූ උත්තමාඞ්ගනාවෝ විංශති සහස්‍රයක් ධේනූන්ගෙන් රත්රන් භාජනවලින්(හා) රජත භාජනවලින් රජමන්දිරයට සෑම දවස්හි ක්ෂීරය ගෙණෙත්ය.

594 ජම්බුද්වීපයෙහි සකල ජනයන්විසින (හැර)ගෙණයන්නමුත් ඌනත්වයක් නොවන්නාවූ ඒ රජයාණගේ ධනය මේ (මහා) පෘථිවියෙහි පස් ආකාරයෙන් ප්‍රමාණකළ නොහැක්කේය.

595 ශෝභනවූ ප්‍රභාවන් කාන්තාවන්විසින් මේ ආදි රසවත් වචනයෙන් කුස රජයාගේ ඓශ්වර්යය වර්ණනාකරමින් මෙයාකාරයෙන් මාතෘ මහේෂිකාවට කථනයකළ කල්හි,

596 මනෝඥනවූ මහේෂිකා චන්ද්‍රිකාතොමෝ චන්ද්‍ර කාන්තිය ප්‍රවිෂ්ටවූ ක්ෂීරාර්ණවය මෙන් වනා සන්තෝෂ වර්ධනයවී නොයෙක් මේ කාරණය මහා නරේන්ද්‍රයාහට කී කල්හි,

597 (මහා) නරේන්ද්‍රතෙම ඒ (කථාව) ශ්‍රවණයකරමින් හයට පැමිණ ශීඝ්‍රව ආගමනයකොට මහා (බෝධි) සත්ත්වයානවහන්සේ දර්ශනයකරමින් මධුර වචනයෙන් මෙයාකාරයෙන් කියයි:

(589) සප්තාඞ්ගයකින්—සප්ත, අඞ්ගයකින්. (590) පඤ්චාඞ්ගයක්—පඤ්ච, අඞ්ගයක්. (591) ධ්වජාරෝපණය—ධ්වජ, ආරෝපණය. (592) ප්‍රමාණාතික්‍රාන්තවූ—ප්‍රමාණ, අතික්‍රාන්තවූ. (593) උත්තමාඞ්ගනාවෝ—උත්තම, අඞ්ගනාවෝ. (595) මෙයාකාරයෙන්—මේ, ආකාරයෙන්. (596) මනෝඥනවූ—මනඃ, ඥනවූ. ක්ෂීරාර්ණවය—ක්ෂීර, අර්ණවය. නරේන්ද්‍රයාහට—නර, ඉන්ද්‍රයාහට. (597) නරේන්ද්‍ර—නර, ඉන්ද්‍ර. මෙයාකාරයෙන්—මේ, ආකාරයෙන්.

Digitized by Google

598 ජම්බුද්වීප තලයෙහි රජුන්ගේ මස්තකවලට (නමාගත්) ශ්‍රී පාද පද්මය ඇත්තා ලැබූ සිංහ රජුන්ගේ පාදයෙන් යුක්තවූ සකලෛශ්වර්‍ය්‍යකාරණකොටගෙණ සුරේන්ද්‍රයා (හා) සමානවූ,

599 ස්වාමීන්ද්‍රයාණෙනි, දැවරවූ ඔබවහන්සේ නොයෙක රාජ්‍ය ඓශ්වර්‍ය්‍යය හැරදමා සූපකාර කර්මාන්තය කොට මේ නගරයෙහි ඉඳින භාවය නොමජානනයකරම්.

600 (එහෙයින්) ස්වාමීන්ද්‍රයාණෙනි, අස්මත්හුවිසින් විජානනය නොකොට කරණලද්දාවූ වධ්‍යය පුෂ්කරාම්බුවක් මෙන් හෘදයට ග්‍රහණයනොකොට මුදුහුවූ මෛත්‍රී චිත්තයකොට ක්ෂමාකෙළේවීනම් යහපත්වන්නේය.

601 මහා සත්වෝත්තමතෙම (ඒ වචනය) ශ්‍රවණයකොට දන්වූ වචනයක් කිවහොත් භයට පැමිණී වහා හෘදය පැළී මියන්නේය. එසේහෙයින් අද(දවස් හි) මේ (මද්‍ර රජහු) සංග්‍රහණයකොට ලැබියි,

602 මෙයාකාරයෙන් කල්පනාකොට භාජන අතරෙහි ස්ථාපනයකොට ඒ (මද්‍ර නරේන්ද්‍රයාගේ) චිත්තය සන්තුෂ්ටකොට මිහිර වචනයෙන් මෙසේ කියන්නේය:

603 මද්‍ර නරේන්ද්‍රෝත්තමයාණෙනි, අස්මත්ශබ්දවාච්‍යතෙම උතුම්වූ රාජෛශ්වර්‍ය්‍යය අත්හැර අවුදින් ප්‍රභාවතී (නානාපාවට) පත්‍රමයකොට කරිවානුවූ සූපකාර කර්මාන්ත කොට,

604 කරණලද්දාවූ ඒ සියලු දෙයම අන්‍ය කිසිම කාරණයක් නොවන්නේමය ; මාගේ අග මෙහෙසිය ; එසේහෙයින් තිතිකාලයට යුක්තවූ (නෑනාත්තේ) අස්මත්පුත්‍රිකා.

605 මහා(බෝධි)සත්වෝත්තමයාණන්විසින් මෙයාකාරයෙන් කියනලද වචනයට මද්‍ර රජතෙම ස්වල්පනොවූ චිත්ත සන්තෝෂයෙන් අනලස්ව තමාගේ රාජ භවනාභ්‍යන්තරයට ප්‍රවිෂ්ටවී,

606 ප්‍රභාවතියට ආමන්ත්‍රණයකරමින් බොහෝසෙයින් අවවාද වචන දීපයනොකොට කුස රජ්‍යාගේ සමීපයට ගොස් අභිවාදනයකොට ක්ෂමාකරවාගන්නා ඒවසික් කල්හි,

607 ඊතෙම රජයාගේ වචනය ශ්‍රවණයකරමින් තමන්ගේ නෑගෙනියන් සහමග සන්තෝෂයෙන් පරිවාර ස්ත්‍රීන් ග්‍රහණයකොට දිව්‍යාප්සරාවක් මෙන් සජ්ජිතවෙමින්,

---

(598) සකලෛශ්වර්‍ය්‍යය—සකල, ඓශ්වර්‍ය්‍යය. සුරේන්ද්‍රයා—සුර, ඉන්ද්‍රයා. (599) ස්වාමීන්ද්‍රයාණෙනි—ස්වාමි, ඉන්ද්‍රයාණෙනි. (600) පුෂ්කරාම්බුවක්—පුෂ්කර, අම්බුවක්. (601) සත්වෝත්තම—සත්ව, උත්තම. (602) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. නරේන්ද්‍රයාගේ—නර, ඉන්ද්‍රයාගේ. (603) නරේන්ද්‍රෝත්තමයාණෙනි—නර, ඉන්ද්‍ර, උත්තමයාණෙනි. රාජෛශ්වර්‍ය්‍යය—රාජ්‍ය, ඓශ්වර්‍ය්‍යය. (605) සත්වෝත්තමයා—සත්ව, උත්තමයා. මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. භවනාභ්‍යන්තරයට—භවන, අභ්‍යන්තරයට. (607) දිව්‍යාප්සරාවක්—දිව්‍ය, අප්සරාවක්.

Digitized by Google

608 කුස තරණශ්‍රී ස්වාමී රජ හා සේනුවන් පරිද්දෙන් තමා හැර ශිෂ්‍යයට එ ක්‍ෂාවූ මිණිසිකා චන්ද්‍රිකාව පුරදී දුකලා ඒ සාවිත්‍රාවගේ මාත්‍රා මදිනන්තරව විය විහතනහතරමින්,

609 භාජනයෙහි තිබුනාවූ ජලය බලමින්ලාසත් (පමණි) ස්වාමින්ගේ සේවන කෙරමින් බෝසෝසත් මුඛකොට ඒ මධ්‍යයෙහි මහා බෝධිසත්ත්වයන්වහන්සේ සොහොය කතු කල්හි,

610 ප්‍රභාවතියෙහි මණ්ඩ මාරුතය වැදී සමිතවූ ලො ඹිලා ප්‍රභාවතී පරිද්දෙන් මධ්‍ය මධ්‍යයෙහි වැදවැටී සුන්දරවූ භක්ති ප්‍රේමය වර්ණනා කොට කොට හැගිටලා,

611 ඉන් පසු ඔහු පද්මාසන මහා නොකොහි අභිෂේකිරා නව සිටු ශක්‍රපුත්‍රයන් තමින් සහ මෙත් ප්‍රභාවතිකාමෙණී (නමැයෙ) කෝමල ශරීර මහා (බෝධි) සත්ත්වයන්වහන්සේ ගේ පාදයෙහි සර්ාපනාකොට (මෙසේ) කියන්නීය :

612 ශ්‍රී සාරවූ ස්වාමීන්ද්‍රයාණෙනි, මා විසින් මේ සඤ්ජරයට අභිමන්ත්‍රණකොට මේ අනෙකරයි පින් ඇවූ දුඃඛය මේ කරමින් ප්‍රමාණකොට කියනු නොහැක්කේය.

613 ඒතාක්කල්පටන් සිට අස්මත්තොමෝ ද නිද්‍රෝපගතනොවී කලිඟට වනනු අවිජාදනයකොට රස ආහාර අනුභවනොකොට හැම කල්හි බොහෝවූ දුඃඛය විඳින යකොට උන්නෙමය.

614 ශ්‍රීමත්වූ ස්වාමීන්ද්‍රයාණෙනි, මා විසින් කරණලද වරදයක් ඇත්තේවීනම් කරුණා මෛත්‍රිය වර්ණනාකරමින් ක්‍ෂමාකරණලද්දේවීනම් ඔබවහන්සේගේ කීර්තිය වර්ණනාවන්නේය.

615 ඔබවහන්සේ මේ මාහට කෝපවූවහොත් එම කාලයෙහි මාගේ පිතෘ නරේන්ද්‍රතෙම (මා) කැබලි සතකට ඡේදනයකොට සුඛ ප්‍රාප්තවූ සප්ත නරේන්ද්‍රයන්හට දෙවන්න.

616 එහෙයින්, මහත්වූ ස්වාමීනි, අද (දවස්හි) මාරණයට නොහැර මේ මාගේ ජීවිත සාරය රක්‍ෂාකොට ගැණීම මේ ඔබවහන්සේටම භාරවන්නේය.

617 මෙනාකාරයෙන් ප්‍රභාවතී කාන්තාව භික්ෂාභේදකොට රෝදනයකොට විලාපයා මේ දුඃඛ කී කල්හි මධ්‍යස්ථවූ ඒ බෝධි සත්වෝත්තමතෙම ශ්‍රවණයකොට,

---

(610) ප්‍රභාවතීනමැති—ප්‍රභා, අන්තයෙහි. (612) ස්වාමීන්ද්‍රයාණෙනි—ස්වාමි, ඉන්ද්‍රයාණෙනි. (613) නිද්‍රෝපගත—නිද්‍රා, උපගත. (614) ස්වාමීන්ද්‍රයාණෙනි—ස්වාමි, ඉන්ද්‍රයාණෙනි. (615) නරේන්ද්‍ර—නර, ඉන්ද්‍ර. නරේන්ද්‍රයන්හට—නර, ඉන්ද්‍රයන්හට. (617) මේනාකාරයෙන—මෙ, ආකාරයෙන්. සත්වෝත්තම—සත්ව, උත්තම.

Digitized by Google

618 සෝභන ගුණ (ඇත්තාවූ) කුස රාජෝත්තමයෝ මුනීන්ද්‍රයන්ගෙන් (ද) කවීන්ද්‍රයන්ගෙන් (ද) ලද්දාවූ පණ්ඩිතයන්ගෙන් හා යතීන්ද්‍රයන්ගෙන් (ද) සිඳුවූ වචනය ග්‍රහණයනොකොට අත් හැරියෝය.

619 (එබැවින්) මේ කාන්තාවහට කෝපවී දන්වූ වචනයක් කියෙම් වීනම් හෘදය පැළී කාලක්‍රියාකළ කල්හි මේ මාවිසින් විඳිනලාවූ දුඃඛය සාධනයනොවන්නේය.

620 මේ ප්‍රකාරයෙන් චින්තනයකරමින් එ කල්හි බෝධිසත්වතෙම ඒ (ප්‍රභාවතී නම්) රජමෙහෙසිකාව සංසිඳුවා අනාගතයෙහි කීර්තිය පැවතීමපිණිස මෙසේ ප්‍රකාශකරයි:

621 මනෝරම්‍යවූ ප්‍රභාවතියෙනි, මේ යුද්ධමත්තවූ සත්තියන්හට මේ මාගේ ජීවිතාන්තය සිමාකොට (හෙවත්, දක්වා) කාය වාක් චිත්තයෙන් අමනෝඥවූ යම් (කිසි) දෙයක් නොකරමිය.

622 ඒ භාවයෙන් භයට නොපැමිණ අනලස්ව රාජ භවනයට ප්‍රවිෂ්ටව (ආහාර) අනුභවකොට (පැන්) පානයකොට (වස්ත්‍ර) අඳිනලාකොට (ආභරණ) පළඳිනයකොට සැපසේ සිටුවයි (කියා) මෙහෙසිකා උත්තමිය යවා,

දශම සර්ග සමාප්තයි.

623 එ කල්හි පුණ්‍යසාරවූ කුස රාජෝත්තමතෙම නුවර පරික්ෂේපකරගෙණ සිටින්නාවූ ශත්‍රූන් දුරුකොට ලත්තාවූ ඝෝර විජය ඥානයෙන් මෙ පරිද්දෙන් සංලක්ෂණයකෙළේයි:

624 සේනාව පරිවාරකරමින් තන්හි තන්හි ස්පන්දනයකොට ආස්ථාරණයකරමින් තමන්ගේ ශක්තිය හඟවමින් අභීතවූ සිංහ නාදයකරමින්,

625 මේ අස්මින්නුවරින් යුද්ධයට පැමිණිකල්හි ශත්‍රුසේනාවෝ වනයට ප්‍රවිෂ්ටවී ධාවනයකරත්ය. (එකල) ශත්‍රු රජයන් සත් දෙනා ද අතපසුකොට බන්ධනයකොට ගෙණ ආගමනයකරවී(යි),

626 මෙසේ ආකාරයෙන් ගුණය (හා) ඥානය (ඇත්තාවූ) කුස රාජෝත්තමයා කල්පනාකොට සත්තෝය (නමැති) සමුද්‍රයේ මධ්‍යයට සම්ප්‍රාප්තව බාහු සූර සිංහ රාජයෙක් පරිද්දෙන් සිටියේ ල්‍ය,

(618) රාජෝත්තමයෝ—රාජ, උත්තමයෝ. කවීන්ද්‍රයන්ගෙන්—කවි, ඉන්ද්‍රයන්ගෙන් (620) මෙනාකාරයෙන්—මම, ආකාරයෙන්. (621) මනෝරම්‍යවූ—මනඃ, රම්‍යවූ. ජීවිතාන්තය—ජීවිත, අන්තය. (623) රාජෝත්තම—රාජ, උත්තම. (626) මෙයාකාරයෙන—මම, ආකාරයෙන්. රාජෝත්තමයා—රාජ, උත්තමයා.

627 නගරවාසීන්(නමැති) ක්ෂීර සමුද්‍රය වචන(නමැති) අමෘත රශ්මියෙන් සන්තුෂ්ට කොට උදාවූ ඒ නරේන්ද්‍ර(නමැති) චන්ද්‍රයා ඒ රාජාංගණ(නමැති) ආකාශයෙහි දිලි සෙන කල්හි,

628 එ දවස්හි මහා නරේන්ද්‍රතෙම අමන්දවූ භක්ති ප්‍රේමය වර්ධනයකරමින් සන් තෝෂයෙන් වහා කුස රජහුගේ සමීපයට මඟුල් කපුවන් එව්වේය.

629 ඒ දවස්හි දාඪිකාව (හා) ශ්මශ්‍රූ සිද ශීතලවූ සුගන්ධ ජලය ස්නානයකොට අ ත්‍යලංකෘත පරිච්ඡේදන් ආභරණ(හා) ස්නිග්ධ වස්ත්‍ර අච්ඡාදනයකොට,

630 දශ දිශාව අවලෝකනයකරමින් පෘපීය චලනය කරමින් තමාගේ තේජස ජාන නයකරවමින් ප්‍රමාණයක් නැත්තාවූ අනේකාශ්චර්‍යයක් දක්වමින්,

631 හස්ති පෝතනාශබ්දය දූනයකරමින් අගීතවූ සිංහ නාද පවත්වමින් මන්ත්‍රීන්වි සින් පරිවාරිතකරමින් දිව්‍ය රජයකුගේ ප්‍රමාණයෙන් සිටිය කල්හි,

632 අඩ් චන්ද්‍රනා වැනිවූ බුද්බුලයෙන් අලංකෘතවූ විචිත්‍රවූ මුඛ පට්ටාන බන්ධනයකරමින් මනෝනන්දනවූ චාමරයෙන් කර්ණ සජ්ජිතකොට ග්‍රීවයෙහි සව ර්ණ කිංකිණික ජාලා යෝජිතකරමින් ප්‍රභාවෙන් සන්තුෂ්ටවූ රත්රන් සැත් (හා) පොරෝදු (ඇතුව) දළාවල නා ද (ඇත්තාවූ) මාණික්‍ය කිංකිණික දූනයකරවමින් මහා රජයාවිසින් සජ්ජිතකොට යවන ලද්දාවූ හස්තියාගේ පෘෂ්ඨයට කුස රජතෙම ආරූඪවෙමින්,

633 අප්‍රමාණවූ දිව්‍ය සේනාවිසින් පරිවාරකොට ශෝභමානවූ ඓරාවණ (හස්තිරාජ) යාට ආරූඪවෙමින අසුරයන් (හා) යුද්ධපිණිස නික්මුනාවූ ශක්‍ර(දිව්‍ය රාජ)යාගේ ශ්‍රී විභූ තිය දක්වමින් අතිශයින්ප්‍රසන්නවූ ප්‍රභාවතී මහේසිනාව හස්තියාගේ පශ්චිමාසනයෙහි හින්දවාගෙණ අතලස්ව පූර්වද්ශාවෙහි (නුවර) දොරටුව විවෘතකරවා නික්මෙමින්,

634 යුගාන්තයෙහි රෞද්‍රවූ චණ්ඩ මාරුතයෙන් අන්‍යෝන්‍යයන් ගැවසීගෙණ පහළවූ අවිච්ඡින්නවූ මහත්වූ සෙන ඝෝෂා ශතසහස්‍රයක් ඒකාබද්ධව නික්මුනාක් මෙන් ජගත් ප්‍රසි ද්ධවූ තේජසින් යුක්තවූ කුස රජනා තම් අස්මත්ශබ්දවාච්‍යයාය යි ප්‍රකාශකොට දිශාන්ත යෙහි ප්‍රසාරිතව යන පරිද්දෙන තුන් යලක් සිංහ නාද කල කල්හි,

---

(627) නරේන්ද්‍ර—නර, ඉන්ද්‍ර. රාජාංගණ—රාජ, අඞ්ගණ. (628) නරේන්ද්‍ර—නර, ඉන්ද්‍ර. (629) අත්‍යලංකෘත—අති, අලංකෘත. (630) අනේකාශ්චර්‍ය—අනේක, ආශ්චර්‍ය. (632) මනෝනන්දනවූ—මනෝ, නන්දනවූ. (633) පශ්චිමාසනයෙහි—පශ්චිම, ආසනයෙහි. (634) යුගාන්තයෙහි—යුග, අන්තයෙහි. අන්‍යෝන්‍යයන්—අන්‍ය, අන්‍යයන්. දිශාන්තයෙහි—දිශා, අන්තයෙහි,

Digitized by Google

635 දිවාකරයා උදය පර්වතයට ප්‍රාප්තවූ කල්හි දුරුවන්නාවූ ඝනාන්ධකාරයක් මෙන් ද එක්සත්වූ සිංහ රාජ සෙනඟගේ නාදය ශ්‍රවණයකරමින් ධාවනයකොට යන්නාවූ හස්ති සමූහයක් මෙන් ද දිගාන්තයෙහි ප්‍රසාරිතවූ නික්මුණාවූ අග්නිය(හා) ධූමය දුටුවාවූ හාධගයන් පරිද්දෙන් ද ශත්‍රු සේනාව බොහෝසෙයින් ද භය ගෙණ [illegible] රයට ප්‍රවිෂ්ටව ගමනයකළ කල්හි,

636 සූර්ය වංශයට අග්‍රවූ කුස නරේන්ද්‍රතෙම ඒ තමාගේ සන්නද්ධ තේජස දක්වමින් ශත්‍රු [illegible] [illegible] ශත්‍රු රාජයන් දෙනා (මිවුන්ගේ) උත්තර ශාටකවලින්ම මිවුන් [illegible] බොහෝසෙයින් [illegible] ශ්‍රීය [illegible] කොට දශ දිශාවෙහි කීර්තිය ප්‍රසාරිතකරමින් සංග්‍රාම භූමි මණ්ඩලයෙහි සිටිය කල්හි,

637 කිසි ආයුධයක් හස්තයට ග්‍රහණය නොකොට (ගල්) කැටයක්වත් ප්‍රහාර දානය නොකොට මැස්සෙකුවිසින් පානයකරණ ප්‍රමාණයක්වත් ශරීරයෙන් රුධිරය වැගිරීම නොකොට මහත්වූ සිංහ නාදය කරණලද, ප්‍රමාණයෙන් [illegible] ශත්‍රු(රාජයන්) සත් දෙනා භේදකොට ජය ග්‍රහණයකොට කරණලද්දාවූ බල වික්‍රම විචිත්‍රය නිරීක්ෂණයකොට ශක්‍ර දිව්‍යරාජතෙම සන්තුෂ්ටව,

638 තරුණවූ බාලාර්කයාගේ රශ්මිය පරිද්දෙන් නික්මුණාවූ මාණික්‍ය රශ්මි (යුක්තවූ) [illegible] උද්[illegible] [illegible] මාණික්‍ය රත්නයක් ග්‍රහණයකොට වික්‍රම ඇත්තාවූ කුස රජහුගේ හස්තයෙහි [illegible] විකාරය [illegible] භූතකොට ශක්‍ර (දිව්‍ය) රාජතෙම බොහෝසෙයින් සතුතිකොට සන්තෝෂයෙන් දිව්‍ය පුරයට ප්‍රවිෂ්ටවූයේය.

639 (ශක්‍ර) දිව්‍යරාජයාවිසින් (හැරී) ගෙනවුත් [illegible] මාණික්‍ය රත්නයෙහි ආනුභාවයෙන් ද පූර්වයෙහි කරණලද්දාවූ පාප (කර්ම) එ දවස්හි [illegible] ප්‍රාප්තකළදෙය සිඛවන භාවයෙන් ද දිව්‍ය පුරයෙන් ධරණී(තල)යට අවතීර්ණවූ ශ්‍රීමත්වූ පුරේන්ද්‍රයෙකුගේ විලාසයෙන් උතුම්වූ සෝභාවූ ශරීර ක්‍රියාවෙන් පූර්ණ සාරවූ මහා (බෝධි) සත්වතෙම විජයමහමා හවූයේය.

---

(635) ඝනාන්ධකාරයක් — ඝන, අන්ධකාරයක්. දිගාන්තයෙහි — දිග, අන්තයෙහි. (636) නරේන්ද්‍ර — නර, ඉන්ද්‍ර. (638) බාලාර්කයාගේ — බාල, අර්කයාගේ. (639) පුරේන්ද්‍රයෙකුගේ — පුර, ඉන්ද්‍රයෙකුගේ.

Digitized by Google

640 (එවරවන) දිව්‍ය නගර රාජයාට අාරූඪව දිව්‍ය සේනාව පරිවාරකොට ප්‍රීතිප්‍රමෝදයට පත් (හෙවත්, අසුරයන්) ජය ග්‍රහණය කොට ප්‍රමුදිතවූ ඍෂ්‍ය ශ්‍රී ඇත්තාවූ ශක්‍රයා (නමුවූ අසුර නතනාව) හැරගෙන දිව්‍ය පුරයට පැමිණියාවූ සුරේන්ද්‍රයා පරිද්දෙන් මහත්වූ උස්වූ මණ්ඩල හස්තියාට ආරූඪවෙමින් පරිවාරසහිතාව ප්‍රභාවතී මහේෂිකාව (හැර) ගෙණ සවිලපනොවූ රාජ්‍ය ශ්‍රීයෙන් (යුක්තව) කුස රාජෝත්තමයා උතුම්වූ නගරයට ප්‍රවිෂ්ටවෙමින්,

641 තාරකාය, කුන්දය, චන්ද්‍රයාය, (මුක්තා) හාරය, කෛලාස පර්වතය (සහ ඛන්ද්‍රතා) සාදෘශ්‍යවූ කීර්තිය දසදිශාවෙහි පූරණයකරමින් විශ්‍ර (නමැති) ශ්‍රීකාන්තාව හෘදයෙහි ධාරණයකොට සුඛයෙන් ජයග්‍රහණයකලාවූ කුස රාජෝත්තමතෙම අනල්ප ශත්‍රු රාජයන් සත් දෙනා (ඇත්) නොසෑර අල්ප්‍රාණයෙන් සාකෙය සලකාකොට බද්ධකය කොට හැරගෙණ නගරයට පැමිණ මද්‍ර රාජයාට භාරකොට දැනකර සන්තෝෂයෙන් මේ ප්‍රකාරයෙන් කථනයකරයි:

ඒකාදශ සර්ග සමාප්තයි.

642 ශ්‍රීමත්වූ ස්වාමීන්ද්‍රයාණෙනි, මේ (හැර) ගෙණ ආවාවූ ශත්‍රු රාජයන් සත් දෙනා මේ ස්ථානයෙහිම මාරණයකරන්නේවීනමුත්, නැතහොත් ජීවිත දානයකරමින් (අත්) හරින්නේනමුත්,

643 මේ රාජයන්හට ඔබවහන්සේ කැමති ආකාරයක් කරවයි (කියා) මද්‍ර රාජයා හට කී කල්හි ඒ (මද්‍ර) නරේන්ද්‍රතෙම (එය) ශ්‍රවණයකොට මෙයාකාරයෙන් කථනය කරයි:

644 ශ්‍රීමත්වූ ස්වාමීන්ද්‍රයාණෙනි, සකල ජම්බුද්වීපයෙහි රජවරුන්ට ද මේ නරේන්ද්‍රයන් සත් දෙනාහට ද මේ ඔබවහන්සේගේ ප්‍රතිඥාවය, අන්‍ය ප්‍රතිඥාවක් නැත්තේය.

645 එහෙයිහෙයින් ජගද්‍රක්ෂිවූ ස්වාමීන්, මේ ඔබවහන්සේවිසින් වදාරණලද ආකාරයක් සවල්පයකුත් නොවරදවා කරමියි (මද්‍ර) රාජතෙම නොවෙණසව කීයේය.

646 ඒ (මද්‍ර) රජ්ජුරුවිසින් කථනයකලාවූ ඒ වචනය ශ්‍රවණයකොට අතිශයින්මහත්වූ මහා (බෝධි) සත්වතෙම මේ කාලයෙහි සප්ත නරේන්ද්‍රයන් විනාශකලාඤ්ඤත් වන්නාවූ ඵලය කිමෙක්ද(යි),

---

(640) සුරේන්ද්‍රයා—සුර, ඉන්ද්‍රයා. රාජෝත්තමව—රාජ, උත්තම. (641) රාජෝත්තම—රාජ, උත්තම. (642) ස්වාමීන්ද්‍රයාණෙනි—ස්වාමී, ඉන්ද්‍රයාණෙනි. (643) නරේන්ද්‍ර—නර, ඉන්ද්‍ර. මෙයාකාරයෙන—මෙ, ආකාරයෙන්. (644) ස්වාමීන්ද්‍රයාණෙනි—ස්වාමී, ඉන්ද්‍රයාණෙනි. නරේන්ද්‍රයන්—නර, ඉන්ද්‍රයන්. (645) ජගද්‍රක්ෂිවූ—ජගත්, රක්ෂිවූ. (646) නරේන්ද්‍රයන්—නර, ඉන්ද්‍රයන්.

Digitized by Google

647 මෙසේකාරයෙන් කල්පනාකොට අනාගතයෙහි කීර්තිය පැවතීමට අමෘත රස වූ වචනයෙන් මේ අපගේ බෝධිසත්ත්වතෙම මෙයාකාරයෙන් ප්‍රකාශකරයි:

648 දිව්‍යාඞ්ගනාවන් මෙන් දිලියෙන්නාවූ ප්‍රභාවතියගේ නැගනියන් සත් දෙනා මේ දවස්හි මේ (සත්) රජදරුවන්ට අග්‍ර මහේෂිකා කොට දානයකරවයි (කියා) සන්තෝෂයෙන්,

649 බෝධි සත්ත්වෝත්තමයාවිසින් කීකල්හි (එය) ශ්‍රවණයකොට මද්‍ර රාජතෙම සන්තුෂ්ටව, ස්වාමිනි, අප සියලු දෙනාහට ද මුල්වී සිටිනතැනැත්තේ මේ ඔබවහන්සේ වේද?

650 එසේහෙයින් ස්වාමිනි, ඔබවහන්සේගේ චිත්තයට හැකිතුදෙයක් සිඩකිරීමයි කිය අප්‍රමත්තව කියන්නේ කුමටද? මේ ඔබවහන්සේට කැමති ආකාරයක් කළ මනාව (කියා),

651 (මද්‍ර) රජයාවිසින් මෙයාකාරයෙන් කීහෙයින් කුස රාජෝත්තමතෙම සන්තුෂ්ටව ඒ ක්ෂණයෙහි ඒ නගරය දිව්‍යපුරයක් මෙන් සජ්ජිතකරවමින්,

652 කුමාරිකාවන්ට ආමන්ත්‍රණයකොට සජ්ජිතකළාවූ දිව්‍යාඞ්ගනාවන් පරාජයකොට ස්නිග්ධවූ ශුභ්‍රවර්ණවූ ශාටක අවිජාදනයකරවා ආභරණ පිලන්ධනයකරවා,

653 රක්තවර්ණවූ පියුම් සතක මස්තකයෙහි විකසිතවූ නෙළුම් මල් සතක් (හැර) හෙණ (එකක් මුදුනෙහි එකක් බැගින්) ගව්කුරුකොටතැබූවාක් මෙන් ඒ (කුමාරිකාවන්ගේ) අත් රජයන්ගේ හස්තවල ස්ථාපනයකරමින්,

654 උභය පාර්ශ්වයෙහි උත්තමාඞ්ගනාවන් සිට ආශිර්වාදකිරීමට සලස්වා ජය වාදි මඞ්ගල්‍යකොට මෙයාකාරයෙන් කාරබන්ධනයකොට දානයකරමින්,

655 පරිවාර(ජන)යන් එක්ව බහා ප්‍රමාණාතික්‍රාන්තවූ සකලෛශ්වර්‍ය්‍ය (ද) ශ්‍රීසාරවූ කුමාරිකාවන් සත් දෙනා ද,

656 ග්‍රහණයකොට තම තමන්ගේ නගරයට යන මෙන් භාරකොට දානයකරමින් උතුම්වූ සප්ත රජයන්හට මහා සත්ත්වෝත්තමයාවිසින් මනෝරම්‍යවූ ප්‍රිය වචනයෙන් අවසරය දෙවීවිය.

---

(647) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (648) දිව්‍යාඞ්ගනාවන්—දිව්‍ය, අඞ්ගනාවන්. (649) සත්ත්වෝත්තමයා—සත්ත්ව, උත්තමයා. (651) මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. රාජෝත්තම—රාජ, උත්තම. (652) දිව්‍යාඞ්ගනාවන්—දිව්‍ය, අඞ්ගනාවන්. (654) උත්තමාඞ්ගනාවන්—උත්තම, අඞ්ගනාවන්. මෙයාකාරයෙන්—මෙ, ආකාරයෙන්. (655) ප්‍රමාණාතික්‍රාන්තවූ—ප්‍රමාණ, අතික්‍රාන්තවූ. සකලෛශ්වර්‍ය්‍ය—සකල, ඓශ්වර්‍ය්‍ය. (656) සත්ත්වෝත්තමයා—සත්ත්ව, උත්තමයා. මනෝරම්‍යවූ—මනෝ, රම්‍යවූ.

Digitized by Google

657 ඒ ක්ෂණයෙහි සප්ත නරේන්ද්‍රයෝ මහා(බෝධි)සත්ත්වයන්වහන්සේගේ චරණයෙහි ශීතලාශ්‍රය (ඇත්තාවූ) නඛ රශ්මි (නමැති) ගඞ්ගාවෙහි නිමග්නව භයාග්නිය නිර්වාපණය කොට ස්වකීය දේශවලට ප්‍රයාණයකළෝය.

658 සහාබ්ධ තේජසකරණකොටගෙණ සූර්‍ය්‍යයා(හා ද) නිර්මල බලයකරණකොටගෙණ මේරුපර්වතය(හා ද) ඥානයකරණකොටගෙණ බෘහස්පති(හු ද) සාදෘශ්‍යවූ මහත් ඓශ්වර්‍ය්‍යයකරණකොටගෙණ ශක්‍රයා(හා ද) සමානවූ,

659 උතුම්වූ මහා බෝධිසත්ත්වතෙම ආදරකොට මනෝරම්‍යවූ මාතුල රජයාගෙන් අවසරගෙණ පරිවාරවූ චතුරඞ්ගිනී සේනාව හාසමග,

660 ස්වාමීන්ද්‍රතෙම ශරීර ශ්‍රීයෙන් දිව්‍යාඞ්ගනාවක් මෙන් භ්‍රාජිතවන්නාවූ මනෝනන්දනීයවූ අග්‍ර මහේසිකා උත්තම්ය (හැර)ගෙණ සාගල නගරයෙන් නික්ම,

661 ශ්වේතවර්ණවූ අශ්වයන් යොදනලද්දාවූ මාරුතයෙන් කම්පාවන්නාවූ රත්රන් ධ්වජ (ඇත්තාවූ) යහපත්වූ රථ යානාවකට ආරූඪව ස්වාමීන්ද්‍රතෙම මාර්ගයට ප්‍රතිපන්නව,

662 උභය රාෂ්ට්‍රයෙහි ජනයාවිසින් විශේෂයෙන් සජ්ජිතකළාවූ මාර්ගාන්තරයෙහි තන්හි තන්හි සර්වාසගෙණ (හෙවත්, නවාතැන්ගෙණ) දුක්රහිතව ශත යෝජන මාර්ග ක්ෂේපණයකොට,

663 පූර්ණ චන්ද්‍රයා පරිද්දෙන් සකල සත්ත්වයන්ගේ චිත්ත (නමැති) කුමුද ප්‍රබෝධකොට බොහෝවූ රාජෛශ්වර්‍ය්‍යයෙන් (යුක්තව) කුසාවතී නගරය සමීපයට ප්‍රාප්ත කල්හි,

මාදශ සගීය සමාප්තයි.

664 මහා(බෝධි)සත්ත්වයන්වහන්සේ වඩින්නායයි යන වචනය ශ්‍රවණයකොට මේඝ ඝෝෂාව ශ්‍රවණයකොට සන්තුෂ්ටවූ මයූරාඞ්ගනාවක් (හෙවත්, මයූර ධේනුවක්) පරිද්දෙන් සන්තෝෂය වර්ධනයකොට මානා (මහේසිකා) උත්තම්ය,

665 චතුරඞ්ගිනී සේනාව (හැර)ගෙණ බොහෝසෙයින් වෙන් වෙන්වූ රසෝපකරණ සජ්ජිතකොටගෙණ සන්තෝෂයෙන් අභිමුඛ මාර්ගයට පැමිණි කල්හි,

359 මේ කවෙන් අභවත්යේ ඉර බැස්මෙන් නෙලුම් මල් පරවී ඒවායේ උන් මීමැස්සෝ අහක්ව ගිය බවයි.

360 මන් යොන් යුදට, යනු රති ක්‍රීඩාව සඳහා කියනලදී.

362 ඇසේ, සබද විබත්.

363 පබවත, කතු හෝ සබද.

මේ කවෙන් අභවත්නේ ස්වභාවයෙන් සිත් සතුටුකරණ දෙයට මේ ප්‍රසන්නාවෙන් කුමරජුගේ සිත නැලුනුබවයි.

364 රජඳු, යනු මෙහි 'දේව' යන අර්ථයි. මෙහි 'රජ' යන්නේ ස්ත්‍රීලිඞ්ගය කියන ශබ්දය ලෙසද යෙදේ.

367 මහසන්, කතු හෝ සබද.

368 කරබා සිටිති සිතු ඇඳි සිතියම් ලෙසින, යන්නෙන් නාටක ස්ත්‍රීන් නිසොල්මන්ව නිශ්ශබ්දව නරබා සිටිබවයි.

369 අනුරාගය, ඉතා දීර්ඝකාලයකි. (ගැටපද විවරණය බලනු.)

372 එන, භාවක්‍රියාව. නොක් සමග ගන්කල්හි අවද විබත් අර්ථයි.

374 ඉන්, කරණ.

375 සෙන්, කතු හෝ සබද.

376 මා, කතු හෝ සබද.

එන, අවද විබත්හිවූ භාවක්‍රියාව.

379 ..යවට, කම් නොහොත් සපදන් විබත්.

විටක්, කම් විබත්.

381 මෙහි 'පසවිය' හෙවත් පංචායුධ නම්:—දුන්න, මුගුර, කඩුව, කොන්තය, හොවීය හෙවත් හෙල්ලය.

384 ඉඳින, ඉඳනා කල්හි කියාද සන්නකරති.

Digitized by Google

386 සියතින් පතුල් දෙක දෙවා, යන්මෙන් පුරාණ පැවතුන ආගන්තුක සත්කාරයක් දක්නා ලැබේ. පා සෝදා තෙල් ගැල්වීමද කෙළේය. මෙහි 'පතුල්' දුන් ව්‍යවහාරවෙන අර්ථයකි නොව 'පාද' යන්නෙහි වේ.

387 වලදවා, ගෞරව පිණිස මේ ක්‍රියාව යොදන ලදී.

392 කිම්නරක්, තාගින්ක් යනු මුල් අර්ථයයි: මෙයද මේ ස්ථානයට අප්‍රයෝග්‍ය නොවේ.

400 දිටන් කර, අඳිටන් කර කවමනා තැන අ කාරය ලෝපකොට 'දිටන්කර' කියා යොදනලදී.

402 කෙළේ, අපි ක්‍රියාවයි.

404 බඳු, පෙර ඒබන් ජිය යුතුයි. එසේ කල්හි මෙය බහුවචන වේ. එසේ නැතහොත් 'බඳු' එකබස කතා විබත් කියා ගතයුතුයි—එවිට මෙය විබත් පෙරළියට උදාහරණයකි.

406 නිසෙයාබින්, කරණ.

දෙවූ, කතා විබත්.

408 කලං, භාව ක්‍රියාව.

මිනිසත්, කතා විබත්.

409 සාගුන්, සබඳ විබත්.

උක්ත කර්ම වේ.'

412 මම, 'මට' යන අර්ථය. එළිසමකිරීම සඳහා පෙර විබත යොදනලදැයි සිතේ.

417 විමනෙහි, මුද්‍රිත ග්‍රන්ථයේ ගෙවත් කුසගිය පිළිබඳව යෙදීම නොමැත්තේ. විමන යනු මාළිගාවට ද උතුම් ගෘහයට ද නමි.

පිළිපැද, ප්‍රතිපන්නව: ක්‍රියාකොට හෙවත් වැඩකර යන අර්ථයි.

419 බත් කීස, හක්ත නාමය: බත්කෑම පිළිබඳ ක්‍රියාව හෙවත් කටයුතු.

422 දෙක, කතා විබත්.

425 සිව්යෙන්, රසයෙන්, } කාරණ.

429 ඇස, කරණ.

435 පෙපෙර්ගෙවි, පේක බැන්තාලයේ තැදුන වචනයකි, හෙවත් සංස්කෘතාදියෙහි 'දේශි' යන්නෙන් කියැවෙන වචනයයි.

මිය, යන නිපාතයෙන් උක්තවන්නේ 'මෙහිම' යනුයි. 'සිටින්' යනු අගට යෙදුනකල අර්ථය සම්පූර්ණවේ. මෙහි, මෙන් වශයෙන් ගත් කල අදර ඒබමෙන් වේ.

438 දෙමෙහි, දමෙහි කිවමනා තැන දෙමෙවයි කියා පද පෙරළුම් ක්‍රමයෙන් සිඳවී තිබේ.

441 මුර, තමුන් යන අර්ථය.

දවසක්, කාම විබත්.

ඔබ, කතා: සහ යන නිපාතයෙන් උක්තයි.

අප, සබඳ විබත්

446 (4) සා, අසබ නම් කිරිය.

449 නරමෙය්, ක්‍රියා විශේෂණවූ නිපාතයකි.

Digitized by Google

452 කෙළේ, ත්‍රෛකාලික ක්‍රියාවයි: උක්ත කුයා 'තමා' නොහොත් (අනුමානයෙන් යොදාගතයුතු) 'පබවති' වේ.

453 මහසත්, කතෘ හෝ සබඳ.
කෙනෙක්, බුහු බස.

460 තල, සබඳ හෝ කතෘ.

468 උවද, 'වුවද' යන්නෙහි 'වි' කාරය ලොප්වී සිඩයි. වුවහොත් යන අදිසි.
තොප, කතෘ විබත්,
උව, 'උවද' මෙන් සිඩයි.
මෙහි සනුට මල්පිප්මට සමානකරණලදී.

469 යෙදෙයි, සිඩවන්නේය යනු අර්ථයි.

473 කොකෙක්, කතෘ හෝ සබඳ.

477 යෙම් යෙතත්, යම් යතත් යන්නට පිළි පෙරළීමකාට සිඩයි.

479 යෙදෙද, සිඩවේද යන අර්ථයි

480 උත්, 'ඔහු' හෙවත් 'ඔව්හු' වියයුතු තැන 'උත්' කියා කතෘ විබත් යෙදීතිබේ.

481 හිම්, අවදි විබත්.

485 යෙම්, 'යම්' යන්නේ පිළි පෙරළී සිඩයි.
තිව්ව, බුහු බස.

489 තමම්නි, නවම්නි කියාද පාඨයි.

490 උදය, අදර විබත්.

491 මෙනෙ, නැම අම පිළිබඳ නටයුතු කියනලදී.
සොවයින, 'එමතැන' කියාත් පාඨයි.

494 යෙදුවොත්, ලැබෙන ලෙස සැලැස්සුවොත් යන අභිප්‍රායයි.

496 මන, පෙර විබත් (පිණයන පූර්වක්‍රියාවෙන් උක්තයි); අපරක්‍රියාවක් නෑ.

500 මේ කවේ මුල් පද දෙකින් අභවන්නේ කුස රජුගේ ප්‍රධාන භාවයයි.

504 අදකින්, නොමදින්, දුගැවින්: කරණ විබත්.

507 ඇය, කතෘ හෝ සබඳ.

512 සිලෙත් සරණ නිය රුස්ගහ, යන්නෙන් පාද ළඟ වැටී නමස්කාරකිරීම ප්‍රකාශවේ.

517 සාමි දුවක්, මෙය 'දෙව්දු' මෙන් 'සාමි' යන්නේ ස්ත්‍රී ලිඩගය ප්‍රකාශකිරීමට යොදන ලදී.

523 නො වරදීනෙවි හිම පහළත්, පෘථිවිපාලයාගේ (හෙවත් රජුගේ) අර්ථය (හෙවත් අදහස) නො වරදින්නාක් මෙන්, කියාද මීට සමහරු අර්ථ කියති.

524 රස, කරණ විබත්.

525 බෝසත්, පෙර විබත් (බෑද, වීද යන පූර්ව ක්‍රියාවලින් උක්තයි.)

531 ඉඳිනේ, ත්‍රෛකාලික ක්‍රියාව.

536 නැත, මෙහි 'ඇත' අසබ හැව කිරිය වේ.

537 රදු, පෙර විබත් (පවසා යන පූර්ව ක්‍රියාවෙන් උක්තයි.)

Digitized by Google

546 කිමෙවනි, ක්‍රමයෙන් කියාද අර්ථ කිය හැකිය.

547 මට, සබඳ හෝ සපදන්.

548 කැලැකින්, කරණ.

550 දෙසවණත්, 'දෙසවණුත්' කියාද පාඨයි.

551 කසත්, ක්‍රියාව එකවචනයෙහි තිබුනු නමුත් එළිසමකිරීම සඳහා බහුවචනයේ රූපය යොදනලද්. එසේ නැතහොත් 'වදකරු' බහුවචනයකැයි සැලකිය යුතුයි.

552 කුස, අදර විබත්.

553 තුබ, කම් විබත්.

556 මගා, අදර. ග කාරයෙහි සිටින ආ කාරය එළිසමකිරීමපිණිස අ කාරය වෙනුවට යොදනලද්.

මඟා, කියාද පාඨයි.

557 වීලසම, කරණ අර්ථයෙහි සපදන්.

560 මේ කවෙහි අග දෙපදය සමහර පොතක මෙසේය.

කිහිසිඳු වෙසිනවූ ත්
තොලස්වම රජ විමන් දෙර පත්.

563 දූ, කතු විබත්.

ඔබට, සපදන් හෝ සබඳ.

565 මිස, මේ නිපාතයෙන් උක්තකාරක කර්මයනම් ඊට පූර්වයෙන් තිබෙන 'මහසෙන්' යන්නෙන් පටන් ගෙණ 'දී' යන්නෙන් අවසානවූ වාක්‍ය කැබැල්ල වේ.

මොවුන්, කම් හෝ සබඳ.

577 වනතුර, කම් විබත්. වනාන්තරයෙහි හෝ වනාන්තරයට කියාද මීට අර්ථ කිය හැකියි.

581 තොපට, සපදන් හෝ සබඳ.

582 දඹදිවට, සපදන් හෝ සබඳ.

588 (4) වර, කාලයෙහි කියාද අර්ථ කිය හැකිය.

589 සතණින්, කරණ විබත්.

590 දර හසල පසඟ, පෘථිවිය ආශ්‍රයකළාවූ පඤ්චාඞ්ගය නම් පා සතර සහ වලිගය විය යුතුයි.

599 නොම දනිමි, ඒකාන්තයෙන් නොදනිමි. ම කාරය නො යන නිපාතයේ අර්ථය ස්ථිර කිරීමට යොදනලදී. කාව්‍යවල බොහෝවිට මේ ම නිපාතය පද පූරණය පිණිස ම යෙදේ. ගද්‍ය හෙවත් වාසගම්හි එසේ යෙදීම සුදුසු නොවේ.

600 පොකුරඹ මෙන්, නෙළුම් පතේ වක්කරණලද වතුර යන්නම්වත් නොරඳ පතවසයි.

608 මේ කවේ 'රද තුම' යන්නෙහි උතුම්ද ඊළඟ තිබෙන 'උතුම්'ද සමානාර්ථ නමුත් පළමුවෙනි 'උතුම' ගරුබව ඇඟවීමේ පදයක්ලෙස යෙදී තිබේ. මෙහි අන්තිම පදේ කැමී, කමී යන පද දෙකද සමාන අර්ථ. නමුත් කැමි සමාස පදයක කොටසක් බැවින් 'කම' යෙදුනා වරදක් නොවේ.

Digitized by Google

604 අත, සමීපයෙහි යන අර්ථයි.
සුපුපු, නාම පදය. පෙර විබත් ('වෙමි' කියා යොදාගතයුතු ක්‍රියාවෙන් උක්තයි.)

608 දුර, අදර විබත්.

612 තෙකැයි, මෙහි තෙක නාමපදයකි.

619 (2) 'කිමෙව' කිය යුතු තැන 'කිමෙව්' කියා අන්‍යකාරකයෙහි යෙදූ නිසා 'කියන ලද්දේ' කියා අර්ථ කිය යුතුවේ. එවිට 'කිමෙව්' කර්මකාරක ක්‍රියාවකි.

622 (3) කා, බී, ඇඳ, පැලඳ, සකර්මක ක්‍රියා නමුත් මෙහිදී අකර්මක්ලෙස යොදන ලදහ.

632 පිට, කම් විබත්.

634 සිහනද, සිංහයෙකුගේ නාදයට සමානවූ නාදය හෝ ශබ්දය කියා ගතයුතුයි.

638 (3) උර පලඳවමින, ලැපැත්ත මත්තෙහි තිබෙනලෙස නූලකින් මැණික නරේ එල්ලූබව හැයේ.

639 පව්, පෙර විබත් ('ගෙවී' යන්නෙන් උක්තයි.)
පැතුවා, අර්ථ ක්‍රියාව: කතෘ හෝ සබඳ.

640 මඟුලැතුට, සපදත් හෝ කම්.
සිරිත්, කරණ.

641 තාර, කොඳ, සද, හාර, හරගිර, යනු ලෝක ප්‍රසිද්ධ වස්තු බැවින් උපමාවට යොදනලදී.

643 ඔබ, සබඳ හෝ කතෘ.

650 හැකුනක්, අර්ථ ක්‍රියාව: කම් හෝ සබඳ විබත්.

653 මෙයින් හැඟෙන්නේ එක එක රජයාගේ (දකුණතේ) අල්ල මත්තෙහි එක එක කුමාරිකාවගේ (දකුණතේ) අල්ල තැබූබවයි.

668 දෙදෙව්ලොව, චාතුර්මහාරාජිකය තාවතිංසය යන දෙක වේ.

671 ඉක්මන්නමනිසා ආභරණ පලඳින ස්ථාන මතකනැතිව් බෙල්ලේ බඳින ආභරණය කටියෙහිද කටියේ බඳින ආභරණය බෙල්ලේද බැන්දබව කියනලදී.

673 තල, කම් විබත්.

674 දිව්‍ය ස්ත්‍රීයෝ ඇස් පියගැහීම නොකරති. (දෙවිවරුද යක්‍ෂ යක්‍ෂිණියෝද එසේමය.)

675 (2) පමාවූ අඟනක් සොඳ, කියාද පාඨයි.

677 නියොගින්, කරණ.

678 තියෝ, යන්නෙන් කුසරජ පබවති යන දෙදෙනා කියවෙත්.

679 බුදුවරු ධර්මදේශනාකරණ කල බ්‍රහ්මයාගේ ශබ්ද වැනි ගඹුරු ශබ්දයක් පතුරුවති.

684 (4) 'වෙමි' කියා ම ශබ්දකාරකයෙහි යෙදිය යුතු තැන 'වෙද' කියා අන්‍යකාරකයෙහි යොදනලදී. ආවාවද, කීවාවද යනාදි තැන්වල 'වද' ශබ්ද 'වෙද'ට සමානයි. මෙ වැනි ස්ථානවල 'වද', 'වෙද' නිපාතලෙස සැලකිය යුතුයි.

686 සහ 687 අන්‍යකාරකයෙන් කියනලද නිසත් මෙසේ පණ්ඩිතයන් විසින් තමන්ගේ ගුණ වර්ණනාකිරීම සමහර පූර්විදිග පඬිවරුන්ගේ චාරිත්‍රයක් නිසාද 'මුකවෙර්ණුමා ගුණ

Digitized by Google

තුම්', 'ගැඹර කිරි නළ හසළු අලුකියවත්න මුනාවෙට්ටුමා පබඳ' කියායෙද්ම මරදක්යයි නොසලකත්.

687 සකවසින්, කරණ.

'සිඹිරසතු' යනු ශුභයක් (නොහොත් අභිවෘද්ධියක් නොහොත් අභිමතාර්ථය) වේවා යනු අදහසයි.

සැලකිය යුත්තක්—මේ අන්තිමවූ කාණ්ඩයේ සමහර සමාස වචන වලට ඇතුලත්වූ නාමපදවලට විභක්ති කියන ලද්දේ සමාසවශයෙන් පසු වෙන් තේරුම්ගැනීම පහසුවන්නවන පිණිසය.

Digitized by Google

කුසජාතක සිංහල වාසගම.

(එළු ජාතකපොතෙන් ගන්නාලදි. අබෝලිපිවල ඉලක්කම් ඒවාට ඉහළින් තිබෙන වාසගමේ පේළිවල ගණන් හා සම්බන්ධයි.)

ඒවද දශබල ධාරීවූ සුරාසුර වර වක්‍ර වාරු චූඩා මණි මරීචි පරිචුම්බිත චරණ යුගල ඇති සර්වඥයන්වහන්සේ ජේත නම් රජ කුමාරයන්ගේ උයන්හි අනේපිඩු මහසිටානන් විසින් සිව්පණස් කෙළක් ධන වියදම්කරවා පිළිගන්වනලද රත්‍රිස්ථාන දිවාස්ථාන චඞ්ක්‍රමණ මණ්ඩපමාලකාදීන් විරාජමානවූ පද්මෝත්පල කුමුද කුවලය කල්හාර කුසුමෝපශෝභිත පුෂ්කරිණීන් රම්‍යවූ භූමි ප්‍රදේශ ඇති ජේතවන මහාවිහාරයෙහි දිව්‍ය බ්‍රහ්ම ආර්ය ඊර්ය්‍යාපථ විහරණයෙන් දවස් යවනසේක් සස්නෙහි උකටලීවූ එක්තර භික්ෂුකෙනෙකුන්වහන්සේ අරභයා මේ කුසජාතක ධර්මදේශනාව වදාළසේක.

සැවැත් නුවර වසන්නාවූ එක්තර කුලපුත්‍රයෙක් බුදුසස්නෙහි පැවිදි මහණව එක් දවසක් සැවැත් නුවර පිඩු සිගා ඇවිදිනේ සර්වාභරණ විභූෂිතවූ එක් මාතුගාමයකු දැක ශුභ නිමිත්තක් ග්‍රහණයෙන් බලා ක්ලේශ වසඟව ශාසනයෙහි ඇලුම් නැතිව දික්වූ නිය කෙස් හා ඉපිලුණු නහර බහන් හා කිලුටුවූ සිවුරු හා සුදුමැලිවූ සිරුරු ඇතිව වසන්නේය. යම්සේ දිව්‍ය ලෝකයෙන් චුතවන්නාවූ දිව්‍යපුත්‍රයන්ට පැලඳි මල් මලානිකවීමය, දිවසළු කිලුටුවීමය, ශරීරය දුර්වර්ණයට පැමිණීමය, දෙ කිසිල්ලෙන් ඩා වැගිරීමය, දිව්‍යලෝකයෙහි ආලය මදවීමය, යන මේ පඤ්ච පූර්ව නිමිත්තයෝ පහළවෙද්ද එ පරිද්දෙන්ම උකටලීවූ සිත් ඇතිව ශාසනයෙහි පිරිහෙණු කැමති භික්ෂූණ්ටත් සැදැහැ නමැති මල් මලානිකවීමය, සිල්නමැති පිලි කිලුටුවීමය, තරබැහැම් හා නුගුණ පැතිරෙමින් විරූපබවට පැමිණීමය, ක්ලේශ නමැති ඩා වැගිරීමය, විවේක ස්ථානයෙහි නො ඇලීමය, යන මේ පඤ්ච පූර්ව නිමිත්තයෝ පහළ වන්නාහ. ඒ මහණහටද එ නිය... ලද පස් වැදෑරුම්වූ අගුණයෝ පහළවූහ. ඒ බව දුන සෙසු භික්ෂූන්වහන්සේ ඒ මහණ... නොකමැතිකරවා බුදුන් සමීපයට කැඳවාගෙණගොස් 'ස්වාමීනි, මූ ශාසනයෙහි උකට... ලීවූය' යි දැන්වූසේක. එකල සර්වඥයන්වහන්සේ 'මහණ, තා ශාසනයෙහි උකටලීවූ... සැබෑද' යි විචාරා, 'සැබව, ස්වාමීනි,' දැන්වූ කල්හි, 'මහණෙනි, ක්ලේශ වසඟව ... පවතුව; මේ මාතුගාමයෝ නම් පව්වුවූ සත්ව කෙනෙකැයි ඔවුන් කෙරෙහි ... සිත් හැර ශාසනයෙහි ඇලී වාසයකරව; ස්ත්‍රීන්කෙරෙහි පිළිබඳසිත් නිසා ... උත් පුරාතනෙහි නුවණැත්තෝ තේජසින් පිරිහී නොයෙක් වැසනයට ...

1 සුරාසුර=සුර, අසුර. 4 පද්මෝත්පල=පද්ම, උත්පල. 5 කුසුමෝ... කුසුම, උපශෝභිත. 9 සර්වාභරණ=සර්ව, ආභරණ. 12 පැලඳිමල්—උ... මල්ගෑණ ක්ෂණලද්. 13 දිවසළුත් එසේමය. 25 නුවණැත්තෝ=නුවණ, ඇ...

Digitized by Google

වේදැ' යි වදාරා ඒ භික්ෂූන්වහන්සේ විසින් ආරාධිතවූ පර දුක්ඛ දුක්ඛිතවූ කරුණා නිධානවූ තිලෝගුරු බුදුරජාණන්වහන්සේ කඩතුරාවක් පහකොට විචිත්‍ර චිත්‍ර කර්මාන්ත යක් දක්වන කෙනෙකුන් පරිද්දෙන් භවයෙන් ප්‍රතිච්ඡන්නවූ ඉකුත්වත් කථාව ඤාණ යුගාන්ත මහාමේඝයක් නැගී වස්නා කලක් පරිද්දෙන් ගෙණහැර දක්වාවදාරණසේක්:—

යටගිය දවස මල්ල රට කුශාවතී නම් නුවර ඔක්කාක නම් රජ්ජුරුකෙනෙක් දශරාජ ධර්මයෙන් දැහැමින් රාජ්‍යයකරන්නාහ. ඔහුගේ සොළොස්දහසක් පුරඞ්ගනාවන්ට ප්‍රධානවූ ශීලවතී නම් අග්‍රමෙහෙසුන් බිසෝකෙනෙක් වූහ; දූ පුත් දරුකෙනෙක් නැත්තාහ. එකල නුවර වැස්සෝ හා රාජ්‍යවාසීන් හා රජ දොරට රැස්ව 'රට නස්නේය, විනාශවන්නේය' යි මහත්කොට කෝලාහලකළාහුය. ඒ කෝලාහල ඇසූ රජ්ජුරුවෝ සිව්මැදුරුකවුළුව හරවා 'මා රාජ්‍යයකරමින් සිටියදී අන්‍යායක් කරණ කෙනෙක් නැත්තාහ, කුමක්නිසා මොරගැසුද්ද' යි විචාළාහ. එසඳ ඔවුන් විසින් 'සැබව, දේවයන්වහන්ස, අධර්මකාරි කෙනෙක් නැත, වංශ පරිපාලනයකරණ්ට නිසි රජ දරුකෙනෙක් නැත්තාහ, අනික් කෙනෙකුන් රාජ්‍යය හැරගෙණ අධර්මයෙන් රාජ්‍යය නසති; ඒ කාරණයෙන් දැහැමින් රාජ්‍යයකරණ්ට නිසි පුත්‍රකෙනෙකුන් පැතුව මැනවැ' යි කීහ. එසඳ රජ්ජුරුවෝ ද 'දරුවන් ප්‍රාර්ථනාකරන්නාවූ මා විසින් කුමක් කට යුතුද්ද' යි විචාළාහුය. 'දේවයන්වහන්ස, නුඹවහන්සේගේ තුන් වැදෑරුම්වූ නාටක ස්ත්‍රීන්ගෙන් පළමුකොට රැකවල් ඇතිව පිටත ඉන්නාවූ සුළු නළු මුලූ රැකවල් හැර ස්ත්‍රීන් සිත් සේ ඇවිදිණ්ට හැර වදාළ මැනව; ඉදින් එක් කෙනෙකුන් දරු කෙනෙක් ලද්දූ නම් මැනව, නැත් නම් ඉක්බිති අග මෙහෙසුන් බිසවුන්වහන්සේ හැර අවශේෂ ස්ත්‍රීන් හළ මැනව; ඒ කාන්තයෙන් මෙතෙක් දෙනා අතුරෙන් කුසල් ඇති කෙනෙක් දරු කෙනෙකුන් ලබති' කීවාහුය. එ කල රජ්ජුරුවෝ ඔවුන්ගේ බසින් එ ලෙස කරවාත් දරු කෙනෙකුන් නොලදින් නොසතුටුවූහ. නැවත නුවර වැස්සෝ රැස්ව කෝලාහල කළාහ. ඒ අසා රජ්ජුරුවෝ 'තොප හැම කීමෙන් පුරඟනන් රැකවල් හරවාත් එතෙක් දෙනාගෙන් දරු කෙනෙකුන් ලත් කෙනෙක් නැත; දැන් කුමක් කරමෝද්ද' යි විචාරා ඔවුන් විසින් 'දේවයන්වහන්ස, මේ සියලු ස්ත්‍රීහු දුරාචාරවූ කුසල් මඳ සත්ව කෙනෙක, මොවුණ්ට දරු පින් නැතැයි නුඹවහන්සේ නිරුත්සාහනුව මැනව, අග මෙහෙසුන්වූ ශීලවතී දේවීන්වහන්සේ ශීලාචාර සම්පන්නසේක, උන්වහන්සේ රැකවලින් හළ මැනව, දරු කෙනෙක් ඇති වෙති' කී සඳ රජ්ජුරුවෝ එ බස් පිළිගෙණ නුවර වැසියන් රැස්කරවා ශීලවතී දේවීන්වහන්සේ සම්භාරණයෙන් සරහා මාළිගාවෙන් පිටත්කළාහුය. එ කෙණෙහි බිසවුන්ගේ ශීලානුභාවයෙන් ශක්‍ර දේවේන්ද්‍රයන්ගේ පාණ්ඩුකම්බල ශෛලාසනය උන් නොකමැති පරිද්දෙන් හුණුවිය. එක ණෙහි 'මීට කාරණ කිම්දෝහෝ' යි තමන්ගේ දහසක් නුවණැස් මෙහෙයා බලා ශීල

1 පර දුක්ඛ දුක්ඛිතවූ—පර දුඃඛ දුඃඛිතවූ, යනුද පාඨයි. 6 රාජ්‍යයකරන්නාහ—ශබ්ද පද විවරණයෙහි 'රාජ්‍යය' බලනු. 31 ශීලානුභාවයෙන්=ශීල, අනුභාවයෙන්.

Digitized by Google

තී දේවීන් දරුවන් පතන නිසාව දක 'මා විසින් උණ්ම දරු කෙනෙකුත් දිය යුතුය' යි සිතා සියලු තව්තිසා භවනය බලාගෙණ ගොස් එසේත් චුතව මත්තෙහි දිව්‍යලෝකයට යනු කැමතිව සිටියාවූ බෝධිසත්වයන් දක ශක්‍ර දේවේන්ද්‍රයෝ ඔහුගේ විමන් දොරට ගොස් 'සබඳ, තොප විසින් මනුෂ්‍ය ලෝකයට ගොස් ඔක්කාක රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් කුස පිළිසිඳ ගත යුතුය' යි කියා ගිවිස්වා අන් දිව්‍ය පුත්‍රයෙකුත් එලෙසම ගිවිස්වා 'කවුරුත් බිසවුන්ගේ ශීල භේදය නොකෙරෙත්ව' යි සිතා තුමූ මහළු බමුණු වෙසක් මවාගෙණ රජ්ජුරුවන්ගේ මාලිගා දොරට ගියාහුය. එ සඳ රැස්වූ බොහෝ දෙන ඒ ශක්‍ර බ්‍රාහ්මණයා දක 'කුමක්නිසා මෙතනට ආයෙහිද' යි යනාදීන් පරිභව බැණ ඒවාලාහ. ඒ අසා ශක්‍රදේවේන්ද්‍රයෝද 'කුමකැයි මට නින්‍දා කරවුද? ශරීරය ජරාප්‍රාප්ත පමණක් විනා රාගය තරුණවන්නේය. ඉදින් ශීලවතී දේවින් ලදින්නම් ගෙණයෙමි සිතා ආමි' කියා තමන්ගේ ආනුභාවයෙන් හැම දෙනාට පෙරටව සිටගෙණ පිටත්වූ බිසවුන් අත අල්වාගෙණ ඒ සියලු ජනයා නින්‍දාපරිභවනොකෙරෙමින් සිටියදී නික්මුණේය. එ සඳ බිසව් ද 'මේ මහළු බමුණු මා ගෙණයන්නේය' යි පිළිකුලෙන් පෙළී ලජ්ජාවට පැමිණියෝය. රජ්ජුරුවෝ ද බමුණු මාල්ලා විසින් ගෙණ යනලද බිසවුන් දක නොසතුටුවූය.

ඉක්බිති ශක්‍ර දේවේන්ද්‍රයෝ බිසවුන් අරගෙණ නුවර වාසලින් පිටත්ව වාසල් සමීපයෙහි පණවනලද දඹුමැසි ඇති හරණලද දොර පැලලි ඇති පැල්පත්තක් මවා පැල සමීපයට ගියේය. එ කල බිසව් 'මේ නුබගේ ගෙදරදූ' යි විචාරා බමුණු විසින් 'එසේය, සොඳුර, පළමු මම උදකලායෙමි, දන් අපි දෙදෙනෙක් වූම්හ; එහෙයින් මා සල් මාලු ආදිය සිඟාගෙණ එන තෙක් මේ මැස්සේ වැදහොව' යි කියා බිසවුන් ඇඟ මොලකතින් පිරිමැද දිව පහස පතුරුවා නිදීගන්වා දිව පහස ලැබ විසංඥව නිදණ්ට වන් සඳ තමන්ගේ ආනුභාවයෙන් බිසවුන් තව්තිසා භවනයට ගෙණගොස් සරහණලද දිව්‍ය විමානයෙක්හි අතුරණලද දිව යහන්හි සතපාලූහ. ඉක්බිති බිසව් සතියකින් පිබිද එහි දිව්‍ය ලෝකයෙහි සම්පත් දක 'මෙ මා ගෙණායේ මිනිසෙක් නොවෙයි, ශක්‍රදේවේන්ද්‍රයෝ වන' යි සිතා යහනින් නැගී නොයෙක් දිව නළුවන් විසින් පිරිවරණලදුව පරසතු රුක මුල පඩුඇඹුල් සල් අස්නෙහි ඉඳ දිව ඉසුරු විඳිනාවූ සක් දෙව් රජහු කරා ගොස් වැඳ එකත් පස්ව සිටියේය. එකල ශක්‍ර දේවේන්ද්‍රයෝ 'තොපට වරදනයක් දෙමි, කැමති වරයක් ඉල්වාගෙණ' යි කීහ. එ බස් අසා සතුටුවූ බිසව් 'දේවයන්වහන්ස, මට පුත්‍ර වරයක් දුනමැනවැ' යි ඉල්වූය. එ කල ශක්‍ර දේවේන්ද්‍රයෝ 'දේවිනි, එක් කෙනෙකුත් තබා දරුවන් දෙන්නකු දෙමි; බල, ඉන් එක්කෙනෙක් නුවණැතිව රුව නැති වෙති, එක් කෙනෙක් රූ ඇතිව නුවණ නැති වෙති; ඔවුන් දෙදෙනාගෙන් පළමුව කවුරුත් ලබන්නාදැයි' විචාරා 'නුවණැති තැනැත්තන් පළමුව ලබන්නා කැමැත්තෙමි' කී සඳ එ බස් ශක්‍ර දේවේන්ද්‍රයෝ පිළිගෙණ ඒ බිසවුණ්ට කුසතණ මිටක් ද දිව සළුවක් ද දිව සඳුන් හරයක් ද පරසතු

21 මොලකතින්=මොලක්, අතින්.

Digitized by Google

ම ග මල් ද කොකනද නම් වීණාවක් ද දී බිසවුන් කැඳවා ගෙණ දුවුන් රජ්ජුරුවන්ගේ ශ්‍රීයහන් ගබඩාවට වැද රජ්ජුරුවන් හා එක් යහන්කරවා තමාගේ පය මහපටඇඟිල් ලෙන් බිසවුන්ගේ පෙකණිය පිරිමැද සුරපුරටම නැගී ගියාහ. එකෙණෙහි පුරණලද බෝධි සම්භාර ඇති අප මහබෝසතාණෝ තව්තිසා භවනයෙන් චුතව අවුත් ශීලවතී දේවීන් බඩ පිළිසිඳ ගත්හ.

බිසවුන් තමන් කුස දරුගැබ පිහිටි බව දත්හ. ඉක්බිති රජ්ජුරුවෝ පිඹිද බිසවුන් දැක 'දේවීන, කවුරුන් විසින් ගෙණ යන ලද්දද' යි විචාරා, 'ශක්‍ර දේවේන්ද්‍රයන් විසිනැ' යි, කී කල්හි, 'කිමෙක් ද, මහළු බමුණකු ගෙණගිය නියාව මම දිටිම්; කු මක් නිසා මට වලහා ක්වද්ද' යි කිවුය. 'දේවයන්වහන්ස, අදහා ගතමැනව, ශක්‍ර දේ වේන්ද්‍රයෝ මා හැර ගෙණ දිව්‍යලෝකයට ගියාහුය' යි දෙවෙනිව තුන්වෙනිවත් කියා ගිවිස්වා ලිය නොහී ශක්‍ර දේවේන්ද්‍රයන් විසින් දෙනලද කුසතණ හා දිව සළු ආදිය පෑ ගිවිස්වා, 'එන්නාට ශක්‍ර දේවේන්ද්‍රයෝ තොප ගෙණ ගියෝය, දරු කෙනෙකුන් ලද්දද' යි විචාරා, 'එසේය, දේවයන්වහන්ස, දරු කෙනෙකුන් ලදිම්' කිව්ය. එ බස් අසා සතුටුවූ රජ්ජුරුවෝ බිසවුණ්ට ගබපෙරහර දුන්හ.

ඉක්බිති බිසව් ද ක්‍රමයෙන් දසඑකඩ මසක් ඇවෑමෙන් පුතනු කෙනෙකුන් වැදූහ. ඒ කුමාරයාට 'කුශ' කුමාරයෝය යි නම් තැබූහ. ඒ කුශකුමාරයන් පියවර නගා ඇවිදිනා කාලයෙහි අනික් දිව්‍යපුත්‍රයෙක් දෙව ලොවින් අවුත් බිසවුන් කුස පිළිසිඳ උපන්හ. ඔහට 'ජයම්පතිය' යි නම් තැබූහ. ඒ රජ කුමාරවරු දෙදෙන මහත්වූ පෙරහරින් පෙරඩමස සඳසේ වැඩිව්ය පැමිණියෝය. මහා බෝසතාණයෝ තමන් ද්‍රව්‍යණැති බැවින් සියලු ශිල්පයන් ආචාරි කෙනෙකුන් ගත් නොසිගෙණ සිය නුවණි න්ම දැන නිමවූහ.

ඉක්බිති බෝසතාණයන් සොළොස් ඇවිරිදි වයසට පැමිණි කල්හි පිය රජ්ජුරු වෝ කුමාරයන් රාජ්‍ය අභිෂේකකරණු කැමතිව බිසවුන් කැඳවා 'දේවීනි, තො පගේ පුතනුවන් අභිෂේකකරවා නාටක ස්ත්‍රීන් හා ඓශ්වර්ය පාවා දී ජීවත්වන්නාවූ අපි රාජ්‍යයෙහි පිහිටියාහුගේ ශ්‍රී විභූතිය දකුම්හ. මේ මුළු දඹදිව යම් රජකෙනෙකුගේ දූවක් කැමතිවේද උන් ගෙන්වා අග මෙහෙසුන් කරවම්හ. කවර රජ්ජුරු කෙනෙ කුන්ගෙ කුමාරිකාවක් කැමැත්තෝද ? උන්ගේ අභිප්‍රාය දැන කියව' යි කීහ. බිසවුන් 'යහපතැ' යි ගිවිස 'කුමාරයාණ්ට මෙ පවත් කියා අභිප්‍රාය විචාරා ගෙණ එව' යි කියා කාම්මින්තක යවූහ. ඒ ස්ත්‍රී ගොසින් බෝධිසත්වයාණ්ට එ පවත් කීව්ය. ඒ අසා මහ බෝසතාණෝ 'මම රූ නැත්තෙමි, රූප ශ්‍රීන් යුක්තවූ රජ කුමාරිකාවක් ගෙණෙන ලද්දේ නම් මා දැක 'යකකු මෙන් විරූපවූ මොහුගෙන් මට කම් කිම්ද' යි පලායන්නීය. ඒ අපට ලජ්ජා නාවුනු වන්නේය, එසේ හෙයින් මට ගෘහාවාසයෙන් ප්‍රයෝජන

12 පෑ—පා සත අජීස්. 15 දසඑකඩ මසක්—සමහර පොත්වල 'දසමසක්' කියාතිබේ.

Digitized by Google

නෑත; මව් පිය දෙදෙනා ජීවත්වෙන තෙක් උපස්ථානකොට ගුරු දෙදෙනා ඇවෑමෙන් ගොස් මහණවෙමි' යි සිතා මහාබෝධිසත්ත්වයෝ තමන්ගේ මේ අදහස ඒ කම්මිත්තියට කීහ. ඕ තොමෝ ගොස් එ පවත් බිසවුන්ට කීව. බිසව් එ පවත් රජ්ජුරුවන්ට කීහ. ඒ අසා රජ්ජුරුවෝ නොසතුටුවූහ. නැවත කීප දවසකින් එම ලෙසම කියා යවූහ. බෝධිසත්ත්වයෝ නොකැමැත්තෝය යි තුන් යලක් වලකා සතරවෙනි වාරයෙහි 'දෙ මව් පියන් ක්වා නොකොට වරදවා පිළිපැදීම කටයුතු නොවෙයි; ඊට නිසි උපදේශයක් කෙරෙමි' යි සිතා මහා බෝධිසත්ත්වයෝ තරල් දෙටුවෙකු කැඳවා බොහෝ රත්රන් දී එක් ස්ත්‍රී රූපයක් කොට ගෙණෙව' යි කියා ඔහු නික්මවා තුමූ රත්රනින් ස්ත්‍රී රූපයක් කළෝය. බෝධිසත්ත්වයන්ගේ අභිප්‍රාය සිතූ පැතූ ලෙසම සිඬවන බැවින් එ රන් රුව කියා නිමවිය නොහැකි රූප ශෝභා ඇත්තේ වී. එ කල මහා බෝධිසත්ත්වයෝ එ රන් රුව සුරත් කොමු පිළියක් අඳවා ශ්‍රී යහන් ගබීයෙහි සිටුවූහ. ඉක්බිති බෝධිසත්ත්වයෝ තරහල් ඇදුරා විසින් ගෙණෙනලද රන් රුවට නිසු කොට 'යව, අපගේ ගබීයෙහි තුබූ ස්වර්ණ රූපය ගෙණෙව' යි ස්වර්ණකාරයාහට නියෝගකෙළේය. එ සඳ ඒ ගොස් ශ්‍රී යහන් ගබීයට වැද එ රන් රුව දැක 'කුමාරයන්වහන්සේ හා සමග ක්‍රීඩා පිණිස ආ දිව්‍යාප්සරාවක් වනැ' යි සිතා අත දික්කරණ්ටත් නොපොහොසත්ව බෝධිසත්ත්වයන් කරා ගොස් 'දේවයන්වහන්ස, බිසවුන්වහන්සේ නක්වච වැඩසිටී හෙයින් වැද්ද නොහෙමි' කීය. නැවත බෝධිසත්ත්වයන් විසින් 'ඇදුර, ඒ රන් රුවය, සැක නැතිව ගැර ගෙණ එයි' කියා යවනලදුව ගොස් ගෙණයේය. ඉක්බිති බෝධිසත්ත්වයෝ බඩාලා ගෙණ රුව රත්රන් ගබෙහි ලවා තමන් කළ රුව ආභරණ ආදීන් සරහා රථ යානාවෙක්හි තබා 'මෙබඳු රූප ශ්‍රී ඇති කෙනෙකුන් ලදීම් නම් පාවාගණිමි' යි කියා රන් රුව් මෑනියන් සමීපයට යවූහ. ඒ දැක බිසව් සතුටුව අමාත්‍යයන් රැස්කරවා 'සගයෙනි, ම පුතණුවෝ නම් මහ පිණැත්තාහ; ශක්‍ර දේවේන්ද්‍රයන් විසින් දෙනලද කෙනෙක. එ හෙයින් සුදුසු කුමාරිකා කෙනෙකුන් ලැබෙති; තෙපි හැම මෙ රන් රුව පිළිසත් රථ යානාවෙක තබා ගෙණ මුළු දඹදිව ඇවිදීමින් යම් රජ්ජුරු කෙනෙකුන්ගේ මෙ බඳු රූ ඇති කුමාරිකාවක දුටු නම් ඒ රජහට මෙ රන් රුව දී 'ඔක්කාක රජ්ජුරුවන්වහන්සේ තුබවහන්සේ හා සමග විවාහ සම්බන්ධයක් කරණු කැමතිසේකැ' යි කියා දවස් නියමකොටගෙණ එව' යි නියෝගකළාහුය.

එ සඳ ඒ නියෝග ලද ඇමතියෝ මහ පෙරහරින් එ රන් රුව හැරගෙණ ඇවිදිනාහු යම් නුවරකට පැමිණෙද්ද එහි සවස් වේලෙහි බොහෝ දෙනා රැස්වෙන තැනක ඒ රන් රුව වස්ත්‍රාභරණ කුසුමාදීන් සරහා රන් සිවිගෙයක්හි තබා පැන්තොටට යන එන මංහස සිටුවා තුමූ ඉවත්ව යන එන්නන් බස් අසන පිණිස සැඟවී සිටිනාහ. එ කල බොහෝ දෙන එ රන් රුව දැක රන් රුවකැයි නොදැන 'මනුෂ්‍යවූවත් මෝ

15 දිව්‍යාප්සරාවක්=දිව්‍ය, අප්සරාවක්. 22 පිණැත්තාහ=පින්, ඇත්තාහ.

Digitized by Google

තොමෝ දිව්‍යාප්සරාවක මෙන් ඉතා හොබනීය. මෝ තොමෝ කොයි සිට අවුත් කුමක් නිසා මෙ තන සිටියෝද; අපගේ නුවර මෙබඳු රූප ශ්‍රීන් ඇති කෙනෙක් නැතැ' යි යනාදීන් ප්‍රශංසාකෙරෙමින් යත්නාහ. එ කල අමාත්‍යයෝ 'ඉදින් මේ නුවර මෙ බඳුවූ කුමාරිකා කෙනෙකක් ඇත්තම් 'අසෝ රජ්ජුරුවන්ගේ අමාත්‍යයන්ගේ දියනියන් වනියෝය' යි කියති. එසේ නොකියෝනම් ඒකාන්තයෙන් මෙ බඳු රූ ඇති කෙනෙකුන් මේ නුවර නැති හෙයිනැ' යි ඒ රුව හැර ගෙණ අනික් නුවරකට යත්නාහ. මේ ලෙස ක්‍රමයෙන් ගොස් මද්‍රරට සාගල නුවරට පැමිණියාහුය. එ නුවර මද්‍ර රජ්ජුරුවන්ගේ දිව්‍ය ස්ත්‍රීන් හා සමානව උතුම්වූ රූප ශෝභා ඇති දූ අට දෙනෙක් ඇත. ඔවුන් ඇම දෙනාට වැඩිමාලූ ප්‍රභාවතීන්ගේ ශරීරයෙන් හැම වේලෙහි බාලාර්ක රශ්මියට බඳුවූ පැහැ විහිදුවන්ය. ඝන අන්ධකාරවූත් රාත්‍රියෙහි සතර රියන් ගෙයෙක්හි ප්‍රදීපාලෝකයක් නැතිව ශරීරාලෝකයෙන්ම ඒකාලෝක වන්නේය. උණ්ට කිරිමව්වූ කුදු තොමෝ ප්‍රභාවතීණ්ට නහන පැන් ගෙණෙනු පිණිස ස්ත්‍රීන් අට දෙනෙකු ලවා රන් කල අටක් ගෙන්වාගෙණ සවස් වේලෙහි පැනට යන්නී ඔක්කාක රජ්ජුරුවන්ගේ රන් රුව ගෙණ පුරුෂයන් විසින් මංහස සිටුවනලද රුව දැක ප්‍රභාවතිය යන සිතින් ලඟට ගොස් 'මේ නොකීකරු දරුවෝ අප පැනට එවා තුමූ මේ වේලේ පලමුකොට අවුදින් මෙතන සිටියෝය; රජ කුලයට පරිභව උපදවන්නාවූ කෙල්ල, ඉදින් රජ්ජුරුවන්වහන්සේ දන්සේක් වීනම් අප හැම නසාපියනසේකැ' යි කියා කිපී නොපුලනෙහි පාරක් ගැසුව. එකෙණෙහි අත්ල පැළී යන කලක් පරිද්දෙන් වේදනාවට පැමිණ රන් රුවකැයි දැන ලජ්ජාව සිතාසෙමින්, 'බලග, මා කල දෙයක; මම් මාගේ දියනියනැ යි සිතා පහරක් ගැසීමි; මෝ තොමෝ මාගේ දරුවන්ගේ රුවට කුමක් අගීද? මාගේ අතට ආයාසවූ පමණෙකැ' යි තමා හා එක්ව ගියවුණ්ට කීව. එ බස් අසා රජ පුරුෂයෝ 'මාගේ දියනියෝ මීටත් වඩා රුව ඇත්තාහ යි කියන්නාවූ තෙපි කුමක් කියව්දැ' යි විචාලාහ. එ කල ඔවුණ්ට 'මේ රන් රුව මද්‍ර රජ්ජුරුවන්ගේ දියනියන් ප්‍රභාවතීන්ගේ රූප ශ්‍රීන් සොළොස්වන කලාවෙන් කලාවකුත් නොහගනේය' යි කුද කීව. ඔහු එ බස් අසා සතුටුව රජ ගෙයි වාසලට ගොස් 'ඔක්කාක රජ්ජුරුවන්ගෙන් ආ දූතයෝ වාසල සිටියාහුය' යි මද්‍ර රජ්ජුරුවණ්ට කියා යවූහ. එ බස් අසා මද්‍ර රජ්ජුරුවෝ හුණස්නෙන් නැගී සිට 'ගෙණව ගෙණෙව' යි වහා ගෙන්වාගෙණ දුටුහ. එ කල දූතයෝ 'දේවයන්වහන්ස, අපගේ රජ්ජුරුවන් වහන්සේ නුබවහන්සේගේ සුව දුක් විචාළසේක' යනාදීන් කථාකොට භාරණලද සම්භාවනා ඇතිව රජ්ජුරුවන් විසින් 'කුමක් පිණිස අවිදු' යි විචාළ කල්හි 'අපගේ රජ්ජුරුවන්වහන්සේගේ සිංහ ගර්ජනාවට බඳුවූ අභීත නාද ඇති කුශ නම් කුමාරයෙක් ඇත; අපගේ රජ්ජුරුවන්වහන්සේ උන්වහන්සේට රාජ්‍යය දෙනු කැමතිසේක; නුබවහන්සේ සමීපයට එවූසේක; නුබවහන්සේගේ ප්‍රභාවතී නම්

---

10 ප්‍රදීපාලෝකයක්=ප්‍රදීප, ආලෝකයක්. 11 ශරීරාලෝකයෙන්ම=ශරීර, ආලෝකයෙන්ම. 26 හුණස්නෙන්=හුන්, අස්නෙන්.

Digitized by Google

කුමාරිකාවන්වහන්සේ ගේ රන්රුව වියදමට ඇරගෙණ දෙවාවදාළ මැනවැ' යි කීවිය. ඒ අසා මද්‍ර රජ්ජුරුවෝ 'මේ බඳුවූ මහ රජ්ජුරු කෙනෙකුන් හා සමග විවාහ සම්බන්ධයක් වන්නේය' යි සතුටුව 'මැනව' යි ගිවිස්සාහ. එ කල දූතයෝ 'අප විසින් කල් යැවිය නොහැකැයි, වහා ගොස් රාජ කුමාරි කෙනෙක් ඇති නියාව අපගේ රජ්ජුරුවන්වහන්සේට කියම්ම: උන්වහන්සේම අවුත් කැඳවාගෙණයනසේකැ' යි කීවුය. රජ්ජුරුවෝත් 'යහපතැ' යි පිළිගෙණ දූතයණ්ට ප්‍රසාද දී යවූහ. ඔහු ගොස් එ පවත් රජ්ජුරුවණ්ට හා බිසවුණ්ට කීවිය. එ පවත් අසා ඔක්කාක රජ්ජුරුවෝ මහ පිරිවරින් කුශාවතී නුවරින් නික්ම ක්‍රමයෙන් ගොස් සාගල නුවරට පැමිණියාහ. එ බව අසා මද්‍ර රජ්ජුරුවෝ සිව්රඟ සෙනග පිරිවරා පෙර ගමන් ගොස් නුවරට කැඳවාගෙණවුත් මහත් සත්කාර සම්භාවනා කළාහුය. කීප දවසකින් ඔක්කාක රජ්ජුරුවන්ගේ ශීලවතී දේවී තොමෝ නුවණැති බැවින් 'කවුරු දනිද්ද' යි සිතා 'රජ්ජුරුවන්වහන්ස, ලේලනියන් දක්නා කැමැත්තම්හ' යි මද්‍ර රජ්ජුරුවණ්ට කීවුය. රජ්ජුරුවෝත් 'මැනවැ' යි පිළිගෙණ දියනියන් කැඳවා යවූය. එ සඳ ප්‍රභාවතී සර්වාභරණයෙන් සැරසී කිරිමවුන් විසින් පිරිවරණ ලදුව අවුත් නැන්දනියන් දැකලා සිටියාහ. ශීලවතී දේවී ප්‍රභාවතීන් දැක 'මේ කුමාරිකා යහපත් රූ ඇත්තීය, මා පුතනුවෝ විරූපයහ, ඉදින් මූ උන් දුටුවූ නම් එක දවසකුන් නොරඳා පලායන්නාහ, ඊට නිසි උපායක් කෙරෙම්' සිතා ඉක්බිති බිසව් 'මහ රජ, මාගේ යෙහෙළනියෝ මා පුතනුවන්වහන්සේට නිස්සාහ; එතකුදුවූවත් අපගේ වංශ පරම්පරාවෙන් පැවත එන චාරිත්‍රයෙක් ඇත; ඉදින් මූ එ ලෙස පිළිපදිත් නම් කැඳවාගෙණ යම්හ' යි මද්‍ර රජ්ජුරුවණ්ට කීවුය. එපවත් අසා මද්‍ර රජ්ජුරුවෝ 'කවර ආචාරයෙක්ද' යි විචාළහ. 'අපගේ වංශයෙහි දරුගැබ්යක් පිහිටන තෙක් ස්ත්‍රීහු දවල් ස්වාමි පුත්‍රයා දකිණ්ට නොලැබෙති; ඉදින් මූ එ ලෙස පවතිත් නම් කැඳවාගෙණ යම්හ' යි කීවිය. ඒ අසා රජ්ජුරුවෝ 'දියනියනි, එ ලෙස පවතිණ්ට පිළිවන්ද' යි විචාළහ. ප්‍රභාවතී 'යහපතැ' යි ගිවිස්සාහ. ඉක්බිති ඔක්කාක රජ්ජුරුවෝ මද්‍ර රජ්ජුරුවණ්ට බොහෝ සම්පත් දී ප්‍රභාවතීන් කැඳවාගෙණ ගියාහ. මද්‍රරජ්ජුරුවෝත් මහ පිරිවරින් දියනියන් නික්මවූහ. ඔක්කාක රජ්ජුරුවෝ ගොස් කුශාවතී නුවර දිව්‍ය පුරයක් මෙන් සරහා බැඳන ගත සියලු සත්වයන් මුදා හරවා පුතනුවණ්ට ප්‍රභාවතීන් අගමෙහෙසුන් කොට අභිෂේකකරවා 'කුසරජ්ජුරුවන්ගේ ආඥාය' යි අණබෙර ලවා සේසත් නැංවූහ. දඹ දිව සියලු රජ දරුවෝ තම තමන්ගේ දරුවන් කුස රජ්ජුරුවණ්ට සේවය පිණිස එවූහ. එ කල බෝධිසත්වයෝ තළ නාටකාදි මහත් පිරිවරින් යුක්තව අපමණවූ ඓශ්වර්‍ය්‍යයෙන් රාජ්‍ය ශ්‍රී විඳිනාහ.

එ සඳ කුසරජ්ජුරුවන් හා ප්‍රභාවතීදේවිය හා දෙදෙනා දිවා භාගයෙහි ඔවුනොවුන් නොදැක රාත්‍රියෙහිම දක්නාහ. ඒ ප්‍රභාවතීන්ගේ ශරීර ශෝභාව මහා බෝධි

---

13 සර්වාභරණයෙන්=සර්ව, ආභරණයෙන්.

Digitized by Google

සත්වයන්ගේ තේජසින් සූර්‍ය්‍යාලෝකයෙහි ඛද්‍යෝතයන් මෙන් ද දිවා චන්ද්‍රයා පරිද්දෙන් ද නිෂ්ප්‍රභාවූය. කුස රජ්ජුරුවෝත් ශ්‍රී යහන් ගබින් පහන්වන්නාට පළමුම පිටත්වන්නාහ. මෙ ලෙසින් කලක් ගිය සඳ ප්‍රභාවතීන් දුවල් දක්නා කැමතිව මෑනියන්ට කීවිය. මෑනියෝත් ඔහු කී බස් අසා 'පුතනුවෙනි, දරුකෙනෙකුන් ලබන කල් ඉවසව' යි නැවතූහ. බෝධිසත්වයෝත් නැවත නැවතත් ඇවිටිකොට කිවූය. එ කල මෑනියෝ 'දක්නා කැමතිහොත් ඇත්හලට ගොස් ඇත්ගොවුවන් හා එක්ව සිටුව, මම එතනට උන් කැදවාගෙණ එමි, එකල ඇස් පුරා දැකපියව; තොපවූ නියාව නොහඟවව' යි කිවූය. බෝධිසත්වයෝත් 'යහපතැ' යි පිළිගෙණ ඇත්හලට ගියාහුය. එ කල්හි ශීලවතී දේවි ප්‍රභාවතීන් ඇත්හලට කැදවාගෙණ ගොස් 'මේ අසවල් ඇතාය, මේ අසවල් ඇතාය' යි නම් කිය කියා දක්ව දක්වා යන සඳ කුසරජ්ජුරුවෝ ප්‍රභාවතීන්ගේ පිටට ඇත්ලූලෑත්තියක් ගැසූය. එ කල ප්‍රභාවතී 'රජ්ජුරුවන්වහන්සේට කියා තොපගේ අත් කප්පාලමි' යනාදීන් කියාත් බිසවුන් ලවාත් කෝපකරවූය. එ සඳ බිසව් ප්‍රභාවතීන්ගේ පිට අතින් පිරිමැද 'මේ ඇත්හල කොල්ලෝ නම් ඉතා චපලයෝය, තුබ ඊට උරණනොවන්නේය' යි යනාදී කියා අස්වසා රජගෙට ගියාහුය.

තවද කලෙකින් බෝධිසත්වයෝ ප්‍රභාවතීන් දක්නා කැමතිව පෙර පරිද්දෙන්ම මෑනියන්ට කියා අස්සලට ගොස් අස්සලයක්හු පරිද්දෙන් සිට ප්‍රභාවතී දැක එතන දී අස් බෙට්ටක් ගැසූය. එ දවස් ද කිපියාවූ ප්‍රභාවතී බිසව් සංහිඳවූය. ඉක්බිති කල්යාමෙන් ප්‍රභාවතී බෝධිසත්වයන් දක්නා කැමතිව නැන්දනියන්ට කියා උන් විසින් වළකනලදුව නැවත නැවතත් යාච්ඤාකොට බිසවුන් ඊසින් එසේ විනම් කුස රජ්ජුරුවෝ සෙට නුවර පැදකුණු කෙරෙති, තෙපි ඒ වේලාවට සිව්මැද්දුරු කවුළුවෙන් දකුව' යි කියා දෙවන දවස් නුවර සරහවා රජ්ජුරුවන්ගේ මලනුවන් ජයම්පති කුමාරයන් රජාභරණයෙන් සරහා මඟුලැතු පිට හිඳුවා බෝධිසත්වයන් ඇත්ගොව් වේශයෙන් පශ්චිමාසනයෙහි ඉඳුවා නුවර පැදකුණුකරවා ප්‍රභාවතීන් කැදවාගෙණ සිව්මැදුරු කවුළුයෙන් බලමින් 'තොපගේ ස්වාමි පුත්‍රයානන්ගේ ශ්‍රී විභූතිය බලව' යි කීවිය. එ කල ප්‍රභාවතී ජයම්පති කුමාරයන් දැක 'මට සුදුසුවූ වල්ලභයාන කෙනෙකුන් ලදිමි' සතුටුවූය. එ දවස් ඇත්ගොව් වෙසින් පිටි පස උන් බෝධිසත්වයෝ සිත්වූ පරිද්දෙන් ප්‍රභාවතීන් දකිමින් හසන විකාර මුඛ විකාරයෙන් උසුලු විසුලු පෑ කෙළියාහ. එ ලෙස ඈත ගිය පසු බිසව් 'තොපගේ ස්වාමි පුත්‍රයානන් දුටුදු' යි ප්‍රභාවතීන් විචාර උන් විසින් 'ස්වාමීනි, දිටිමි; පිටිපස්සෙන් උන් ඇත්ගොව් ඉතා චපලය; මට උසුලු විසුලු පෑයේය; එ බඳුවූ නොහික්මුනු පින් මද නැනැත්තාහු කුමක් පිණිස රජ්ජුරුවන් පිටිපස්සේ ඉඳුවූදැ' යි කිව. එබස් අසා බිසව් 'දියෙනියෙනි, රජ්ජුරුවන්ට ආරක්ෂා පිණිස සැලසූ ඇත්ගොව්වාය' යි වලහා කීවය. ඒ අසා ප්‍රභාවතී 'මේ ඇත්ගොව්වා

---

1 සූර්‍ය්‍යාලෝකයෙහි=සූර්‍ය්‍ය, ආලෝකයෙහි. 22 රජාභරණයෙන්=රජ, ආභරණයෙන්. 23 පශ්චිමාසනයෙහි=පශ්චිම, ආසනයෙහි.

Digitized by Google

ඉතා නිර්ගීතය, රජ්ජුරුවණ්ට රජ්ජුරුකෙනෙකැ යි නොසිතයි; මේ කිමෙක්ද? කුස රජ්ජුරුවෝ නම් මූම වනැ යි, ඒකාන්තයෙන් උන් රූ නැති කෙනෙකුන් විය යුතුය; ඒ කාරණයෙන් මා නොදක්වති' සිතා කුද කැඳවා 'යව, මැනියෙනි, කුස රජ්ජුරුවෝ ඇතු පිට ඉදිරියේ උන් නැනැත්තෝ ද නොහොත් පිටිපස්සේ උන් නැනැත්තෝදැ' යි නියම දැන ගෙණ එවයි කිව්ය. එ විගසම ඒ මම කෙසේ දැන ගණිම්දැ' යි විචාළහ. කුදට 'පලමුයෙන් ඇතු පිටින් බට නැනැත්තෝ රජ්ජුරුවෝය; මේ සලකුණෙන් නියම දැන ගෙණ එව' යි කිව්ය ඒ නියෝග ලද කුදු ගොස් එක් තෙනෙක සිට පළමුකොට බෝධිසත්වයන් හා දෙවෙනිව ජයම්පති කුමාරයන් බට නියාව දුට. එ කල බෝධි සත්වයෝ ඇත මෑත බලා දුර සිටි කුදු දැක 'ආයේ මා පරීක්ෂාකරණ්ටය' යි දැන ලඟට කැඳවා 'මේ කොරතුරු නොකියව' යි කියා නික්මවූහ. ඕ ගොසින් 'පෙර ආසනයේ උන් නැනැත්තෝම පළමුකොට බටුය' යි කියා ගිව්ස්වා දූය. නැවත කල් යාමකින් බෝධිසත්වයෝ ප්‍රභාවතින් දක්නා කැමතිව මැනියණ්ට කිව්ය. බිසව් නවතා ගත නොහී 'එසේ වීනම් අප්‍රසිද්ධ වේශයකින් උයනේ ගොස් සිටුවයි' කිව්ය. එ බස් අසා කුස රජ්ජුරුවෝ උයනට ගොසින් මගුල් පොකුණේ කරවටක් දියට බැස නෙළුම් පතක් ඉස වසාගෙණ නෙළුම් මලකින් මූන වසාගෙණ සිටියාහුය. බිසවුත් ප්‍රභාවතීන් උයනට කැඳවාගෙණ ගොස් සවස් වේලෙහි පුෂ්ප ඵල පල්ලවයෙන් සඤ්ඡන්නවූ සපු දුනුකේ නා පනා සීනිද්ද බෝලිද්ද ආදී ගස් ලිය ද ගිරා බොකල් ඈ පක්ෂී දක්වමින් මගුල් උයන් ඇවිද ගෙණ ඇගේ සිත් පොලඹමින් පොකුණු තෙරට ගියෝය. එකෙණෙහි ප්‍රභාවතී තොමෝ පස් පියුමෙන් හැවසී ගත් පොකුණ දැක නගණු කැමතිව පිරිවර හා සමග පොකුණට බැස කෙළිමින් මහා බෝධිසත්වයන් මූන වසාගණ සිටි පියුමට අත දික්කළාය. එකල රජ්ජුරුවෝ නෙළුම් පත ඉවත්කොට 'මම කුස රජය' යි ප්‍රභාවතීන් අත ඇල්වූය. ඔහුගේ මුඛය දැක 'යක්ෂයෙක් මා අල්වා ගතැ' යි මුරගාමින් හයින් මූර්ඡාවගියාය. එ සඳ රජ්ජුරුවෝ අත ඇරපිහ. ඉක්බිති බිසව් සිහි ලදින් සිතන්නාහු 'මා අත ඇල්වූවෝ ඉදින් කුස රජ්ජුරුවෝ වී නම් ඇත් හළදී ඉලත්තියෙනුත් අස්හලදී අස් බෙටියෙනුත් මුත් විසින්ම ගසනලද්දිමි; ඇතුගේ පශ්චිමාසනයේ හිඳ මා වෙහෙසුවෙන් මූමය; මෙ සේ විරූපවූ දුර්මුඛවූ වල්ලභයාගෙන් මට ප්‍රයෝජන කිම්ද? ජීවත්ව උනිම් නම් මට වල්ලභයන් අරුම නොමත්තේය' යි සිතා තමන් හා එක්ව ආ අමාත්‍යයන් යවා 'යාන වාහණ සරහව, අද දවස්ම නික්මෙමි' කීහ. ඔහු එ පවත් රජ්ජුරුවණ්ට කීවාහුය. ඒ අසා රජ්ජුරුවෝ 'ඉදින් මූයණ්ට අවසර නොලද්දා නම් පැළී මියන්නාහ. වන්නාට දැනට යෙත්ව යි, නැවත මාගේ බලයෙන් ගෙන්වාගණිම්' යි සිතා ගමන් අනුදන්හ. එ කල්හි ප්‍රභාවතී පිරිවර හා සමග පිය රජ්ජුරුවන්ගේ සාගල නුවරටම ගියෝය.

ප්‍රභාවතී තොමෝ කුසරජ්ජුරුවණ්ට ජාතියෙහි කල ප්‍රාර්ථනාවෙන් නොකමැතිවූහ. බෝධිසත්වයෝ ද පූර්වයෙහි කරනලද අකුශල බලයෙන් විරූපව ගියාහ. ඒ කෙසේද යත් :—

Digitized by Google

යට ගිය දවස බරණැස් නුවරට නුදුරු ගමෙක්හි වීථි දෙකෙක කෙළෙඹි කුල දෙකෙක් ඇත්තේය. ඉන් ගෙයෙක පුත්‍ර දෙන්නෙක් වූහ. ඉන් බෝධිසත්වයෝ බාල මලනුවෝ වූහ. අනික් කෙළෙඹි කුලයෙහි දියණි කෙනෙක් වූහ. ඒ කුමාරිකාව බෝධිසත්වයන්ගේ බෑනණ්ට සරණගෙණවුය. බෝධිසත්වයෝ වෙන ගෙයක් දොරක් නැතිව බෑනන්ගේ ගෙහි වාසයකෙරෙති. ඉක්බිති එක් දවසෙක අතිරස කැවුම් පිස කිසි යම් කට යුත්තක් නිසා වල ගිය බෝධිසත්වයණ්ට තිබා තුමූ දෙදෙන අනුභව කළාහ. ඒ වේලෙහි සිඟා වැඩි පසේබුදු කෙනෙකුන්වහන්සේ දැක බෝධිසත්වයන්ගේ බෑදෑනියෝ 'උණ්ට කැවුම් පසුව පිස දුන හැක්කැ' යි සිතා බෝධිසත්වයණ්ට තිබූ කොටස පිළිගැන්වූය. බෝධිසත්වයෝ එකණෙහි වලින් අවුය. ඉක්බිති බෑදෑනියෝ කියන්නාහු 'ස්වාමීනි, නුඹ සතු කැවුම් පසේබුදුණ්ට පිළිගැන්වීමි, පින් අනුමෝදන්වුව මැනවැ' යි කී කල 'තොප සන්තක කොටස කාපියා මාගේ කොටස දන් දෙණ්ට කාරණ කිමෙද්ද' යි කිපී ලුහුබඳවා ගොසින් පසේබුදුන්වහන්සේගේ පාත්‍රයේ තුබූ කැවුම් ඇරගති තුය. ඒ කල ස්ත්‍රී මැනියන්ගේ ගෙට ගොස් සපු මල් පෙත්තක් සේ සක රත්වූ අලුත් ගිතෙල් ගෙණ පාත්‍රය පුරා සතුටුව 'ස්වාමීනි, මා උපනුපන් ජාතියෙහි මාගේ ශරීරයෙන් ආලෝක පැතිරේව යි, උතුම් රූ ඇතිවෙම්ව යි, අසත් පුරුෂයා හා එක තැන වාසය නොකෙරෙම්ව' යි කියා කළ ප්‍රාර්ථනා වශයෙන් ප්‍රභාවතී බෝධිසත්වයන් නොකමැතිවූය. බෝධි සත්වයෝ ද පසේබුදුන්වහන්සේගේ පාත්‍රයට කැවුම් කොටස පිළිගන්වා 'ස්වාමීනි, ඉදින් යොදුන් සියයෙක උන්නත් මුත් මාගේ බලයෙන් ගෙන්වාගෙණ මට පාදපරිචාරිකා කරණ්ට සමර්ථ වෙම්ව' යි ප්‍රාර්ථනාකළෝය. කිපී ගොස් පසේබුදුන්ගේ පාත්‍රයේ තුබූ කැවුම් හැරගත් හෙයින් මුඛය විසුලුව ගියේය. මේ තෙම මොවුන්ගේ පූර්ව ක්‍රියා වන්නේය.

බෝධිසත්වයෝ ප්‍රභාවතීන් ගිය නියාව අසා ශෝකයට පැමිණියාහ. අවශේෂ නාටක ස්ත්‍රීහු නොයෙක් ප්‍රකාරයෙන් සිත් නලවන්නාහු පොළඹා ගත නුහුණුවාහ. ප්‍රභාවතීන් නැති රජගෙය කුස රජ්ජුරුවණ්ට හිස්වූවාක් මෙන් වැටහෙන්නේය. මෙලෙසින් රාත්‍රියෙහි බොහෝ දුක් වී අළුයම නැගී සිට 'සාගල නුවරට ගොස් ප්‍රභාවතී දේවීන් කැඳවාගෙණ එම්' කියා 'මා එන තෙක් රාජ්‍යය පියානන්වහන්සේට වෙවස මලනුවණ්ට වෙවස පාවා දී ලියා නම් නැවත ඇරගැන්ම ආයාස වේද්ද' යි සිතා මෑනියන් ශීලවතී දේවීන් සමීපයට ගොස් 'මෑනියන්වහන්ස, ධන ධාන්‍යාදීන් හරිතවූ ඇත් ඇති අස් ඇති රිය බල යන් සිව්රඟ සෙනඟින් යුක්තවූ පඤ්ච රාජ කකුධ භාණ්ඩයන් ඇති සියලු උපභෝග පරිභෝග වස්තුයෙන් සමෘද්ධවූ මේ රාජ්‍යය ප්‍රභාවතීන් කැඳවාගෙණ එන තෙක් පාවාගත මැනවැ' යි මෑනියණ්ට කියා අවසර ඉල්වූහ. ඒ බස් අසා බිසව් බියපත්ව 'පුත, ස්ත්‍රීහු නම් නොයෙක් වඤ්චා දනිති' යනාදීන් අවවාද කියා මගදී අනුභවකරණ පිණිස අනන්ත රසයෙන් යුක්තවූ රාජ භෝජනය රන් මුඩමෙක පුරා දුන්හ. ඒ සඳ මහා බෝධිසත්වයෝ මෑනියන් තුන් යලක් පැදකුණු

---

28 ධානාදීන්=ධාන්‍ය, ආදීන්.

Digitized by Google

කොට සසහ පිහිටුවා වැද ජීවත්ව උනිම් නම් සැපසේ අවුත් දකිව නම් එව්ද' යි කියා අවසර ඉල්වාගෙණ ශ්‍රී යහන් ගබඩාවට වැද දුනු මුගුරු කඩු කොන්ත සොටි යන පඤ්චායුධ සන්නද්ධවගෙණ රන් මුඩම් හාසමග කහවණු දහසකුත් පසයෙහි ලාගෙණ කොකනදනම් වීණාව අතින් ගෙණ නුවරින් පිටත්ව මගට පිළිපන්ව මහත්වූ බල වීර්‍ය ඇති මහා බෝධිසත්වයෝ එ දවස් දවල් බතට පණස් යොදුන් මග ගෙවා ගෙණ ගොස් බත් අනුභවකොට පස්වරු භාගයෙහි තුබූ පණස් යොදුන ගෙවා ගොස් සවස් වේලෙහි පැන් සනහා සාගල නුවරට වන්හ.

බෝධිසත්වයන් එ නුවරට වන් කෙණෙහිම ප්‍රභාවතී උනස්නෙහි හිඳ නොහී යහණෙන් බිමට බැස්සාව. එ කල නුවරට වැද විඩා පත්ව යන්නාවූ බෝධිසත්වයන් දුක එක්තරා ස්ත්‍රියක් තමාගේ ගෙට කැඳවාගෙණ ගොස් ඉඳිනා අසුන් දී පය සෝධවා සැතපී හුන් කල්හි බත් මාලු සපයා අනුග්‍රහකරවූය. එ සඳ සතුටුවූ මහා බෝධිසත්වයෝ රන් මුඩම හාසමග මසුදහස ඒ ස්ත්‍රියට දී ගෙණ ගිය පඤ්චායුධය එම ගෙයි තබා 'මා ගොස් ආයුතු තැනෙක් ඇත' යි කියා වීණාව අතට ඇරගෙණ ඇත්හලට ගොස 'මේ රාත්‍රියෙහි සැතපෙන තෙනක් දෙව නම් නොපට වීණා ගායනාකෙරෙමි' යි කියා ඇත් ගොව්වන් විසින් අනුදන්නාලද්දුව එක් තෙනෙක වැදහෙව මදක් නිඳා පිබිද ගමන් විඩා සංසිඳුවාගෙණ වීණාව නත් සරහා සියලු නුවර වාසීහු සැපයෝ වේ අසත්ව' යි සිතා ශී කියමින් වීණා ගායනාකරන්නාහ. එ කල්හි සිම වැදහොත් ප්‍රභාවතී ද ඒ ශබ්දය අසා 'මේ අනික් යොකෙනකුන්ගේ වීණා ශබ්දයෙක් නොවෙයි, ඒකාන්තයෙන් කුස රජ්ජුරුවන්වහන්සේ මා නිසා මෙනුවරට ආසේක්මය' යි දන්නාහුය. මද්‍ර රජ්ජුරුවෝ ද ඒ වීණා ශබ්දය අසා 'ඉතා මිහිරිකොට ගායනාකරන්නෙන් සෙට ඔහු කැඳවා ගායනාකරණ්ට උව මැනවැ' යි සිතූහ. බෝධිසත්වයෝ මෙතන විසීමෙන් ප්‍රභාවතිය දක්න නොහැක්ක, එහෙයින් අයුක්තය' යි උදෑසණක් සේම ඇත්හලින් නික්ම සවස බත් අනුභවකල ගෙයින්ම පෙරබත අනුභවකොට වීණාව ගෙයි තබා මද්‍ර රජ්ජුරුවන්ගේ මගුල් කුඹලාගේ ගෙට ගොස් ඔහට අතවැසිව එක දවසින් මැටි හැරගෙණ 'ආචාරීණි, වලන් කෙරෙම්ද' යි විචාර 'එසේ කල මැනවැ' යි කී සඳ මැටි පිඩක් ඇරගෙණ සකෙහි තබා සක කරකැවූහ. එකවිට කරකවනලද ඒ සක ඉර මුදුනට එන තෙක්ම කරකැවින. මහා බෝධිසත්වයෝ නොයෙක් ප්‍රකාර ඇති කුඩා මහත් බොහෝ වලන් රූ නගා කොට 'මේ රූ ප්‍රභාවතීන් විනා වෙන කෙනෙක් නොදක්ත්ව' යි අධිෂ්ඨානකලාහුය. මෙ ලෙසින් නිමා වියලා පලහා කුඹල්හල පිරූය. එ සඳ කුඹල් දෙටුවා නොයෙක් විසිතුරු අත්කම් දක්වා කරණලද වලන් ගෙන්වා ගෙණ ගොස් රජ්පුරුවන්ට දුක්වය. එ කල මද්‍ර රජ්ජුරුවෝ සුදුටු වීරූ එ වලන් දුක සතුටුව මේ වලන් නලෝ කවුරුද්ද' යි විචාර කුඹලා විසින් 'මමය, ස්වාමීනි' කී කල්හි, නොපගේ කර්මාන්ත මම නොදනිම්ද? නොවලහා කියව්' යි තරව විචාළසඳ,

---

3 පඤ්චායුධ=පඤ්ච, ආයුධ 8 උනස්නෙහි=උන්, අස්නෙහි.

Digitized by Google

‘දේවයන්වහන්ස, මාගේ අතවැස්සා විසින් කරණලද්දු’ යි කීය. ‘එව්බල තට මේ අත වැසිකමට නිසි එකෙක් නොවෙයි, ඇදුරුකමට නිස්සෝය; තෝ මෙතැන් පටන් උන්ගෙන් ශිල්ප උගණුව. තවද එ තෙම මෙ තැන් පටන් මාගේ දරුවණ්ට කෙළි වලන් කෙරෙව’ යි නියෝගකොට, ‘තෝ ඔහට දෙවා ලව’ යි බෝධිසත්වයණ්ට රන් මසු දහසක් යවා ‘මේ කුඩා වලන් දරුවණ්ට දෙව’ යි යවූහ. කුඹලාද එ වලන් ඇර ගෙණ පුරගෙට ගොස් ‘කෙළි වලන් ගෙණෙමි’ යි කියා යවීයේය. එ බස් අසා රජ කුමාරිකාවරු එ තනට රැස්වූය. ඒ කුඹලා විසින් වලන් බෙදන සඳ බෝධිසත්වයන්ගේ ආනුභාවයෙන් ප්‍රභාවතීන් උදෙසා රූ තගා කරණලද වලන්ම උණ්ට දීන. එ සඳ ප්‍රභාවතී ඒ වලන්වල මහා බෝධිසත්වයන්ගේ හා තමන්ගේ හා කුදගේ රූ දැක ‘මේ අනික් කෙනෙකුන් විසින් කළ දෙයෙක් නොවෙයි, කුසරජ්ජුරුවන් විසින්ම කරණලද්දු’ යි දැන කිපී ‘මෙයින් මට ප්‍රයෝජන නැත, කැමති කෙනෙකුණ්ට දීපියව’ යි කීවිය. එ සඳ උන්ගේ තගුන් කිපි බව දැන ‘මේ කුසරජ්ජුරුවන් විසින් කළ දෙයකැ යි සිතාවුද? මේ කුඹලා විසින් ‘කළාය, ඇරගණුව’ යි යනාදීන් වෙහෙසා කීවිය. ඒ ප්‍රභාවතී තොම කුස රජ්ජුරුවන් එ නුවර ගිය බවද එ වලන් උන් විසින් කළ බවද කිසිවුණ්ට නොකීව. ඉක්බිති කුඹලා රජ්ජුරුවන්ගෙන් යවනලද මසු දහස ගෙණ ගොස් බෝධිසත්වයන්ට දී ‘සබඳ, රජ්ජුරුවන්වහන්සේ තොපට සමාධිවූසේක, මෙ තැන් පටන් රජ කුමාරිකාවරුණ්ට තෙපි වලන්කරව, මම එ ගෙණ ගොස් දෙමි’ කීයේය. ඒ අසා බෝධිසත්වයෝ ‘ප්‍රභාවතීන් මෙතන වැසත් දුක්ක නොහැක්කැ’ යි සිතා ඒ කහවණු දහස ඔහටම දී එ තනින් ගොස් රජ්ජුරුවණ්ට මඟුල් මෙහෙ කරණ තලකරුවා ළඟට ගොස් ඔහට අතවැසිව තල්වැටක් කොට එහිම සේසතය, රාහලය, රාඛඩම ගෙණ සිටි ප්‍රභාවතීගේ රූපය යනාදී විසිතුරුවූ අත්කම් දැක්වූය. තලකරුවා ඒ තල්වැට ආදි බෝධිසත්වයන් විසින් කරණලද කර්මාන්ත විශේෂ ගෙණගොස් දැක්වූය. රජ්ජුරුවෝ ඒ කර්මාන්ත විශේෂය දැක ‘මේ තල්වැට ආදිය කවුරුන් විසින් කරණලද්දේදු’ යි යනාදීන් පෙර පරිද්දෙන් විචාරා මසු දහසක් දී ‘මේ තල්වැට ආදී මාගේ කුමාරිකාවරුණ්ට දෙව’ යි නියෝගකළාහ. ඒ කර්මාන්තයන් බෙදූ දෙන තලකරුවා ද බෝධිසත්වයන් විසින් ප්‍රභාවතීන් උදෙසා කරණලද තල්වැට උණ්ටම දුන්නේය. එ සඳ ප්‍රභාවතී එ විසිතුරු රූපයන් දැක කුස රජ්ජුරුවන් විසින් කරණලද බව දැන ‘කැමති කෙනෙක් ඇර ගණුව’ යි බිමට දැමූය. ඒ දැක ඉතිරි කුමාරිකාවරුන් වෙහෙසකලද තලකරුවා රජ්ජුරුවන් විසින් දෙනලද මසු දහස ගෙණ ගොස් බෝධිසත්වයණ්ට දුන්නේය. ඉක්බිති බෝධිසත්වයෝ ‘මෙයින් මට අඵාතය’ යි සිතා ඒ රන් ඔහට දී එතනින් ගොස් රජ්ජුරුවන්ගේ මාලාකාරයාට අතවැසිව නොයෙක් ප්‍රකාර ඇති මල් පවි ගොතා ප්‍රභාවතීන් පිණිස නොයෙක් රුවින් විසිතුරුකොට මල් පුඹුලක් ද කළාහුය. මල්කරුවාත් ඒ සියල්ල ඇරගෙණ ගොස් රජ්ජුරුවණ්ට දුන්නේය. රජ්ජුරුවෝත් විශේෂ කර්මාන්තය දැක ‘මේ ගෙතුවෝ කවුරුද්දු’ යි විචාරා ‘දේවයන්වහන්ස, මා විසින,’ යි කී කල්හි ‘තොපගේ මල් ගෙතීම අපි නොදනුමෝද?

Digitized by Google

මේ ගෙනුවා කියව' යි තරයේ විචාරණලද්දේ 'අතවැස්සා විසින් ගොතනලද්දැ' යි කීයේය. එ බස් අසා රජ්ජුරුවෝ 'එ තෙම අතවැස්සෙක් නොවෙයි, කොපට ඇදුරකමට නිසිය, ඔහු කෙරෙන් මල් ගෙතීම් ඉගෙණ ගණුව, ඔහු ලවා මෙ තැන් පටන් මාගේ දරුවණ්ට මල් ගොතාලව' යි සතුටුව මසු දහසක් දී 'මේ මල් කම් දරුවණ්ට දෙව' යි යවූහ. ඒ මල්කරුවා ද බෝධිසත්වයන් විසින් ප්‍රභාවතීන් උදෙසා රූ නගා කරණලද මල් සුඹුල උණ්ටම දුන්නේය. ප්‍රභාවතී ද ඒ මල් සුඹුලෙහි කුස රජ්ජුරුවන්ගේ හා තමන්ගේ හා නොයෙක් රූ දැක කුස රජ්ජුරුවන් කළ බව දැන කිපී බිමට දැමුව. තෙපු නුඹු පෙර පරිද්දෙන්ම වෙහෙසූය. මල්කරුවා ද මසු දහස ගෙණ ගොස් බෝධිසත්වයණ්ට දී එ පවත් කීයේය. බෝධිසත්වයෝ 'මෙයිත් මට අසාධ්‍යය' යි එ රන් ඔහට දී එ තනින් රජ්ජුරුවන්ගේ අරක්කැමියා කරා ගොස් ඔහට අතවැසිව දවසක් අරක්කැමියා රජ්ජුරුවණ්ට මේ වඩාගෙණ යමින් තමහට පිසන පිණිස බෝධිසත්වයණ්ට ඇටමුසු දඩමසක් දීලා ගියේය. බෝධිසත්වයෝ ද ඒ ඇටය පිස මුළු නුවර සුවඳ පැතිරෙණ සේ දුම් කරවූහ. එ සඳ රජ්ජුරුවෝ සුවඳ අසා 'කිමෙක්ද මුළුතැන් ගෙයි අනික් මාලුවක් පිසද්දැ' යි විචාරා අරක්කැමියා විසින් 'දේවයන්වහන්ස, අනික් පිසන මාලුවක් නැත්තේය, එතකුදුවුවත් ඇට මුසු මසක් අප ඇමට පිසන ලෙස අතවැස්සාට දීලා ආයිමි, එහි සුවඳ විය යුතුය' යි කී සඳ රජ්ජුරුවෝ එ ගෙන්වාගෙණ ඉන් සුඟක් අනුභවකොට බැලූය. එ කෙණෙහිම එහි රස සත් සියයක් පමණ රස නහරවල පැතිර සිටියේය. රජ්ජුරුවෝ ඒ රස තෘෂ්ණාවෙහි බැඳී ඔහට මස්සෙන් දහසක් දී 'මෙ තැන් පටන් තොපගේ අතවැස්සා ලවා මටත් මාගේ දරුවණ්ටත් බත් මාලු පිස දරුවණ්ට ඔහු විසින් ගෙණ දෙණ්ට කියව, තොප විසින් අපට ගෙණෙව' යි නියෝගකෙළේය. අරක්කැමි ගොස් බෝධිසත්වයණ්ට කීයේය. එ බස් අසා බෝධිසත්වයෝ 'දැන් මාගේ මනෝරථය මස්තක ප්‍රාප්තවනියේය' යි සතුටුව 'මෙ තැන් පටන් ප්‍රභාවතීන් දකිමි' යි සිතා ඔහට රන් දහස දී දෙවන දවස් බත් මාලු පිස රජ්ජුරුවණ්ට අරක්කැමියා අත යවා රාජකුමාරිකාවරුණ්ට ගෙණයන වලුත් කද තාමූ හැරගෙණ ගොස් ප්‍රභාවතීන්ගේ මාලිගාවට නැංගේය. එ සඳ ප්‍රභාවතී වලුත් කඳ ගෙණයන බෝධිසත්වයන් දැක 'මුන්වහන්සේ තමන්වහන්සේට නුසුදුසුවූ වහල් කල මනා දෙය කරණසේක; ඉදින් මම දවස්ගණනක් බැණ නොනැගී උන්මි නම් මූ මා නැමැත්තෝ වනැයි සිතා අන් තෙනකට නොගොස් මා දැක දැක මෙහි වාසය කරණසේක, ඒ නොකොට මෙහි ඇසිල්ලකුත් නොරඳ යන සැටියේ බැණ දොඩා නික්මවම්' සිතා දොර අඩවලුකොටගෙණ එක් අතකින් දොර අල්වාගෙණ අගුලු කාණුවේ වැතිර සිට 'කුසරජ්ජුරුවන්වහන්සේ මෙ බඳුවූ කාරියක් ඉදින් ජීවිතය නේ කමුත් නොකරණසේක; එතකුදුවුවත් මා නිසා උදෑසණය සවසය මධ්‍යමරාත්‍රිය මධ්‍යාහනය යන විභාගයක් නැතිව දිය දර සැපයීම් පිසීම් කැවීම් පෙවීම් ආදි හීණ ක්‍රියාවෙන් හා දුර්භෝජන දුක්ඛ සෙයාවෙන් දවස් යවමින් මෙහි සිට දුක් නොවිඳ නුඹවහන්සේගේ කුශාවතී නුවරටම නැගී ගොස් මා කෙරෙහි සිතිවිල්ලක් නොසිතා

Digitized by Google

නුඹවහන්සේ වැනි සකුරු පුවක් සේ දු හැළිහිය මුහුණු ඇති යකින්නක අගමෙහෙසුන් කොට ගෙණ රාජ්‍යය කල මැනව; ඉදින් විරූපවූ නුඹවහන්සේ කෙතෙක් කල් මී ඉද දුක් උනත් මම නොකමැත්තෙමි, නොරඳ වහා නික්මුන මැනවැ' යි කිව්ය. එ කල්හි මහා බෝධිසත්ත්වයෝ 'ප්‍රභාවතීන්ගෙන් කථාසම්භාෂණයක් ලදිමි' සතුටුව 'මුවපොල්ලණ්ට බඳුවූ ඇස් ඇති හේමාභරණ විභූෂිත ගාත්‍ර ඇති මනාවූ තඹ ප්‍රදේශ ඇති රන් තම්න් විසිතුරුවූ වස්ත්‍රයෙන් ශෝභමානවූ දේහ ඇති ප්‍රභාවතීනි, තොපගේ රූප සෞන්දර්යයෙන් පැහැරගන්නාලද සිත් ඇති ක්ලේශාන්ධකාරයෙන් වසනලදුව දිග් විභාගයෙහි අසමර්ථ හෙයින් කුසාවතී නම් රජධානියට යා නොහෙම්; ඒ රාජ්‍ය ශ්‍රීයෙන් මට ප්‍රයෝජන නැත්තේය, මෙ රටම වාසයකෙරෙමි' යි කීහ. බෝධිසත්ත්වයන් විසින් මෙ ලෙස කී කල්හි 'මූ විපිළිසරව නැගී යෙති පරිභවකොට කියමින් සිටියදී මා කෙරේ ඇලීම කථාකෙරෙති, ඉදින් මූම කුසරජය යි අවුත් මා අත අල්වාගත්තු නම් කවුරු වලකත්ද' යි නෙට වැද දොර අගුල් ලාගත්තුය. බෝධිසත්ත්වයෝ ද වස්ත්‍ර හැරගෙණ ගොස් තෙසු රජ කුමාරිකාවරුන් බත් කැවූහ. ඉක්බිති ප්‍රභාවතී 'කුස රජ්ජුරුවන් විසින් සපයනලද ආහාරය ගෙණෙව' යි කුදට විධානකොට ගෙන්වාගෙණ ඉම් බත් අනුභවනොකරෙමි, තොප ලත් බත් මට දීපියා මේ බත් තෙපි කාපියව; කුස රජ්ජුරුවන්වහන්සේ මේ නුවරට ආ බව කාටත් නොගහව' යි කිව්ය. එ තැන් පටන් කුදත් ප්‍රභාවතීන්ගේ බත් කොටස තුමූ අනුභවකොට තමන්ගේ බත් ප්‍රභාවතීණ්ට දෙන්නීය. කුස රජ්ජුරුවෝ එ තැන් පටන් නොදක්නාහු 'මා කෙරෙහි ප්‍රභාවතීන් සෙන්හ ඇති නැති බව පරීක්ෂා කෙරෙමි' යි සිතා එක් දවසක් රජ කුමාරිකාවරුන් බත් කවා වලන් කද ගෙණ යමින් ප්‍රභාවතීන්ගේ දොර සමීපයෙහි අඩි ඇන වලන් අඬවා පැකිල වැටීගී කෙඳිරිගාමින් ඔත්තාහුය. එ කල ප්‍රභාවතී බෝධිසත්ත්වයන්ගේ කෙඳිරිගැවිලි අසා ගෙයි දොර හැර බලා කද කරතබාගෙණ වැදහොත්නාවුන් දැක 'මුන්වහන්සේ මුලු දඹදිවට අග්‍ර රජකෙනෙක, මා නිසා රෑ දවල් දුක් විඳිමින් සිට මැළි බැවින් වසුන් කදේ බරින් මැඩී වැටීගියසේක; ඉදින් අමුත්තෙක් වීනම් මට මීට වඩා වැරැද්දෙක් නැත; ප්‍රාණය ඇද්ද නැද්දැයි පරීක්ෂාකෙරෙමි' සිතා හයගෙණ නෙසින් පිටත්ව බෝධිසත්ත්වයන්ගේ ස්වාසය පරීක්ෂාකරණු පිණිස නැඹුරුව මූන බැඳුව. එ සඳ කුස රජ්ජුරුවෝ කෙල කටක් පුරා ගෙණ ප්‍රභාවතීන් මුහුණට දැමූහ. එ කල ප්‍රභාවතී බැණ දොඩා ගොස් ගෙට වැද දොර අඩවලුකොට 'රජ්ජුරුවන්වහන්ස, සමෙක් විරූපීව රූ ඇත්තෙන් ප්‍රාර්ථනාකෙරේද නොකමැතියත් කැමතිවේද ඔහුට අවඩ වන්නේය' යනාදීන් ප්‍රභාවතීන් විසින් නොයෙක් ලෙස බැණ දොඩා පරිභව කළත් බෝධිසත්ත්වයෝ උන් කෙරේ නොකලකිරී 'එම්බා ප්‍රභාවතීනි, මේ ලෝකයෙහි යම් පුරුෂයෙක් ලෝකස්වාදරති වශයෙන් තමා නොකමැතිවූද කැමතිවූද ස්ත්‍රීයගෙන් දර්ශනය ස්පර්ශය සම්භාෂණය සම්භෝගය යි යන මෙයින් එක්තරා සන්තෝෂ කාරණ

5 හේමාභරණ=හේම, ආභරණ. 7 ක්ලේශාන්ධකාරයෙන්=ක්ලේශ, අන්ධකාරයෙන්.

Digitized by Google

යෙක් ලැබෙද්ද එසේ ලබනලද ලාභය මනාවූ ලාභයකැයි ප්‍රශංසාකරම්හ. තමා නොකමැතිවූවත් ස්ත්‍රිය කෙරෙන් ප්‍රීති වචනයක් නොලැබීම තපුරුවන්නේය. එසේ හෙයින් තොපගේ දක්නා ලාභාදි ඓශ්වර්‍ය විඳිමින් මෙහි වාසයකෙරෙමි' යි කීහ. මහා බෝධිසත්වයන් මෙ ලෙස කී කල්හිත් ප්‍රභාවතී මදකුත් පසුනොබැස 'තද කොටම කියා මොහු පලවමි' සිතා 'මදකුත් සෙන්හ රහිත වශයෙන් නොකමැත්තාවූ මා කෙරෙහි පිළිබඳ සිතින් කැමතිව වසන්නාවූ තෙපි පිපාසයෙන් පීඩිතව බොලඳකමින් කිහිරි උලක් හැරගෙණ ගල්පොත්තක් කැන පැන් හැර ගන්නා කැමතියක්හු හා ද ඝර්මයෙන් පීඩිතව දැලක් බැඳ සුළං රඳවන්නාක්හු හා ද සමානයව' යනාදීන් තද පරුෂ බස් කියා දෙඩූව. ඒ බස් අසා කුස රජ්ජුරුවෝ 'මනෝඥවූ අඞ්ග ප්‍රත්‍යඞ්ගාදිවූ ස්ත්‍රී සෞභාග්‍යයෙන් යුක්තවූ ප්‍රභාවතිනි, අනේක කෝටි චාටු නාටක ස්ත්‍රීන් හා අනන්ත සාමන්ත චක්‍ර මෞලි මාලාලිත පාද පීඨ ඇති රාජ්‍යශ්‍රීය හැර තොප කෙරෙහි බැඳුනු සිතින් තොරටට පැමිණ දුක් විඳිමින් තොප හාසමග ප්‍රේමාන්විත කථා සම්භාෂණ මාත්‍රයකුත් නොලද්දාවූ මම හාවභාව ලීලා කටාක්ෂ නිරීක්ෂණ මන්දස්මිත මධුර භාෂිතාදී සෞභාග්‍යයෙන් යුක්තවූ කෝමලාඞ්ග ඇති තොපගේ ලය ගලින් කරණලදැයි සිතමි. තවද ප්‍රභාවතිනි, තොපි යම් පමණ කලක් කෝපයෙන් බැම හිඳ රුෂ්ටව බලන්නීද ඒ තාක් මද්‍ර රජ්ජුරුවන්ගේ මේ භවනයෙහි දුක් විඳිමින් අරක්කැමිව වාසයකෙරෙමි. යම් කලෙක්හි සිතා පහලකර ස්නිග්ධවූ නිරීක්ෂණයෙන් සතුටුව බලන්නෙහිද ඒ කල චිත්ත සන්තාපයන් දුරුකොට රාජ්‍ය ශ්‍රීයට පැමිණියාක් මෙන් වෙමි. එහෙයින් සොඳුර, මෙ තැන් පටන් මෙ බඳුවූ තද මත් නොකරව' යනාදීන් යාච්ඤාව කීවාහුය. ඒ බස් අසා ප්‍රභාවතී තොම 'මෙ තෙම වදුරු ලාමෙවෙයි බැඳුනු වානරයක්හු පරිද්දෙන් මා කෙරෙහි ඉතා සක්තව කියන්නේය, උපදේශයකින් බොරුවක් කියා මෙයින් නික්මවමි' සිතා මහරජ, 'කුස රජ්ජුරුවන්වහන්සේ මට ස්වාමිවනසේක්ද නොවනසේක්දැ' යි නිමිත්ත විචාළ තැන නිමිත්තපාඨකයෝ 'නුඹවහන්සේ සත් කඩක් කොට කැපුවත් උන්වහන්සේට අගමෙහෙසුන් වන්නේ නැතැ' යි තරයේම කිව්ය; එහෙයින් නොයෙක් කාරණයෙන් නොකමැතිවූ මා නිසා දුක් නොවිඳ නුඹවහන්සේගේ රටටම පලාගිය මැනවැ' යි කිව්ය. ඒ අසා කුස රජ්ජුරුවෝත් ඔවුන් කී බස් ප්‍රත්‍යුත්තරයෙන් පසුබස්වමින් 'සොඳුර, මා විසිනුත් නිමිත්ත විචාළ තෙන මාගේ රට නිමිත්තපාඨකයෝ 'තොප විනා උන්ට වල්ලභ කෙනෙක් නැත්තාහ' යි තරයේම කිව්ය. ඒ කී නිමිත්තයෙනුත් මා දුටු කාරණයෙනුත් මා විනා තොපට අනික් වල්ලභ කෙනෙක් නැත, ඒ කාරණයෙන් තොපගේ තද මත් හැරපියව' යි කීහ. ප්‍රභාවතී කුස රජ්ජුරුවන්ගේ බස් අසා 'කවර ලෙසකිනුත් මුන් ලජ්ජාවට පමුණුවාලිය නොහැක්කේය, යේවා නොයේවා, මුන්ගෙන් මට කම් කිම්දැ' යි සිතා දොර අගුළු ලා ගත්තාය. ඒ කල බෝධිසත්වයෝ වලන් කද කර තබාගෙණ පලාගියාහුය.

---

9 ප්‍රත්‍යඞ්ගාදිවූ=ප්‍රති, අඞ්ග, ආදිවූ. 13 භාෂිතාදී=භාෂිත, ආදී. 14 කෝමලාඞ්ග=කෝමල, අඞ්ග.

Digitized by Google

එ තැන් පටන් දකුමුත් නැතුව අරක්කැමිකම් කෙරෙමින් දඹු මුසු සිල්බත් කම්න් බත් නිවන ඔරුව පිට සයනාකෙරෙමින් දර පළමින් පැන් ගෙණෙමින් වළන් සෝදමින් උදෑසණ කැද අවුළු ර දවල් බත් මාළු අවුළු පිසගෙණ ගොස් කවමින් පොවමින් මධුරන්න පාන සයන වස්ත්‍රාභරණාදීයක් නැතිව කාම තෘෂ්ණානුරාගයෙන් බැඳී බොහෝ දුක් විඳිමින් එක් දවසක් මුළුතැන්ගෙය මිදුලෙන් යන්නාවූ කුද දැක කැඳවා ප්‍රභාවතීන් කෙරෙහි හඬින් නොඇසුකන්ව පුහුව යන සඳ වහා ගොස් ඇරැඳවා 'කුද, තොසින් ගියේ සාම්දුව මෙන් තදව ගියෙහිද? මෙ තෙක් දවස් මුළුල්ලෙහි තොප හැම සමීපයෙහි වැස පුව දුක් විචාරිම් පමණකුත් නොලදුම්හ, සෙසු ලාභයෙක් කැලම වේද? ඒ කුමක් වුවත්, ප්‍රභාවතීන් තොපගේ සමවායෙන් තද මත් හරවා දක්වාලිය එවුද' යි විචාළහ. ඒ අසා කුදත් 'යහපතැ' යි කිව. එ කල බෝධිසත්ත්වයෝ සතුටුව 'ඉදින් ඇත්සොඬක් මෙන් ක්‍රමෝන්නත මට සිළුටුවූ ඌරු යුගලයක් ඇති ප්‍රභාවතී තොම තොපගේ සමවායෙන් ප්‍රේම දෘෂ්ටියෙන් මා බැලූ නම් වේව යි, මා හා සන්තෝෂයෙන් යුක්තව ප්‍රිය කථාවක් කළා නම් වේව යි, නොහොත් සෙන්හයෙන් මන්දස්මිතයක් පවාපුතම වේවයි, තවද මා දැක සතුටුව මා හා සිනාවෙන් [illegible] බැලූ නම් වේව යි, ඉදින් තරුණාකී රශ්මියෙන් ප්‍රවිකසිත සරසිරුහ පයෝධර මෘදු කොමල පාණිපල්ලවයෙන් මාගේ ශරීරය ස්පර්ශකළාතම් වේවයි, සැපසේ මාගෙ කුසාවතී නුවරට ගොස් [illegible] මම් නිතර කුද ගැරෙන පසිද්දෙන් හාර කේයූර කඩය කටක නූපුර රසනා නැලි මුදු ආදී සර්වාභරණයෙන් හි සරහාලම්, තෙපි ප්‍රභාවතීන්ට කාරණා කියා මාගේ වසඟයට පමුණුවා ලව' යි කීවිය. කුදත් බෝධිසත්ත්වයන්ගේ බස් අසා 'දේවයන්වහන්ස, නුඹවහන්සේ සැකයක් නොසිතුව මැනව, කීප දවසකින් උන් නුඹවහන්සේ වසඟයට පමුණුවා මාගේ සාමීප්‍යය දක්වාලම්' බෝධිසත්ත්වයන්ට කියා තමා යිය කාරිය සම්බන්ධකොටගෙණ ප්‍රභාවතීන් කරා ගොස් උන්ගේ ගෙය කසල හරින්නියක මෙන් යටත්පිරිසෙයින් ගසාලන්ට නිසි තැනක් විවරකුත් ගෙස් නොතිබා වහන් පටන් සියල්ලම දොර ලා ගෙය ඇමද කසල දමා දොරට පිට ලා එලිපත් පඩිය ගාවා උස් පුටුවක් ලා ඊට මිප්ව ප්‍රභාවතීන්ට අස්නක් පණවා 'දියනියන්, මෙසේ අව මැනව, ඉසබලම්හ' යි ප්‍රභාවතී මිටි පුටුවෙහි ඉඳුවාගෙණ නොමෝ උස් පුටුවෙක ඉඳ තමාගේ දන දෙකින් උන්ගේ ඉස වහල්කොට ගෙණ මඳක් ඉස නිය ගා 'අහෝ මූන්ගේ ඉස උකුණෝ බොහෝව ගියෝය' යි කියමින් තමාගේ ඉසින් උකුණන් හැරගෙණ ප්‍රභාවතීන්ගේ අත්ලෙහි ලා 'තොපගේ ඉස උකුණන්ගේ විචර බැලුව' යි යනාදි වශයෙන් නොයෙක් කථාකොට බෝධිසත්ත්වයන්ගේ ගුණ කියමින් 'ප්‍රභාවතී තොමෝ කුස රජ්ජුරුවන්ගේ නුවර වසන සමයෙහි ඒ කුස රජ්ජුරුවන්

4 මධුරාන්න=මධුර, අන්න. වස්ත්‍රාභරණාදියක්=වස්ත්‍ර, ආභරණ, ආදියක්. තෘෂ්ණානුරාගයෙන්=තෘෂ්ණා, අනුරාගයෙන් 11 ක්‍රමෝන්නත=ක්‍රම, උන්නත. 15 තරුණාකී=තරුණ, අකී. 18 සර්වාභරණයෙන්=සර්ව, ආභරණයෙන්.

Digitized by Google

වහන්සේගෙන් අන්න පාන වස්ත්‍රාභරණ ගන්ධ මාල්‍ය තාම්බූලාදී කිසි සත්කාරයකුත්
නොලදූ යි සිතමි; කාරණ කිම යත්, ස්ත්‍රීහු නම් එක දවසකුත් ඇකයෙහි වැ
තිර ඔත් ස්වාමිපුත්‍රයාගේ සිත් නොතලකිරුවනි; මේ කුස රජ්ජුරුවන් වනාහී අරක්
කැමිව නොපා නිසා රාජ්‍ය ශ්‍රීය හැර අවුත් බැල මෙමෙහෙකොට දුක් විඳිමින් සිටියදීත්
සුව දුක් විචාරීම පමණකුත් නොකරව; ඉදින් උන්වහන්සේ කෙරෙහි ස්නේහය නැ
තත් මුළු දඹදිවට අග්‍රරාජවූ මේ කුස රජ්ජුරුවන්වහන්සේ මා නිසාම දුග් ගන්නාසේ
කැයි දන උන්වහන්සේට කිසි නම් සත්කාරයක් කරණ්ට උව මැනවැ' යි කීව. ඒ බස්
අසා ප්‍රභාවතී කිපි සඳ කුදත් නැගී සිට ප්‍රභාවතින් කරවිය අල්වා ඇතුළුගෙට දමා
තොමෝ පිටත්ව දොර වසා දොර අඩිනා ලඟුව ඇද අල්වා ගෙණ සිටියාය. ඒ සඳ
ප්‍රභාවතී උත් අල්වාගත නොයී දොරමුල වැද සිට ඇට දොඩමින් 'මේ බදුවූ නොකිව
මනා බස් කියන්නාවූ නොකට පුතු දයනා මේ කෙල්ල සිසුම් මුවහත් ඇති ශස්ත්‍රයෙන්
ජිහ්වාච්ඡේදනය ලබණ්ට නිසි එකනැ' යි යනාදීත් කීපුනාය. ඉක්බිති කුදත් ලඟුව
ඇද අල්වාගෙණ සිට 'පින් මද නොනිකරු තෙතත්තිය, තිගේ රුව නාට කුමක් කෙ
රේද? අපි තොපගේ රූපයෙන් කා බී රකෙත දෙයෙක් ඇද්ද'? යනාදීත් දොඩා බෝධි
සත්වයන්ගේ ගුණ වර්ණනා කෙරෙමින් 'කෙල්ල ප්‍රභාවතිය, ආරෝහ පරිණාහයෙන් යු
කතවූ සිඩාධගනාව ප්‍රතිභාගවූ විශිෂ්ට රූ ඇත්තෙමි තිගේ රූප සෞන්දර්ය්‍යය හා ඒ
රජාධිරාජවූ කුස රජ්ජුරුවන්වහන්සේ හා සමානකොට නොසිතුව; කුස රජ්ජුරුවන්
වහන්සේ අපරිමිත බල වාහන ද මහානුභාවය ද මුක්තා මාණික්‍ය ශඞ්ඛ ශිලාප්‍රවාල
කනක රජතාදී මහා ධන ඇතිසේක, ත්‍රි මද ගලිත හස්ති රාජයකු පරිද්දෙන් කිසිව
කුනු එසිත් වැළකිය නොහැකි කාය බල ඇතිසේක, අන්න පාන වස්ත්‍රාභරණ ග්‍රාම
ක්ෂේත්‍රාදී සියලු උපභෝග පරිභෝග වස්තුයෙන් සමෘද්ධවූ කාශි කෝශලාදිවූ බො
හෝ රාජ්‍යවලට අධිපතිසේක, සකල ජම්බුද්වීපයෙහි අනන්ත රාජධානිවල ඒ ඒ රජදරු
වණ්ට අග්‍රරාජත් සේක, ශත්‍රු ජන නමැති මත්තහස්තීන් මධ්‍යයට වන් සිංහ රාජයකු
පරිද්දෙන් අභීත සිංහ නාද ඇතිසේක, පුරවිතෙදිල්ලෙණ්ට බදුවූ ලීලෝපේතවූ ගීත
ස්වර ඇතිසේක, ගම්භීරෝදාර මධුර ශ්‍රවණීය රමණීය කමනීය ප්‍රාර්ථනීය මධුර ස්වර ඇති
සේක, ස්වයම්භූ ඥානයෙන් ප්‍රතිවේදනයකරණලද අක්ෂර ලිඛිත ගණිත ගන්ධර්වාදී අ
ෂ්ටාදශ විද්‍යාස්ථානාදී අනේකශත ප්‍රභේද භින්නාදී ශිල්පයන් ඇතිසේක, උභය
කුල පරිශුද්ධ අනන්‍ය සාධාරණ ශුභ ගුණ මණි ගණාකීර්ණ ඉක්ෂ්වාකු වංශභූතවූ කුස
රජ්ජුරුවන්වහන්සේගේ ඇති ගුණ සලකා තොපගේ 'රූ ඇත්තෙමි' යන නද මින්
ඇර උන්වහන්සේ කෙරෙහි සෙනෙහස පතුරුවා ලව' යි යනාදීත් බෝධිසත්වයන්ගේ
නොයෙක් ගුණ කියා අවවාදකළාය. ඉක්බිති ඒ බස් අසා ප්‍රභාවතී තොමෝ කෝප
යෙන් දිලී?, 'කුදා, තෝ තිගේ පමණ නොදත ගර්ජනාකරන්නෙහිය, අතට පැමිණි

---

1 වස්ත්‍රාභරණ=වස්ත්‍ර, ආභරණ. තාම්බූලාදී=තාම්බූල, ආදී. 12 ජිහ්වාච්ඡේදනය=ජිහ්වා, ඡේදනය. 16 සිඩාධගනාව=සිඩ, අධගනාව. 25 ගම්භීරෝදාර=ගම්භීර, උදාර. 26 ගන්ධර්වාදී=ගන්ධර්ව, ආදී. 28 ගණාකීර්ණ=ගණ, ආකීර්ණ.

යා විනම් ස්වාමිදරුවන් ඇති නියාව අදුන්වාලම්' යනාදීන් කියා කුද හයගැන්වූව. එසඳ කුදත් 'එම්බල, නී රක්නා නිසා මෙ නෙක් දවස් මුලුල්ලෙහි කුස රජ්ජුරුවන් මෙ නුවරට ආ නියාව; තොපගේ පියානන්වහන්සේට නොකීමි, වන්නාට අද දවස් රජ්ජුරුවන්වහන්සේට කියා තිට නිගඩක් කියවන්නෙමි වේද' යි මහත්කොට කියා උන් හයගැන්වූව. ප්‍රභාවතී ද ඒ අසා හැන් වෙවුලා, 'මැනියෙනි, එසේ නොකීව මැනවැ' යි කියා කුද අස්වැසූහ. මහා බෝධිසත්ත්වයෝ ද ප්‍රභාවතීන්ගේ දැකුමුත් නොලැබ 'දුර්භෝජන දුක්ඛ සෙය්‍යාදීන් සත් මසක් මුලුල්ලෙහි දුක් විඳත් මැගේ දැකුම් විඩරකුත් නොලබම්, ඉතා තද පරුෂ බස් ඇතිවූ මැගෙන් මට ප්‍රයෝජන කිම්ද? මාගේ රටට ගොස් මව් පිය දෙදෙනා දැක වාසය කෙරෙම්' සිතූහ.

එද්‍ද සඳ මනුෂ්‍ය ලෝකය බැලූ ශක්‍ර දේවේන්ද්‍රයෝ කුස රජ්ජුරුවන් සත් මසක් මුලුල්ලෙහි දුක් විඳත් ප්‍රභාවතීන් දක්ක නොහී උකටලීවූ නියාව දැක 'ඈ ලැබෙණ්ට නිසි කාරණයක් කෙරෙමි' යි සිතා මද්‍ර රජ්ජුරුවන්ගෙන් ගිය දූතයන් බඳුකොට 'ප්‍රභාවතී තොමෝ කුස රජ්ජුරුවන් හැර පියා පලා අවුය, වහා අවුත් උන් කැඳවාගෙණ යව' යි සත් රජ්ජුරු කෙනෙකුණ්ට වෙන වෙනම පත් අසුන් ඇතිව දූතයන් යවූහ. ඔවුන් දැක රජ්ජුරුවෝ සතුටුව වෙන වෙනම සිය සෙනග පිරිවරා සාගල නුවරට අවුත් වටලාගෙණ උන්න දැක 'තොපි කුමක් නිසා අවුද' යි ඔවුනොවුන් විචාරා 'ප්‍රභාවතීන් නිසා මද්‍ර රජ්ජුරුවන් විසින් කැඳවා යවූ හෙයින් ආම්හ' යි යනු අසා 'මේ තෙම තමාගේ එක දුව අප සත් දෙනාටම දේද? මුන්ගේ නොකටයුතක් තක් බලව, අප හැම වෙහෙසුයේය' යි දණ්ඩෙන් ගැසූ විෂඝෝර සර්පයන් පරිද්දෙන් කිපී 'වෙන වෙනම අපට ප්‍රභාවතීන් හෝ දෙව, යුධ හෝ කරව' යි පත් හසුන් යවූහ. ඒ අසා මද්‍ර රජ්ජුරුවෝ බලවත් හයට පත්ව අමාත්‍යයන් කැඳවා 'කුමක් කරමෝද' යි විචාළහ. එ කල අමාත්‍යයෝ 'දේවයන්වහන්ස, මේ රජ දරුවෝ සත් දෙන ප්‍රභාවතීන් නිසාම අවුය, ඉදින් නුදුනහොත් පවුරු පදනම් වාසල් බිඳගෙණ නුවරට වැද ජීවිතක්ෂයට පමුණුවා රාජ්‍යය හැරගණුම්හ යි කියා සේනාව සන්නද්ධකොට ගෙණ යුධාභිමුඛව සිටිනාහ, වද්නට පළමුකොට ප්‍රභාවතීන් යවම්හ' යි කිවාහුය. එ බස් අසා රජ්ජුරුවෝ 'එක්කෙනෙකුණ්ට ප්‍රභාවතීන් පාවාදුන්නමෝ නම් සෙස්සෝ යුධකරන්නාහ; එහෙයින් එක් කෙනෙකුණ්ට දී සංසිඳවිය නොහැක්ක; මුලු දඹදිව අග්‍රරාජන්ව සිටි කුස රජ්ජුරුවන් හැර පියා ආ ගමනට විපාක දක්වම්, මැ සත් කඩක් කොට කපා රජ දරුවන් සත් දෙනාට දී පියා ගැලවෙම්හ' යි කිවුය. එ ලෙස රජ්ජුරුවන් කී බස් රාජාඞ්ගණය මුලුල්ලෙහි ප්‍රකාශව ගියේය. එ පවත් ඇසූ පරිවාර ස්ත්‍රීහු ගොස් ප්‍රභාවතීණ්ට කීහ. එ බස් අසා ප්‍රභාවතී මරණ හයින් පෙළී හඬමින් උනස්නෙන් නැගී ජාම්බෝනද සුවර්ණයට බඳුවූ රන් වත් පැහැ ඇති රන් කම්

7 සෙය්‍යාදීන්=සෙය්‍යා, ආදීන්. 25 යුධාභිමුඛව=යුධ, අභිමුඛව. 30 රාජාඞ්ගණය=රාජ, අඞ්ගණය.

Digitized by Google

ක් විසිතුරුවූ වස්ත්‍ර ධාරීවූ තරුන් හා පරිවාර ස්ත්‍රීන් විසින් පිරිවරණලදුව මෑනියන් ගේ ගෙට ගොස් නමස්කාරකොට අඬ අඬා සිට ‘මෑනියන්වහන්ස, මාගේ ශරීරය සනුමුවන සඳුන් තුවරලා කස්තුරු කපුරු ආදී සුවඳ සුන්නෙන් උලා ඔප් නගණලද ප්‍රියකරුවූ මනා ඇස් සඟලක් ඇති නිම්ලවූ කිසි කැලලක් නැති පෙම්බරවූ දළකඩ මිටි ඇති කැඩපතකින් බල බලා සරහණලද මාගේ මේ මුඛ බිම්බය මේ සත් රජුන් විසින් දමනලදුව තිබෙන්නේ වේද. තවද මෑනියන්වහන්ස, බමර වැල සලා මෙන් ඝන නිල් අක් බඹුරු සිනිඳු මොලොක් දික්වූ සඳුන් සාන්දු ජබාදු ආදි සුවඳ ගන්වනලද මේ මාගේ කෙස්වැටිය අමු සොහොන්හි දමනලදුව උකුස්සෝ ගිජුලිහිණි ආදී පක්ෂීහු පසුරෙන් බදාගෙණ ආකුලව්‍යාකුලකොට ඇත මෑත අදිනාහු වේද. තවද මෑනියන්වහන්ස, පබළු දළු මෙන් රත්වූ නිය ඇති සාවුන් බඩ ලොම් සේ මෘදු කෝමල තුනු ලොමින් ගැවසී ගත් රන් සඳුන් සුවඳ ගල්වනලද මනෝඥවූ මාගේ හස්ත යුගලය මේ රජුන් විසින් කපා වල දමනලදුව කොක්කාවුන් විසින් ඒකාන්තයෙන් ඩැහැගෙණ යන්නේ වේද. තවද මෑනියන්වහන්ස, මාගේ මේ සුවර්ණ තාල ඵලයට බදුවූ උපමා ඇති මුඛ පද්මයෙහි ලොල්ව උඩබලා උන් සුවර්ණ චක්‍රවාක යුගලයක් මෙන් ශුණුවාවූ වට මටවූ සඳුන් කොකුමඟරා මුතු හරින් හොබනාවූ මෙ මා තන යුගලය කපා වල දමන කල්හි මෑනියන්ගේ තනයෙහි එල්ලුණු බාල දරුවන් පරිද්දෙන් කැනහිල්ලු එල්ලෙන්නාහු වේද. තවද මෑනියන්වහන්ස, මේ මාගේ රන් පෝරුවක් මෙන් පළල්වූ තලා හඹා වේලා මනෝඥකොට කරණලද රන් රසු දැලින් යුක්තවූ මෙවුල්දමින් සජ්ජිතවූ කටී ප්‍රදේශය මෙ රජුන් විසින් කපා වල දමනලදුව කොක්නහවු ඩැගෙණ කැමති තැනකට ගෙණ ගොස් කන්නෝ වේද. තවද මෑනියන්වහන්ස, බල්ලෝය කොක්නහවුය කැනහිල්ලුය යනාදිවූ දළ ඇති සත්වකෙනෙක් ඇත් නම් ඒ සියලු සත්වයෝ ප්‍රභාවතීන්ගේ ශරීර මාංස නමැති රසායනය අනුභවකොට ඒකාන්තයෙන් අජරාමරවෙති සිතම්. තවද මෑනියන්වහන්ස, මේ එක්වූ රජ දරුවෝ සෙනඟයෙන් ඉඳුක් මාගේ ශරීර මාංසය ලියාගෙණ ගියානු නමුත් ඔවුන්ට යාච්ඤාව කියාත් ඇට ඇරගෙණ දෙමං අතුරෙක්හි දවාපුව මැනව. තවද මෑනියන්වහන්ස, ඒ සොහොන් බිම මල්වනු කරවා එහි උඩු කිණිහිරිගස් මෑ ඇතිකරවා හිම කාලයාගේ කෙළවර මැදින් මස පීපී වැණී ගිය මල් ගෙන්වා ගෙණ රන් සුමුගෙක් පුර ඔර පිට තබාගෙණ ‘මාගේ දියනියන් ප්‍රභාවතීන්ගේ ජවී වර්ණය මෙ බඳුය’ යි බල බලා මා සිහිකල මැනවැ’ යි යනාදීන් වලපමින් මෑනියන්ගේ සමීපයෙහි සිට හැඬූහ. ඒ සඳ මද්‍ර රජ්ජුරුවන්ගේ නියෝගයෙන් වධකයා තමාගේ පොරවත් කොලොම්බුවත් ඇරගෙණ රජගෙට ආයේය. ඒ වධකයා ආ බව රාජාඞ්ගණයෙහි ප්‍රකාශවිය. ඒ අසා ප්‍රභාවතීන්ගේ මෑනියෝ රජ්ජුරුවන් කරා අඬ අඬා ගොස් පොරොව හා කොලොම්බුව දුන ‘දේවයන්වහන්ස, මනාව හැදුරුණු සිහින් සිනුවලඟ ඇති මාගේ දියනියන් මේ පොරොවෙන් කපා බෙදා මේ සත් රජ්ජුරුවන්ට දෙවන සේක්ද’ යි විචාළෝය.

---

15 කොකුමඟරා=කොකුම, අඟරා. 31 රාජාඞ්ගණයෙහි=රාජ, අඞ්ගණයෙහි.

Digitized by Google

ඉක්බිති රජ්ජුරුවෝ නිසවුත් ශිවිස්වමින් 'දේවීනි, ප්‍රභාවතීන් කපා කොදී අනික් කු මක් කෙරෙමුද? තොපගේ දියණියෝ සියලු දඹදිවට අග්‍ර රජ්ජුරුවන් විරූපයයි හැ රජ්ජයා ගිය මග එම පිය නොමැනෙන තෙක් මරණ නලල නිබාගෙණ අවුය; දූන් ත මාගේ රූ. නිසා තරණලද ඊෂ්‍යාවෙහි විපාක ලබන්නී වේද' යි කීය. එ බස් අසා සිසව අයනියන් ලඟට ගොස් අඬමින් වලපමින් 'දියණියෙනි, තොපට අමනාපයක් සිතිලත් නොසිතස්නාවූ මාගේ බස් නොඇසීම තොප දූන් ලේ පෙර පෙරග සත් කඩක් කොට කපා මේ රජදරුවණ්ට දෙනලදුව යමපුරයට යන්නෝ වේද. තවද මේ ලෝකයෙහි යම සැලයෙක් වැඩෙහි හැසිරෙණ හිතෙස්නුගේ කීම නොකරන් නෙද එ තෙම මෙ බඳුවූ දුක් කම්කටුලුට ද නොයෙක් අනය ව්‍යසනයට ද පැමි ණෙයන්නේය. තවද රත් කම්බුපුල මාණික්‍ය මෙඛලා දාමයෙන් විරාජමානවූ ප්‍රභාවතීනි, ඉඳින් තමා තොපගේ සිත් පස්සෙ නොගොස් උභය කුල පරිශුද්ධ අභිජාතින්ත වූ සූර්‍යවංශ ප්‍රසූත සෞර වියන් විඥාත්ත සමන්විත කුස රජ්ජුරුවන් හා එක්ව තොප හා සමාන රූප ශ්‍රී ඇති දූකුම් කාවුනාවූ කුමාරකෙනෙකුන් ලදහොත් අප ඇම අයුළුවූ බොහෝ ඥාති වර්ගයා උසින් සත්කාර සම්මානනා කරණලදුව සියලු දුක් දුරුකොට බොහෝ දවසක් සැපසෙ වාසයකරන්නාහු වේද. තවද මාගේ සොඳුරුවූ දියණියෙනි, යම කුස රජක්හුගේ මණි කනක රජතාදි විචිත්‍රවූ කර්මාන්තයෙන් යුක්ත රාජ භවනයෙහි සර්වාභරණයෙන් සැරසුණාවූ දිව්‍යාඞ්ගනා ප්‍රත්‍යාග පුරාඞ්ගනාවන් විසි න් වයනලද පඤ්චාඞ්ගික තූර්‍ය නාද අනවරතයෙන් පවත්ද, මනාවූ ලක්ෂණවත් මඞ්ගල හස්තීන් ප්‍රධානකොට ඇති කෛලාස කූට ප්‍රතිභාග අනේක ශත මත්ත හ ස්තීන් නාදකෙරෙද්ද, තවද ප්‍රභාවතීනි, රාජාඞ්ගණයෙහි උදෑසණ සවස මනාවූ ලක්ෂ ණ ඇති මඞ්ගල අශ්වරාජයා ප්‍රධාන ක්ෂීර සාගරයෙහි තරඞ්ග පරම්පරාවෙහි උපරි මානවූ නොයෙක් දහස් ගණන අශ්වයෝ කුලමානය ශෙසාංව පවත්නාහුද, තවද ය ම් කුශාවතී රාජධානියෙහි ඒ ඒ ස්ථානයෙහි සර්වාභරණ විභූෂිත ස්ත්‍රී විලාසදරයන වැනවූ තරු නාටක ස්ත්‍රීනියෝ නොයෙක් ප්‍රභේද ඇති නෘත්‍ය නාට්‍යයන ගෙණ යැම මෙවලි සිම සුඛිත මුදිතව සේවය කෙරෙද්ද, තවද ප්‍රභාවතීනි, කුස රජ්ජුරුවන්ගේ යම ගෘ හෝද්‍යානයෙහි විද්‍යුල්ලතා සදෘශව විරාජමානවූ සව ... මයූර රාජයන් විසින් මිහිඟු බෙර හඬින මහත්ව පවත්වනලද කේකානාදයෙන් ද කොයිල්ලිහිණියන් විසින් පවත්වනලද ද අනුරාගයෙන් ද හරින විද, එ බඳුවූ ශ්‍රී සෞභාග්‍ය හා ඓශ්වර්‍ය විශේෂ ඇති ඒ කුශාවතී රාජධානියෙහි ඉපුරු හැර ඊට වඩා තවර සැපයෙක් නොයි ඇති හෙයින් එට අවුද්' යි යනාදීන ප්‍රභාවතීන්ට අවවාද වශයෙන් කුශාවතියෙහි විභූති වර්ණනාකොට 'ඉඳින් ඒ කුසරජ්ජුරුවෝ අද මෙ තන ට තා මෙ සත් රජදරුවන් මරා ලුහුබැඳවා මාගේ දියණියණ්ට පැමිණි මෙ දුක් දුරුකොට කැඳවාගෙණ යන්නෝ වේද, කසුටු රැසක් කැටක් ගසා ලනනාක් මෙන තමන්ගේ වචන මාත්‍රයකින්ම සකල ශත්‍රු මර්දනක

16 රජතාදී=රජත, ආදී. 17 සර්වාභරණයෙන්=සර්ව, ආභරණයෙන්. දිව්‍යාඞ්ගනා= දිව්‍ය, අඞ්ගනා. පුරාඞ්ගනාවන්=පුර, අඞ්ගනාවන්. 20 රාජාඞ්ගණයෙහි=රාජ, අඞ්ගණ යෙහි. 23 සර්වාභරණ=සර්ව, ආභරණ. 25 ගෘහෝද්‍යානයෙන්=ගෘහ, උද්‍යානයෙහි.

Digitized by Google

රන්නාවූ ඉදින් සිතුවහොත් එක් සියයක් රාජධානීන් හැරගණ්ට නිසිවූ සමර්ථ ඇති ඊසිකුවූ ප්‍රඥානුභාව ඇති ඒ කුසරජ්ජුරුවෝ අද මේ නුවර වී නම් අප හැමට පැමිණි මේ දුකින් ගලවාහන්නාහුය' යි යනාදින් කුස රජ්ජුරුවන්ගේ බොහෝ ගුණ කථනය කළාහුය. ඒ කල්හි ප්‍රභාවතී තොමෝ 'කුස රජ්ජුරුවන්ගේ ගුණ කියන්නාවූ මාගේ මෑනියන්වහන්සේගේ මුඛ නොසෑහෙන්නේය, එසේ හෙයින් උන්වහන්සේ අරක්කැමි කම් කොට මේ ගම වසන බව මෑනියන්වහන්සේට කියමි' සිතා 'මෑනියන්වහන්ස, අනන්‍ය සාධාරණ ගුණ ගණාභරණ විභූෂිත ශෞර වීර්‍ය්‍ය බල පරාක්‍රම ප්‍රතාප ප්‍රඥාගුණ ඇති මේ සතුරන් නසා අප හැම රක්ෂණ්ට නිසිවූ කුස රජ්ජුරුවන්වහන්සේ අපට ආලාරිකව මෙ තනම වාසයකරණසේක, උන්වහන්සේ කැඳවමිද' යි විචාළාය. ඉක්බිති 'ප්‍රභාවතිනි, මරණ භයින් ජඩීතව නත්දෙඩව්ද? අඥානයෙන් මූඪව ප්‍රලාප දෙඩව්ද? බොලදකමින් කිවමනා දෙය තබා අනිකක් කියව්ද? තොප මෙ කියන්නේ කිම්ද? ඒ කුස රජ්ජුරුවෝ ඉදින් මේ නුවරට අවුනම් අපට නොදැනෙණ්ට කාරණ කවරේද? ඉදින් එත් නම් අපට කියා එවා තමන්ගේ සේනා වාහණයන් පිරිවරා නේන්ද? මෑගේ කුමන නත්දෙඩීමෙක්ද?' යනාදින් දෙඩූය. එසඳ ප්‍රභාවතී 'මෑනියන්වහන්සේ කුමක් කීවත් අදහා නොගන්නාසේක, ප්‍රත්‍යක්ෂයෙන් දක්වාලා කියමි' සිතා මෑනියන්ගේ අත අල්වාගෙණ මතු මාල් තලයට නැගී ගොස් සිව්මැදුරු කවුළුව හැර පිටත බලා වලන් සෝදමින් සිටි බෝධිසත්ත්වයන් දිශාවට අත දික්කොට 'මෑනියන්වහන්ස, නෙල කුමාරිකාවරුන්ගේ අන්තඃපුර ආසනනයෙහි මුළුතැන්ගෙයි මිදුලෙහි තරයේ කැසපට ගන්වා අරක්කැමි වේශයෙන් නැබුරුව සිට වලන්සෝදනසේක් කුසරජ්ජුරුවන්වහන්සේය' යි දැක්වූය. ඒ කල බෝධිසත්ත්වයෝ 'ප්‍රභාවතී නිසා සත් රජ්ජුරු කෙනෙක් මේ නුවර වටලා ගත්තාහ' යි යනු අසා 'අද දවස් මාගේ මනෝරථය මුදුන් පැමිණෙන්නේය, මාගේ මේ ගමට ආ නියාව අද දවස් ප්‍රභාවතී දෙමව්පියන්ට කියන්නීය, ඒ අසා මා ගෙන්වා ගෙණ උන් මට පාවා දෙති. ඒ කල මා ගත් දුක් සාර්ථකවන්නේය යි වලන් සෝධා තැන්පත්කොට තබමි' සිතා පැන් ගෙණවුත් වලන් සෝදණ්ට පටන්ගත්හ. එසඳ වලන් සෝදමින් සිටි රජ්ජුරුවන් දැක දියණියන්ට උරණව 'කෙල්ල, තෝ චණ්ඩාල එකක්ද? අවශේෂ හීන ජාතියෙහි එකක්ද? නොහොත් මෙ බුදු රාජවංශය නසණ්ටය යි උපන් එකක්ද? මද්‍ර රජ කුලයෙහි උපන් නෝ සකල රාජ මෞලි මාණික්‍ය කාන්තිය ඔබතලද පාදපීඨ ඇති තොපගේ පල්ලහවූ කුස රජහු ලවා සූද ක්‍රියා කරවූද' යි පරිභව බිණූය. ඉක්බිති ප්‍රභාවතී තොමෝ 'මාගේ මෑනියන්වහන්සේ මා නිසා මේ කුස රජ්ජුරුවන්වහන්සේ අවුත් මේ නුවර වසන බව නොදන්නාසේක් වනැ' යි සිතා 'මෑනියන්වහන්ස, මම චණ්ඩාල ස්ත්‍රියකුත් නොවෙමි, නොසු හීන ජාති එකකුත් නොවෙමි, නුඹවහන්සේගේ රාජවංශය නසන එකකුත් නොවෙමි, මේ ඉක්ෂ්වාකු රාජ වංශය

2 ප්‍රඥානුභාව=ප්‍රඥා, අනුභාව. 7 ගණාභරණ=ගණ, ආභරණ.

ට තනාණලද කේතුවක් වැනි රජ්ජුරුවන්වහන්සේය යි දනිමි. ඉඳින් නුඹවහන්සේලා සිතත් මම මුන්වහන්සේ දැස කෙනෙකුනැයි නොසිතමි' කියා බෝධිසත්ත්වයන්ගේ ඓශ්වර්ය්‍ය වර්ණනාකරන්නාවූ ප්‍රභාවතී තොමෝ 'මෑනියන්වහන්ස, මේ කුස රජ්ජුරුවන්වහන්සේ ත්‍රිපිටකවෙහි පාරප්‍රාප්ත සදාචාර නිරතවූ විසි දහසක් පමණ බ්‍රාහ්මණයන් තමන්වහන්සේගේ මාලිගාවෙහි මධුරන්න පානයෙන් සන්තර්පණය කරවනසේක්ද, තවද රන් සැන් රන් පොරෝදු රන්සන්නාහයෙන් සදනලද කනක ගිරි ශිඛර සුන්දරවූ ත්‍රිමද ගලිතවූ විසිදහසක් පමණ හස්තිපූ සතනයෙන් සැරහී සිටිද්ද, යම් රජ්ජුරු කෙනෙකුන්වහන්සේගේ ප්‍රචණ්ඩ මාරුතයෙන් මෙහෙයනලද ශරත් කාලයෙහි මේඝ කූට නිකර සුන්දරවූ මනෝඥ ලක්ෂණාන්විත රාජ වාහන යෝග්‍යවූ නොයෙක් අශ්වාලඞ්කාරයෙන් සරහනලද විසිදහසක් පමණ අශ්වයෝ හැම වේලෙහිම සන්නද්ධව සිටිද්ද, තවද මේ රජ්ජුරුවන්ගේ සුරලෝකාවතීර්ණ සුන්දර විමානයක් මෙන් ශෝභමානවූ නගනලද ධවලාත පත්‍රයෙන් විරාජමානවූ මනාව සරහනලද සිංහාසනයෙන් සශ්‍රීකවූ සුර සුන්දරීන් සමාන පුර සුන්දරීන් විසින් සලනලද චාරුචාමර නිකරාකීර්ණවූ සියලු රථාලඞ්කාරයෙන් විචිත්‍රකොට සරහනලද එල්වනලද මලොලඹු මල්දම් රන්මිණි කිකිණි දැලින් ශෝභමානවූ විසිදහසක් පමණ රථ නිරන්තරයෙන් සැදී සිටිද්ද, තවද යම් රාජෝත්තමයකුගේ ධරණි තලාවතීර්ණ අනේක වර්ණ ඇති අභ්‍ර කූට සහස්‍රයෙන් ශෝභමානවූ ඝන ගර්ජනානුකාර බෘංහිත ගර්ජනා ඇති නිසාන තම්මැට එකැස්බෙර ආදීන් සරහනලද පිටු ඇති විසිදහසක් පමණ වෘෂභරාජයෝ මදාන්ත හස්තීන් මෙන් තප්ලා කුර ඇත සිටිද්ද, තවද රක්ත නීල ශ්වේත කෘෂ්ණාදී අනේක වර්ණ ජවලවූ අනවරතයෙන් වැහෙන්නාවූ ක්ෂීර ධාරා සහස්‍රයෙන් සංසිඳුවනලද ග්‍රීෂ්ම සන්තාපය ඇති ශකතවූ තුඞ්ග තරඞ්ග භඞ්ගාකාර ඇති විසිදහසක් පමණ දෙනුන් සතනයෙන් රජත් සවර්ණමය භාජන පුරා ක්ෂීර දෝහණය කෙරෙද්ද' යනාදීන් ප්‍රභාවතීන් කුස රජ්ජුරුවන්ගේ යශෝවිභූතිය ප්‍රශංසාකොට 'මෙ බඳු ඓශ්වර්ය්‍ය ඇති රාජාධිරාජයා නුඹවහන්සේම දහස කොට සිතන පමණ විනා මම එ ලෙස නොසිතමි' යනාදීන් බෝධිසත්ත්වයන්ගේ ගුණ කථනයකළාය. එ කල ඛිසව් තොමෝ මෑ අසම්භිනව කියන්නීය, ඒකාන්තයෙන් අදහගෙණ මදුරජ්ජුරුවන්කරා ගොස් එ පවත් කීවිය. එ බස් අසා රජ්ජුරුවෝ සුහුව ප්‍රභාවතීන් කරා ගොස් 'දියනියෙනි, කුසරජ්ජුරුවන් මෙ නුවරට ආයේ සැබෑද' යි විචාළහ. එ සඳ ප්‍රභාවතී 'එසේය, පියානන්වහන්ස, උන්වහන්සේ මේ නුවරට අවුත් රාජ කුමාරිකාවරුන්ට අරක්කැම් කම කරන්නේ දැන් සත් මසෙකැ' යි කිව්ය. ඒ අසා මද්‍ර රජ්ජුරුවෝ උන්ගේ බස් අදහා නොගෙණ කුද කැඳවා විචාරා නියමකොට දැන 'එම්බල කෙල්ල, වෙස් වලා මධු

5 මධුරන්න=මධුර, අන්න. 9 අශ්වාලඞ්කාරයෙන්=අශ්ව, අලඞ්කාරයෙන්. 11 සුරලෝකාවතීර්ණ=සුරලෝක, අවතීර්ණ. 13 නිකරාකීර්ණවූ=නිකර, ආකීර්ණවූ. 14 රථාලඞ්කාරයෙන්=රථ, අලඞ්කාරයෙන්. 16 තලාවතීර්ණ=තල, අවතීර්ණ. 17 ගර්ජනානුකාර=ගර්ජනා, අනුකාර. 21 භඞ්ගාකාර=භඞ්ග, ආකාර. 23 යශෝවිභූති=යශස්, විභූති.

Digitized by Google

වෙසින් පැමිණි විෂඝෝර සර්පරාජයකු පරිද්දෙන් සකල භුවන ශේඛරවූ විශිෂ්ට කාය බල ඥාන බල ඇති කුස රජ්ජුරුවන් වෙස් වලා තොප නිසා මීට අවුත් සත් මසක් මුළුල්ලෙහි දුග්ගණිමින් සිටියදී අපට නොකී හී කලදෑ ඒකාන්තයෙන් වැරැද්දේය යනාදීන් ප්‍රියනියණ්ට දෙඩා වේගයෙන් ඉක්මන්ව බෝධිසත්වයන් කරා ගොස් සුව දුක් විචාරා බද්ධාඤ්ජලිව සිට 'මහ රජ්ජුරුවන්වහන්ස, සත් මසක් මුළුල්ලෙහි දුග්ගණිමින් සිටියදී නුඹවහන්සේ මෙවෙස් වලා අවුත් මේ ගම සිටි බව නොදනුම්හ; ඒ අප නොදැන කළ වරදට ක්ෂමාකළ මැනවැ' යි යාච්ඤාකළාහ. එ බස් අසා මහාබෝධිසත්වයෝ 'ඉදින් මම කදනොට කීම් නම් මොහුගේ ළය පැළී යන්නේය, එසේ හෙයින් අස්වසා කියම්' යි සිතා වලාන් අස්සෙ සිට 'දේවයන්වහන්ස, මෙ බඳුවූ මම සම්ප්‍රාප්තවූ රාජ්‍ය ශ්‍රීය හැර ප්‍රභාවතීන් කෙරෙහි බද්ධාභිලාෂයෙන් වෙස් වලා අවුත් අරක්කැම් කම් නොකෙරෙමින් දුක් වූනිමුද කළ ඒ අනාචාරය අධිරාජත්ව සිටි මා බඳුන්ට නුසුදුසු හෙයින් මාගේම වරද් විනා නුඹවහන්සේගේ වැරැද්දෙක් නැත්තේය; එ හෙයින් මෙ මා කළ දෙයට නුඹවහන්සේ ක්ෂමාකොට වදාළ මැනවැ' යි කීහ. එ සඳ මද්‍ර රජ්ජුරුවෝ මහා බෝධිසත්වයන් විසින් ප්‍රිය වචනයෙන් කියනලද පිළිසඳර කථා ඇතිව සන්තෝෂ ප්‍රාප්තව ප්‍රාසාදයට ගොස් ප්‍රභාවතීන් කැඳවා 'නුවණැති තෙනැත්තිය, මහා බල පරාක්‍රම ඇති කුස රජ්ජුරුවන් කරා ගොස් ක්ෂමාකරගණුව, ඒ කුස රජ්ජුරුවෝ තොපට පැමිණි මේ භය දුරුකොට ජීවිතය රැක දෙන්නාහුය, වහා ගොස් ක්ෂමාකරගණුව' යි කීහ. එ සඳ ප්‍රභාවතී පිය රජ්ජුරුවන්ගේ බස් අසා නඟුන් හා පරිවාර ස්ත්‍රීන් විසින් පිරිවරා බෝධිසත්වයන් සිටි තෙනට ගියාය. කුස රජ්ජුරුවෝ ද මෙහෙකෙරෙමින් සිට ප්‍රභාවතීන් තමන් කරා එන නියාව දැන 'දැන් මම මැගේ මත් බිඳ මාගේ පා පිට මඬෙහිම වැද හොවම්' සිතා වලන්වල තිබූ පැන් බිම නමා කාලවිටක් පමණ තැන් පාගා බොරකොට බොර මඬෙහි සිටියාහුය. එ කල ප්‍රභාවතී ගොස් බෝධිසත්වයන්ගේ පත්ලෙහි ඉස තබා මහ පවනින් මුලිනුපුටා එලනලද ස්වර්ණ තාල ස්කන්ධයක් පරිද්දෙන් මඬෙහි වැද වැතිර තමාගේ සුරක්ත පල්ලවාභිරාමවූ මෘදු කෝමල පාණි යුගලයෙන් මහා බෝධිසත්වයන්ගේ තරුණ අරුණ කිරණ සම්පත්තියෙන් ප්‍රක්ෂිප්තවූ සන්ධ්‍යා රාග නිර්විශේෂවූ ප්‍රභා භාසුර පාද පද්ම යුගළය අල්වා ගෙණ මරණ භයින් පීඩිතව මහ හඬින් හඬ හඬා 'දේවයන්වහන්ස, මාගෙන් වෙන්ව නුඹවහන්සේ විසින් රාජ්‍ය ශ්‍රී විභූතිය හැර අපමණ දුඃඛයෙන් යම් පමණ කලක් ඉක්මවනලදද එ පමණ කාලයක් මුළුල්ලෙහි මා විසිනුත් දුර්භෝජන දුක්ඛ සෙයනාදීන් හා ස්නාන පාන රහිතවීමෙන් නුඹවහන්සේ සේම දුකින්ම දවස් යවනලද්දේය; එසේ හෙයින් මට නොකිපී ක්ෂමාකොට වදාළමැනව. තවද මහ රජ්ජුරුවන්වහන්ස, මාගේ සත්‍ය වචනයෙක් ඇසුව මැනව: මම මෙතැන් පටන් දිවි හිමි

---

5 බද්ධාඤ්ජලිව=බද්ධ, අඤ්ජලිව. 7 'වරදට' වෙනුවට සමහර පොතක 'අපරාධයට' කියා තිබේ. 10 බද්ධාභිලාෂයෙන්=බද්ධ, අභිලාෂයෙන්. 23 මුලිනුපුටා=මුලින්, උපුටා. 25 පල්ලවාභිරාමවූ=පල්ලව, අභිරාමවූ.

Digitized by Google

යෙන් නුඹවහන්සේට කයින් වචසින් මනසින් අමනාපයක් නොසිතමි නො
කරමි, ඉදින් මා මෙසේ යාච්ඤාවෙමින් සිටියදී මට ක්ෂමා නොකොට මාගේ බස්
නොපිළිගන්සේක්විනම් දූන් ම පියානන්වහන්සේ මේ සත් රජ්ජුරුවන්ට මා සත්
කඩක් කොට කපා දෙනසේක, එසේ හෙයින් මට ක්ෂමා කොට මා රැක්ක මැනවැ'
යි යාච්ඤා කළාය. එ කල්හි කුස රජ්ජුරුවෝ ප්‍රභාවතීගේ බස් අසා 'ඉදින් 'සබඳ, තො
පිම වෙද දන්නා, ඒ මට ඇසිද්ද' යි කියන්නම් මුන්ගේ ලය පැළීයන්නේය, එහෙයින්
මුන් අස්වසා කියමි' සිතා 'ප්‍රභාවතීනි, තෙපි මෙ ලෙස යාච්ඤාවෙමින් සිටියදී කුමක්
නිසා තොපකීවා නොකෙරෙව්ද ? තොප කෙරෙහි මාගේ මදකුත් කෝපයෙක් කන
ස්සල්ලෙක් නැත්තේය තවද තෙපි කිසිවකටත් නොබව. තවද කලණ ගුණයන්
ඇති රාජ පුත්‍රිය, සත්‍ය වචනයක් ඇත, කියමි: මමත් මෙ තැන් පටන් කයින් වච
සින් මනසින් අප්‍රියයක් නොකරමි, මේ එක මද්‍රරජ කුලය තබා මෙ බඳු නොයෙක්
සිය ගණන් රාජ කුලයන් මර්දනයකොට මා කැමති පරිද්දෙන් තොප ඇරගෙණ යණ්ට
සමර්ත්‍ථවුවත් මම තොප නිසා මාගේ රාජ්‍ය ශ්‍රිය හැර හීණ ක්‍රියා කෙරෙමින් මෙ නො
ක් දවස් මුළුල්ලෙහි දුක් වින්දේ ඒ බඳුවූ මා පෙණී සිටියදී තොපට කිසි යම් භය
කුත් නැත්තේය' යි යනාදීන් ප්‍රභාවතීන් අස්වසා සියලු රජ පිරිවරින් පිරිවරණලදුව
ක්ෂත්‍රිය මායම උපදවාගෙණ 'මා ජීවත්ව සිටියදී මාගේ භාර්‍ය්‍යාව අනිකෙක් ඇරගෙණ
යේනැ' යි කේශර සිංහරාජයකු මෙන් පැලඹෙමින් 'මේ සියලු සාගල නුවර වාසීහු
මා මෙතනට ආ බව දනිත්ව' යි ඇත මෑත පනිමින් අභීත නාද පවත්වමින් අත්
පොළසන් දෙමින් 'දූත් ඒ කොල්ලන් ජීවග්‍රහයෙන් අල්වාගෙණ එමි' සියලු අන්තඃ
පුර වාසීන් අස්වසා, තවද 'මණි කනක රජතාදී විචිත්‍ර චිත්‍ර කර්‍මාන්තයෙන් විරාජමා
නවූ රථානාවෙක්හි හික්මුනාවූ කීකරු සියලු අශ්වාලඞ්කාරයෙන් සරහණලද අශ්වයන්
යොදව, දූත් ශත්‍රු මර්ත්‍ථනයකරන්නාවූ මාගේ බල පරාක්‍රම සාමර්ත්‍ථ්‍යය බලව' යනාදීන්
අභීත නාද පවත්වමින් 'ශත්‍රු මර්දනය කිරීම මට භාරය, තෙපි තොපගේ මාලිගාවට
ගොස් ඉස් සෝඩා නහා සැරසීගෙණ වැද සිදුව' යි ප්‍රභාවතීන් එතැනින් නික්මවූහ. ඒ
කල්හි මද්‍ර රජ්ජුරුවෝ ද කුස රජ්ජුරුවන්ට පිරිස් හරණ පිණිස අමාත්‍යයන් යැවූහ. ඒ
නියෝග ලද අමාත්‍යයෝ ගොස් මුළුතැන්ගෙයි මිදුලෙහි වට තිරයක් බැඳ එලවන
ලද මඟුල් කපුවා විසින් කරණලද දැළි රැවුලු අත්දම් තිබිම් ඇතිව ඉස් සෝඩා නහා
සියලු රාජාභරණයෙන් සැරහී ඇමති මණ්ඩල ආදිය ද මෙ තැන්හිම පිරිවරා මාලිගාවට
යෙමින් අත්පොළසන් දෙමින් සියලු අන්තඃපුර වාසී සත්වයන් බල බලා සතුටුවන
පරිද්දෙන් අභීත නාද පැවැත්වූහ. ඒ සඳ මද්‍ර රජ්ජුරුවෝ මනාව හික්මවනලද රන්
සැත් රන් පොරොදු රත් සන්නාහ කර්‍ණ චාමරාදී සියලු හස්ත්‍යාලඞ්කාරයෙන් සරහණලද්

---

9 'කලණ' වෙනුවට සමහර පොතක සමාන අර්ථ ඇති 'කල්‍යාණ' ද සමහර පොතක 'කරුණ' යන අර්ථ ඇති 'කරුණු' ද දක්නා ලැබේ. 21 අශ්වාලඞ්කාරයෙන්=අශ්ව, අලඞ්කාරයෙන්. 28 රාජාභරණයෙන්=රාජ, ආභරණයෙන්. 31 හස්ත්‍යාලඞ්කාරයෙන්=හස්ති, අලඞ්කාරයෙන්.

Digitized by Google

දැවූ නනතලද බවලාන පත්‍ර ඇති මඟුලැත් සරහා බෝධිසත්ත්වයන් නැංගෙණ පිණිස සවුහ. එකල කුස රජ්ජුරුවෝ ඇතු පිටට පැන නැගී ප්‍රභාවතීන් පශ්චිමාසනයෙහි හිඳුවාගෙණ චතුරඞ්ගිනී සේනාව විසින් පිරිවරණලදුව නුවර නැගෙණහිරි වාසලින් පිටත්ව කැනහිල් රැසක් මධ්‍යයට වන් කේසර සිංහරාජයකු පරිද්දෙන් යුධ භූමියට වැද 'මම කුස රජය, ප්‍රාර්ථනා කෙනෙක් බඩින් තලාව යෙත්ව' යි කියා අසනි සම්ප්‍රාප්ත නිර්ඝෝෂ ඝෝරකොට තුන් යලක්-සිංහ ස්වරයෙන් අභීත නාද පැවැත්වූහ. එ සද කුස නරේන්ද්‍රයාගේ ඒ සිංහ නාදය අසා භය පත්ව ඉස් දූ දූ අත පලා ගොස් පර්වත වන ගහණාදියට වත් මෘග ශූකරාදීන් පරිද්දෙන් ශත්‍රු රජ දරුවන් පිරිවරා සිටි නොයෙක් සිය දහස් ගණන් ඝන ගර්ජනානුකාර භීම නාද ඇති භීම යේනානුකාරී යෝධාභිරූඪ ත්‍රිමදගලිත තරුණ ගජේන්ද්‍ර සේනාව ද, ප්‍රලය කාල ප්‍රවෘත්තොධාර චණ්ඩ මාරුතාභිඝාත සින්ධු තුරඞ්ග තරඞ්ග ගඞ්ගානුකාරී රඞ්ග තුඞ්ග දුර්ජනවූ යුධ මණ්ඩලාභිලාෂ ඇති දහස් ගණන් අසරුවන් විසින් ද උපලක්ෂිත අශ්ව සේනාව ද, වේරම්භ වාතයෙන් ප්‍රේරිතව ඝෝර නිර්ඝෝෂ පවත්වමින් දිගාන්තරාභිධාවනයකරණ විද්‍යුල්ලතා සහස්‍රයෙන් සඥ්කවූ මේඝ කූටානුකාරීවූ රථාලඞ්කාරයෙන් විචිත්‍ර ධ්වජ පතාකා කිඞ්කිණී ගම්භීර චක්‍ර ඝෝෂ ඇති ප්‍රචණ්ඩ දුර්දණ්ඩ කෝදණ්ඩ කාණ්ඩාභිලක්ෂිත ප්‍රබල යෝධාධිෂ්ඨිතරථ සේනාව ද, නානා වේශ ග්‍රහණ භීෂණවූ දුර්වාර ගර්වෝද්ධත පවනාතිපාත වේග ඇති ඛඞ්ග මුද්ගර තෝමර කුන්ත චාරු චාප බාණාදි විවිධ යුධ ග්‍රහණාතිභීෂණ අනේක කෝටි පාබල සේනාවද යනාදී මේ සේනාව මරණ භයින් ත්‍රසනව සිටපිය සිවීඝ නොහී භයෝන්මාදයෙන් මූර්ච්ඡාවට පැමිණ ඔවුනොවුන් ඇඳිනගත නොහී සිය සෙනඟම කොටා වටා දුව පැන පැන විධාපත්ව ඒ ඒ අත දිවපුහ. එ සද මේරු සාරවූ කුස රජ්ජුරුවෝ මයූර පර්වතයෙන් අලලනලද මහා සමුද්‍රය පරිද්දෙන් නිරායාසයෙන් තමන්ගේ සිංහ නාද මාත්‍රයෙන් ඒ ශත්‍රු සාගරය මර්ථනයකොට ප්‍රභාවතීන්ගේ පාණිග්‍රහණය පිණිස ආ සත් රජුන් ජීවග්‍රහයෙන් අල්වා සිටි සද ශක්‍රදේවේන්ද්‍රයෝ තමන්ගේ දහසක් නුවණැස් මෙහෙයා මනුෂ්‍ය ලෝකය බලා ඒ රණ මඬලෙහි ශත්‍රු රජ දරුවන් හා සමග විජය ශ්‍රී කාන්තාවගේ පාණිග්‍රහණය කල අපගේ

---

2 පශ්චිමාසනයෙහි=පශ්චිම, ආසනයෙහි. 3 චතුරඞ්ගිනී=චතුර, අඞ්ගිනී. සමහර පොතක 'හිරි' වෙනුවට 'හිර' කියා තිබේ. 7 නරේන්ද්‍රයාගේ=නර, ඉන්ද්‍රයාගේ. 9 ගර්ජනානුකාර=ගර්ජනා, අනුකාර. යේනානුකාරී=යේනා, අනුකාරී. 10 යෝධාභිරූඪ=යෝධ, අභිරූඪ. ගජේන්ද්‍ර=ගජ, ඉන්ද්‍ර. ප්‍රවෘත්තොධාර=ප්‍රවෘත්ත, ධාර. 11 මාරුතාභිඝාත=මාරුත, අභිඝාත. ගඞ්ගානුකාරී=ගඞ්ගා, අනුකාරී. 12 මණ්ඩලාභිලාෂ=මණ්ඩල, අභිලාෂ. 13 දිගාන්තරාභිධාවනයකරණ=දිග, අන්තර, අභිධාවනයකරණ. විද්‍යුල්ලතා=විද්‍යුත්, ලතා. 14 කූටානුකාරී=කූට, අනුකාරී. රථාලඞ්කාරයෙන්=රථ, අලඞ්කාරයෙන්. පතාකාකිඞ්කිණී=පතාකා, කිඞ්කිණී. 15 කාණ්ඩාභිලක්ෂිත=කාණ්ඩ, අභිලක්ෂිත. 16 යෝධාධිෂ්ඨිතරථ=යෝධ, අධිෂ්ඨිතරථ. ගර්වෝද්ධත=ගර්ව, උද්ධත. පවනාතිපාත=පවන, අතිපාත. 17 බාණාදි=බාණ, ආදි. 19 භයෝන්මාදයෙන්=භය, උන්මාදයෙන්. සමහර පොතක 'භයෙන් උන්මාදයෙන්' කියා තිබේ. 22 නිරායාසයෙන්=නිර්, ආයාසයෙන්. 24 'රණමඬලෙහි' යන්න වෙනුවට 'රණධරණී මණ්ඩලයෙහි' කියාද සමහර පොතක තිබේ.

Digitized by Google

විශුද්ධ ශ්‍රී මහා බෝධිසත්ත්වවූ කුස රාජාධිරාජෝත්තමයාණන්වහන්සේ පර හිංසාවක් නොකොට සිංහ නාද පමණක්ත් කැටක් ගසා නපුරු රැළක් පලවන කලක් පරිද්දෙන් නිරායාසයෙන් කරණලද ශත්‍රු සේනාව මර්දනය දැක සඤ්ජාත ප්‍රීති ප්‍රමෝදයෙන් ප්‍රමුදිතව ‘මේ උත්තම පුරුෂයාගේ විරූපතාව දුරුකොට උත්තම රූප සෞන්දර්යයෙන් සරහන්ට උවමැනවැ’ යි සිතා තරුණාර්ක රශ්මීන් ප්‍රධානයක්මෙන් අප්‍රමාණවූ ‘වෛරෝචන’ නම්වූ අෂ්ටවඞ්ක මාණික්‍ය රත්නයක් තුෂ්ටි දානයෙන් ගෙණ හැර උරසඵලයෙහි පැළඳවූහ. එ සඳ මහා බෝධි සත්ත්වයෝ ඒ සත් රජුන් අල්වා ඔවුනොවුන්ගේ උතුරු සළුවෙන් පිටිතොල අයා බඳවාගෙණ ඒ රණ භූමියෙන් නොයෙක් ජය ඝෝෂා පවත්වාගෙණ මාණික්‍ය රත්නයෙහි ආනුභාවයෙන් දිවි දළින් ඔප්නගා කරණලද සුවර්ණ ප්‍රතිමාවක් මෙන් විරාජමානව අනන්‍යසාධාරණ ශ්‍රී විභූතියෙන් යුක්තව සුර සෙන් පිරිවරා සුජාතාවන් හාසමග ඓරාවණ වාහණාරූඪව අසුර විජයකොට අවුත් වෛජයන්ත ප්‍රාසාදයට වදනා ශක්‍ර දේවේන්ද්‍ර විලාසයෙන් මාලිගාවට වැද මද්‍ර රජ්ජුරුවන් දැක, ‘මයිලනුවන්වහන්ස, නුබවහන්සේට විරුඩව අවුදින් නුවර වටලාගත් ශත්‍රු සේනාව මර්දනයකොට රජ දරුවන් සත් දෙනා ජීවග්‍රහයෙන් අල්වාගෙණ ආමි, මොවුන් මරනත් මැරුව මැනව, අරිනත් හළ මැනව, වහල් මෙහෙ ගන්නත් ගත මැනව, කැමැත්තක් කළ මැනවැ’ යි කීහ. එ බස් අසා මද්‍ර රජ්ජුරුවෝ ‘මහ රජ්ජුරුවන්වහන්ස, අප හැම දෙනාටම ප්‍රධානව සිටි හෙයින් මොහු නුබවහන්සේටම සතුරෝමය, මරනත් තබනත් අරිනත් නුබවහන්සේටම කැමැත්තක් කළ මැනව’ යි කීහ. මද්‍ර රජ්ජුරුවන් විසින් මෙ ලෙස කී කල්හි මහා බෝධිසත්ත්වයෝ ‘මොවුන් මරා ලබන්නේ කිම්ද? මුන් හැම මෙ නුවරට ආ ගමන් ව්‍යර්ථනොවේවයි ප්‍රභාවතීගේ නගුන් සද්දෙන මේ රජ දරුවන් සත් දෙනාට දෙවාලම්’ සිතා ‘දේවයන්වහන්ස, දිව්‍යාප්සරාවන් හා සමාන රූප ශෝභා ඇති නුබවහන්සේගේ දූන් සත් දෙනා මේ රජ දරුවණ්ට පාවා දී මුන් හැම බෑණකොට ගත මැනවැ’ යි කිවූය. එ බස් අසා මද්‍ර රජ්ජුරුවෝ ‘මහ රජ්ජුරුවන්වහන්ස, අපටත් උන්ටත් නුබවහන්සේ ප්‍රධානසේක, ඉදින් කැමතිසේක් විනම් දෙවා වදාළ මැනවැ’ යි කිවුය. ඉක්බිති කුසරජ්ජුරුවෝ ඒ ක්ෂත්‍රිය කන්‍යාවන් සද්දෙන සර්වාභරණයෙන් සරහා රජ දරුවන් සද්දෙනාට මහ මඟුලින් පාණිග්‍රහණයකරවා දුන්හ. එ සඳ රජ්ජුරුවෝ සද්දෙන ස්ත්‍රී රත්න ප්‍රතිලාභයෙන් අතිශයෙන් සතුටුව කුස රජ්ජුරුවන් වැද අවසර ඉල්වාගෙණ තම තමන්ගේ රාජ්‍යයටම පලාගියාහ. ඉක්බිති උපාය කෞශල්‍ය ඥාන ඇති මහා බෝධිසත්ත්වයෝ කීප දවසක් එහි වාසයකොට මයිල් රජ්ජුරුවන්ගෙන් අවසර ඉල්වාගෙණ ප්‍රභාවතීන් කැඳ

1 රාජාධිරාජෝත්තම=රාජ, අධිරාජ, උත්තම. 2 ‘පලවන කලක් පරිද්දෙන්’ වෙනුවට සමහර පොතක ‘පලවන පරිද්දෙන්’ කියා තිබේ. 5 තරුණාර්ක=තරුණ, අර්ක. 10 අනන්‍යසාධාරණ=අන්, අන්‍ය, සාධාරණ. 11 වාහණාරූඪව=වාහණ, ආරූඪව. 20 ව්‍යර්ථනොවේවයි=වි, අර්ථනොවේවයි. 21 දිව්‍යාප්සරාවන්=දිව්‍ය, අප්සරාවන්. 26 සර්වාභරණයෙන්=සර්ව, ආභරණයෙන්.

Digitized by Google

වාගෙණ චතුරඞ්ගිනී සේනාව විසින් පිරිවර මහත්වූ රාජානුභාවයෙන් සකල නුවරින් නික්ම මනාව සරහා පිළියෙළකරනලද්දාවූ නගනලද ධවලාතපත්‍ර ඇති විචිත්‍ර චිත්‍ර කර්මෝජ්ජවලවූ රථනාකාවකින් ගොස් මාණික්‍ය රත්න කාන්තියෙන් හා විශිෂ්ටවූ රූප සෞන්දර්‍ය්‍ය ශෝභාවෙන් විරාජමානවූ විමානයක්මෙන් ගමන් ගත් සිඛ යුගලයක් පරිද්දෙන් කුසාවතී රාජධානියෙහි සියලු සත්වයන්ට නේත්‍රෝත්සවය කෙරෙමින් නුවරට වන්හ. එ සඳ බෝධිසත්වයන්ගේ මෑනියෝ ශීලවතී දේවී 'කුසරජ්ජුරුවෝ ප්‍රභාවතිය කැඳවාගෙණ නුවරට ආහ' යි යනු අසා කෑම් බීම් ආදී බොහෝ උපකරණ ඇරගෙණ මහ පිරිවරින් පෙරගමන්කොට ගොස් දූත සතුටුව බෝධිසත්වයන් කැඳවාගෙණ නුවර පැදකුණුකොට මාලිගාවට වැද රාජ්‍යශ්‍රීයෙහි පිහිටුවූහ. එ තැන් පටන් ප්‍රභාවතීන් හා කුස රජ්ජුරුවන් හා දෙදෙන ඒකාත්මිකව සමග වාසයෙන් දිවි පමණින් දශරාජ ධර්‍මයෙන් යුක්තව රාජ්‍ය ශ්‍රී අනුභවකොට කෙළවර කම්වූ පරිද්දෙන් සංසාර යාත්‍රාවකළාහුය යි තිලෝගුරු බුදුරජානන්වහන්සේ දම් සභා මණ්ඩපයට රැස්වූ ශාසනයෙහි උකටලීවූ ඒ භික්ෂූන්වහන්සේ ප්‍රධානකොට ඇති සිව් වණක් පර්ෂදට මේ අතීත කථාව ගෙණහැර දක්වා ධර්‍ම දේශනාකොට වදාරා දුඃඛසත්‍යය සමුදයසත්‍යය නිරෝධසත්‍යය මාර්ගසත්‍යය යි යන චතුරාර්‍ය්‍ය සත්‍යයන් ප්‍රකාශකොට මේ ජාතක ධර්‍ම දේශනාව පූර්‍වාපර සන්ධි ගළපා නිමවා වදාළසේක. චතුස්සත්‍ය ධර්‍ම දේශනාවගේ කෙළවර උකටලීවූ භික්ෂූන්වහන්සේ දහසක් නයින් හෙබියාවූ සෝවාන් ඵලයෙහි පිහිටා නිවන් දුටුසේක.

එ කල මව් පිය දෙදෙන සුද්ධෝදන රජ්ජුරුවන් හා මහාමායා දේවී වූහ. ජයම්පති කුමාරයෝ නම් ධර්‍ම භාණ්ඩාගාරිකවූ ආනන්ද ස්ථවිර වූහ. එ සමයෙහි කුඳ දූත් බුජ්ජුත්තරා නම් භික්ෂුණී වූහ. ප්‍රභාවතී තොමෝ රාහුල ස්ථවිරයන්ට මව් වූ බිම්බා දේවිය වූය. එ සමයෙහි රජ පිරිස් දූත් බුදු පිරිස් විය. ප්‍රභාවතී නිසා සත් මසක් දුක් ගෙණ සත් රජුන් මත් මැඩ සෙමෙහි තබා ප්‍රභාවතීන් ගෙණවුත් රාජ්‍ය යකල කුසරජ්ජුරුවෝ නම් ලොවුතුරා බුදුවූ මම්ම වේදැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

නිමි.

1 රාජානුභාවයෙන්=රාජ, අනුභාවයෙන්. 3 කර්මෝජ්ජවලවූ=කර්ම, උජ්ජ්වලවූ. 'කර්මාන්තජ්වලිතවූ' කියාද පාඨයි. සමහර පොතක 'විශිෂ්ට' වෙනුවට 'නිර්විශේෂ' කියා තිබේ. 5 නේත්‍රෝත්සවය=නේත්‍ර, උත්සවය. 10 ඒකාත්මිකව=ඒක, ආත්මිකව. 15 චතුරාර්‍ය්‍ය=චතුර්, ආර්‍ය්‍ය. 16 පූර්‍වාපර=පූර්‍ව, අපර. 20 භාණ්ඩාගාරිකවූ=භාණ්ඩ, ආගාරිකවූ. 21 සමහර පොත්හි 'රාහුල ස්ථවිරයන් මවූ බිම්බා දේවී වූහ' කියා තිබේ. 24 ලොවුතුරා=ලෝ, උතුරා.

Digitized by Google

සිබෑවි රට පවතින

කුසජාතක කථාවේ සංක්ෂෙප්පය.

———(:)o(:)———

පෙරකිය දවස ශකුනි නම් බලසම්පන්න රජෙක් විය. ඒ රජ දෙවියන්ට අධි පතිවූ ඉන්ද්‍රයා භාසමාන යශාළුව වසන්නේය. ඔහුට දූ පුත් කෙනෙකුන් නැති බැවින් තමාගේ ඇවෑමෙන් පසු රාජ්‍යයට පත්වීමට කෙනෙකුන් නැති හෙයින් ස්වකීය වංශය විනාශවන්නේයයි එක් දවසක් කල්පනාකොට මහත් ශෝකයෙන් පීඩිතව තමාගේ හිස අල්ලාගෙන සිතිවිල්ලෙන් උන්නේය. මෙසේ ඔහු ඉඳිනාකල්හි ඉන්ද්‍ර තෙම ඔහු දැක, 'අහෝ යාළුව, කුමක් නිසා නෙපි හිස අත්ලෙහි ගසාගෙණ ඔය කාරණයෙන් ඉඳිනෙසිද්ද' යි විචාළේය. එ බස් අසා එතෙම කියන්නේ 'භවත්, කෞශික යානෙනී, මට පුතයකු කෙනෙකුන් හෝ දුවනි කෙනෙකුන් හෝ නැත; එසේවූ කල්හි මට කොපමණ සම්පත් හා බලපරාක්‍රම ඇතත් මාගේ වංශය විනාශවන්නේය' යි කීය. එ වීට ඉන්ද්‍රයා කීයන්නේ, 'යාළුව, මම තොපට එක් බේතක් එවම්, ඒ බේත තොප ගේ සියළු භාර්‍යාවන්ට බොන්නට දෙව, ඒ කාරණකොටගෙණ ඔව්හු දූ දරුවන් ලබ න්නාහුය' යි කියා ගියේය.

ඉක්බිති සුරේන්ද්‍රවූ ඉන්ද්‍රතෙම ගන්ධමාදන පර්වතයට ගොස් එකී ඖෂධය ගෙණ වුත් රජ්ජුරුවන්ට යැව්වේය. රජ්ජුරුවෝ ඒ ඖෂධය පානයකරණ ආකාරය කියා බිසෝවරුන් වෙත යැවූහ. ඒ වේලාවට ඔහුගේ අගබිසවීතොමෝ නිදමින් උන්නාය. එහෙත් අනිකුත් බිසෝවරු ඇට කථාකරනාකොට බෙහෙත පානයකළෝය. ඒ හේතු වෙන් ඔව්හු ගර්භිණිවූහ. අගබිසවීතොමෝ පිබිද බලා ඔවුන් ගැබ්ගෙණසිටි බැව් දැන 'ගැප් පිහිටීම පිණිස තොප විසින් කුමක් කරණලද්දේද' යි විචාළාය. ඔව්හු 'රජ්ජුරුවන් විසින් දෙනලද බෙහෙතක් බීවෙමුය' යි කීවාහුය. 'කුමක් නිසා මට කතා නොකොට එය තොප විසින් බොනලද්දේද? මෙසේවූ බැවින් ඒ බෙහෙත ගෙණේ කලද භාජනය මට කියව' යි කීය. 'එය කුශ කරඬුවක ගෙණෙනලද්දේය' යි කීවා හුය. 'ඒ කරඬුව කොයිද්ද' යි විචාරා හැරගෙණ එය සෝදා වතුර ගෙණ බීවාය. බී තොමෝද ගර්භිණිවූවාය.

අට නව මසක් ගිය කල්හි සියලුම බිසෝවරු පුත්‍රයන් ප්‍රසූතකළාහුය. අගබි සව් වැදූ පුත්‍රයා වනාහි දසඅටක් අවලක්ෂණවලින් යුක්තය, ඔහුගේ මුහුණ සිංහ මුහු ණක් වැනිය, ඉතා බලසම්පන්න ශරීර ඇත්තේවිය. ඔහුගේ උත්පත්ති මඞ්ගල්‍යය උදාරතරලෙස පවත්වා ඔහුට 'කුශ' යන නාමය තබනලද්දේය.

ඉක්බිති මහාශකුනි රජ්ජුරුවන්ට යටත් රජදරුවෝ කියන්නාහු 'පිත්වත්නි, මහා ශකුනි රජ අප හැමට උපකාරකරන්නේය, එහෙයින් අපි ගොස් ඔහු ගණිමුය' යි කියා

---

21 මෙහි 'කුශ' යනු 'ලී' යන අර්ථයි.

Digitized by Google

චතුරඞ්ගිනී සේනාවක් හැරගෙණ ගොස් ඔහුගේ අගනුවර වටලාගත්තෝය. මහාශකුනි රජ්ජුරුවෝ ඔවුන් හා සටන් කරන්ට නොහැකිව නුවරට වදනා දොරටු වසා දමා ප්‍රාකාරවල රැකවල් තබන ලෙස නියෝගකළේය. එ සඳ කුසකුමාරයා තමාගේ මෑණියන් ලඟට ගොස් 'මෑණියන්වහන්ස, දොරටු වසාතිබෙන්නේ කිම්ද' යි ඇසීය. ඕතොමෝ 'තොපගේ පිය රජ්ජුරුවන් විසින් සුළු රජදරුවන් හා සටන් කරන්ට නොහැක්ක, එබැවින් දොරටු වසා ඇතුළු නුවරට වැද ඉන්නේය' යි කීවාය. 'මෑණියන්වහන්ස, මම උන් හා සටන්කරන්ට කැමැත්තෙමි, රජ්ජුරුවන්වහන්සේගෙන් යුද්ධරථයක් පමණක් මට ලැබේවා'. එ බස් ඇසූ මව් බිසව් කියන්නී 'මාගේ පුත්‍රය, උඹේ දකීනස රජ්ජුරුවන්වහන්සේට අප්‍රිය බැවින් හා කෝප එළවන බැවින්ද උන්වහන්සේ ඔබට රථයක් දෙනසේකැයි කෙසේ නම් සිතිය හැක්කේද' යි කීවාය. 'මෑණියන්වහන්ස, උන්වහන්සේ සමීපයට ගොස් 'මම රථයක් ලදිම් නම් සතුරන් හා යුද්ධ කරමි' යි කියන බව සැලකළ මැනවැ' යි එතෙම කීයේය.

ඉක්බිති රජ්ජුරුවන් විසින් රථයක් දෙනලද්දුව කුසකුමාරයා හියවුරු දෙකක් හැරගෙණ රථයට පැනනැගී යුද්ධයට පිටත්වයාමට සැරසුනේය. එකල්හි දේවේන්ද්‍රවූ ඉන්ද්‍රතෙම 'මේ සුළු රජදරුවෝ බලසම්පන්නය, මේ භද්‍රකල්පයෙහි බෝධිසත්වවූ කුසකුමාරයාට යම් දුකක් වීනම් නපුරුය, එහෙයින් මම ඔහුට පිටුවහල්වෙමි' යි සිතා කුසකුමාරයා අතට සඞ්ඛයක්ද චක්‍රායුධයක්ද ගදාවක්ද දී, 'බෝසතාණෙනි, මේ වස්තු තොපගේ ආරක්ෂාව පිණිස වන්නේය' යි කියා ගියේය.

කුසකුමාරතෙම නුවර එක් වාසල්දොරක් අරවා නික්මුණේය. සක පිඹිබ කෙණෙහිම සතුරු සෙනග ඒ හඬ අසා භයපත්ව පලාගියාහ. සමහරුන්ගේ කන් අගුළු වැටී ගියේය, සමහරුන්ගේ කන් පැළීගියේය. යම් විටක එතෙම චක්‍රායුධය හෝ ගදාව දමා ගැසීනම් සතුරෝ බිම වැටෙත්නාහ. ඔහු සතුරන් මැදට පැන සක පිඹිබ කල්හි ඔවුන්ගේ කන් පැළී 'මොහු රාක්ෂයෙකැ' යි කියා පලායන්නාහ.

කුසකුමාරයා මෙසේ සියලු සතුරන් ජයගෙණ රට සංසිඳුවා පිය රජ්ජුරුවන් ලඟට ගොස් ඒ බව සැලකළේය. රජතෙම ඒ අසා ප්‍රීතියෙන් පිණාගොස් තමාට කියන්නේ 'මේ තරුණයා ශරීර ශක්ති සම්පන්නය, ඉතා නිර්භීතය, කුමක් නිසා මම මොහුට නොකැමැතිවෙම්ද' යි කියා මෙ තැන් පටන් ඔහුට ප්‍රියවිය.

රජ්ජුරුවෝ තමන්ගේ සියලු කුමාරවරුන්ට භාර්‍ය්‍යාවන් ගෙණඊම පිණිස කටයුතු සම්පාදනයකොටතබා කුසකුමාරයන්ට භාර්‍ය්‍යාවක් සොයාදීමට උත්සාහකළේය. සියලුදෙනම 'අප දූන් සරණකොට දෙනු කැමැත්තම්හ, එහෙත් කුසකුමාරයන්ට නොදෙම්හ' යි කීවාහුය. මේ අවධියට එක් රජ කෙනෙක් වෙන රජ කෙනෙකුගේ දුවක් සරණකොට ඉල්ලා නොලද්දේය. මහාශකුනි රජ්ජුරුවෝ මේ කුමාරිකාව තමන්ගේ වෙන කුමාරයෙකුටය යි වඤ්චාවෙන් කැමතිකරවා ගෙණවුත් යහපත් නක්ෂත්‍රයෝග බලා මහත් උත්සවපවත්වා කුසකුමාරයන්ට භාවාදුන්නේය.

Digitized by Google

ඉක්බිති රජ්ජුරුවෝ රාජපුරුෂයන්ට 'ජනවත්නි, කුශකුමාරයන්ට කිසිවෙකු විසින් කැඩපතක් නොදක්විය යුතුය, දියට බැස නාන ස්ථානයක ඔහු විසින් ස්නානය නොකළමනාය, ඔහුගේ භාර්යාව වෙතට රාත්‍රියෙහි මුත් දවල්දවසෙහි ගමට ඉඩ නොදිය යුතුය' යි කියා අවවාදකළාහුය. කල් යාමෙන් එක් දවසක් කුශ කුමාරයා තමාගේ සොහොයුරන් හා ක්‍රීඩාකරමින් සිටින කල්හී තමාගේ භාර්යාව ඔහු දැක 'අර කුමාරවරුන් කැටුව සෙල්ලම් කරන්නාවූ 'පිශාචයා' කවුදැයි' ඇසීය. 'එ නුඹගේ පුරුෂයා' යි උත්තර ලදින් 'කුමක්ද මාගේ ස්වාමියා එබඳු කෙනෙක්දැ' යි විචාළාය. නැවත් එක් දවසක් ඔහු කුමාරවරුන් සමග දියෙහි ක්‍රීඩාකරමින් සිටින්නා දැක තමාගේ වල්ලභයා සැබවින්ම එබඳු විරූප තැනැත්තෙක්දැ යි අසා සැක දුරුකරගත නොහැක්ව උපායක් යොදන්නී 'රාත්‍රියෙහි ඔහු මා වෙතට ආ කල්හි වැස්ම ඉවත්කර මැයි' කියා පානක් වසා තබාගෙණ ඉඳ කුශකුමාරයා ඈ වෙතට ආ කල්හි ඒ වැස්ම ඇරියාය. දහඅටක් අවලකුණුවලින් හා සිංහයෙකුගේ හිසක් වැනි හිසකින්ද යුත් ඔහුගේ රූපය දැක භයපත්ව 'පිශාචයෙක්ය, පිශාචයෙක්ය' යි හඬගා පැන දිවීය.

මෙය සිදුවූ නොබෝ දවසකින් කඳුපලාත්වල වැසියෝ මහාශකුනි රජුට විරුධව කැරලි ගැසූ හෙයින් රජ්ජුරුවෝ ඔවුන් මර්දනයකොට රටසංසිඳුවා එන ලෙස කුශකුමාරයන් පිටත්කොට හැරියේය. කුශකුමාරයා පිටත්ව ගිය කල්හි ඔහුගේ බිසව් තමන්ගේ මෑනියන්ට හා පියානන්ට 'මා පිශාචයෙකුට දුන්නේ මේ ලෝකයෙහි මිනිසුන් නැති නිසාද? මම මළෙම් නම් මැනවි, ජීවත්ව උනිම් නම් මින් පලායමී' යි දන්වා අරිණලදුව දෙමව්පියෝ අවුත් ඈ හැරගෙණ ගියාහුය.

කුශකුමාරයා කඳුරට වැසියන් මැඩපවත්වා ගෙදර අවුත් භාර්යාව නොසිදුටී මව්බිසවගෙන් විචාළසඳ ඕතොමෝ 'ඈගේ දෙමව්පියන් විසින් ගෙණයන ලද්දීය' යි කීවාය. 'කුමක් නිසාදැ' යි කී කල්හි 'නුඹ පිශාචයෙකැ යි ඈට වැටහී ගියබැවිනැ' උත්තරදුන්නාය. 'මෑනියන්වහන්ස, මම ගොස් ඈ අරගෙණ එමි' කියා 'යහපතැ' යි මෑනියන් විසින් සමු දෙනලදුව එතෙම සඞ්ඛයද, චක්‍රායුධයද, ගඳුවද ගෙණ පිටත්වූයේය. කඳුපලාතේ නගරයක දොරටු වසාදමා එක් දිශාවක් බලාගෙණ සිටින්නාවූ මහත් ජන සමූහයක් තමන් යන්නාවූ මාර්ගයෙහිදී දැක 'මෙසේ කුමක් නිසා මෙහි ඉඳිනාහුදැ' යි ඔවුන් අතින් කුමාරයා විචාළේය. 'අපි සිංහයෙකුට බයින් ඉන්නෙමුය' යි කී කල්හී 'උඟ නොමරන්නේ මන්දැ' යි කුමාරයා විචාළ බසට 'අපට එය නුපුළුවන්හෙයිනැයි' ක් සඳ 'මම උඟ මැරුවෙම්නම් නුබලා මට දෙන්නේ කුමක්දැ' යි ඇසීය. ඔවුහු 'අපගේ චතුරඞ්ගිනී සේනාවෙන් භාගයක් දෙමුයැ' යි කීවෝය. එසඳ කුශකුමාරයා සිංහයා ළඟට ගොස් සක පිම්බේය. එකෙණෙහි සිංහයාගේ කන් පැළී එහිම මළේය. ඒ දුටු මනුෂ්‍යයෝ 'දැන් අපගේ සිව්රඟසෙනඟින් භාගයක් ගණුව' යි පැවරුවෝය. 'මම ඒ භාගය නොපවෙතම තබායමි; මා නැවත මෙහි ආ කල එය දුනමැනවැ' යි කියා කුමාරයා තමාගේ බිසව් උන්නාවූ නුවරට ගොස් පැමිණියේය.

Digitized by Google

ඉක්බිති කුමාරතෙම රජගෙට මල් සපයන මාලාකාරයා සමීපයට ගියේය. මාලාකාරයා 'නුබ කවරෙහිද' යි ඇසීය. 'මම මල්කරුවෙකුගේ පුත්‍රයෙක්මි' කීය. නැවත 'නුබේ නම කුමක්ද' යි ඇසීය. 'වෘජී' යයි කුමරු උත්තරදුන්නේය.

බෝධිසත්වයෝතම් සියලු ශිල්පශාස්ත්‍රවල කෙළ පැමිණියෝය. එබැවින් ඒ කුමාරයා ඉතා ලක්‍ෂණවූ මල්දමක් ගොතා දුන්නේය. මල්කරු එය ගෙණ ගොස් රජ්ජුරුවන්ගේ කුමාරිකාවන්ට දුන්නේය. කුමාරිකාව එය බලා 'කිසිකලකත් තා විසින් නොකළතරම් මෙවැනි ලක්‍ෂණ මල්දමක් තට කෙසේ ලැබුනේද' ඇසීය. 'එය මාගේ අතවැස්සෙක් විසින් තරණලද්ද' යි කී කල්හි 'ඔහු දකිනු කැමැත්තෙමි' යි කුමාරිකාව විසින් කියනලද්දුව මාලාකාරයා ඔහු කුමාරිකාව වෙතට අඬගසාගෙණ ගියේය. කුමාරිකාවද කුමාරයා දුන 'මේ යක්‍ෂයා කෙසේ ලැබුනේද' යි මපතව 'පිශාචයා, පිශාචයා' යයි මුරගැසීය. එවිට හෙතෙම පලාගියේය.

ඉක්බිති කුමාරතෙම රජවාසල සූපකාරයා සමීපයට ගියේය. සූපකාරයා 'නුබ කවරෙහිද' යි විචාළේය. 'මම සූපකාරයෙකුගේ පුතෙක්මි' කීය. 'නුබේ නම කිම්ද' යි විචාළ බසට 'මම සුගන්ධභාජන නමි' යි කුමාරතෙම කීයේය. ඔහු මස් මාංස ඉතා රසවත්කොට පිසන හෙයින් එක් දවසක් ඔහු විසින් පිසනලද බඳිනලද මස් මාංස අරක්කැමියා විසින් කුමාරිකාවට පිළිගන්වනලද්දේය. එවිට ඕ තොමෝ කෑම මෙසේ රසවත්කොට පිසුවේ කව්ද' යි විචාරා, 'මාගේ අතවැස්සෙක් විසිනැ' යි කී කල්හි 'තාගේ අතවැසියා මම දකිනු කැමැත්තෙමි' යි කීවාය. ඈ ඔහු දුක පෙරපරිද්දෙන් මොරගැසුවාය.

නැවතත් ඒ කුශකුමාරයා වෙදෙක් සමීපයට ගියේය. වෙද විසින් 'නුබ කව්ද' යි අසනලද්දුව 'මම වෛද්‍යයෙකුගේ පුත්‍රයෙක්මි' උත්තරදුන් කල්හි 'නුබේ නම කිම්ද' විචාළකල්හි 'මම ආත්‍රෙය' නම්යි කුමාරතෙම කීය. ඉක්බිති කුමාරිකාව මොළේ පිළිබඳ රෝගයකින් පීඩිතවූවාය. එකී වෛද්‍යාචාර්‍ය්‍යා විසින් කරණලද ප්‍රතිකාරවලින් කිසි පිහිටක් නොලැබුනු බැවින් මේගැණ ඔහු කල්පනාකරමින් ඉන්න බව කුශකුමාරයාට පෙණී 'ස්වාමිනි, කනස්සලුව ඉන්ට හේතු කවරේද' යි විචාළේය. 'රජ්ජුරුවන්ගේ කුමාරිකාවට මොළය පිළිබඳ රෝගයක් වැලඳී එය ගුණකරන්ට උත්සාහකොට නුපුළුවන්ව ඉදිමි' යි කීය. එබස් අසා කුශකුමාරතෙම 'මම ගොස් ඈ සනීපකොට එමි' යි කියා ඈ බලන්ට ගියේය. ඈ ඔහු දුක 'මේ යක්‍ෂයා කොයි සිට ආයේද' යි සිතා 'ඒ බව ඔහුට ඇසෙන පරිද්දෙන් කීයෙම් නම් ඒ මා සුවපත් නොකර' යි කල්පනාකොට තමන් සම්පූර්ණයෙන සනීප ලබනතුරු නොකීයනලෙස නියමකරගත්තාය. ඈ සනීප ලැබූකල්හි ඔහුට 'පිශාචයෙක්ය, පිශාචයෙක්ය' කියන ලදින් එතෙම පලාගියේය.

ඉක්බිති කුශකුමාරතෙම මන්ත්‍රීන් සමීපයට ගියේය. මන්ත්‍රීන් 'තෝ කව්ද' යි

Digitized by Google

ඒවාළසද 'මම සහස්‍රබල නම්' යි කීයේය. එවිට ඔව්හු තමන්ලඟ මෙහෙකිරීම පිණිස ඔහු රඳවාගත්තෝය.

මේ අවසියට ඉහත කියනලද රජුගේ පුත්‍රයා කුශකුමාරයාට කැඳවාගෙණ ගිය කුමාරිකාව ඔහු අත්ඇරදමා තමාගේ දෙමව්පියන්ගේ ගෙදරට අවුත් සිටිනබව අසා ඈගේ පියරජනට කියා යවන්නේ 'තොපගේ දුහිතෘව මට පාවාදෙන්නෙහි නම් මැනව්, එසේ නොකළෙහි නම් තොප රාජ්‍යයෙන් පහකරමි' කීය. ඊට රජු කියන්නේ 'මම මාගේ දුවනියන් මහාශකුනි රජුගේ පුත්‍රයාට දුනිමි, දූන් වෙන කෙනෙකුට දිය නොහැක්කැ' යි කියා ඇරියේය. එකල්හි ඒ කුමාරයා චතුරඞ්ගිනී සේනාවක් හැර ගෙණවුත් රජුගේ නුවර වැටලූවේය. යුධයට යා නොහී රජ්ජුරුවෝ නුවර දොරටු වස්වා ඇතුළු නුවරට වැද උන්නේය. එසඳ කුශකුමාරයා 'පින්වතුනි, නුවර වාසල් වසා තිබෙන්නේ කුමක් නිසාද' යි මන්ත්‍රීන්අතින් විචාළේය. ඔව්හු සියල්ල විස්තර කොට කීවාහුය. එවිට කුශකුමාරයා මන්ත්‍රීණ්ට කියන්නේ 'රජ්ජුරුවන්වහන්සේගේ කුමාරිකාව මට පාවාදෙනුලැබේනම් සතුරණ්ට පහර දෙමි' යි කීය. මේ බව ඇම තියන් විසින් රජුට සැලකළ කල්හි රජ 'මම මාගේ දුවනියන් මහාශකුනි රජ්ජුරු වන්ගේ පුත්‍රයාට දුනිමි, ඈ මේ මිනිසාට නැවත කෙසේ දෙම්ද? දූන් පවතින විසවුල සම්පූර්ණයෙන්ම ඈ නිසා සිදුවිය' යි කීයේය. එවිට ඇමතියෝ කියන්නෝ 'දූනට වෙන ආකාරයකින් සතුරන් ජයගත නොහැකිබැවින් මේ මිනිසා වහාම සතුරන් හා යුධකෙරේවා, එවිට කාහට ජයවන්නේදැයි දනුම්හ' යි කීවාහුය. රජ්ජුරුවන් විසින් 'මැනවැයි' කියා එසේ කිරීමට ඔවුණ්ට අවසර දුන්කල්හි මන්ත්‍රිවරු කුශකුමාරයා කැඳවා 'සහස්‍රබලයෙනි, තා කීලෙස කරව' යි නියෝගකළෝය.

එකල්හි කුශකුමාරයා ඊ පන්සියක් ඇති හියවුරු දෙකක්ද, සකද, චක්‍රායුධයද, ගදාවද හැරගෙණ යුධයට පිටත්වූයේය. ඔහු සක් ගසිය පිඹ කල්හි සතුරන්ගේ කන් පුපුරා ඔව්හු පලාගියෝය.

කුමාරිකාව 'මේ අඟ ඉතා නිර්භීතය, ධෛර්‍ය්‍යසම්පන්නය, කුමක් නිසා මම මොහු නොකැමතිවෙම්ද' යි සිතා ඔහු කෙරෙහි පිළිබඳ සිත් උපදවා 'පියානන්වහන්ස, නුඹ වහන්සේගේ පොරොන්දුව ඉෂ්ටකරවදාළ මැනවැ' යි කීවාය. 'දුවනියෙනි, නුඹ කුශකුමාරයාට දෙමි' යි රජතෙම කීයේය. එවිට කුමාරිකාතොමෝ 'මේ කුශකුමාරයාම වනැ' යි කිවාය. 'එසේවිනම්, දුවනියෙනි, ඔහු වෙතට යව' යි කියා රජ්ජුරුවෝ කුශකුමාරයාණ්ට බොහෝ ගෞරවාදරකොට චතුරඞ්ගිනී සේනාවක් ඔහුට පාවාදී තමන් කැමති පරිද්දෙන් කල්යවනලෙස ඔහුට අවසර දුන්නේය.

ඉක්බිති කුශකුමාරයා යථෝක්ත කාදු රට නගරයට ගොස් 'පින්වතුනි, මා විසින් තබාගිය අඞ්චතුරඞ්ගිනී සේනාව මට දූන් දෙව' යි නගරවාසීන්ගෙන් ඉල්ලූවේය. එබිසට ඔව්හු කියන්නාහු 'තරුණය, ජලගැල්මකින් සිව්රඟ සෙනග විනාශවිය' යි

Digitized by Google

කීවෝය. සමීපයෙහි බැටළුවන් තණ කමින් සිටිනවා දුටු කුසකුමාරයා කියන්නේ ‘හැටවයස් ගොණා කොතනට ගියේද, ඇතා කොතනට ගෙණයනලද්දේද එතනට හරකුත් සහ බැටළුවන්ද ගෙණයනුලබනබව සලකා දැනගනිමි. සේනාව දෙන්නාහු නම් මැනවි, එසේ නැතහොත් සටන්වන්නේය’ යි කීයේය. එතෙම මෙසේ කියා ඔවුන් ගයගන්වා සේනාව ලබාගෙණ එක් ගඞ්ගාවක් සමීපයට ගියේය. පිපාසත්වූබැවින් නානපිණිස ඒ ගඟට බැස්සේය. එවිට ගංගාවෙහි ඔහුගේ මුහුණේ ඡායාව දුටු ‘අමනෝඥවූ රූ ලකුණු දසඅටද සිංහයෙකුගේ හිසවැනි හිසක්ද මට ඇතිබැවින් භා මාගේ බිසව මා නොකමැති බැවින් ද මාගේ ජීවත්ව ඉඳීමෙන් ප්‍රයෝජන නැත්තේය; මම ගොස් ප්‍රාණය හානිකරගණිමි’ යි සිතීය. එසේ කල්පනාකොට වනයකට ගොස් එල්ලී මැරෙණ්ට සැරසෙනකල්හි දෙවියන්ට නායකවූ ඉන්ද්‍රයා ‘මේ භද්‍රකල්පයෙහි උපන් බෝධිසත්වකෙනෙක් බැවින් ද තමාට රූ නැත්තෙන් එල්ලී මැරෙණ්ට සැරසෙන බැවින් ද මම ඔහු සනසමි’ යි සිතා ඔහුට කියන්නේ ‘තරුණය, අධෛර්‍ය්‍ය නොවව, තාගේ පණ නසානොගන්න පිණිස මම තාගේ හිසෙහි මේ මැණික තබමි, තාගේ පළමු තිබුන ධෛර්‍ය්‍යය නැවත ලබන්නෙහිය’ යි කියා අන්තර්ධානවූයේය.

ඉක්බිති කුසකුමාරයා තමාගේ මාළිගාවට යන්නේ එහි දොරටුවට පැමිණියේය. එවිට එහි සිටි දොරටුපාලයා ‘මෙහි නොවදුව, මෙය කුසකුමාරයන්ගේ මාළිගාවය’ යි කියා වැලකුවේය. ‘මම කුසය’ යි කී කල්හි දොරටුපාලයා එය නොඇදහූබැවින් කුසකුමාරයා තමාගේ හිසෙහි තිබුන මැණික ඉවත්කළේය. එකෙණෙහි ඔහුගේ පළමු තිබුන රූපය දුටු දොරටුපාලතෙම ඔහු ඇඳිනගත්තේය.

කුසකුමාරයා මේ ස්ථානයෙහි නවතිණ්ට නියමකරගෙණ ඒ බව පියරජ්ජුරුවණ්ට දන්වාඇර එහිම වාසයකෙළේය. සුරේන්ද්‍රවූ ඉන්ද්‍රතෙම මහත් නිධාන පිහිටි ස්ථාන ඔහුට දැක්වූයේය. කුසකුමාරයා එහි චතුර්විධ මාණික්‍යවලින් යුත් නුවරක් ගොඩනගා තමාගේ වාසභූමියවූ බැවින් ඊට ‘කුසිනාගරය’ යි නමකෙළේය. එතෙම චක්‍රවර්තිරජවිය.

නිමි.

Digitized by Google

නේපාල රට පවතින

කුසජාතක කථාවේ සංක්ෂේපය.

———(:)o(:)———

බුදුරජාණන්වහන්සේ රජගෘහ නගරයට වැඩවදාළ කල්හි භික්ෂුහු උන්වහන්සේගේ කැස්සක් කරණකොටගෙණ මාරයා විනාශවූයේ කුමක් නිසාද යි ඇසුවෝය. එකල්හි ඒ ඇසීමට උත්තර වශයෙන් උන්වහන්සේ විසින් මෙහි පහත පෙණෙන කථාව වදාරණලද්දේය.

එක් සමයෙක්හි සුබන්ධු නම් රජ්ජුරුකෙනෙක් බාරාණසියෙහි රාජ්‍යයකළේය. එක් දවසක් ඔහුගෙ ශ්‍රියහත් ගබඩාව විස්මපත් ආකාරයෙන් එකපැහැර උක් (හෙවත් ඉක්ෂු) වනයක් විය. ඉන් එක් උක් ගසක් ඇසට ප්‍රියවඩවන බැවින් රජ තෙම නිමිති දන්නන් රැස්කරවා එහි කුමක් වියැතුදැයි විචාළේය. එසින් රජුහට පුත්‍රයෙක් උපදින්නේය යි ඔව්හු කීවෝය. කල්යාමෙන් උග්නස උන ගසක් පමණ මහත්විය. එක් දවසක් උදෑසණ පිරිමි දරුවෙක් ඉන් පැනනැංගේය. උග්ගසෙන් උපන් බැවින් ඔහුට 'ඉක්ෂවාකු'ය යි නම් තබනලද්දේය. ඒ තෙම අගබිසවුන් විසින් පෝෂ්‍යයකරණලද්දේය. සුබන්ධු රජුගේ ඇවෑමෙන් ඉක්ෂවාකු රජවිය. ඔහුගේ අගබිසව් වූ අලින්ද ඇතුළුව බොහෝ බිසෝවරු ඔහුට ඇතිවූහ. මහළු වයසට පැමිණ සිටිමේ වී නමුත් ඔහුට දරු සම්පත් නැති විය. එබැවින් රජ තෙම දරුවන් ලැබීම පිණිස උපදෙස් දනුමැතියන් අතින් විචාළේය. මහජනයාගේ ප්‍රයෝජනය පිණිස බිසෝමාලිගාවේ දොරවල් පක්ෂයකට තුන් වරක් ඇර තබන ලෙස ඔවුන් විසින් කියනලද්දේය. අලින්ද හැර අනිකුත් සියලු බිසෝවරු මේ අවකාශයෙහි ප්‍රයෝජන ගණු කැමතිව රාත්‍රියෙහි මාලිගාවෙන් පිටත්ව තම තමන් කැමති ස්ථානවලට ගියාහුය. මේ කාලයට තුසිතභවනයෙහි ඉන්ද්‍ර පදවියට පත්වූ තැනැත්තේ සුබන්ධුගේ ඇවැස්ස නෑයෙක් විය. ඒ ඉන්ද්‍ර තෙම ඉක්ෂවාකු රජුගේ නොකටයුතුවූ නින්දිත ක්‍රියාව ගැණ කලකිරී පිළිකුල්කරණ කැස්සකින් පීඩිතවූ මහළුවූ කුණු වැකුණු කුදු ශරීරයකින් යුක්තවූ බ්‍රාහ්මණ වේශයක් මවාගෙණ රජු ඉදිරියට දුකසේ පැමිණ වැඳ වැතිර අභිරමණය පිණිස බිසවක් ඉල්ලා යාච්ඤාකොට සිටියේය. රජු විසින් අන්තඃපුරයෙන් කැමති බිසවක් අරගන්න ලෙස අනුදන්නාලද්දෙන් ඒ තෙම අලින්ද ගෙණ යාමට තෝරාගත්තේය. අලින්ද ඉතා දැඩි ලෙස විරුඩතාම පෑ නමුත් ඒ බ්‍රාහ්මණ ඉන්ද්‍රයා ඈ ඇදගෙණ නුවරින් පිට එක් ජරාපත්වූ පරණ ගෙයකට අරන් ගියේය. එහිදී ඈ විසින් ඔහුගේ කකුල් සෝදා සම්පූර්ණයෙන් නග්නව සිටීමට සලස්වා ඇගේ සිත පොළඹා ගැණීමට උත්සාහකළේ නමුත් එය නොහැක්විය. පසුවදා උදය ඉන්ද්‍ර තෙම තමාගේ වේශය හැරදමා ඇගේ යහපත් ගතිය ගැණ සතුටුව ඒ ස්ථිර ගුණයට ප්‍රතිඵල වශයෙන්

13 මේ ආදී තැන්වල 'අලින්ද' වෙනුවට සමහර පොතක 'අවුන්ද' කියාතිබේ.

Digitized by Google

ඇගේ අතට එක් බෙහෙතක් දී තියන්නේ ‘මෙය තිගේ වඳබව දුරුකරන්නේය, නිශ්චම කැමැත්ත ලෙස මම මේ උතුම් වස්තුව දෙමි, මේ චූර්ණය වතුරෙන් දියකොට පානයකරත්, ඒ කරණකොටගෙණ තිට උපදින්නාවූ පුත්‍රයා කඞ්ඝර ගති ඇති වෙයි, ධෛර්‍ය්‍යසම්පන්න වෙයි; එහෙත් මා කැටුව මාලිගාවෙන් පිටත්ව යාමට ආදර සහිතව කැඳවූ කල්හි නී නා හෙයින් එ තෙම ඉතා අවලක්ෂණවන්නේය’ යි කියා තිබේය. මේ ප්‍රවෘත්තිය අලින්දු බිසව විසින් රජ්ජුරුවණ්ට විස්තරකොට සැලකළ කල්හි රජ තෙම ඒ බෙහෙත අන්තඃපුරයෙහි සියලු ස්ත්‍රීණ්ට ද දුන්නේය. ඖෂධ ජලය ඉතා ස්වල්පවූ හෙයින් හා බිසෝවරුන්ගේ ගණන ඉතා මහත් බැවින්ද කුශ තණ ගසක් ගෙණ එහි අග ඒ ජලයෙහි ගලා එහි තැරවුනු ප්‍රමාණ ගෙණ එකී එකී බිසවට දෙනලද්දේය. ඉක්බිති බිසෝවරුණ්ට කුමාරවරු පන්සියයක් උපන්හ.

රජ්ජුරුවෝ ඔවුණ්ට නම් තබන්නෝ ‘කුශ’ තෘණ නාමය ඊට එක් කොට ‘ඉලුකුශ,’ ‘දේවකුශ’ ආදි නම් කළෝය. අලින්දු බිසවගේ විරූපවූ පුත්‍රයාට වනාහි හුදකලා ‘කුශ’ යන නාමයම තබනලද්දේය. ඔහුට ‘ශුඩකුශ’ යන නාමය දෙන ලදැයි සමහරු කියති.

මේ කුමාරයා රජ්ජුරුවණ්ට අප්‍රියය, ඔහුගේ උරුමවාසිකම කැඩීමට කීපවරක් උත්සාහකළේය; එහෙත් කුශ කුමාරයාගේ පුහුසුලුකම හා ධෛර්‍ය්‍යය නිසා එය නොකොට හැකිවිය. එක් වනාවක් රජ මහත් අග්ගලා ගොඩක් තුළ කුඩා අග්ගලාවක් සඟවා තමාගේ කුමාරවරුන් ඉදිරෙන් එකී කුඩා අග්ගලාව සොයාදෙන තැනැත්තාට රාජ්‍යය දෙනබව ප්‍රකාශකළේය. මේ ගැණ උත්සාහකිරීමට සියල්ලවුණ්ට පසුව ඔහුට ඉඩ තබනලද්දේ නමුත් ඒ කරුණම අග්ගලාව සොයාගැණීමට ඔහුට උපකාරවිය. නැවතත්, කුමාරවරුන් අතුරෙන් යමෙක් ඉතා ඉක්මණට කන්නේද ඔහුට තමාගේ රාජ්‍යය හිමිකර දෙන ලෙස කිව්සේය. සියල්ලෝම කෑම කන භාජන තම තමන් වෙත ගෙණවුත් දෙන කල් බලාසිටියෝය; එහෙත් කුශ කුමාරයා ඔහුට ගෙණ කෑම භාජනයක් නැතුව බිම දමාගෙණ අනුභවකොට නිමවූ හෙයින් රජ්ජුරුවෝ නොකැමතිවූවත් ඔහු තමාගෙන් පසු රාජ්‍යයට නියමකළේය. කුශ කුමාරයා කෙරෙහි රාජලක්ෂණ පිහිටාතිබෙනබව දුටු රජ තෙම තමාගේ රාජකකුධභාණ්ඩ සඟවා තැබීමෙන් හා තමාගේ මරණාසන්නයේදී ඒවා සැඟවූ ස්ථාන උපමා වචනවලින් සඟවා කීමෙන් ද ඔහුගේ සිංහාසන ප්‍රාප්තවීමේ බලාපොරොත්තුව කඩකිරීමට අභිප්‍රායකළේය. ඒ සඟවා කියනලද වචන ‘කුශකුමාරයාට නොවැටහෙයි, එවිට ඒ වස්තු වෙන කුමාරයෙකුට හිමිවූ කල්හි රාජ්‍යය ද ඔහුට අත්වන්නේය’ යි රජ තෙම සිතීය. කුශකුමාරයා රජ්‍යයට පත්ව එකී තේරවිලිබස් විමසා දැන සියලුම වස්තු අත්පත්කරගත්තේය. මෙ උපමාර්ථ පදවලින් එකක් නම් ‘යෝජනනිධි’ හෙවත් ‘යොදුනේ නිධානය’ වේ. එහෙත් කුශකුමාරයා ‘යෙදීම හෙවත් සැදීම’ යන අර්ථ ඇති ‘යුජ්’ යන වචනයෙන් ‘අශ්වශාලාව’ කියනලදැයි සිතා අස්සල අසුන් අන්දවන ගෙයි බිම හාරවා වස්තුව ගත්තේය. මෙ වනාහි උදාහරණයක් වශයෙන් දක්වනලද්දේය.

Digitized by Google

තවද කාන්‍යකුබ්ජ නුවර භද්‍රකසත් වංශයෙහිවූ මහේන්ද්‍රක නම් රජුට ඉතා රූපසම්පන්න දුවක් වූවාය. අලින්ද්‍ර බිසව් වනාහි කුශ කුමාරයා රාජ්‍යයට පත්වූ කෙණෙහි ඔහුට ඒ කුමාරිකාවන් සරණපාවාදීම පිණිස කතාබස්කොට නොබෝදවසකින් මඞ්ගල්‍යය නියමකරගත්තාය. සරණපාවාදීමේ මඞ්ගල්‍යය කුශ කුමාරයායි කියා වෙන කුමාරයෙක් දක්වාගෙණ ඉතා අලඞ්කාරලෙස සිද්ධකරණලද්දේය. එතකුදුවුවත් තමාගේ ලක්ෂණඇති ලේලි නොම ඇගේ පුරුෂයාගේ ඉතා අවලක්ෂණ රූපය දැක ප්‍රාණය හානිකරගණීය' සිතා අලින්ද්‍ර බිසව් බයපත්වූහ. එබැවින් තමාගේ වංශයෙහි පැවති සිරිතක්ය යි කියා ඒ දෙදෙනාගේ වාසය පිණිස පොළව යට ගෙයක් තනවා පිළියෙලකරණලද්දේය. ඒ ගෙයි ගබඩාවලට එළියවැටීමට ඉඩනොතබනලදින් ඔව්හු අන්ධකාරයෙහිම සමගිව වාසයකළෝය. එහෙත් සුදශීනා නමැති ඒ බිසව් තමාගේ ප්‍රිය වල්ලභයා දැකීමට උපන් මහත් ආශාව දරාගත නොහී එළියෙහිදී ඔහු ඇට දක්වන ලෙස තමාගේ නැන්දණියන්ගෙන් තදින් ඉල්ලාසිටියාය. සුදශීනාව විසින් තමාගේ අවලක්ෂණවූ ස්වාමියාගේ දැකීම වලකනු පිණිස කුශ රජුගේ මලනු කෙනෙක් කුශරජයාය යි කියා සිංහාසනාරූඪකොට ගනාවූ තොල් හා මහත් උදරයකින් යුක්තවූ විරූප හිසක් ඇත්තාවූ කුශ රජ තෙම ධවලච්ඡත්‍රය අල්ලාගෙණ සිටියේය. සුදශීනා තමාගේ පුරුෂයායයි සැලකූ ඒ කුමරු දැක ඉතා සතුටුව, නැවත ධවලච්ඡත්‍රය ඇල්ලීම පිණිස එ බදුවූ කළු විරූපවූ තැනැත්තා පත්කිරීමගැණ ඇගේ නොසතුටු භාවය ප්‍රකාශකළාය. එක් දවසක් ඕ තොමෝ උයනෙහි ඇවිදිද්දී ඔහු දැක යක්ෂයෙකු දුටු තැනැත්තියක් මෙන් පලාගියාය.

නමුත් නොබෝ කලකින් තමන් රැවටුනු බව ඕ තොමෝ දැනගත්තාය. මේ අවසියට නුවර මහත් ගින්නක් අවගෙණ දණ්ට පටන්ගත් කල්හි කුශ රජුගේම විශේෂ කාරණකොටගෙණ හස්තිශාලාව ගින්නෙන් බේරාගන්නාලද්දේය. මේ පිළිබඳව රජුගේ නම සියලු දෙනාගේ මුඛයෙහි පැවතුනේ ඔව්හු 'එතෙම ඉතා කළු පාටය, මහත් රතු ඇස් ඇත්තේය,' යනාදී වශයෙන් ඔහුගේ විස්තර කීවාහු. එවිට සුදශීනාට තමාගේ වැරැද්ද පෙණීගියේය. තවද උද්‍යානයෙහිදී ඇ විසින් දක්නාලද යක්ෂයෙකු වැනි තැනැත්තා තමාගේම ස්වාමි පුරුෂයා බව දැන කනගාටුවට හා විස්මයට ද පැමුණුනාය. වහාම ඕ තොමෝ කාන්‍යකුබ්ජයට පිටත්වයාමට නැන්දණියන්ගෙන් අවසර ඉල්ලා යාච්ඤාකොට අවසර ලදින් තමාගේ ලජ්ජාව සඟවාගැණීමට කාන්‍යකුබ්ජ නගරයට පිටත්වගියාය.

කුශරජ ඇගේ වෙන්වීම ධරාගත නොහී තමාගේ මලනු කෙනෙකුට රාජ්‍යභාරදී වීණාවක් අතින් ගෙණ උතුරු දෙසට පිටත්වගියේය. එ තෙම කාන්‍යකුබ්ජ නගරයට පැමිණි වහාම ඒ බව සුදශීනාට දැනගණ්ට ලැබෙන ලෙස ක්‍රියාකළේය.

1 මෙ ආදි තැන්වල 'කාන්‍යකුබ්ජ' වෙනුවට සමහර පොත්වල 'කන්‍යාකුබ්ජ' කියා දක්නාලැබේ.

සූප ශාස්ත්‍රයෙහි දක්‍ෂකම කාරණකොටගෙණ එ තෙම නොබෝ කලකින් රජ්ජුරුවන්ගේ මුළුතැන්ගෙයි ධුරයකට පත්විය. එහි සිටිද්දී නොනැමෙන තද ගති ඇති තමාගේ භාර්‍ය්‍යාවගේ හිත ගැණීමට රහසින් උත්සාහකොට නුපුළුවන්විය. ඕ තොමෝ ඔහුට අනුකම්පානොකළාය.

මෙවකට සුදර්ශනා බිසව් කුශරජ්ජුරුවන් අත්හැර ආ බව සෑම තැනම ප්‍රසිද්ධ විය. කාන්‍යකුබ්ජ රජුට යටත් සුළු රජදරුවෝ සත් දෙනෙක් සුදර්ශනා පිණිස වෙන වෙනම හසුන් පත් එව්වෝය; රජතෙම ඔවුන්ගේ ඉල්ලීම් ගැණ උදහස්ව ඒවා නොසලකා උන්නේය. එවිට ඔව්හු සමගිව රජ්ජුරුවන්ගේ අගනුවර ගැණීම පිණිස සැරසී පිටත්ව ආවෝය. රජ්ජුරුවෝ තමාගේ දැඩි සිත් ඇති දුවට කිපී බැණ සටනේදී තමාට යම් හානියක් වීනම් ඈ සත්කඩක් කොට කපා සතුරු රජවරුන් සත් දෙනාට බෙදා දෙනබව කියා තර්ජනයකෙළේය. මේ ඉතා භයඞ්කාරවූ තර්ජනය ඇසූ සුදර්ශනා තොමෝ තමන් විසින් අත්ඇර දමනලද්දාවූ මුළුතැන්ගෙයි මෙහෙකරමින් උන් තමාගේ පුරුෂයා කරා වෙවුලමින් ගියාය. එවිට එ තෙම ඈ ගලවා ගැණීමට හා ඇගේ පියානන් වෙනුවට යුද්ධකිරීමටද ප්‍රතිඥාදුන්නේය. මෙ විට තමන්ගේ බෑනනුවන් මුළුතැන්ගෙයි මෙහෙකරමින් සිටිනබව රජ්ජුරුවන්ට දන්වනලදුව රජ තෙමේ වහා ඔහු සමීපයට ගොස් ඔහුට අපමණවූ ගෞරවාදර කොට පසු ගිය කාලයෙහි ඔහු ගැණ පැවති නොසැලකිලිභාවය පිරිමැසුවේය. ධීරසාරවූ කුශ රජතෙම හස්ති රජයෙකු පිට නැගී සතුරන් ඉදිරියට ගොස් ප්‍රථමකොට කරණලද ඝෝෂාවෙන්ම ඔවුන්ගේ ධෛර්‍ය්‍ය බිඳ ඔවුන් තමාගේ වශගයට පමුණුවාගත්තේය. ඉක්බිති රජතෙම කුශ රජ්ජුරුවන්ගේ නියෝගයෙන් එක එක රජකුට තමන්ගේ එක එක කුමාරිකාව සරණපාවා දුන්නේය. කුශ රජ්ජුරුවෝද කාන්‍යකුබ්ජ නගරයෙහි ස්වල්ප දවසක් විජය ශ්‍රී අනුභවකරමින් සිට දමනයවූ ස්වකීය බිසව හා සමග තමාගේ රාජධානියට පිටත්ව ගියේය. යන්නාවූ මාර්ගයෙහිදී පැහැදිලි ජලය ඇති දෙලක් සමීපයෙහිදී තමාගේ ජායාව එහි වැටීමෙන් ස්වකීය ශරීරයේ අවලක්ෂණ දුක බොහෝසේ කලකිරී ඒ දෙලෙහි ගිලී පණ නසාගන්ට සැරසුනේය. එකල්හි ඉන්ද්‍රතෙම අවුත් ඔහු ඉදිරියෙහි පෙණීසිට ජ්‍යෝතිරස නම්වූ දුර්ලභ මාණික්‍ය අල්ලනලද මාලයක් ඔහුට තෑග්කොට කියන්නේ 'මේ පලඳුව, ඒ කාරණකොටගෙණ තොපි පෘථිවිතලයෙහි සිටින්නවුන් අතුරෙන් ඉතා රූපත් තැනැත්තහු වන්නාහුය; ස්වකීය ආකාරය කැමති කල්හි මෙය තොප ඇඳි පිළියෙන් වසව, එවිට තොපගේ රූප ලක්ෂණ අන්තර්ධාන වන්නේය' යි කියා ගියේය. කුශ රජ මාලය පැලඳී වහාම ඔහුට දිව්‍ය ශරීරයක් වැනි ලක්ෂණ සම්පන්න ශරීරයක් පහළවිය. ඒ දුටු සුදර්ශනාතොමෝ ප්‍රීතියෙන් පිණා ගියාය.

එ කල කුශරජ්ජුරුවෝ නම් දැන් බුදුරජහු වන්නාහ; කාන්‍යකුබ්ජ රජ මහානාම වෙයි, අලින්ද බිසව් මායා බිසව වෙයි; සුදර්ශනා බිසව් යශෝධරා වෙයි, මාරයා සහ ඔහුගේ පිරිස සතුරු රජදරුවෝ සත් දෙනා වන්නාහ.

Digitized by Google

භික්ෂූන් විසින් ආරාධිතවූ බුදුරජාණන්වහන්සේ කුශ රජ විරූපව ඉපදීමට කාරණ මෙසේ ගෙණහැර දක්වා වදාළසේක: තමන්වහන්සේ පෙර එක් ජාතියක සුදර්ශන යන නාමයෙන් ප්‍රසිද්ධව ඉතා ප්‍රිය දර්ශනීයවූ භාර්‍ය්‍යාවක් ඇතුව වාසය කළසේක. එක් දවසක් ඔහු ගෙදර නැති වේලෙහි ඕ තොමෝ ප්‍රත්‍යේක බුදුවරයෙකුට ප්‍රණීතවූ ආහාරයක් දුන්නාය. එ තෙම තමාගේ භාර්‍ය්‍යාව සමීපයෙහි තරුණ පුරුෂයෙක් දැක කිපී ඔවුන්ට ගරහා කථාකළේය. ඕ තොමෝ ද උන්වහන්සේ නිකෙලෙස්වූ ශුද්ධවන්තයෙක් බව දන්වා 'එසේ පරිභවනොකරව' යි ඔහුට කියමින් තමාගේ නිර්දෝෂතාව ගැණ අහස සාක්ෂි දරණලෙස ඉල්ලාසිටියාය. පසේබුදුරජාණන්වහන්සේද ඒ ගෘහපතියාට තමන්වහන්සේගේ ශුද්ධභාවය අවබෝධකරණු සඳහා අහසට පැන නැගී රාජහංසයෙකු සේ වැඩියසේක. මේ කාරණකොටගෙණ සුදර්ශනගේ කුකුස් දුරුවූ කල්හි එ තෙම භාර්‍ය්‍යාවගෙන් තමා විසින් කරණලද වරදට ක්ෂමාව ඉල්ලාගෙණ ඉක්බිති එක් භාවනාවක ගැලීඉද එම සිල්වත් ස්ත්‍රිය මතු ජාතියෙහිද තමාගේ භාර්‍ය්‍යාව කොට ලැබෙන හැටියට ප්‍රාර්ථනාකළේය. ඒ ශීලසම්පන්න ස්ත්‍රිය නම් සුදර්ශනා බිසව් වන්නීය. ඈගේ ස්වාමි පුරුෂයා අවලක්ෂණ වූයේ පසේ බුදුන් ගැණ කළාවූ නුසුදුසු සැක හේතුකොටගෙණ විය.

නිමි.

Digitized by Google

ශෑමපද විවරණය.

[බ. = බලනු. *v.* = vide, see. h. = having.]

සැලකියයුත්තක්—අක්ෂර, අඞ්ගනා, අත්කම්, ආදී ප්‍රකෘතිරූපයෙන් සිටින නාමපද ඒක වචන බහුවචන යන දෙකට සමව යෙදේ. (මගේ සිංහල ව්‍යාකරණයෙහි 83 පිටේ සිට 88 පිට දක්වා බලනු.)

NOTE.—Nouns in their basal forms, such as අක්ෂර, අඞ්ගනා, අත්කම්, are common to both singular and plural. (*Vide* pp. 83 to 88 of my Sinhalese Grammar.)

අ.

අ, නෑ යන අර්ථ ඇති පදයක් (ප්‍රාණාක්ෂරයකට ඉදිරියෙන් යෙදනකල 'අන්' කියා වේ.): a negative particle; not. (අ changed into අන් before a vowel.)

අක්බඹුරු, අගවකුටුවූ: curley (of hair)

අක්ලිෂ්ට, කිලුටුනැති, පිරිසිදු: not soiled, clean, pure

අක්ෂර, අකුරු: letter

අක්ෂිය, ඇස: eye

අකෘත්‍යය, නොකටයුතු, කරන්ට නුසුදුසු: improper to be done [infamy

අකීර්තිය, නින්දාව, අප්‍රසිද්ධය: disgrace,

අකුස, ඇතා හික්මවීමට පාවිච්චිකරණ හෙණ්ඩුව: hook or goad to govern an elephant [plant (අක්ෂර, බ. *v.*)

අකුර, මොට්ටය, ඉකිරිය, පැළය: sprout,

අග්නි, ගිනි: fire

අග්‍ර, අග, උතුම්, ප්‍රධාන: end, best, chief

අග්‍රප්‍රාප්ත, අගතැන්පත්, කෙළවරට පැමිණි: reached the end or summit

අග, (අග්නි, අග්‍ර, බ. *v.*)

අගි, වටිනාවූ: valuable

අගිල්, අගරු නම් සුවඳ ලී වර්ගය: aloe wood

අඟ, සතුන්ගේ ඉසේ අඟ: horn (අඞ්ග, බ. *v.*)

අඞ්ගනා, ස්ත්‍රී: woman

අගරු,(අඞ්ගරාග, බ. *v.*)

අඞ්ක, සලකුණ: mark

අඞ්කුර, (අකුර, බ. *v.*)

අඞ්කුශ, (අකුස, බ. *v.*)

අඞ්ග, ශරීරය, ශරීරයේ අවයව, අවයව: body, member of the body, member,

අඞ්ගරාග, ඇඟේ ගාන සුවඳ, විලවුන්: fragrant unguent for the body

අඞ්ගුලිය, ඇඟිල්ල: finger

අච්ඡාදනයකොට, ඇඳ, වසා: h. dressed, h. covered

අඤ්ජනයකළ, (සිතුවම් ආදිය) ඇන්දවූ: drawn (of pictures, etc.)

අජර, නොදිරණ: undecaying

අට්ට, කැමති: desirous

අඩුක්කුව, එක පිට එක තිබූ කෑම භාජන රැස: collection of vessels of food placed one upon another

අත්කම්, අතින්කරණ වැඩ: handicraft

අත්පොළසන්, අත්පිඩි ශබ්දය: sound of clapping hands

අත්‍යලඞ්කෘත, ඉතා අලඞ්කාර (ලක්ෂණ) කරණලද: very well decorated [hand

අත්ල, අල්ල, අත: palm (of the hand),

අත, හස්තය, දිශාව, ලඟ, සමීපය, සීමාව, කෙළවර: hand, direction, nearness, proximity, limit, end. ['සවණත' 'යහණත' යනාදී තැන්වල 'අත' නම් අර්ථයක් සඳහා නොව පදපූරණය පිණිස යොදනලදී; අත නොහොත් ත යන ප්‍රත්‍යය ආධාර අර්ථයපිණිසද යෙදේ: In words such as 'සවණත,' 'යහණත,' අත is used as a mere expletive; අත or ත also indicates a locative sense.]

Digitized by Google

අතඹුල, අතටගත් නෙල්ලිගෙඩිය—යම් ඇස ඉදිරිපිට තිබෙන අනුමාන නැති දෙයක් කියන කල මෙය බොහෝවිට යෙදේ: nelli (*Phyllanthus Emblica*) fruit resting on the hand—generally used when referring to any thing clearly visible

අතරමග, ස්ථාන දෙකක් අතර මාර්ගය: road between two places

අතවැසියා, වැඩකරුවා, උපකාරකාරයා, ගෝලයා: servant, assistant, pupil

අති, ඉතා, බොහොම: very, most

අතිශයෙන්, ඉතාවැඩිලෙසින්: exceedingly

අතුට, අතුරලා: h. spread

අතුනුබාන, බඩවැල වෙලාසිටින කුඩා නහර: caul which encloses the bowels

අතුර, තුළ, ඇතුළ: into, inside

අතුරු, අතර, කරුණු: interval, particulars

අතුල්‍යවූ, අසමානවූ: unequal, unlike

අද, අද දවස, හෘදය; ඇවිත්: to-day, heart; h. come

අදිටන කරනු, මෙසේ වෙවයි නියමකොට සිතීම, දෘඪලෙස නියමකරගැනීම: firm resolution

අදිප, අධිපති, ප්‍රධාන: chief

අදෘශ්‍ය, නොපෙනීම; නොපෙනෙන: state of being invisible; invisible

අදෘශ්‍යමානව, නොපෙනී: being invisible

අඳනය, අඳින සිවුර: under garment of Buddhist monk

අධ්‍යාශය, අදහස, තද ආශාව: intention, great desire

අධර, තොල: lip

අධික, වැඩි, මහත්: great

අධිපති, (අදිප, බ. ව.)

අධිරාජන්, ප්‍රධාන රජ්ජුරුවෝ: chief king, emperor

අධිෂ්ඨානය, මෙසේ වෙවයි නියමකොට සිතාගැනීම: firm resolution

අධෝලිපි, පොතක පිටුවල පාතින් ලකුණු යොදා ලියන ලියවිලි: foot-note

අන්, වෙන: other (අ, බ. ව.)

අන්තර්ධානකොට, නොපෙණියන්ටසලස්වා, නැතිකොට: h. caused to vanish

අන්තරයාතරයෙහි, අතරතුරෙහි: in the interval

අනන්තකල්පය, අවුරුදු දහසකට අඟලක් වැඩෙන මේ පොළොව ගව්වක් වැඩීමට යන කාලය, එනම් අවුරුදු 1,774,080,000: an age consisting of 1,774,080,000 years

අන්තඃපුරය, බිසෝවරුන් සිටින මාලිගාව, ඇතුළු නුවර: inner appartment of a palace occupied by queens, inner town

අන්තේවාසිකයා, (අතවැසියා, බ. ව.)

අභ්‍යන්තරනගරය, ඇතුළුනුවර, රජමාලිගාව: inner town, king's palace

අන්‍ය, වෙන: other (අන්, බ. ව.)

අන්‍යාය, අයුක්ත, අධර්මය: injustice

අන්‍යෝන්‍යයෙන්, ඔවුනොවුන්: one another

අන්විත, යුක්ත, ඇති: having

අනයි, (අනඝ, බ. ව.)

අනඞ්ගයා, කාමයට උපමාකරණ එනම් මද විංකෙනෙක්: Indian Cupid [less, many

අනන්ත, කෙළවරක් නැති, බොහෝ: end-

අනන්තනාථ, නාගලෝකයේ රජ: king of the Naga (snake) world

අනන්‍යසාධාරණ, වෙනඅයවලුන්ට සාධාරණ (පොදු) නැති: not possessed by others, uncommon

අනය, අවැඩ, විපත්තිය: ill-luck, calamity

අනර්ඝ, උතුම්: precious, invaluable

අනවරතයෙන්, නිතර: always

අනතුරුව, පසුව: afterwards

අනලස්ව, ප්‍රමාදනැතුව: without delay

අනාගතය, මතුකාලය: future time

අනාදරය, ගෞරවය නොහොත් ප්‍රේම නැතිබව: want of respect or affection

Digitized by Google

අනාථපිණ්ඩික, බුදුන් ජීවමානකාලයෙහි සිටිය බොහෝ පින්කම්කළ එක් ශ්‍රද්ධාවන්ත බෞද්ධ සිටුකෙනෙක්: a Buddhist grandee who lived in the time of Buddha and did many meritorious acts

අනිවර්තන, නොනවතින: not stopping

අනුදත්ත, කැමැත්තදුන්න, ඉඩදුන්න: consented, permitted

අනුදත්තාලදුව, කැමැත්ත දෙනලදුව, ඉඩ දෙනලදුව: h. obtained the consent, h. been permitted

අනුබන්ධනයකොට, පස්සෙන් එලවා: h. pursued [is eaten

අනුභවතරණ, කන: who-eats or which-

අනුභාව, (ආනුභාව, බ. ව.)

අනුරාගය, ඇල්ම, ආදරය, අතිශයෙන් ප්‍රීතිවීම: attachment, love, great enjoyment

අනුස්මරණයකොට, සිහිකොට: h. thought of, h. remembered [ous

අනේක, නොයෙක්, බොහෝ: many, vari-

අප්සරාව, දිව්‍යනාටක ස්ත්‍රී; celestial damsel

අපමණ, ප්‍රමාණනැති: unlimited

අපරපර්වතය, ඉරබසින පර්වතය, අස්තපර්වතය: western mountain behind which the sun sets

අපරිමිත, ප්‍රමාණකරනුබැරි, අප්‍රමාණ: unmeasurable, infinite

අබ, වලාකුළු, එනම් ඇටවර්ගය: cloud, mustard seed

අඹ, වතුර, එනම් ගෙඩි, ස්ත්‍රී, ගෑණි: water, mango, woman, wife

අම්බර, ආකාශය: sky

අඹල, කරකැවුන: turned round

අඹුල, නෙල්ලි: a fruit (*Phyllanthus Emblica*)

අභ්‍යන්තරය, ඇතුළ: inside, inner space

අභ්‍රකූට, වලාකුල්: cloud

අභිප්‍රාය, අදහස, කැමැත්ත: intention, meaning, wish

අභිනව, අලුත්: new

අභිමතය, කැමැත්ත: wish

අභිමුඛමාර්ගය, ඉදිරියට තිබෙන මග, ඉස්සරහ: road in front of, front

අභිමුඛය, ඉස්සරහ, ළඟ: presence, front, proximity

අභිමුඛව, ඉස්සරහටවෙලා, ඉදිරියෙන්: being in the presence, before the face, in front

අභිවාදනය, වැඳීම, නමස්කාරකිරීම: worshipping, salutation

අභිලාෂය, තදආශාව, කැමැත්ත, ආදරය: longing, wish, affection

අභිෂේකය, ඉසෙහි පැන්ඉස්මෙන් රජකමට පත්කිරීම: installation of kings by sprinkling water on the head

අභීත, භයනැති: fearless

අභීතව, බයනැතුව: without fear

අම්බිකාව, ස්ත්‍රී, භාර්යාව: wife

අම, (අමෘතය, බ. ව.)

අමන්ද, ඒකාණුවූ, බොහෝ: not little or few, much, many

අමර, නොමැරෙන; දෙවි: undying; god

අමුත්තක්වූනම්, 'මළේනම්' යන ප්‍රිය සංවාක්‍යය: 'should a change occur,' an euphemistic expression for 'if (he) died'

අමෘතපානය, දෙවියන්ගේ බීමවර්ගයක්: nectar or beverage of the gods

අමෘතය, දෙවියන්ගේ කෑම, දෙවියන්ගේ බීම: ambrosia, nectar (of gods)

අමෝරා, ගැස්මටමෙන් උස්කොටකර නොහොත් ගැස්මට (යොදන ආයුධය) කරකවා: h. lifted up or whirled (an instrument) as if to strike

අයෝශූල, } යකඩඋල: iron spike
අයශ්ශූල, }

අයුති, සමානයි: like

අයුර, වැනි, වාගේ: like

අයෝග්‍ය, නුසුදුසු: improper [engaged

අයෝජිතව, යෙදීනැතුව: without being

අර්ණව, මුහුද, සාගරය: sea, ocean

අර්ඝ, (අරුඝ, බ. ව.)

Digitized by Google

අඩ, භාගය: half [cook

අරක්කැමියා, කෑමලුයන්නා, කෝකියා:

අරභයා, ගැණ: about, concerning

අරුණ, ඉරපායන්ට ඉස්සර අහසේ නගින රතුපැහැ: twilight

අරුත, අර්ථය: meaning

අරුම, ලබාගැණීමට අමාරු: difficult to obtain, scarce [ed

අලංකෘතවූ, සරසනලද: decorated, adorn-

අලබ්ධව, නොලැබ: not h. received

අලලනලද, කලතනලද: stirred

අලස, ප්‍රමාද, කාර්‍ය්‍යසරනැති: slow, inactive

අළු, එළිය: light

අළුයම, ඉතා උදය, පාන්දර: dawn

අවඩ, අනර්ථය, හානිය: want of prosperity, evil

අවතීර්ණ, බැස්ස: descended

අවරණ, (ආවරණය, බ. *ව.*)

අවලෝකනයකොට, බලා: h. seen

අවවාදය, දොස්නැඟීම, දූනම්තිකම: censure, advice

අවශේෂ, ඉතුරු, අනිත්: remaining, other

අවැඩ, (අවඩ, බ. *ව.*)

අවිච්ඡින්න, නොකැඩූ, ඒකාබද්ධ: uncut, continuous

අවිත්, ඇවිත්: h. come

අවිද්‍යමාන, ඇත්තේ නැති: not existing

අවිදූර, දුරනුවූ, ළඟ: not distant, near

අවුර, ප්‍රාකාරය, තාප්පය: rampart

අවුළු, } කැවිලි, මාලුපිණි: sweetmeat
අවුලුපත්, } (eaten after a meal), cooked vegetable or meat

අෂ්ට, අට: eight

අෂ්ටම, අටවෙනි: eighth

අෂ්ටවංශමාණික්‍යය, වක් හෙවත් පැති අටක් ඇති මැණික: an octagonal gem +

අෂ්ටාංගබ්‍රහ්මඝෝෂාව, අට ආකාර නාදයක් පතුරුවන බ්‍රහ්මයාගේ කථාකරණ ශබ්දය: Brahma's voice which consists of eight tones ×

අෂ්ටාදශ, දහඅට: eighteen

අෂ්ටාදශවිද්‍යා, විද්‍යා හෙවත් ශාස්ත්‍ර දහඅට (එනම්, ශික්ෂා, කල්ප, ව්‍යාකරණ, නිරුක්ත, ජ්‍යොතිශ්ශාස්ත්‍ර, ඡන්දස්, ඍක්, යජුෂ්, සාම, අථර්ව (යන වේද සතර), මීමාංසා, න්‍යායවිස්තර, ආයුර්වේද, ධනුර්වේද, ගාන්ධර්ව, අර්ථශාස්ත්‍ර, පුරාණ, ධර්මශාස්ත්‍ර): 18 kinds of learning or lore (viz. the science which teaches the proper pronunciation of words and laws of euphony; that which lays down the ritual and prescribes rules for ceremonial and sacrificial acts; grammar; that which contains glossarial explanations of obscure words, including derivation; astronomy (including astrology); prosody; *Ṛ*ik veda; Yajush veda; Sama veda; Atharva veda; philosophy; logic or logical philosophy; science of health or medicine; archery;

+ මේ මැණික පරම්පරාවෙන් පැවත අවුත් ධර්මාශෝක රජුට හාරවූකල්හි මිහිඳුමහ තෙරුන්වහන්සේ ලක්දිවට වඩින දවස් ඒ මැණික සහ බුදුන්ගේ ඌර්ණරෝමධාතුව ද ගෙණවුත් සීගිරිපර්වතයෙහි නිධානකලබව රාජරත්නාකරය නම් පොතේ කියාතිබේ: The historical work R*a*jarat*na*kara says that this gem, having passed to king Dharm*a*soka as an heirloom, was brought to Ceylon by his son Mihindu Mahaterunn*a*nse, together with Buddha's *urn*aroma (circle of white hair turned to the right between the eye-brows—a token of greatness), and enshrined in the Sigiri Rock along with the 'circle of hair.'

× ඒ අටනම (names of the eight tones are):—විස්සට්ඨ, මඤ්ජු, විඤ්ඤෙය්‍ය, සවණීය, අවිසාරී, බින්දු, ගම්භීර, නින්නාදී.

music; science of wealth (political economy) or political science; ancient or legendary history; jurisprudence)

අෂ්ටාඞ්ගශීලය, කරුණු අටකින් යුත් ශීලය (එනම්: සතුන්මැරීම; සොරකම්කිරීම; ස්ත්‍රීසේවනය; බොරුකීම; මත්පැන්බීම; ඉරගැරුණයින්පසු කෑම; නැටීම ගායනාව වාදනය විසුලුදේ දැකීම මල්ගඳ විලවුන් දැරීම සැරසීම; උස්මහ ආසන, යන මෙවායින් දුරුවූ පැවතුම අට පිළිබඳ අඞ්ග අට): the 8 qualities appertaining to the 8 precepts of Buddha (viz. avoiding the following: killing; stealing; cohabiting with women; lying; drinking intoxicating liquor; eating after midday; dancing, playing on musical instruments, sounding drums, looking at ludicrous things, decking the body with flowers or applying to it scents and unguents; high or grand seats)

අසත්පචිතය, (අපරපචිතය, බ. *v.*)

අස්ථානය, නුසුදුසු ස්ථානය: unsuitable place

අස්ථි, ඇට: bone

අස්මත්, මම, අපි: I, we

අස්මත්නු, අපි: we

අස්වසා, සනසා: h. consoled

අස්සල, } අශ්වයින් බඳින ගෙය: stable for
අස්හල, } horses

අසංක්ලිෂ්ට, කිලුටු නැති: not soiled, not defiled

අසත්‍ය, බොරු, මිථ්‍යා: untrue, false

අසනි, හෙණ: thunder

අසම්භින්න, නොකැඩුණු: unbroken, continuous

අසම්භීතව, භයනැතුව: without fear

අසර, (අප්සරාව, බ. *v.*)

අසරුවා, අශ්වයා පිටගත්තා: horseman

අසුර, දෙවියන්ට සතුරුවූ යක්ෂකොට්ඨාසයක්: a class of demons who are enemies of gods

අසා, ශ්‍රවණයකොට: h. heard (ආඝ්‍රාතය කොට, බ. *v.*)

අසුන්, ලියුම්, ආසන: letter, seat

අහිතවූ, අකරුණාවන්ත, ආදරයනැති, මිත්‍ර නොවූ, විරුඬ, සතුරු: unkind, unaffectionate, unfriendly, inimical

අසෝ, අසවල්: such and such (descriptive expression)

ආ.

ආකර්ෂණයකොට, ලඟටඇද: h. attracted

ආකාශගඞ්ගාව, දිව්‍යලෝකයේ ගඞ්ගාව: celestial river

ආකාශය, අහස: sky

ආකුල, පිරුණු, ගැවසීගත්, අවුල්වූ: full of, crowded, confused

ආගමනය, ඊම: coming

ආගමනයකොට, ඇවිත්: h. come

ආඝ්‍රාණයකොට, ගඳ හෝ සුවඳ දැන, ඉඹ: h. smelled

ආචාර්‍ය්‍යයා, ගුරුවරයා: teacher

ආචාරය, සිරිත, පිළිපැදීම: custom, behaviour

ආදිය, පටන්ගැන්ම, මුලටඇති දේ: beginning, first part (=et cetera)

ආනන්දස්ථවිර, බුදුන්ගේ කුඩාමව් මහාප්‍රජාපතීගෝතමීගේ පුත්‍රවූ උන්වහන්සේගේ ප්‍රධානශ්‍රාවකයෙක්: a chief disciple of Buddha

ආනුභාව, අනුභස, බලය, තේජස: authority, power, dignity

ආභරණ, ශරීරය අලඞ්කාරකරණ බඩු: ornament

ආම්‍ර, අඹ: mango

ආමන්ත්‍රණයකොට, කැඳවා, අඬගසා: h. called or invited

ආයාචනාකළ, යාච්ඤාකළ: begged, solicited

ආයාස, වෙහෙස, වේදනාව: fatigue, pain

ආයුවර්ධනයකිරීම, ආයුෂවැඩිකිරීම, 'ආයුබෝවා' කියා සෙත්වැඩීම: prolonging life, wishing long life

ආර්ද්‍රවූ, තෙත්වූ: wet

ආර්‍ය්‍ය, උතුම්: noble

ආරාධනාව, ඉල්ලීම, යාච්ඤාව: request, solicitation, invitation

Digitized by Google

ආරාධිතවූ, ආරාධනා (ඉල්ලීම්) ලැබූ: solicited, invited

ආරූඪවෙමින්, නැඟෙමින්: ascending

ආරෝපණයකරමින්, තබමින්, දමමින්, ඉඳුවමින්: placing, putting, planting, stringing

ආරෝහ, උස: height

ආලස්‍ය, අලස, ප්‍රමාද, කඩිසරනැති: slow, idle

ආලාරිකව, සමීපව, ළඟ: near

ආලිඞ්ගනයකරමින්, වැලඳගනිමින්: embracing

ආලෝකය, එළිය: light

ආවර්තවූ, කරකැවුන: revolved, turned round

ආවරණය, මුවාව, වැස්ම: screen, covering

ආවලිය, වැල: string, line

ආවාටය, වළ: hole

ආශ්චර්‍ය්‍යවූ, පුදුම: wonderful

ආශ්‍රයකරණලද, පුරුදුකළ: practised, learned

ආස්තරණයකළ, ඇතුරුවාවූ, විහිදෙව්: spread, moved about

ආසන්නය, ළඟ: near, proximity

ආහාරය, අහර, කෑම: food

ඇ.

ඇකය, උකුල, තුරුල්ල: hip

ඇකි, පුළුවන්: able

ඇඟි, අදහස: intention, motive

ඇත්හල, ඇතුන්බඳින ගෙය: stable for elephants

ඇතුළ්ගෙය, ගබඩාව, කාමරය: room

ඇද්ද, ඇතිද, ඇත්තේද: is there ?

ඇදුරා, ගුරුවරයා, ආචාර්‍ය්‍යයා: teacher

ඇනිය, සේනාව: army

ඇම, හැම, සියලු: all

ඇමද, අතුගා: h. swept

ඇවෑම, පසුවීම, නැතිවීම: passing off, destruction

ඇවිටිකොට, යාච්ඤාකොට: h. begged

ඇසිල්ල, ක්ෂණය, මොහොත: moment

ඉ.

ඉක්බිති, ඉක්බිතිව, } ඊටපසු, නැවත: afterwards, next, again

ඉක්ෂ්වාකු, ඔක්කාකනම් ඉතා පුරාණ රජවංශයක්: a very ancient dynasty of kings

ඉක්ෂු, උක්: sugar-cane

ඉකිගසා, ඉක්නාගසා: h. sobbed

ඉකුත්වත්, පසුවූ, පසු (ගිය ජාතිය) පිළිබඳ: past, relating to the previous life

ඉකුත්වූ පසුගිය: past

ඉදින්, අනියම් අර්ථය අඟවන නිපාතයක්: a particle denoting uncertainty (used at the commencement of conditional clauses)

ඉඳු, ඇදනැති, අවංක, යහපත්: honest, good (ඍජු, බ. v.)

ඉඳු, (ඉන්ද්‍ර, බ. v.)

ඉඳුවර, (ඉන්දීවර, බ. v.)

ඉන්ද්‍ර, ප්‍රධාන; ප්‍රධානයා, ස්වාමියා, දෙවිවරුන්ගේ නායකයා: chief; chief, lord, chief of the gods

ඉන්ද්‍රචාප, දේදුන්න: rainbow (literally 'Indra's bow')

ඉන්ද්‍රනීලමාණික්‍යය, ප්‍රධාන නිල් මැණික: best of blue sapphires

ඉන්දීවර, නිල්මානෙල්: blue lotus

ඉලන්තිය, ඇත්බෙට්ට: elephant's dung

ඉෂ්ටවූ, යහපත්, ආදරවන්ත, ගරුකරණලද: good, beloved, respected

ඉස්ලූඅත, ඉස් පෙව් පෙව් දිශාව: direction in which (each individually) directed (lit. 'put') his head (in the flight)

ඉසුරු, ප්‍රධාන; සම්පත: chief; wealth

ඊ.

ඊර්‍යාපථ, (යාම, ඉඳීම, සිටීම, නිදාගැනීම යන) ශරීරය පිළිබඳ පැවතුම්: position of the body (of which there are four, viz. going, standing upright, sitting, lying down.)

Digitized by Google

ඊශ්වරයා, ප්‍රධානයා, ශිවදෙවියෝ: lord, god *Siva*

උ.

උකටලීවූ, කලකිරුණු, ඇලුම්නැතිවූ: discouraged, disheartened, disgusted

උච්ච, උස්: high

උජ්වලිතවූ, දිලිහුනාවූ, උසස්ව බැබලූ: shone brightly, brilliant

උත්, (=ත්, ද) සහ: and

උත්කණ්ඨිත, (උකටලීවූ, බ. ව.)

උත්පත්තිය, ඉපදීම: birth [born

උත්පතනවන්නාවූ, උපදින: who-is to be

උත්පල, නිල්මානෙල්: blue lotus

උත්පාටනයකොට, උදුරා, උගුල්ලා: h. eradicated

උත්තර, ප්‍රධාන, උසස්; උතුරුදිශාව, ඇසීමට කියන වචනය: chief, upper; north, answer

උත්තරශාටකය, උතුරුසළුව, කරේ නොහොත් ශරීරයෙහි ඉහළකොටසේ ලන වස්ත්‍රය: an upper garment worn over shoulders

උත්සාහකොට, වෑයම්කොට: h. tried

උතුරුසළුව, (උත්තරශාටකය, බ. ව.)

උද්ග්‍රහණයකරවා, උගන්වා: h. taught

උද්දූප, පවුර (කොටුතාප්පය) ප්‍රවේසමට බඳින බැම්ම: buttress

උද්දාම, උඩඟුකම: pride [proud

උද්දාමකළේ, උඩඟුබවට පැමිණවී: made

උද්‍යාන, උයන: park, pleasure garden

උද්වහණයකොට, උසුලා: h. born up or supported

උදක, දිය, වතුර: water

උදකලා, තනියම: alone

උදයපර්වතය, ඉරපායන පර්වතය: eastern mountain behind which the sun rises

උදාවීම, ඉහළටනැඟීම, උදය: rising up

උදුසණක්ෂණම, ඉතාඋදෑසන්, අලුයම: at dawn, very early morning

උදු, (උත්, බ. ව.)

උදුල, (උජ්වලිතවූ, බ. ව.)

උදෙසා, නිසා: on account of

උන්නත, උඩඟු: high minded, proud

උන්සන, උන්නාවූ ආසනය: seat which was occupied [other

උනුන්, ඔවුනොවුන්: one another, each

උපකරණ, ද්‍රව්‍ය, යමකටඋවමනා දේ: materials, necessaries

උපදේශය, උපාය, ගුරුකම: contrivance, means, advice [successively

උපනුපන්, උපන්නාවූ උපන්නාවූ: born

උපභෝග, සැපපිණිස පාවිච්චිකරණ ඇඳ පුටු ආදිය: things used for comfort, as furniture (පරිභෝග, බ. ව.)

උපලක්ෂිත, යුක්ත, ඇති: contained

උපශෝභිත, අලංකාරකරණලද: decorated, made beautiful

උපාය, යමක් කරණ විධිය, උපක්‍රමය, ප්‍රයෝගය: contrivance, means, stratagem

උපුල, (උත්පල, බ. ව.)

උපෝසථදිනය, පෝයදවස: quarter (day) of the moon observed as the Buddhist sabbath

උබය, } දෙක: two, both
උභය, }

උර, (උරු, බ. ව.)

උරණ, තරහ: anger

උරුතලයෙහි, ළැපැත්තෙහි, පපුවෙහි: in the breast or bosom

උරිඳු, ප්‍රධාන නාගයා, අනන්තයා: chief of the N*a*gas, Ananta

උල්ලංඝනයකොට, උඩින්පැන, ඉක්මවා, කඩකොට: h. leaped over, transgressed

උව, උනාවූකල්හි: when become

උවද, උනාවූකල්හිද: even when become

ඌ.

ඌකාවා, උකුණා: louse

Digitized by Google

ඌනත්වය, අඩුකම: deficiency

ඌරු, කලවය: thigh

ඍ.

ඍජුබූ, (ඉදු, බ. ව.)

ඍද්ධි, ආනුභාව, උතුම් බලය: great authority, supernatural power

එ.

එකෙණෙහි, ඒක්ෂණයෙහි, ඒමොහොතෙහි: at that moment

එකත්පස්ව, එකපැත්තකින්: on a side

එක්තුල්, එකසමාන: alike, similar

එකබඳ, එකපුනි, } (එකතුල්, බ. ව.)

එකලාව, තනිවි: being alone, alone

එකලුවේ, හැමතැනම එකසැරි එළිය පැතිරේ, බබලයි: becomes well illuminated, shines

එකැස්බෙර, එකමූණුඇති බෙරවර්ගයක්, රබන්: a drum with one skin or face, timbrel

එනකුදුවුවත්, එසේවිනමුත්: although so happened, nevertheless

එම්බල, හැබ, ඔබ්, අහෝ: oh you!

එම්බා, 'එම්බල' යන්නේ අර්ථඇති ඊටවඩා ගෞරවය අඟවන පදයක්: a term equal to එම්බල, but more respectful than that

එවුද, හැකිද, පුළුවන්ද: is it possible?

එසඳ, එකල්හි, ඒ වේලෙහි: at that time

ඒ.

ඒ, ඒ දෙය, ඒ තැනැත්තා (ගුණවචනයක් නොවන තැන්වල මෙම අර්ථයි): it, he (when ඒ is not an adjective)

ඒකචාරී, තනියම හෝ සිරෙණ නොහොත් වසන: living or going alone

ඒකාත්මිකව, එක ආත්මයක්ව, එක්කෙනා වගේ: as one, in unity

ඒකාදශ, එකොළොස්වෙනි: eleventh

ඒකාන්තයෙන්, අනුමානනැතුව, සත්තක ලෙසින්: truly

ඒකාලෝකවේ, (එකලුවේ, බ. ව.)

ඓ.

ඓරාවණ, ශක්‍රයාගේ ඇතා: Sakra's elephant

ඓරාවණාරූඪ, ඓරාවණපිට නැගුණු: mounted on Airawnna's back

ඓශ්වර්යය, ඉසුර, සම්පත: wealth, prosperity

ඔ.

ඔක්කාක, (ඉක්ෂ්වාකු, බ. ව.)

ඔත, වැටුන, වැටිලත්; වැටුනකල්හි: fallen; when fallen

ඔර, ළැපැත්ත: bosom

ඕ.

ඕ, ඈ: she

ඕජස්, ඕජෘ, } බලය, වීර්යය, තේජස: power, strength, splendour

ඕජෝවර්ධනයකරණ, බල හෝ තේජස වැඩිකරණ: increasing power or splendour

ඕෂ්ඨ, තොල: lip

ඕෂධී, බොහොම එළියඇති එක් තාරකාවක්, බෘහස්පති තරුව: a kind of very bright star, Jupiter

ඕහට, ඔහුට: to or for him

ඖ.

ඖෂධ, බෙහෙත්: medicine

ක.

ක්‍රමෝන්නත, ක්‍රමයෙන් උස්වූ නොහොත් මහත්වූ: gradually become (or grown) high or large

ක්‍රීඩා, සෙල්ලම්: play, sport [sporting

ක්‍රීඩාකරණ, සෙල්ලම්කරණ: playing,

ක්‍රීඩාධුරය, සෙල්ලම්භාවය: playful state

ක්‍රූරචාරී, ක්‍රූර හෙවත් නපුරු ස්වභාවඇති, හිත රිදෙන: cruel, unpleasant

Digitized by Google

ක්ලාන්තභාව, වෙහෙස: weariness

ක්ලිෂ්ට, කිලුටුවූ: soiled [thought

ක්ලේශ, සිත කිලුටුකරණ සිතිවිලි: sinful

ක්ලේශාන්ධකාරය, කෙලෙස් නමැති අඳුර: darkness-like sinful thoughts

ක්ෂණය, මොහොත: moment

ක්ෂත්‍රිය, රාජවංශයට අයිති: belonging to the royal caste

ක්ෂමාකරගෙණ, සමාව ලබාගෙණ: having obtained pardon

ක්ෂයවී, ගෙවී, පසුවී: h. passed off

ක්ෂීර, කිරි: milk

ක්ෂීරමාතෘ, කිරිමව්: wet-nurse

ක්ෂීරාර්ණවය, කිරිමුහුද: sea of milk

ක්ෂේත්‍ර, කෙත්: field

ක්ෂේපණයකළ, ගෙවූ, දැමූ: spent (as time), put, thrown

කටක, වළල්ල, බඳපටිය: bracelet, girdle

කටාක්ෂනිරීක්ෂණ, ඇස්කොණින් බැලීම: side long look

කටිය, ඉඟටිය: loin

කටුක, කටදත, රෞද්‍ර, අමිහිරි: pungent, hot, disagreeable, unpleasant

කණ්ඨ, උගුර: throat

කණවැන්දුම, දීගනොගොසින් ඉඳීම, කසාදනොබැඳ ඉඳීම: unmarried state, celebacy (දැන් බොහෝසෙ යෙදෙන අර්ථය නම් 'මළ ස්වාමිපුරුෂයා ඇතිරීම' යනුයි: this word now generally means 'widowhood') [said

කථනයකරණ, කියන: who-says, which-is

කථාප්‍රවෘත්තිය, කී කරුණු: what was said

කදලි, කෙසෙල්: plantain

කණ්ඩෝපැණියා, කණාමැදිරියා: firefly

කඳු, සමූහය, රාශිය, පර්වතය: multitude, group, hill, mountain

කන්‍යා, විවාහනූන ස්ත්‍රී, දස අවුරුදු ගෑණි: virgin, girl of ten years old

කනක, රත්රන්: gold

කනස්සල්ල, කනගාටුව: sorrow, distress

කපට, කවටකම්කරණ, ප්‍රයෝගදන්නා: jesting, trickish [barber

කපුවා, ඉසරැවුළු කපන්නා, පණික්කියා:

කපෝල, කම්මුල: cheek

කපෝලස්ථලය, කම්මුලට අයිති කොටස, කම්මුල: part appertaining to the cheek, cheek

කම්, කාමය, ඇල්ම, ක්‍රියාව: lust, attachment, action

කම්කටුල, වදය, තද දඬුවම: persecution, severe punishment

කම්පාකරවා, සොලවා: h. caused to move or shake

කම්පාවෙමින්, වෙවුලමින්, සෙලවෙමින්: trembling. moving, shaking

කම්මිත්ත, වැඩකාරි: maid-servant

කමනීය, සිත්අලවන, ප්‍රිය දැකුම් ඇති: lovely, charming, beautiful

කමල, නෙළුම්මල්: lotus flower

කමින්, කර්මාන්තයෙන්, වැඩෙන්: from or by means of work or workmanship

කර්කශ, රෞද්‍ර, මෘදුනැති: rough, hard, not soft

කර්ණ, කන්: ear [to the ear

කර්ණරසායන, කණ සතුටුකරණ: pleasing

කර්ණිකාව, පියුම්බටුව, කෙමිය: pericarp of a lotus [to be done

කර්තව්‍යනූවූ, කිරීමට යුතුනැති: improper

කාර්ය, ක්‍රියාව: action

කර්මාන්තය, වැඩ: work

කර්මාන්තකරත්නී, (කම්මිත්ත, බ. ව.)

කාර්ෂාපණ, කහවණු, ඔලිඳ ඇට 40 ක නොහොත් රත්රන් පවුමෙන් හතෙන් පස් පංගුවක් පමණ බර රන් කාසියක්: a gold coin of the weight of 40 olinda (*Abrus precatorius*) seeds or about five sevenths of a sovereign

Digitized by Google

කරග්‍රීව, ශරීරයේ කරින් ඉහළකොටස, ඉස: part above the neck, head

කරබාගැනීම, කර පාතවනැමීම, කැරහාවය: bending the neck, stooping, hard-heartedness, roughness

කරා, වෙතට, ලඟට: to proximity (= to)

කරේණුකා, ගැහැනුව, ඇතින්නී: she elephant

කල්, ස්ත්‍රී, ගැණි, කාලය: woman, time

කල්ප, ඉතා දීර්ඝ කාලයක්, මේ ලෝකය විනාශවීමේ සිට නැවත හැදී විනාශවීම දක්වා ගතවෙන කාලය, බ්‍රහ්ම ලෝකයේ දවසක දිග ප්‍රමාණය හෙවත් යුග දාහක් (එනම් මනුෂ්‍ය ගණනින් අවුරුදු 4,320,000,000): a very long period of time, duration of the world, length of a day in Brahma world, which is equal to 1,000 yugas or 4,320,000,000 years of mortals

කල්පලතා, දිව්‍ය ලෝකයේ කපක් මුලුල්ලෙහි නොනැසී පවතිමින් සිතූ පැතූ දේ දෙන වැලක්: a creeper in heaven which lasts a *Kalpa* and grants all desires

කල්බඳුන්, ස්ත්‍රීන්: women

කල්‍යාණ, වාසනාවන්ත, සිත් අලවන, යහපත්: blessed, fortunate, lovely, good

කල්‍යාණසහිත, වාසනාවඇති, භාග්‍යවඇති, සැපත් සම්පත්වඇති: h. good fortune or luck, good [lily

කල්හාර, සුදුමානෙලුම්වර්ගයක්: white water-

කලකිරී, එපාවී, උකටලීව: being disgusted or disheartened

කලඞ්ක, කැලල, දෝෂය: spot, stain, fault

කලණ, (කල්‍යාණ, බ. ව.)

කලඹ, වැසිවලාව: rainy cloud

කලඹ, මොනරාගේ පෙදය, මිටිය: peacock's tail, bundle. (කලබ, බ. ව.)

කලවිට, ගොයම් පාගන කමත: threshing-floor

කලස්, කළගෙඩි: water-pot

කලාපය, (කලඹ, බ. ව.)

කලාව, සඳමඬලේ දහසයෙන්කොටස (රාශියක තිහෙන්පංගුවෙන් හැටෙන් පංගුවෙහි ද වැඩේ): a digit or one 16th part of the moon (used also for 60th part of one 30th part of a zodiacal sign)

කලුණ, යහපත් හෙවත් වාසනාවන්ත ස්ත්‍රී: lovely or fortunate woman

කවිඩා, කපුටා: crow

කවර, කොයි, මොන: what ?

කවස, යුධ ඇඳුම, සන්නාහය: armour, coat of mail

කවීන්ද්‍රයා, ප්‍රධාන නොහොත් උතුම් කාව්‍ය කාරයා: chief or great poet

කසුන්, (කාඤ්චන, බ. ව.)

කසල, කුණු: dirt, rubbish

කහවණු, (කාර්ෂාපණ, බ. ව.)

කාඤ්චන, රන්රන්: gold

කාණ්ඩය, කොටස, ඊය: part, arrow

කාණ්ඩාභිලක්ෂිත, ඊයෙන්සැරසුන: armed with arrows [some woman

කාන්තාව, ලක්ෂණඇතිස්ත්‍රී: lovely or hand-

කාන්තිය, ලක්ෂණ, එළිය, බැබලීම: beauty, lustre

කාම, ඇල්ම, ආශාව, රූපශබ්ද ගන්ධාදිය විඳීමට ඇති ආශාව: attachment, love, wish, lust

කාය, ශරීරය: body

කාරබන්ධනයකොට, සරණපාවා, කසාද බැඳ: h. married, h. united in matrimony

කාලක්‍රියා කළ, මළ, මැරුණ: dead, disceased

කාලවර්ණ, කළුපාට: black or dark colour

කාලාතික්‍රමණයකරණ, කල් අරින හෙවත් පසුකරණ: passing time

කාලින්දී, යමුනා නම් (ගඞ්ගා නම් ගඟේ) අත්තක්: the river Yamuna

කාව්‍ය, කවිපොත, කවි: poem, poetry

කාව්‍යකෙළේය, කවිකෙළේය, කවිපොත සැදුවේය: he composed the poem

Digitized by Google

කාශී, ඉන්දියාවේ බරණැස් නුවර : Benares

කැඩපත මුහුණ බලන කණ්ණාඩිය : mirror

කැත, හාරා : h. dug

කැතහිල්ලු, හිවල්ලු, නරි : jackals

කැලම, ඒකාන්තයෙන්ම, සත්‍යකටම : certainly, surely

කැලිකසල, කුණු : dirt, rubbish

කැසපට, අමුඩය : dressed cloth passed between the two legs and tucked up at the back like a truss

කිකිණි, (කිංකිණිකා, බ. v.) [bells

කිංකිණි, කුඩා මිණිගෙඩි : small tinkling

කිංකිණිකා, කුඩා මිණිගෙඩිවලින් යුත් : h. small tinkling bells

කිමෙක්ද, මොකද : what ?

කිලකුවැල, අලකාවලිය, ස්ත්‍රීන්ගේ නලලෙල හි වකුටුකොට හරිනස්සනලද කෙස්රොද : curl formed on the forehead of women

කිරණ, රශ්මිය : ray or beam of light

කිරීට, ඔටුන්න : diadem, crown

කීර්තිය, යශස, ප්‍රසිද්ධය : glory, fame

කීවා, කීදේ : what was said

කුක්ෂිය, බඩ, ඇතුළ : womb, belly, the inside or interior, interior of anything

කුකුස්, ශඞ්කා, අනුමාන : doubt

කුංකුම, කොකුම් නම්වූ සුවඳ ද්‍රව්‍යයක් : saffron (*Crocus Sativus*)

කුකුහලවෙමින්, සැක නොහොත් ආශාව ඇතිවෙමින් : being in doubt or eagerness

කුදුබව, කුදුස්වභාව, කුදුනම : hump on the back

කුඩ්මල, මල් කැකුළු, පිපිනෙණඑන මොට්ටු : flower bud, opening bud

කුන්ත, අනිත ආයුධ වර්ගයක්, හෙල්ල : lance, spear [jesmine

කුන්ද, වැකොඳ, සමන්මල් : a kind of

කුබ්ජ, කුදු : hump-backed

කුම්භ, කළ, ඇතාගේ නලලේ කුම්භාකාර කොටස : water-jar, frontal-globe on the forehead of an elephant

කුම්භකාරයා, බඩහැලයා : potter

කුම්භස්ථල, ඇතාගේ කුම්භය තිබෙන ස්ථානය : place where the elephant's *Kumbha* is

කුමුදු, සුදු නෙළුම්, සුදු මානෙල් : white water lily [koo

කුරවික, කොවුලා : Indian or black cuc-

කුල්මත්, ප්‍රීතිමදය, මහත් සතුට : state of being elated with joy, ecstasy

කුලඹ, (කුලාඞ්ගනාව, බ. v.)

කුලාඞ්ගනාව, උතුම් කුලයේ ස්ත්‍රී : respectable or high-born woman

කුලාම්බිකාව, (කුලාඞ්ගනාව, බ. v.)

කුලපර්වත, මහ මෙරුවට පිහිටා තිබෙන පර්වත හෙවත් ලොකුකඳු : mountains which surround the great rock Mahameru

කුලපුත්‍රයා, උතුම් කුලයෙහි උපන් තැනැත්තා : high-born person, nobly-born youth

කුවලය, දිය නිල්මානෙල් : blue water lily (කුවල, කියාද යෙදේ : the form කුවල is also used) [*cynosturoides*)

කුශතෘණ, කුසතණ : a kind of grass (*Poa*

කුශාවතී, }
කුසාවතී, } ඉන්දියාවේ දකුණු කොසොල් රට අගනුවර (රාම රජගේ පුත් කුශ කුමාරයා විසින් තනනලද නුවර බැවින් ඊට කුශාවතී යයි නම විය යනු ඉන්දියාවේ පවතින මතයකි) : capital of Dakshina-Kosala situated in the defiles of Vindhya and is supposed to be the same as Ramnagar in Bundelkhand (According to the Hindu notion, Kusawati was so called after its founder Kusa, elder son of Rama.)

කුසුම, මල් : flower

කුසුමෝපශෝභිත, මලින් අලඞ්කාරකරණලද : adorned with flowers

Digitized by Google

කූට, කන්දේමුදුන : summit or peak of a mountain

කූපතීර්ථ, ලින්තොට, ළිඳලඟ නෑහැම් ආදිය කරණ ස්ථානය: place near wells used for bathing, etc.

කෘශ, කුඩා, සීන්, දුර්වල : small, little, lean, feeble

කෘතයුගය, අවුරුදු 1,728,000 ඇති පළමුවෙනි යුගය : first of the four Yugas or ages of the world extending over 1,728,000 years

කෘෂ්ණ, කලු : black

කෙස්වැටිය, කොණ්ඩය, කේශකලාපය : mass of hair (on the head)

කෙළිදෙළ, (ක්‍රීඩාධුරය, බ. ව.)

කෙළෙඹියා, බොහෝ වස්තු ඇත්තා, ධනවතා : rich man

කේකානාදය, මොනරහඬ : cry of a peacock

කේතුව, කොඩිය : flag, banner

කේයූර, අතේ වැලමිටට ඉහළින් දමන වළලු වර්ගයක් : a bracelet worn on the upper arm, an armlet

කේශකලාපය, (කෙස්වැටිය, බ. ව.)

කේශර, (සිංහයාගේවැනි) බෙල්ලේ ලොම් වැටිය, සිංහ වර්ගයක් : mane (as of the lion), a species of lions

කෛලාසපර්වත, හිමාලපර්වතයේ ශිව කුවේර යන දෙව්වරුන්ගේ විමාන පිහිටි කන්ද : a peak of the Himalayas having the residences of Siva and Kuvera

කෝක්නාවා, වෘකයා (එනම් ඉතා රෞද්‍ර සතෙක්) : wolf

කොකනදවෙණ, කොකාගේ නාදයට සමාන නාදඇති වීණාවර්ගයක් : a lute having the shape and voice of the crane

කොට්ඨාසය, කොටස, පංගුව : part, portion

කොන්තය, (කුන්තය, බ. ව.)

කපොලතල, කම්මුල : cheek

කොමල, මෘදු, සෞම්‍ය, සතුටුඋපදවන : tender, pleasing

කොමුපිළි, හණ පට්ටාවලින් නොහොත් කෙඳිවලින් කළ රෙදි, පටරෙදි වර්ගයක් : linen cloth, wove silk

කොලොම්බුව, මස්තබා කැපීමට පාවිච්චිකරණ කොටය : piece of wood on which meat is cut

කොල, බල, අඩෝ : you fellow ! (derisive or disrespectful term of address)

කොසොල්, (කෝශල, බ. ව.)

කෝකිල, කොවුල් නම පක්ෂියා : Indian (or black) cuckoo

කෝටි, සියක් ලක්ෂය, 10,000,000 : ten millions, a crore

කෝදණ්ඩ, දුන්න : bow

කෝමල, (කොමල, බ. ව.)

කෝශල, ඉන්දියාවේ සරයු හෙවත් ගොග්‍රා නම් ගඟ අසල පිහිටි පලාතක් (මෙකල බේරාර් හෙවත් ගොන්වාන කියන පලාත යයි කල්පනාකාර තිබේ) : a kingdom situated along the banks of the Sarayu or Gogra (It is indentified with the modern province of Berar or Gondwana.)

කෞමුද, (කුමුදු, බ. ව.)

කෞශල්‍ය, දක්ෂ; skilful

කෞශිකයා, ඉන්ද්‍රයා : Indra

ඛ.

ඛඩ්ග, කඩු : sword

ඛඩ්ගපත්‍ර, කඩුතලය, කඩුව : blade of the sword, sword

ඛණ්ඩය, කොටස, කෑල්ල : part, piece

ඛද්‍යෝතයා, කණාමැදිරියා : firefly

ඛලමණ්ඩලය, කමත තිබෙන ස්ථානය, කමත : place occupied by the threshing-floor, threshing-floor

ඛාද්‍ය, කනදේ, කැවිලි : eatable, sweetmeat

ඛාජ, කද : pingo (a structure for carrying loads)

ඛුජ්ජුත්තරා, බුදුන් ජීවමානකාලයේ සිටිය බණෙහි ඉතා දක්ෂ මෙහෙණින්නක් :

Digitized by Google

a female robed devotee who lived in the time of Buddha and who was very clever in preaching his doctrines

ඛුර, (සතුන්ගේ පයේ) කුර: hoof

ඛේදය, දුක; අහෝ: sorrow; alas!

ඛේල, කෙල: spittle

ග.

ග්‍රහණය, ගැණීම: taking, seizing

ග්‍රහණනිසිභණ, ගැණීම කරණකොටගෙණ භාහසඋපදවන: causing great fear on account of taking or seizing

ග්‍රාම, ගම: village

ග්‍රීවය, බෙල්ල: neck [Ganges or river

ගඞ්ගානුකාර, ගඞ්ගාවටසමාන: like the

ගජ, ඇත්, හස්ති: elephant

ගජේන්ද්‍ර, ප්‍රධාන නොහොත් උතුම් ඇතා: chief or noble elephant

ගණ, සමූහය: multitude, group

ගණදෙවියා, ශිවාගේ සහ පාර්වතියගේ පුතුවූ නුවණට අධිපතිවූ දෙවියා: son of *Siva* and *Parvati* and god of wisdom

ගණාකීර්ණ, සමූහයෙන් ගැවසීගත්: full of or overspread with multitude, crowded with [ments-like multitude

ගණාභරණ, සමූහ නමැති ආභරණ: orna-

ගණිත, ගණන්ශාස්ත්‍රය: arithmetic, mathematics

ගත්, ශරීරය; ගත්තාවූ: body; taken

ගඳ, සුවඳ, යහපත් හෝ අයහපත් ගන්ධය: good smell, smell

ගඳකිළිය, සුවඳපතුරුවන ගෙය (බුදුන් වැඩ උන් ගෙයට නම්): 'the scent-house' (applied to the room in any temple occupied by Buddha)

ගඳගජ, සුවඳවිහිදුවන උතුම් ඇතා: 'the scent-elephant,' elephant of the best kind

ගන්ධකුටිය, (ගඳකිළිය, බ. ව.)

ගන්ධමාදන, මහමෙරට නැගෙනහිරින් පිහිටි සුවඳවිහිදුවන වනාන්තර ඇති කන්දක්: a mountain to the east of Mahamera, renowned for its fragrant forests

ගන්ධර්ව, ගායනාකරන්නා, ගායනාශාස්ත්‍රය දන්නා, දිව්‍ය ගායනාකාරයා: musician, singer, class of demi-gods regarded as the singers or musicians of gods (ගාන්ධර්ව, බ. ව.)

ගන්ධහස්ති, (ගඳගජ, බ. ව)

ගන, වළාකුළ, ඝනකම: cloud, thickness

ගබ, (ගර්භ, බ. ව.)

ගබ,
ගබඩාව, } ඇතුළ්ගෙය, කාමරය: room

ගබ්පරිහර, බඩේ පිළිසිඳගත් දරුවාගේ ආරක්ෂාව පිණිස කරණ පිළිවෙතක්: a ceremony performed for the protection of the child conceived in the womb

ගම්භීර, ගැඹුරු: deep, profound

ගම්භීරෝදර, පාත් උස්, ගැඹුරු මහත්: low and high or great

ගමනයකළ, ගිය: who or which went

ගර්ජනා, ගෙරවීම, ගොරවන හඬ: roaring, thunder

ගර්ජනානුකාර, (අහස) ගෙරවීම්සමාන: like thunder or roaring

ගර්භ, කුසය, ඇතුළ: womb, interior of anything (ගබඩාව, බ. ව.)

ගර්භප්‍රතිහාරය, (ගබ්පෙළහර, බ. ව.)

ගර්වෙච්ඡිත, උඩඟුකමින් වැඩුනාවූ: elated with pride

ගරහන්නේය, නින්දාකරන්නේය: scorns

ගරුවූ, උතුම්, ගෞරවනීයවූ: great, noble

ගලවන, වෙන්කරණ, පහකරණ: removing, taking off [h. united or connected

ගළපා, එකතුකොට, සංයෝජනයකොට:

ගාන්ධර්ව, (ගන්ධර්ව, බ. ව.)

ගැඹර, (ගම්භීර, බ. ව.)

ගිරි, පර්වතය, කන්ද: mountain, hill

Digitized by Google

ගිවිස්වූ, කැමතිකරවූ, එකඟකරවූ: h. made to consent, h. convinced

ගීතඝෝෂ, ගී ශබ්දය: sound of singing or music

ගුරු, දෙමව්පියෝ: parents

ගුහා, ලෙණ: cave

ගෘහ, ගේ: house

ගෘහවාසය, ගිහිව ඉඳීම, ගිහිගෙයි ඉඳීම: living a secular life, being a householder

ගෘහෝද්‍යාන, ගෙයලඟ පිහිටි උයන, ගෙවල් සහ උයන්: pleasure garden or park attached to a residence, houses and parks

ගෙවුයන්, (ගෘහෝද්‍යාන, බ. ව.)

ගෝපකයා, බලන්නා, ආරක්ෂාකරන්නා: guardian, protector

ඝ.

ඝ්‍රාණය, නාසය: nose

ඝටය, කළය: water-pot [great; cloud

ඝන, තද, මහත්; වලාකුළ: hard, thick,

ඝර්මය, ග්‍රීෂ්මය: heat

ඝට්ටනය, වැදීම, තට්ටුවීම: friction, striking against [butter

ඝෘත, ගිතෙල්, එළගිතෙල්: ghee, clarified

ඝෝරකොට, භයඋපදවනලෙස, තදලෙස: frightfully, violently

ඝෝෂා, ශබ්දය, නාදය: noise, tumult

ච.

චක්‍ර, රෝදය, සමූහය: wheel, multitude

චක්‍රවාක, සක්වාලිහිණි, එනම් ඇල්වල හැසිරෙණ පක්ෂිවර්ගයක්: ruddy goose

චක්‍රවාට, සක්වල, මුළුලෝකය: universe

චක්‍රවාටපර්වතය, පොළොව වටේ පිහිටාතිබෙන ගල්වලල්ල: circular range of rocks surrounding the universe

චඞ්ක්‍රමණ, සක්මන්පල: place for walking

චඤ්චලය, චඤ්චලගතිය, නොසන්සුන් භාව: unsteadiness, rudeness

චඤ්චලවෙමින්, කම්පාවෙමින්, සෙලවෙමින්: trembling, being agitated

චඤ්චුව, තුඩ: beak, bill

චණ්ඩ, නපුරු, කෲර, තද: fierce, violent

චණ්ඩාල, ජාතිවලින් ඉතා හීන ජාතිය, ශූද්‍ර පුරුෂයා බ්‍රාහ්මණ ස්ත්‍රී යන දෙදෙනාගෙන් පැවතෙන වර්ගය: lowest and most despised of the castes originating from a S*u*dra father and a Br*a*hma*n*a mother

චතුපඤ්චාශත්, පනස්හතර: fifty-four

චතුපාරිශුද්ධිශීලය, සතරසංවරශීලය (එනම්: ප්‍රාතිමෝක්ෂසංවරශීලය හෙවත් විනය එකඟව ශරීරයහාවචනයපැවැත්වීම, ඉන්ද්‍රියසංවරශීලය හෙවත් ධර්මයට එකඟව ඉන්ද්‍රිය මැඩපැවැත්වීම, ආජීවපාරිශුද්ධිශීලය හෙවත් නිවැරදි ජීවිකාවකිරීම, ප්‍රත්‍යසන්නිශ්‍රිත ශීලය හෙවත් ප්‍රයෝජනය න්න සිවුපසය සැරසීම්ආදියපිණිස නොව විශ්‍රවැස්මආදී ඒ ඒ ප්‍රයෝජන පමණක් ලකා සේවනයකිරීම): four rules of conduct to be observed by a Buddhist monk to curb his worldly passions (viz. conforming the body and word with the *Vinaya* or discipline prescribed for Buddhist monks, keeping the five senses under proper restraint, living a just and simple life, making a proper use of the five *pratyayas* or requesites of the monks)

චතුර්ථ, සතරවෙනි: fourth

චතුර්වේදය, වේද සතර (එනම්: ඍක්, යජුස්, සාම, අථර්ව): the four vedas (viz. *R*ik, Yajus, S*a*ma, and Atharwa)

චතුරඞ්ගිනීසේනාව, අඞ්ග හෙවත් කොටස් සතරකින්යුත් සේනාව (අඞ්ගසතරනම්:— හස්තිසේනාව හෙවත් ඇතුන්පිට ඉඳ යුද්ධකරණ සේනාව, අශ්වසේනාව හෙවත් අසුන්පිට ඉඳ යුද්ධකරණ සේනාව, රථසේනාව හෙවත් රථවල සිට යුද්ධකරණ සේනාව, පත්තිසේනාව හෙවත් පයින්ගෙන ස් (බිමසිට) යුද්ධකරණ සේනාව): a four

fold army (consisting of elephant riders, chariot riders, cavalry, and infantry)

චතුරාර්‍ය්‍යසත්‍යය, බුදුන්වදාළ උතුම් සත්‍ය හෙවත් සැබෑකාරණා හතර (ඒ හතරනම්: දුඃඛසත්‍යය හෙවත් සියලු සංස්කාර දුකබව්; සමුදයසත්‍යය හෙවත් ඒ දුක් ඉපදීමේ හේතුව; නිරෝධසත්‍යය හෙවත් දුක නැතිකළවිට ලැබෙන සැප, එනම් නිර්වාණය; මාර්ගසත්‍යය හෙවත් ඒ දුක නැතිකරණ අන්දම): four great truths proclaimed by Buddha (viz. existence is misery; cause of misery; Nirv*ana* or felicity secured by the destruction of that misery; and means of obtaining that destruction)

චතුරෝපාය, රජුන් විසින් සතුරන් ජයගැනීමට යොදන උපායහතර (එනම්: භේදය හෙවත් සමගිය කඩකිරීම, දණ්ඩය හෙවත් දඬුවම්කිරීම, සාමය හෙවත් සංසිඳවීම (සමාදානය), දානය හෙවත් දීම (අල්ලස්දීම්ආදිය): four means of success employed by kings against enemies: (viz. sowing dissension, punishment or open attack, conciliation or negotiation, gifts or bribary)

චතුෂ්පාද, } සිව්පා, පා හතරක්ඇති; පා හතරක්ඇති සත්තා: h. four legs; quadruped
චතුෂ්පද, }

චතුෂ්ෂෂ්ටි, හැටහතර: sixty-four

චතුෂ්ෂෂ්ටිශිල්ප, හැටහතරක් ශිල්ප, කලා නම් කුඩා ශිල්ප හැටහතර: 64 minor arts and sciences +

චතුස්, හතර: four

චතුස්සංග්‍රහවස්තු, අනුන්ට සංග්‍රහ කිරීමට තුබුවූ කාරණා හතර (ඒ හතරනම:—දානය හෙවත් දීම, ප්‍රියවචන කීම, අර්ථචර්‍ය්‍යා හෙවත් අනුන්ට ශුභසිද්ධිය පිණිස ක්‍රියාකිරීම, සමානාත්මතා හෙවත් අනුන්ට තමන් සමකොට ආදරයවීම): four means of propitiating or entertaining others (viz :—munificience, affability, promoting the prosperity of others, and loving others as ourselves)

චතුස්සත්‍යය, (චතුරාර්‍ය්‍යසත්‍යය, බ. ස.)

චන්දන, සඳුන්: sandal-wood

චන්ද්‍රිකාතල, හඳපාන වැටෙන්ට ගෙවල ඉහළ සාදන භූමිය හෙවත් තට්ටුව: story or floor on the top of a house to admit moonlight

චන්ද්‍රිකාව, බබලන හෙවත් ලක්ෂණ ස්ත්‍රී, උත්තමී: beautiful woman, noble woman

චපල, චංචලවෙන ස්වභාව ඇති, නොහික්මුණු: unsteady, fickle, rude

+ ඒ හැටහතරනම්: the names of the sixty-four are:—1 නෘත්‍ය, 2 ගීත, 3 වාද්‍ය, 4 නාට්‍ය, 5 ආලේඛ්‍ය, 6 විශේෂකච්ඡේද්‍ය, 7 තණ්ඩුලකුසුම බලිවිකාර, 8 පුෂ්පාස්තරණ, 9 දශනවසනාංගරාග, 10 මණිභූමිකාකර්ම, 11 ශයනරචන, 12 උදකවාද්‍ය, 13 උදකඝාත, 14 චිත්‍රාශ්චයෝගා, 15 මාල්‍යග්‍රථනවිකල්පා, 16 ශේඛරාපීඩයෝජන, 17 නේපථ්‍යයෝගා, 18 කර්ණපත්‍රභංගා, 19 ගන්ධයුක්ති, 20 භූෂණයෝජන, 21 ඉන්ද්‍රජාල, 22 කෞචුමාරයෝගා, 23 හස්තලාඝව, 24 විචිත්‍රශාකයූපභක්ෂ්‍ය විකාරක්‍රියා, 25 පානකරසරාගාසවයෝජන, 26 සූචිවානකර්ම, 27 වීණාඩමරුක සූත්‍රක්‍රීඩා, 28 ප්‍රහේලිකා, 29 ප්‍රතිමා, 30 දුර්වචනයෝගා, 31 පුස්තකවාචන, 32 නාටිකාඛ්‍යායිකාදර්ශන, 33 කාව්‍යසමස්‍යාපූරණ, 34 පට්ටිකාවේත්‍රවාණවිකල්පා, 35 තර්කුකර්මාණි, 36 තක්ෂණ, 37 වාස්තුවිද්‍යා, 38 රූප්‍යරත්නපරීක්ෂා, 39 ධාතුවාද, 40 මණිරාගඥාන, 41 ආකරඥාන, 42 වෘක්ෂායුර්වේදයෝගා, 43 මේෂකුක්කුටලාවකයුද්ධවිධි, 44 ශුකසාරිකාප්‍රලාපන, 45 උත්සාදන, 46 කේශමාර්ජනකෞශල, 47 අක්ෂරමුෂ්ටිකාකථන, 48 ම්ලේච්ඡිතකවිකල්පා, 49 දේශභාෂාඥාන, 50 පුෂ්පශකටිකානිමිත්තඥාන, 51 යන්ත්‍රමාතෘකා, 52 ධාරණමාතෘකා, 53 සම්පාට්‍ය, 54 මානසීකාව්‍යක්‍රියා, 55 [illegible], 56 ඡලිතකයෝගා, 57 අභිධානකෝශච්ඡන්දෝඥාන, 58 [illegible], 59 ද්‍යූතවිශේෂ, 60 ආකර්ෂක්‍රීඩා, 61 බාලක්‍රීඩනකානි, 62 වෛනයිකීනාංවිද්‍යානාංඥාන, 63 වෛජයිකීනාංවිද්‍යානාංඥාන, 64 වෛතාලිකීනාංවිද්‍යානාංඥාන.

Digitized by Google

චම්පක, සපු : a tree bearing yellow fragrant flowers (*michelia champaca*), its flower

චරණය, පය, පාදය : foot [ව: biography

චරිතය, ගුණමක්සම්බන්ධකථාව, ජීවිතකථා

චලනාකරමින්, සොලවමින් : shaking

චලිත, සෙලවුන : shaken, moved

චාටු, ප්‍රියවචන කියන : having pleasing or agreeable words

චාප, දුන්න : bow

චාමර, චමර නම් මුවන්ගේ වල්ගාවලින් සාදන පවන්ගහණ වර්ගයක් : a *chowrie* or bushy tail of the Chamara (*Bos Grunniens* used as a fly-flap or fan and reckoned as one of the insignia of royalty

චාරිත්‍රය, සිරිත : custom [beautiful

චාරු, සිත් අලවන, ලක්‍ෂණ : pleasing,

චිත්තය, සිත : mind

චිත්‍රකර්ම, සිතියම් : picture, painting

චිත්‍රකර්මෝජ්ජ්වලවූ, සිතියමින් මනාව දිලිසුනාවූ : shone brightly on account of the painting [who-thinks

චින්තනයකරණ, සිතන්නාවූ : thinking,

චින්තාමාණික්‍යය, සිතූ පැතූ දේ ගෙණදෙන මාණික්‍යක් : a gem which is said to yield what its possessor desires

චීවරය, සිවුර : robe (of Buddhist monk)

චුතවනු, පහවීම, මැරියාම : departure, dying

චුම්බනයකොට, ඉඹලා : h. kissed

චුල්ලනාටකාංගනාන්, සුළු හෙවත් පහළ පන්තියේ නටන ගෑණුන් : inferior dancing women

චූඩාමණි, ඉසේ පලඳින මාණික්‍ය, ඔටුන්නඅග මාණික්‍ය : a jewel worn on the top of the head, a gem on the top of a crown

ඡ.

ඡත්‍ර, කුඩය : umbrella

ඡදනය, පියැස්ස, පලේ : roof (of a house)

ඡවි, හම, සිවිය : skin

ඡාදනයකොට, වසා : h. covered

ඡේදනයකළ, කැපූ : cut

ජ.

ඥානය, නුවණ : organ of intelligence, intellect [sense, wise

ඥානාන්විත, නුවණ ඇති : having good

ජ්‍යෙෂ්ඨ, වැඩිමහළු, ප්‍රධාන : eldest, chief

ජ්වලවූ, දිලිසුනාවූ, බැබලූ : shone

ජ්වලිතකරවමින්, දවමින්, ගිනිපත්තුකරමින්, බබුළුවමින : burning, kindling, shining

ජගත්, ලෝකය : world

ජගත්‍රය, ලෝකත්‍රය (ඒනම් : කාමලෝකය හෙවත් පස්කම්සැප විඳින ලෝකඑකොළහ, එනම් සතරඅපාය, මනුෂ්‍යලෝකය, දිව්‍යලෝක හය; රූපලෝකය හෙවත් ඇස කණ සිත යන තුණින් අරමුණුලබන බ්‍රහ්මපාරිසජ්ජ ආදී බ්‍රහ්මලෝක දහසය; අරූපලෝකය හෙවත් ශරීරය නැතුව සිතින් පමණක් අරමුණුලබන ආකාසානඤ්චායතනආදී ලෝක සතර) : the three great worlds (viz. the world consisting of the four hells, world of men, and six heavens; the world of Brahmas, consisting of 16 divisions, where both mind and body exist; and the highest world of Brahmas consisting of 4 divisions, where only the mind exists)

ජගත් නායක, } ලෝකයට ප්‍රධානයා : chief
ජගද්නායක, } of the universe

ජගද්චක්ෂු, ලෝකයට ඇස : eye of the universe [universe

ජගද්ගුරුවූ, ලෝකයට ප්‍රධානවූ : chief of the

ජඝන, උකුල : hip and loins

ජඞ්ගමවූ, සෙලවෙන්නාවූ, කම්පාවෙන්නාවූ : moving

ජඞ්ඝා, කෙණ්ඩය : leg from the ankle to the knee, shank

ජන, මිනිස්සු : people

Digitized by Google

ජනිතවෙව, උපදුව: may (you) be born

ජබාදු, එනම් සුවඳවර්ගයක්: a kind of perfume

ජම්බුද්වීපය, දඹදිව, සතරමහ දිවයින්අතුරෙන් ලංකාව, ඉන්දියාව ආදී රටවල් ඇතුළත් දිවයින: one of the four large islands or continents of the world comprising Ceylon, India, etc.

ජර, ජරාව, දිරීම, මහළු වයස: decay, decripitude, old age

ජලය, වතුර: water

ජලරාක්ෂසයා, දියරකුසා, වතුර අරක්ගෙණ වසන්නාවූ අමනුෂ්‍යයා: water imp

ජාතවී, පුතුවී; ඉපදී: h. become son; h. been born

ජාතකවූ, උපන්නාවූ: born

ජානු, දන, දනහිස: knee

ජාම්බෝනද, දඹරත්රන්, ඉතාපිරිසිදු රත්රන් වර්ගයක්: a kind of very pure gold

ජාලා, දැල්: net

ජිව්හා, දිව: tongue [tongue

ජිහ්වාච්ඡෙදය, දිවකැපීම: cutting off the

ජීවග්‍රහයෙන්, පණ ඇතුව අල්ලාගැණීමෙන්, බෙල්ලෙන්අල්වාගැණීමෙන්: taking captive (without killing), catching by the neck

ජීවිතක්ෂයටපමුණුවා, මරා: h. killed [life

ජීවිතාන්තය, ජීවිතයේ කෙළවර: end of

ජේතවනාරාමය, ජේතනම් රාජකුමාරයාවිසින් සාදවා බුදුන්ට පූජාකළ එක් ප්‍රසිද්ධ විහාරයක්: a famous monastery built and presented to Buddha by a prince named Jeta

ඤ.

ඤාති, නෑ, බන්ධු: relation

ඨ.

ඨානන්තරය, තනතුර, වැඩේ: profession, post

ඣ.

ඣා, දහඩිය: perspiration

ත.

ත, කාලාතිපත්තියෙහි අසම්භාවනීය ක්‍රියා අගට යොදන ප්‍රත්‍යයක්, කල්හි යන අර්ථය ඇඟවීමපිණිස ක්‍රියා අගට යොදන අකුරක්: a suffix added to verbs to form the subjunctive mood denoting time when (අත, බ. *v.*)

ත්‍යාග, තෑග්ග, තෑගිවත්තකම, දීමටකැමතිකම: gift, liberality, generosity

ත්‍රයෝදශ, දහතුන්වෙනි: thirteenth

ත්‍රාසනව, තැතිගැණී, භයව: being alarmed, being frightened

ත්‍රි, තුණ: three

ත්‍රිදශය, ශක්‍රයාආදී දෙවිවරුන් තිස්තුන්දෙනා වසන දිව්‍යලෝකය: the heaven occupied by the thirty-three gods including *S*akra

ත්‍රිනේත්‍රකාන්තාව, ශිව දෙවියන්ගේ භාර්‍ය්‍යා වූ පාර්වතී: P*a*rvat*i*, wife of *S*iva

ත්‍රිපිටක, විනය, අභිධර්ම, සූත්‍ර යන පිටක හෙවත් බුද්ධධර්මයේ කොටස් තුණ: three divisions of Buddhist Scripture (viz. Vinaya or that which treats of discipline or moral training, Abhidharma or that which treats of metaphysics, and S*u*tra or that which treats of discourses or sermons of Buddha)

ත්‍රිමණ්ඩලය, දනදෙක හා පෙකණිය යන මඩවූ ස්ථාන තුණ: the three round places (viz. the two knees and navel) of the body

ත්‍රිමදනලිත, කන්දෙක, නාසය, කට, යන ස්ථාන තුණෙන් මදනාවූ ඕජස වැගුරුණු හෙවත් වැහුණු: exuding ichor from three places (viz. the two ears, the nose, and the mouth)

ත්‍රිවිද්‍යාව, පූර්වේ නිවාසානුස්මෘතිය ඥානය හෙවත් ඉහත උපන් ජාතිය දන්නා නුවණ, චුතූත්පාදඥානය හෙවත් සත්වයන්ගේ චුතිඋත්පත්ති දන්නා නුවණ, ආශ්‍රව

Digitized by Google

ක්ෂයකරඥානය හෙවත් කෙලෙසුන්නසන නුවණ යන ඥාන තුණ; ඍග්, යජුස්, සාම යන වේද තුණද කියවේ: three kinds of knowledge (viz. knowledge of events in previous birth, knowledge of the birth and death of beings, and knowledge of the means of destroying worldly passions); three vedas (viz. Rig, Yajus, and Sama)

ත්‍රිශක්තිය, තේජස, උත්සාහ, මන්ත්‍රණය (දුනම්තිකම්ගැණීමට එක්ව කථාකිරීම) යන බල තුණ: three kinds of power (viz. dignity, energy, and deliberation or consultation)

ත්‍රෛ, තුන්: three

ත්‍රෛලෝක්‍යාචාර්ය, තුන්ලොවට ගුරු: teacher of the three worlds (ජගත්‍රය, බ. ව.)

තටාක, } විල, පොකුණ: pond
තඩාග, }

තත්, ඒ; වීණාවේ ලනුව: that; string of a musical instrument

තත්වය, ඇතිහැටි, ආකාරය, ඇත්ත: true state or condition, truth

තත්වූ, හරියාකාර, සැබෑවූ: true

තත්සරනා, (වීණාවේ) ලනුහරිගස්සා: h. stringed, h. prepared the strings for play (of musical instruments)

තතු, (තත්වූ, බ. ව.)

තප්තව, තැවී, කනගාටුවෙන් මිරිකී: distressed, afflicted

තබා, තියා, ඇර, නොමරා ඉතිරිකොට: h. kept, h. left, h. spared (without killing)

තර්ජනයකළාය, තරවටුකළාය: threatened or cautioned

තර, මහත්: great, large

තරකොට, හයියෙන්, තදින්: violently, forcibly

තරඞ්ග, රැළ: wave

තරයේම, ඉතාතදින්, ඉතාස්ථිරලෙස: very firmly or emphatically

තරළා, බඩාලා: goldsmith

තරිඳු, හඳ: moon

තරුණාර්ක, තරුණ (බාල) රැස් ඇති ඉර, වඩා ඉහළට නොගිය ඉර: sun not high in the sky

තල්වැට, (තාලවෘන්ත, බ. ව.)

තලත්, (බලහඳුයා, බ. ව.)

තලය, මතුපිට, යටිපතුල: surface, sole (of the foot)

තව්තිසාභවනය, (ත්‍රිදශය, බ. ව.)

තව, තපස: asceticism

තාක්, තුරු, තෙක්: till, up to

තාඩඞ්ක, කණේපලඳින ආභරණයක්, තෝඩු: large ear-ring

තාප, (සිත) තැවීම, කනගාටුව: sorrow, distress

තාපනය, (තාප, බ. ව.)

තාම්බූල, බුලත්: betel

තාමරස, රතුනෙළුම්: red lotus

තාල, තල්ගහ: palmyra tree

තාලඵලය, තල්ගෙඩිය: palmyra nut

තාලවෘන්ත, තල් ගොබෙන් කළ පවන්පත: a fan made of the tender leaf of palmyra

තැත්කරණ, උත්සාහකරණ: trying

තිත්, (තීර්ථක, බ. ව.)

තිතික්ෂණය, ඉවසීම: forbearance, patience

තිතික්ෂාකිරීම, ඉවසීම: having patience, forbearing

තිදස, (ත්‍රිදශය, බ. ව.)

තිනෙත්, ඊශ්වර හෙවත් ශිවදෙවියෝ: god Siva

තිබූ, ඉතුරුව තිබුන: remained, left

තිලකය, හින්දුආගම්කාර කුලවත් අය විසින් නලලේ සඳුන් කොකුම් ශුඩ අළු මිශ්‍රකොට තනාගත් ද්‍රව්‍යයෙන් කළ බින්දුව හෝ ලපය: a mark made on the foreheads of respectable classes of Hindus with a substance composed of sandal wood, saffron and sacred ashes

තිලෝගුරු (ත්‍රෛලෝක්‍යාචාර්ය, බ. ව.)

තීක්ෂණ, තියුණු, සිහුම්: sharp, keen

Digitized by Google

තීර්ථ, තොට, වතුර තිබෙන ස්ථානය: place of water

තීර්ථක, බුද්ධාගමට අයිතිනැති බොරු තාපස කොට්ඨාසයක්: a class of ascetics not appertaining to Buddhism

තීරභූමිය, ඉවුර, ඉවුර ළඟ බිම: bank, ground near the bank or shore

තීරය, තෙර, ඉවුර: bank, shore

තුඞ්, (තුඞ්ග, බ. v.)

තුඞ්ග, උස්: high, tall

තනු, ශරීරය; තුනී: body; thin

තුමූ, තමා, තමන්; ප්‍රථමා විභක්තිය ආශ්‍රය කරණ තෙම, තෙමේ, තොමෝ යන පද වල බහුවචනය: self or selves; plural form of the prepositions තෙම, තෙමේ, තොමෝ indicating the nominative case

තුරඟ, (තුරඞ්ග, බ. v.)

තුරඞ්ග, අශ්ව: horse

තුරු, වෘක්ෂය, ගස: tree [tance

තුවරලා, සුවඳවර්ගයක්: a fragrant subs-

තුෂ්ටවූ, සතුටුවූ: pleased, delighted

තුෂ්ටිජනක, සතුටදීම: affording pleasure

තූර්ය, බෙර, වීණා, කයිතාලම් ආදී ශබ්දප තුරුවන දේ: musical instruments (drums, flutes, cymbals, etc.)

තෘණ, තණකොළ: grass

තෘණරූපය, පඹයා: scare-crow

තෘතීය, තුන්වෙනි: third [greed

තෘෂ්ණා, ආශාව, ලෝභය: strong desire,

තෙ, තුන: three

තෙපුල, වචනය, කථාව: word, talk

තෙමඩුල්ල, (ත්‍රිමණ්ඩල, බ. v.)

තෙම, තෙමේ, } පෙරවිබත සහ පුරුෂලිඞ්ගය ආශ්‍රයකරණ නිපාතයක්: a preposition denoting the nominative case, affixed to words in the masculine gender (තුමූ, බ. v.)

තෙරුවන්, (රත්නත්‍රය, බ. v.)

තෙසක්, (ත්‍රිශක්තිය, බ. v.)

තෙසු, ඉතුරු, අනිත්: remaining, other

තේජස්, තේජඃ, } පරාක්‍රමය, බලය, මහත්තම, එලිය: prowess, dignity, greatness, lustre

තේජස, (තේජස්, බ. v.)

තේමනය, තෙමීම, තෙමීමට (හෙවත් සායම් කිරීමට) ගන්න වතුර: wetting, water used for wetting or colouring

තොම, තොමෝ, } තෙම, තෙමේ, යන නිපාතවල ස්ත්‍රීලිඞ්ගය කියන පද: prepositions standing for the feminine forms of තෙම, තෙමේ (තුමූ, බ. v.)

තොයිනා, ජලයෙන්, වතුරෙන්: with or by means of water

තොර, පිටවූකරුණ, ආරංචිය: what was out, news (තොරතුරු, බ. v.)

තොරතුරු, විශේෂ විභාග, සම්පූර්ණ කරුණු: full particulars, ins and outs

තෝමරය, යකඩඋල හෝ පොල්ල: iron club or spike, javelin

තෝරණ, තොරණ, ගෙඩිගෙය: a temporary ornamental arch

තෝෂය, සතුට, ප්‍රීතිය: joy, pleasure

ථ.

ථල, ගොඩ: land, *terra firma* (as opposed to ජල, water)

ද

ද්වය, දෙක: two

ද්වාත්‍රිංශත්, තිස්දෙක: thirty-two

ද්වාත්‍රිංශත්කථා, බුදුන් විසින් මහණුන්නාන්සේලාට සහ අටසිල් දසසිල් සමාදන්වූ අයවලුන්ට කෙලෙස්වැඩීමට හේතුවනපරිද්දෙන් කිරීමට තහනම්කල කථා තිස්දෙක: the thirty-two discourses or conversations prohibited by Buddha for monks and lay-devotees to be en-

Digitized by Google

gaged in so as to promote worldly passions ×

ද්වාදශ, දොළොස්වෙනි : twelfth

ද්වාර, දොර : door

ද්වි, දෙක : two [double

ද්විගුණව, දෙකක්වී : h. become two or

ද්විතීය, දෙවෙනි : second

ද්විතීයව, දෙවෙනිව : secondly

ද්වීප, දිවයින : island

දග්ධ, දැවාවූ : burnt, scalded

දත්, දැනගත් : known

දද, (ධ්වජ, බ. ව.)

දන්ත, දත්, දළ : tooth, tusk

දනුමැති, ඥානවන්ත : wise

දඹදිව, (ජම්බුද්වීප, බ. ව.)

දඹු, දඹුකඩ : burnt rice, etc. in the bottom of a cooking pan

දම්, (ධර්මය, දාමය, බ. ව.)

දර්පය, ආඩම්බරය : pride

දර්ශනය, දැකීම : seeing

දර්ශනයකොට, දැක : h. seen

දරුගර්භය, දරුවෙකුගේ පිළිසිඳගැනීම: conception (of a child in the womb)

දළකඩමිට, ඇත්දත්මිට : ivory handle

දවසැර, දවස්යවා, කල්යවා : h. passed days or time

දශදිශා, දිශා හෙවත් දික් දහය (එනම්:— උතුර, ඉසාන, නැගෙණහිර, ගිනිකොණ, දකුණ, නිරිත, බස්නාහිර, වයඹ, අහසදිශාව, පොළොවදිශාව): the ten directions of the world (viz. north, north-east, east, south-east, south, south-west, west, north-west, nadir, zenith)

දශම, දසවෙනි : tenth

දශපාරමිතාධර්ම, දශපාරමිධර්ම, } බුදුබව ලැබීමපිණිසපිරිය යුතු හෙවත් පුරුදුපුහුණුකළයුතු කාරණා දහය (එනම්: දාන, ශීල, නෛෂ්ක්‍රම්‍ය හෙවත් තාපස (මහණවීම), ප්‍රඥා, වීර්‍ය්‍ය, ක්ෂාන්ති හෙවත් ඉවසීම,

---

රථ, වාහණය, කරත්තය : carriage, vehicle

රථචක්‍රය, කරත්ත රෝදය : wheel of a carriage

රථාලංකාරයෙන්, රථවල ලක්ෂණින් හෝ සැරසිලිවලින් : by the beauty or decorations of the carriages

රදන්නාවූ, (රඤ්ජමානවූ, බ. ව.)

රදා, නැවතී : h. stayed

රම්භා, කෙසෙල් : plantain

රම්‍යවූ, හිතසතුටුකරණ, ලක්ෂණ : pleasing, lovely, beautiful [lovely, charming

රමණීය, සිත් අලවන හෝ සතුටුකරණ :

රළ, සමූහය, (මුදු ආදියෙහි) රැළ : multitude, wave

රශ්මිය, රැස්, එළිය : ray of light, light

රශනා, ස්ත්‍රීන්ගේ ඉගටියේ බඳින හවඩියක් : a girdle or zone worn by women

රස, වතුර, දියර, රශ්මිය, (පැණිරස ආදී) රස : water, liquid, ray of light, taste

රසඥායු, රස නහර, රස ඕජස දරණ නහර : olfactory nerve

රසායනය, අමෘතය, ජරාව වලක්වා ජීවිතය අදීකරණ බෙහෙතක් : an elixir of life, a medicine supposed to prevent old age and prolong life

රසුදැල්, මිණිගෙඩි බැන්දවූ දැල් : net with tinkling little bells

රහස් අඞ්ග, රහස් හෙවත් නොදක්වන ශරීරයේ කොටස, ලිංගුව : private part of the body, sex [of, without

රහිත, හැරදමනලද, නැති : left, deprived

රාඛඩම, රාබොනභාජනය, රාවිත : cup or vessel to drink toddy out of

රාක්ෂසයා, රකුසා, යක්ෂ කොට්ඨාසයක් : a class of demons, goblin

රාග, පාට, වර්ණ, ඇල්ම, කාමතෘෂ්ණාව : colour, attachment, love, sexual feeling

රාජදුහිතෘ, රජ්ජුරුවන්ගේ දූ, කුමාරිකාව : king's daughter, princess

රාජධානිය, රජු වසන ප්‍රධාන නුවර : chief town containing the king's residence, metropolis, seat of government

රාජන්, රජ්ජුරුවෝ : king

රාජයා, රජ : king

රාජාංගණය, රජගෙදර මිදුල : compound or yard in front of king's palace

රාජාධිරාජ, රජුන්ගේ රජ : king of kings

රාත්‍රිස්ථාන, රාත්‍රියට නවතින ස්ථානය : place of residence during the night

රාවය, ශබ්දය, නාදය : sound

රැසිවී, රැස්ව, කැටිව : h. assembled

රාෂ්ට්‍රය, රට : country

රාහල, රා බොන නොහොත් විකුනණ ස්ථානය : toddy shop or tavern

රාහුල, ගෞතම බුදුවූ සිද්ධාර්ථ කුමාරයාට දුව යශෝධරාදේවීන් කුස උපන් කුමාරයා : son of Siddhartha (who became Gautama Buddha) and queen Ya*s*odhar*a*

රැ, ගෙණහැර, අරන් : h. taken

රැඟුම්, නැටුම් : dance

රැඳි, (රඤ්ජමානවූ, බ. ව.)

රැඳීමනොකොට, නොනැවතී : without stopping or staying

රැඳුන, රැඳූ, } (සායම්) පෙවුන හෝ සායවුන : dyed (රඤ්ජමානවූ, බ. ව.)

Digitized by Google

රැහැණ, (රජ්ජු, බ. ව.)

රිය, (රථය, බ. ව.)

රිවි, සූර්ය්‍යා, ඉර: sun

රිවිකුල, (සූර්ය්‍යවංශය, බ. ව.)

රුචි, කැමති: wishful, desirous of h.

රුචිරවූ, බබලන, ශෝභාමත්: bright, shining

රුධිරය, ලේ: blood

රුපු, (ශත්‍රු, බ. ව.) [ty

රුව, රූපය, ලක්ෂණ: form or figure, beau-

රුෂ්ටව, කෝපව, තරහව: in anger or wrath

රුසිරු, (රූපශ්‍රීය, බ. ව.)

රූ, රූපය, } (රුව, බ. ව.)

රූපශ්‍රීය, රූප සම්පත්තිය: wealth like handsome form or figure [pollen

රේණු, රොන්, මලේ සුවඳකුඩු හෙවත් ධූලි:

රෝදනයකරමින්, අඬමින්: crying

රෝෂය, තරහ, කෝපය: anger, wrath

ල.

ල, ලිය, ලූ, ලන යන ක්‍රියාවල ධාතුව: root of the verb ලිය, ලූ, ලන

ලක්ෂණ, ලකුණ, රුව: mark, sign, beauty

ලක්ෂණාන්විත, ලක්ෂණඇති: h. beauty, beautiful

ලකල්, (අලඞ්කෘතවූ, බ. ව.)

ලත්, ලැබූ: got, gained

ලද්දාවූ, ලද, } (ලත්, බ. ව.)

ලන, දළු: tender leaf

ලතා, ලිය, වැල, (සිහින් ශරීරයඇති) ස්ත්‍රී: creeper, woman (especially slender woman)

ලබ්ධව, ලබා: h. obtained or got

ලඹා, (ලම්බමාන, බ. ව.)

ලම්බමාන, එල්ලෙන: hanging down

ලයාන්විත, (සිත) අලවන හෙවත් සතුටුකරණ: attracting or pleasing (the mind)

ලලාට, නලල: forehead

ලවන්, තොල්: lips

ලා, ලාකඩ, රතු සායමක්: lac, a red dye

ලාක්ෂාරස, ලාකඩවතුර: solution of lac

ලාඤ්ඡන, ලපය, ලකුණ: spot, mark

ලාජ, විලඳ, පොරි: flakes of fried grain

ලාභය, ලැබීම, ලබනලද දෙය: getting or gaining, thing gained or got

ලාවෙණි, උගුලෙයි: in the trap

ලැග්ගාවූ, වැතිරුණාවූ, නිදාගත්තාවූ: reposed, slept [sleeping

ලැගීම, වැතිරීම, නිදාගැනීම: reposing,

ලිඛිත, ලිවීම, ලිවීමේ ශාස්ත්‍රය: writing, art of writing

ලිය, (ලතා, බ. ව.)

ලිය, ලීම, } දැමීම: putting ('ලූ' යන්නට යෙදූ සංග්‍රහ බලනු: see the note to 'ලූ')

ලීලා රාගසහිත සෙල්ලම්: amorous sport

ලීලෝපේත, සිත්පිණවන, බබලන: pleasing, shining

ලුහුබඳවා, පස්සෙන් එලවා: h. pursued

ලූ, ලෑවූ, දැමූ: put, inserted (මේ ආදී 'ල' යන ධාතුවෙන් සිඩවූ ක්‍රියාපද වෙන ක්‍රියා අගට ඒවායේ අර්ථය සම්පූර්ණ කිරීමට හෝ ස්ථිර කිරීමට බොහෝසේ යොදනුලැබේ: this and other inflections of the root 'ල' are often used at the end of other verbs as auxiliaries to complete or emphasise their meanings)

ලෙද, වාගේ, මෙන්: like

ලෙල, (ලීලෝපේත, බ. ව.)

ලෙලදෙන, ලෙලෙන, } නටන, සෙලවෙන: quivering, shaking

ලෙව්හට, ලෝකයාහට, මිනිසුන්ට: to the people of the world, to men

ලේඛනයකොට, ලියා: h. written [eager

ලොල්ව, ගිජුව, ආශාව: being greedy or

Digitized by Google

ලොව්දුරු, මේ ලෝකය මැව්වායයි කියන මහා බ්‍රහ්මයා: the great or supreme Brahma who is said to have created this world

ලොවුතුරු, ලෝක සබ්භාවට උසස්, උතුම්, ලෝකෝත්තර: uncommon, noble, spiritual

ලෝකත්‍රය, (ජගත්ත්‍රය, බ. ව.)

ලෝකාස්වාදරණිය, ස්ත්‍රී පුරුෂ දෙදෙනාගේ සංසර්ගය හෙවත් එකටවාසය: cohabitation, sexual intercourse [the world

ලෝකාග්‍රවූ, ලෝකයට ප්‍රධානවූ: chief of

ලෝකාභිවෘද්ධිය, ලෝකය වඩා සම්පූර්ණකිරීම: advancing prosperity of the world

ලෝල, ආශාව, ගිජුබව: desire, eagerness, greed

ලෝභිවූ, ලෝබවූ, ගිජුවූ: greedy

ලෝහජලය, (යකඩ ආදී පොළවෙන් හාරා ගන්න) ද්‍රව්‍ය උණුකර ලබාගන්න දියර: liquid obtained by melting metal

ව.

ව්‍යක්තයා, උගතා, ඥානවන්තයා: learned man, wise man

ව්‍යඤ්ජන, ව්‍යංජන: cooked vegetable, etc eaten with rice, seasoned article

ව්‍යර්ථ, නිෂ්ඵල: fruitless, vain [tress

ව්‍යසනය, විපත්තිය, පීඩාව: calamity, dis-

ව්‍යාකුල, බොහෝසේ අවුල්වූ: greatly perplexed

ව්‍යාප්තවන්නාවූ, පැතිරෙන: spreading

වක්ත්‍රය, මුහුණ: face

වගුරුවමින්, පෙරමින්: shedding

වඞ්ක, වක, නැම්ම, පැත්ත: bend or curve, side

වචස, වචනය: word

වඤ්චාකරවයි, රවටයි: deceives, defrauds

වඩා, ඇඳ: h. dressed ×

වත්අත්, (ගණදෙවියා, බ. ව.)

වත, වැතුව, වත්ත, මුහුණ: wealth, garden, face [ed

වතළ, පැතුරුණ, විසිදුන: spread, scatter-

වජ්ජ, වරද, දෝෂය: fault

වදන්, වචන: words

වදාරා, කියා: h. said (වදාළ, බ. ව.)

වදාළ, කී; ගෞරවපිණිස ක්‍රියාපද අගට යොදන පදයක්: said; a word used at the end of other verbs as an honorific

වධකයා, (රාජනියෝගයපිට) අපරාධකාර මිනිසුන් මරන්නා, අලුගෝසුවා: executioner, hangman

වධය, දඬුවම, තදපීඩාව: punishment, torture [come

වන්, ඇතුල්වූ, පැමිණි: entered, arrived,

වන්දනය, වැඳීම: worshipping [or came

වන්නෙම්, පැමුණුනෙම්: one who arrived

වනගහණය, කැලෑවෙන්ගැවසුන ස්ථානය: place covered with forest

වනපංක්තිය, කැලෑසමූහය හෝ පෙළ: group or line of forests

වනාන්තරය, ලොකුකැලෑව: thick forest

වනිතාව, ස්ත්‍රී, භාර්යාව: woman, wife

වයඃප්‍රාප්ත, ලොකුවයසටපැමිණි, ලොකුවූ: arrived at maturity, grown up

වර්චස, අශුචි: ordure, foces

වර්ණය, පාට: colour

වර්ණනාකොට, විස්තරකොට: h. described

වර්ධනයකරණ, වැඩිකරණ, දියුණුකරණ: increasing, advancing

× මේ 'වඩා' සම්බන්ධ 'වඩ' යන ක්‍රියා [illegible] 'වර්ධන' යන එයි සාමාන්‍ය අර්ථය [illegible] එබඳු ස්ථානවලදී ඒ ඒ තැනට ගැලපෙන [illegible]. The verb 'වඩ' connected with 'වඩා' is used in various [illegible] usual sense of 'to increase') with reference [illegible] In such cases the meaning should be determined [illegible] sentence

වඩ්ඪනකරවමින්, වැඩිකරවමින්, දියුණුකරවමින්: causing to increase or grow

වඩ්ඪමානවෙමින්, වැඩිවෙමින්, දියුණුවෙමින්, ලොකුවෙමින්: advancing, growing

වර, උතුම්, ඉතාලක්ෂණ හෝ අගනා: best, excellent, most beautiful or precious

වරප්‍රදානය, වරයක්දීම: giving a boon or favour

වරය, උපකාරය, සතුටු දීමනාව, ආශිර්වාදය: favour, boon, blessing

වල්, (වාලධිය, බ. ව.)

වල්ලභයා, ස්වාමියා, පුරුෂයා: lord, husband

වන, කැලෑ, වනය: jungle, forest

වලග්ග, ඉඟටිය: loins, waist

වලඤ්ජනයකොට, වැළඳ: h. embraced

වලහා, සඟවා: h. concealed

වලා, (වලාහ, බ. ව.)

වලාහක, වලාව, වලාකුළ: cloud

වලි, හම්සැදෙන වැකරැළිඉර, (ප්‍රධානවශයෙන් ස්ත්‍රීන්ගේ) බඩේ ඉහළින් වැටෙන ලක්ෂණයක් සලකන වැකරැළි ඉරක්: fold or wrinkle (on the skin), fold of skin on the upper part of the belly (especially of females, regarded as a mark of beauty)

වස්තු, දේපල, වතු, ගම්බිම්: riches, garden, landed property [ornaments

වස්ත්‍රාභරණ, ඇඳුම් පැළඳුම්: dress and

වස්ස, (වළුන්, බ. ව.)

වශගව, } කීකරුව, යටත්ව: being obedient
වසගව, } (to the will of another) or
වසඟව, } submissive

වනාන, } පෙකණියේසිට පහළට තිබෙන
වනරාජී, } ලොම්වැල: line of hair from the navel downwards

වළුන්, කෑම, ආහාර, වළන්: food, meal, earthen-ware

වහණයවෙන, වැගිරෙන්නාවූ, වැක්සෙරෙන්නාවූ: shedding, pouring out

වහල්කොට, දරාගෙණ අල්ලාගෙණ: h. supported or caught

වහසිබස්බැණ, බිනක්නා, සටනටකැඳවන උඩඟුබස්කියා: h. challenged

වාක්, වචන: words

වාච්‍ය, කියනලද: said, expressed

වාණය, ඊය: arrow, shaft

වාණිජවංශය, වෙළඳ ජනවත් වෛශ්‍යනම්වූ තුන්වෙනි කුලය: the third or mercantile class or caste

වාද්‍යකරණ, බෙර දවුල් ආදිය ගසන: sounding of drums and other musical instruments

වාදනකරමින්, විරුඞ්ධලෙස කතාකරමින්: controverting, disputing

වානරධේනුව, වැඳිරි: female monkey

වානරයා, වඳුරා: monkey

වාලධිය, වල්ගේ: tail

වාසල, දොරටුව: gate [tants

වාසීහු, වාසයකරන්නෝ, ඉන්නෝ: inhabi-

වැකූනාවූ, තැවරුනාවූ: daubed, smeared

වැගුරුණාවූ, වැටුනාවූ, පහවූ: fallen off

වැජඹිනි, (විජෘම්භමානවී, බ. ව.)

වැජඹේ, (විජෘම්භමානවේ, බ. ව.)

වැටීගී, වැටී ('ගී' යනු ද 'වැටී' යන අර්ථයි): h. fallen ('ගී' is synonymous with 'වැටී')

වැණිහිය, ඉහිරීගිය, වැටීගිය: scattered away, fallen off [h. prostrated

වැතිර, වැලඳගෙණ, දිගඇදී: h. embraced,

වැදෑරුම්, ආකාරවූ: like

වැන්න, වාගේය: like

වැරසැර, (වීරසාරවූ, බ. ව.)

වැලිතල, වැලි ඉවුර හෝ කන්ද: sand-bank, mound of sand

වැසනය, (ව්‍යසනය, බ. ව.)

වීක්‍රම, ශූරභාවය, දක්ෂකම, මහත්බලය: heroism, heroic valour, prowess

Digitized by Google

වික්‍රාන්ත, (වික්‍රම, බ. ව.)

විකසිත, පිපුණු: blown or expanded (as a flower)

විකාර, විරූපී, ආකාරය වෙනස්වූ, අවලක්ෂණ: deformed, ugly

විකුම, (වික්‍රම, බ. ව.)

විකෘති, (අවුලු, බ. ව.)

විගස, } කෙණෙහි, මොහොතෙහි, වහා:
විගසින්, } instantly, at once

විචාරා, අසා, විචාරාගෙණකොට: h. asked, h. inquired

විචාලාහුය, ඇසුවාහුය: they-asked or inquired

විචිත්‍ර, නොයෙක් පාට මිශ්‍රවූ, ලක්ෂණවූ: variegated, beautiful

විජය, ජය, දිනීම: victory

විජයකොට, දිනා: h. conquered

විජයශ්‍රීකාන්තාව, ජයනමැති ශ්‍රීකාන්තාව: goddess of wealth personating victory

විඩා, වෙහෙස: fatigue

විඩාපත්ව, වෙහෙසට පැමිණ: fatigued, wearied

විජානනය, දැනීම: knowing

විජෘම්භමානවී, ('විජෘම්භමානවේ' යන්නෙ අතීත රූපයවේ: past form of 'විජෘම්භමානවේ)

විජෘම්භමානවේ, ප්‍රකාශවේ, ප්‍රසිද්ධව හෝ ඓශ්වර්‍ය්‍යයෙන් යුක්තව වාසයකරයි: he-becomes manifest, he-lives in fame or pomp

විතරණ, ත්‍යාගවන්තකම, දීමට කැමතිකම: liberality

විද්‍යාධර, අහසින්යණ්ටපුළුවන් දේවතාකොටසක්: a class of demigods who have the power of going through the air

විද්‍යාස්ථාන, විද්‍යා හෙවත් ශාස්ත්‍ර දරණස්ථාන, ශාස්ත්‍ර: repository of science, science

විද්‍යුත්කාන්තිය, විදුලියේ දීප්තිය හෙවත් බැබලීම: lustre or brilliance of lightning

විද්‍යුද්දාමය, විදුලියේ එලියවැල: flash of forked lightning

විද්‍යුල්ලතා, විදුලියේ එලිසවැල, විදුලිය: streak of lightning, lightning

විදු, විදුලිය: lightning

විධානය, ආඥාව, නියමය: order, command

වින්දනයකොට, විඳ: h. suffered or experienced

විනා, ඇර: except

විනිවිජ්ඣනයකොට, සිදුරුකොට: h. pierced through

විනෝදන, (වෛනෝදජන, බ. ව.)

විපාකය, ඵලය: result

විපිළිසරව, කලකිරී, එපාවී: being disgusted or disheartened

විභාග, බෙදීම, කොටස, කරුණ: division, share, particular

විභූති, සම්පත්, ඉසුරු: magnificence, wealth

විභූෂිතවූ, අලංකාරකරණලද, සරසනලද: decorated, adorned

විමන, (විමානය, බ. ව.)

විමංසනයකොට, සොයා, පරීක්ෂාකොට: h. inquired or searched

විමානය, මාලිගාව, උතුම් ගෙය: palace, mansion

විමානස්ථව, විමානයෙහි පිහිටා, විමානසහිත: being in the mansion, with the mansion

වියනා, (විතානය, බ. ව.)

වියෝග, වෙන්වීම: separation

වියෝගවෙමින්, වෙන්වෙමින්: separating

වියෝගීව, වෙන්වී: being separated

විරක්තවූ, ආලයනැති: unenamoured

විරහ, වෙන්වීම, ස්ත්‍රීපුරුෂ දෙදෙනාගේ වෙන්වීම: separation, separation of lovers or husband and wife

විරාජමාන, බබලන: shining

විරූ, පුරුදුඇති: accustomed

විරූප, අවලක්ෂණ: ugly

විරූපතාව, අවලක්ෂණකම: ugliness

විලය, (විලායන, බ. ව.)

Digitized by Google

විලාප, දුක්මුසු වචනකීම: lamentation

විලාසය, ආකාරය: manner

විලීනවූ, දියවී: melted, dissolved

විවාහමඞ්ගල්‍යය, ස්ත්‍රියක් දීගදීමේ මඟුල: the festival of giving a woman in marriage

විවෘතකරණලද, ඇරිය: opened [opened

විවෘතකරවා, අරවා: h caused to be

විවිධ, නොයෙක්: various

විශිෂ්ට, ඉතා උතුම්: best, eminent

විශිෂ්ටතාව, උතුම්කම, ප්‍රධානකම: excellence, speciality

විශිෂ්ටතාවයෙන්, උතුම්ලෙස, ප්‍රධානලෙස: eminently, especially

විශුද්ධ, ඉතා පිරිසිදු: very clean

විශේෂ, අමුතු, වැදගත්; වර්ග, ආකාර, අමුතු හෝ නොයෙක් කරුණු: peculiar, important; kind, manner, different or various particulars

විශේෂයෙන්, (වෙසෙසින්, බ. ව.)

විෂ්ණු, හින්දුආගමේ ප්‍රධාන දෙවිවරුන් තුන්දෙනාගෙන් (ලෝකය රක්ෂාකිරීමනාරවූ) දෙවෙනියා: the second deity of the Hindu sacred triad, entrusted with the preservation of the world

විෂඝෝර, ඝෝර හෙවත් භයානක විෂඇති: fearfully or highly venomous

විසිරීගියවූ, විසුරුණවූ: scattered

විසංඥව, සිහිනැතුව: unconsciously

විසාඛා, } විශාඛා, } ගෞතමබුදුන් ජීවමානකාලයේ සිටි ඉතා ශ්‍රද්ධාවන්ත බෞද්ධ සිටු උතුමියක්: a very pious Buddhist lady of the Situ class who lived in the time of Gautama Buddha

විසාරදව, බියනැතුව, නිර්භීතව: fearlessly, boldly [emitting, casting forth

විසර්ජනයවන්නාවූ, පිටවෙන, විහිදෙන:

විහරණය, වාසයකිරීම, විසීම: living, state of being [wearied

විහිංසාව, වෙහෙසව, ක්ලාන්තව: being

විංශති, විසි: twenty

වීර්යය, බලය, දක්ෂකම, තේජස: valour, heroism, dignity

වූ, උනාවූ: become

වෘක්ෂය, ගස: tree

වෘද්ධිකාරකවූ, වැඩිදියුණුවට හිතවූ, දියුණුව ගෙණදෙන: promoting prosperity

වෘද්ධිය, වැඩිදියුණුව: advancement, prosperity

වෘෂභ, ගොණා: ox

වෙණ, වීණාව: (Indian) lute

වෙලා, වලාව, වලාකුල: cloud

වෙසෙසින්, විශේෂයෙන්, ප්‍රධානවශයෙන්: chiefly, peculiarly

වේගයෙන්, චංචලභාවයෙන්, සැරෙන්: in an agitated manner, speedily

වේද, ('දකිනෙනු වේද' 'මතුම වේද' ආදී මෙබඳු තැන්වල 'වේද' කථා ව්‍යවහාරයෙහි පවතින 'වද' යන්නට සමානයි: වේද in the above-mentioned quotations and their like is equal to 'වද' used colloquially to indicate that the subject, though spoken of in an interrogative form, is evident

වේරම්බවාතය, සතරදිගින් හමන තද හුළඟක්: a strong wind blowing from the four quarters of the world

වේශය, ආකාරය, ඇඳුම, ස්වභාව අන්දම වෙණස්කොට ගත් ආකාරය: state, dress, disguise

වෛජයන්ත, ශක්‍රයාගේ මාළිගාව: the name *Sakra's* palace

වෛනේයජන, හික්මවියයුතු ජනයා: people who should be restrained or subdued

වෛශාඛ, වෙසක් මාසේ: the second lunar month of the Hindu year (corresponding to April—May)

වොරැද්, (වර්ජමාන, බ. ව.)

ශ.

ශ්මශ්‍රු, රැවුල: beard

Digitized by Google

ශ්‍රද්ධාව, (ආගමසම්බන්ධ දෙයකි විශ්වාසය, සිතපැහැදීමට හේතුව: religious faith, trust

ශ්‍රමණ, මහණුත්තාන්සේ: Buddhist monk

ශ්‍රවණය, කණ, ඇසීම: ear, hearing

ශ්‍රවණයකරව, අසව: hear *imperative*)

ශ්‍රවණීය, ඇසියයුතු, ඇසීමට සිතිරි: fit for hearing, pleasing to the ear

ශ්‍රාවස්ති, ඉන්දියාවේ උත්තරකෝශලනම් පලාතේ ප්‍රධාන පුවර: the capital of Uttara Kosala, a province in India

ශ්‍රී, උතුම්: noble, great

ශ්‍රී, ශ්‍රීකාන්තාව, } විෂ්ණුගේ භාර්‍යාවූ සම්පත්තිවට අධිපති ලක්ෂ්මී නම් දේවතාවී: Lakshm*i*, the wife of Vish*nu* and goddess of wealth

ශ්‍රීය, වැනුව, සම්පත: riches, prosperity

ශ්‍රීසාරය, උතුම් සම්පත, සම්පත්තියේ උතුම් කොටස: best wealth, essence of wealth

ශ්වේත, සුදු: white

ශ්‍රේෂ්ඨ, ඉතා උතුම්: best, most excellent

ශක්තවූ, බලසම්පන්නවූ, ශක්තිමත්: powerful, mighty

ශක්‍රයා, දෙවියන්ගේ රජ්ජුරුවෝ: name of the king of gods

ශකවර්ෂය, ක්‍රිස්තු වර්ෂ 78 දී පටන්ගත් ශාලිවාහන නම් රජුගේ වර්ෂය: the era of king *S*aliva*h*a*n*a which commenced 78 years after the Christian era

ශඞ්කා, සැක, අනුමාන: doubt, hesitation

ශඞ්ඛ, සක්, හක්ගෙඩිය: conch-shell

ශඞ්ඛක්ෂීර, හක්ගෙඩියේ වක්කල කිරි: milk poured into a conch-shell

ශත්‍රු, හතුරා: enemy

ශත, සියය: hundred

ශතපත්‍ර, නෙළුම්: lotus

ශතසහස්‍රය, සියක්දහ: hundred thousand

ශරත්කාලය, වප් ඉල් දෙමස ඇතුලත් කාලය (මේ කාලය යයි සුදුසායා ඉතා අප්ත්මත් ව බබලයි): autumnal season comprising the two months Vap and Il (September—November)

ශශ, හාවා: hare

ශස්ත්‍ර, ආයුධය: weapon

ශාඛා, අතු: branches

ශාඛාමෘග, වඳුරා: monkey

ශාටක, සළු, වස්ත්‍ර: soft cloth, cloth

ශාන්ති, සමාදානය, ආරක්ෂාව: pacification, cessation of hostility, preservation

ශාරද, ශාරද, } හයිඇති, නිර්භයනැති: not bold, diffident

ශාසනය, ආගම පිළිබඳ ඉගැන්වීම හෝ අවවාදය: religious teaching or instruction

ශාසනපත්‍ර, ලියුම්: epistle, letter

ශිඛර, (පර්වතයේ) මුදුන: top or peak (of a mountain)

ශිරාව, හිස, මුදුව: head

ශිල්ප, සිතියම්කිරීම කැටයම්කිරීම ආදී අතින් කරන වැඩ පිළිබඳ ශාස්ත්‍ර: arts, fine or mechanical arts (of which there are 64) (සූසැට ශිල්ප, බ. ව.)

ශිලාප්‍රවාල, ගල් සහ පබළු: stone and coral

ශීඝ්‍ර, ඉක්මණට: quickly

ශීතලාශ්‍රය, සිහිල් ගුණය: quality of coolness

ශීර්ෂය, හිස, මුදුන: head

ශීලානුභාවයෙන්, ශීලයේ බලයෙන්: by the virtue or power of good conduct

ශුණ්ඩාව, ඇත්හොඬ: elephant's trunk

ශුභනිමිත්ත, යහපත් ලකුණ: good sign or mark

ශූකර, ඌරා: hog

ශූන්‍යකොට, සම්පූර්ණයෙන් විනාශකොට: h. completely destroyed

ශෘඞ්ග, අග, ගෙයි මුදුනේ කොන: horn, turret

ශේඛර, ඔටුන්න: crown, diadem

ශේෂව, ඉතුරුව: remaining

ශෛල, ගල්: stone

ශෛලාසනය, ගලින් කළ ආසනය: stony-seat

Digitized by Google

ශෛවාල, සෙමෙල්, පෙද: aquatic plant, moss

ශෝක, කනගාටුව: sorrow

ශෝභනවූ, බබලන, ලක්‍ෂණ, ආදරය උපදවන: shining, beautiful, lovely

ශෝභා, එළිය, බැබලීම, ලක්‍ෂණ: light, brilliance, beauty, grace

ශෝභමානවූ, (ශෝභනවූ, බ. ව.)

ශෝභාසහිත, ශෝභාඇති, බබලන, ලක්‍ෂණ: shining, beautiful

ෂ.

ෂට්, }
ෂඩ්, } සය: six
ෂණ්, }

ෂඩ්වර්ණය, (බුදුන්ගේ ශරීරයෙන් නික්මුණු රැස්වල) පාට සය; (ඒනම්:—නිල, රත්වන් හෙවත් කහ පාට, රත, සුදු, මදටිය පාට, මේ පාට පහ මිශ්‍රවූ වර්ණය: the six colours (referring to the six colours of the rays which emitted from Buddha's person, viz. blue, yellow, red, white, madder, and colour formed by the combination of the said five colours)

ෂෂ්ඨ, සයවෙනි: sixth

ෂෝඩශ, දහසය: sixteen

ස.

ස්කන්දකුමාරයා, ශිවාගේ පුත්‍රවූ යුධයට අධිපති දෙවියෝ, කතරගමදෙවියෝ: military deity of the Hindus and son of *Siva*, Kataragama deviyo

ස්කන්ධ, කඳ, සමූහය: trunk, multitude

ස්තබ්ධබබ, මුරණ්ඩු, පදකම්න් බැඳුන: obstinate, hard-hearted [stinate

ස්තබ්ධවූ, තදවූ, රෞද්‍රවූ: hard, rough, ob-

ස්තම්භ, කණුව: pillar, post

ස්ථවිරී, උපසම්පදාවී දස අවුරුදුගිය මෙහෙණින්න: female Buddhist monk who has passed her tenth year after ordination

ස්ථානවාසීවූ, (ඒ)තැන උන්නාවූ හෝ සිටිනාවූ: who-was at the place [post

ස්ථානාන්තරය, තනතුර, වැඩ: office,

ස්ථානෝචිත, ස්ථානයට සුදුසු, ප්‍රස්තාවටයෝග්‍ය: suitable to the place or occassion

ස්ථාපනය, සිටවීම, තැබීම: act of causing to stand, placing

ස්නිග්ධවූ, සිනිඳු, මොලොක්වූ, ඔපවැටෙන: soft, glossy

ස්නේහය, ආදරය: affection, love

ස්පන්දනංකොට, පැන: h. jumped over

ස්පර්ශකරමින්, තරවමින්, ගාමින්, සපමින්: touching

ස්පර්ශය, අතගෑමෙන් හෝ හැපීමෙන් ශරීරයට ඇති දැනීම හෝ ගුණය, හැපීම, තැරවීම: sense of touch or contact, touch, contact

ස්ඵටික මාණික්‍ය, පළිඟු: crystal

ස්වකීය, තමාගේ: one's own

ස්වයම්භූ, තමාකෙරෙන්ම වූ, තමා විසින් ඉපදෙවූ: made or produced by one's-self

ස්වර්ගය, දිව්‍යලෝකය: heaven [coin

ස්වර්ණ, රන්රන්, රන්රන්කාසිය: gold, gold

ස්වර්ණකර්මාන්ත, රන්රණින් සෑදීම: workmanship in gold

ස්වර්ණකාරයා, බඩාලා, රන්රණින් බඩු සාදන්නා: goldsmith

ස්වර්ණමය, රන්රණින් කළ: made of gold

ස්වරූපය, ස්වභාවයෙන් ඇති රූපය, තමාගේ රූපය: natural form, one's own form

ස්වාමිදුනිතෑව, ස්වාමිවූ ස්ත්‍රී: mistress, lady

ස්වාමීන්ද්‍රයා, ප්‍රධාන හෝ උතුම් ස්වාමියා: chief, noble, or great master or lord

ස්වාසය, හුස්ම: breath

ස, සය; සහිත, ඇතුව, තමාගේ, ස්වකීය: six; united with, together with, one's own

සක්, (ශක්‍රයා, ශඞ්ඛ, ශක්ති, චක්‍ර, බ. ව.)

Digitized by Google

සක්තව, ඇලී, එල්ලීගෙණ : being attached, eagerly

සක, (ශඞ්ඛ, චක්‍ර, බ. ව.)

සකත්, (විෂ්ණු, බ. ව.)

සකල, සියලු : all

සකලෛශ්වර්‍ය්‍ය, සියලු ඉසුරු හෝ සම්පත් : every variety of affluence, wealth, or greatness

සකස්, } මනා, යහපත්, හොඳ : good,
සකස්වූ, } fitting

සකු, (සංස්කෘත, බ. ව.) [wheel

සකෙකි, චක්‍රයෙකි, රෝදයෙකි : on the

සගයෙනි, බාලයෙනි, ගෑවයෙනි : O youngsters! O fellows!

සඟ, (සඞ්ඝ, බ. ව.)

සඟල, දෙදෙක : two

සඞ්කුචිතකොට, අකුලා : h. caused to strink or shrivel [shrunk

සඞ්කුචිතව, ඇකිලී : being contracted or

සඞ්ග්‍රාම, යුධය : war

සඞ්ඝ, භික්ෂූන්වහන්සේලා තුන්නමක් වැඩි ගණන, භික්ෂු සමූහය : a term applied to any number exceeding three of Buddhist monks, priesthood

සජ්ජිතකලාවූ, සැරසූ, සැදුවාවූ, පිළියෙළ කළාවූ : adorned, made, prepared

සඤ්චාරණය කරති, හැසිරෙති, ඇවිදිති : move about, walk about

සඤ්ඡන්න, වැසුන, වටකරණලද : covered, surrounded

සඤ්ජාත, උපන් : born, produced

සඤ්ජානනය කරමි, අඳුනමි : I know, I recognize

සත්, (සත්‍යා, බ. ව.)

සත්අත්, (මහා බ්‍රහ්මයා, බ. ව.) [ous

සත්පුරුෂ, යහපත්, ගුණවත් : good, virtu-

සත්‍ය, සැබෑ : true

සත්ව, සතා : living being

සත, (සත්ව, සප්ත, බ. ව.)

සතඞ්ග, (සප්තාඞ්ගය, බ. ව.)

සතතයෙන්, } නිතර : always
සතතින, }

සතරදිශාව, (නැගෙණහිර, දකුණ, බස්නාහිර, උතුර යන) දිසා හතර : the four directions (viz. East, South, West, North)

සතර පිරිසිදු සිල්, (චතුපාරිශුද්ධි ශීලය, බ. ව.)

සතිය, දවස් හත, සුමානය : week

සතු, සත්තක : appertaining to

සද්ධර්මය (සත්, ධර්මය), උතුම් හෝ සැබෑ ධර්මය : noble or true doctrine or law

සදහම්, (සද්ධර්මය, බ. ව.) [always

සදාකල්හි, හැමවේලේ : at all times,

සදාචාර (සත්, ආචාර), යහපත් හැසිරීම හෝ ක්‍රියාව : good or virtuous conduct

සදිසි, (සදෘශ, බ. ව.)

සදෘශ, සමාන, වැනි : like, resembling

සඳු, චන්ද්‍රයා, උතුම් හෝ ප්‍රසිද්ධයා : moon, excellent, eminent, or illustrious person

සන්තර්පණය, සැතැප්පවීම, සතුටුකරවීම, සැප ඇතිකිරීම : satisfying or gratifying, giving delight or pleasure

සන්තර්පිතව, සැතපී : h. rested, h. slept

සන්තාපය, තැවීම : remorse, distress

සන්තුෂ්ටවූ, සතුටුවූ : pleased, satisfied

සන්ධ්‍යා, සැන්දෑ : evening

සන්නද්ධකොට ගෙණ, යුධ ඇඳුම්ඇඳගෙණ : h. put on the armour

සන්නද්ධව, (සන්නද්ධකොටගෙණ, බ. ව.)

සන්නාහය, (කවච, බ. ව.)

සනහා, නාලා, ස්නානයකොට, සංසිඳුවා : h. bathed, h. consoled

සප්ත, හත : seven

සප්තභූමක, භූමි හෙවත් තට්ටු හතක් ඇති : h. seven stories or folds

සප්තම, හත්වෙනි : seventh

සප්තස්වරය, (වීණාවේ) ස්වර හෙවත් නාද හත : seven tunes or notes [parts

සප්තාඞ්ගය, අඞ්ග හත : seven members or

Digitized by Google

සන්තාන (සන්ත, අභය), (කණිය, බ. ව.)

සපයා, (සම්පාදනයකොට, බ. ව.)

සපැමිණි, (සම්ප්‍රාප්ත, බ. ව.)

සපිරි, සම්පූර්ණ: full, complete

සබ, (සභා, සභා, බ. ව.)

සබඳ, මිත්‍රය, යාලුව: O friend!

සභා, රැස්වූ පිරිස, සමාගම. සභාව පවත්වන ශාලාව: assembly, council, company, meeting, coun il chamber

සම්ප්‍රාප්ත, පැමිණුනාවූ: arrived, come

සම්පන්න, යුක්ත, ඇති: endowed with, possessed of

සම්පතියෙන්, එක්වීමෙන්: by the union

සම්පාදනයකොට, පිළියෙලකොට, ලෑස්තිකොට: h. prepared [filled

සම්පූර්ණකොට, පුරවා: h. completed, h.

සම්බන්ධ, බැඳුම: union, connection [tion

සම්භාෂණය, එකතුව කථාකිරීම: conversa

සම්භාවනා, ගෞරව, ආදර: respect, esteem, affection

සම්භෝගය, ස්ත්‍රී පුරුෂ දෙදෙනාගේ සංසර්ගය: carnal enjoyment, sexual union

සමතැස, (සමන්තාක්ෂි, බ. ව.)

සමන්තාක්ෂි, හැමතැනම ඇස් ඇති, හැමදේ පෙණෙන ඇසක් ඇති. සියලු දේ පෙණෙන හෝ දන්න, සර්වඥ: h. eyes on all sides, h. a universal eye, omniscient

සමන්විත, (සම්පන්න, බ. ව.)

සමය, කාලය: time

සමවත, (සමාපත්තිය, බ. ව.)

සමවාය, එක්වීම, ආශ්‍රය, මැදහත්වීම: connection, interference [whole world

සමස්ත, සියලු, මුලු; මුලුලෝකය: all, entire;

සමාදිවූසේක, සතුටුවූසේක: (his honour or highness was) pleased

සමාප්ත, නිමි, කෙළවරවූ: finished

සමාපත්තිය, පැමිණීම, එක් සවභාවකට පත්වීම: attainment, attaining a certain state

සමීපය, ළඟ, වෙත: vicinity

සමුද්‍රය, මුහුද: sea

සමුදය සත්‍යය, (චතුරාර්‍ය සත්‍ය, බ. ව.)

සමූහය, රැසිය: collection, multitude

සමෘද්ධකොටගෙණ, ඉෂ්ටකරගෙණ: h. accomplished [flourishing

සමෘද්ධවූ, බොහෝකොට ඇති: abounding,

සයනය, ඇඳ, යහන: bed

සයනයකළාය, සැතපුනාය, නිදාගත්තාය: (she) reclined or reposed, (she) slept

සයුරු, (සාගරය, බ. ව.)

සයනයකෙරෙමින්, නිදමින්: sleeping

සර්ගය, (කාව්‍යයක) පරිච්ඡේදය, කොටස: canto (of a poem), chapter

සර්ව, සියලු: all

සර්වඥ, සියළුදේ දත් තැනැත්තා, බුදුන්: the omniscient one, Buddha

සර්වඥයන්වහන්සේ, (සර්වඥ, බ. ව.)

සර්වාභරණ, සියලු ආභරණ: all ornaments

සර, නෙළුම්මල: lotus flower

සරණ, පිහිට: refuge, protection, support (මරණය, සස්වාරණයකරණ, බ. ව.)

සරණකොටහැරගෙණ, පිහිටකොටගෙණ: h. taken as refuge or support

සරසිරුහ, නෙළුම්: lotus

සල්, ගල්: stone

සල්ලාල, ස්ත්‍රීසේවනයට ගිජු මිනිස්සු: lustful persons [thought

සලකා, කල්පනාකොට: h. considered or

සලාමෙන්, චංචලවූවාක්මෙන්: as if stirred or fluttered

සලෙලු, (සල්ලාල, බ. ව.)

සව්, (සර්ව, බ. ව.)

සවණ, (ශ්‍රවණ, බ. ව.)

සවණ, සවනා, } (සර්වඥ, බ. ව.)

සශ්‍රීකම, ශ්‍රියාව නොහොත් ලක්ෂණ ඇතුව: h. the grace or beauty

Digitized by Google

සශ්‍රීකවූ, සිත් අලවන, ලක්‍ෂණ: lovely, beautiful [smooth or soft

සශ්ලිෂ්ටවූ, ඔපගතිය ඇති, සිනිඳු: being

සශෝභන, ලක්‍ෂණ ඇති: beautiful, lovely

සස්න, (ශාසනය, බ. *v.*)

සස, (ශශ, බ. *v.*)

සසර, (සංසාර, බ. *v.*)

සසොබන, (සශෝභන, බ. *v.*)

සහ, හා, සමග: and, with

සහණයකොට, (අස්වසා, බ. *v.*)

සහස්‍රය, දහස: thousand

සහිත, සම්බන්ධවූ, සමග: united with, together with

සංලක්‍ෂණයකළ, සිතූ, කල්පනාකළ: thought, considered

සංස්කෘත, දෙවිවරුන්ගේ භාෂාවයයි සලකන ඉන්දියාවේ ප්‍රධානභාෂාවක්: one of the chief languages of India which is considered to be identical with the language of the gods

සංසාර, (භවය, බ. *v.*)

සංසිඳෙමින්, සංසුන්වෙමින්, නිව්වවගතිඇතිවෙමින්: being composed or sedate

සාගරය, ලොකු මුහුද, සයුර: ocean, sea

සාගල, මද්‍රදේශයෙහි ප්‍රධානනුවර: capital of Madra-*desa*

සාන්ද්‍ර, සුවඳවර්ගයක්: a kind of perfume

සාඵල්‍ය, සඵල, ඉෂ්ටවෙන: fruitful, successful

සාමන්ත, එකප්‍රදේශයක පමණක් ආණ්ඩුකරණ, ප්‍රධාන රජුට යටත්වූ: tributary

සාමර්ථ්‍යය, දක්‍ෂකම, පුළුවන්කම: skill, ability

සායාහ්ණ (=සාය, අහ්ණ), සවස: evening

සාර්ථක, (සාඵල්‍ය, බ. *v.*)

සාරය, අරටුව, සාරවත් කොටස: heart-wood, essence

සාරවූ, ස්ථිරවූ, ඉතා උතුම්වූ: vigorous, firm, excellent, best

සැත්, (ජන්තු, බ. *v.*)

සැදැහැ, (ශ්‍රද්ධාව, බ. *v.*)

සැදූ, (සජ්ජිතකළාවූ, බ. *v.*) [arrived

සැපත්, සම්පත්තිය; පැමිණුන: wealth;

සැපින්නිය, ගැණුසර්පයා: female serpent

සැලසූ, යෙදූ, පත්කළ: engaged, appointed

සැවැත්, (ශ්‍රාවස්ති, බ. *v.*)

සිකි, (මයුර, බ. *v.*)

සිහු, කෘශ, සීන්: thin, slender

සිත්කළුවූ, සිත්සතුටුකරණ, ප්‍රියකරණ: pleasing, lovely

සිතියම්, (චිත්‍රකම්, බ. *v.*)

සිතුරුවන, (චින්තාමාණික්‍ය, බ. *v.*)

සිද්ධ, අහසින්යන්ටපුළුවන් දේවතාකොට්ඨාසයක්: a class of semi-divine beings who have the power of going through the air

සිද්ධාඞ්ගනාව, සිද්ධයන්ගේ ස්ත්‍රී, සිද්ධස්ත්‍රී: wife of Siddhas, female Siddha

සිදඟන, (සිද්ධාඞ්ගනාව, බ. *v.*)

සිඳලත්, උඟුළති, කපති: (they) pull off, (they) cut off

සිඳු, (සින්ධු, සෛන්ධවයා, බ. *v.*)

සින්ධු, මුහුද: sea [hundred

සිය, තමාගේ, ස්වකීය; සියය: one's own;

සිරි, (ශ්‍රී, ශ්‍රිය, බ. *v.*)

සිරිත, (චරිතය, චාරිත්‍රය, බ. *v.*)

සිරුර, ශරීරය: body

සිලුටු, ඔපවූ, රළුනැති, සිනිඳු: smooth, soft

සිව්, සිවු, } හතර: four

සිවුපණස්, පණස් හතර: fifty-four

සිවුපාය, (චතුරෝපාය, බ. *v.*)

සිව්මැදුරුකාව්ළුව, එක් කවුළු (ජනේල) වර්ගයක්: a kind of windows

සිව්මැළි, මොළොක්: soft, tender

සිවරඟසෙනඟ, (චතුරඞ්ගිනීසේනාව, බ. *v.*)

Digitized by Google

සිව්පිරිසක්පශීද, සතරවශීයක පිරිස (එනම් :—භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා): four classes of assembly or audience (viz. monks, nuns, lay male devotees, lay female devotees)

සිව්සඟරුවන, (චතුස්සඞ්ග්‍රහවස්තු, බ. ව.)

සිවිගෙය, දෝලාවශීයක් : a kind of palanquins

සිවුරු, හතර, චීවරය : four, sacerdotal [robe

සිංහනාදකොට, සිංහයෙකුගේ නිර්ඝෝෂ නාදයට සමානව නාදපතුරුවා කථාකොට : h. spoken in the bold tone of a lion's roaring

සිංහාසනය, රජු ඉන්න (සිංහරූපයක්පිට තනනලද) ආසනය : king's throne (built on a lion's image)

සිත්වූ, හීන්වූ : thin, fine

සීමාව, ඉම, නිම, කෙළවර : limit, end

සීමැදුර, (සීහපඤ්ජරය, බ. ව.)

සීහපඤ්ජරකාමාටය, } (සීව්මැදුරුකවුළුව,
සීහපඤ්ජරය, } බ. ව.)

සු, යහපත්, ඉතා : good, best, very

සුගත්, දෙවියෝ, බුදුහු : gods, Buddha

සුගතිඳු, (සුගතේන්ද්‍රයා, බ. ව.)

සුගතේන්ද්‍රයා, උතුම් බුදුහු : illustrious or great Buddha

සුගන්ධ, සුවඳ : good smell, scent

සුගක්, ටිකක් : a little

සුඛිත, සැප ඇති, සතුටු : happy, pleased

සුජාතාව, ශක්‍රයාගේ භාය්‍යාව : consort of *Sakra*

සුදෝදන, } ගෞතම බුදුන්ගේ පියරජ්ජුරුවෝ : royal father of Gautama Buddha
ශුද්ධෝදන, }

සුදර්ශනවීථිය, ශක්‍රයාගේ මාළිගාවට යන වීථිය : street leading to *Sakra's* palace

සුන්දරවූ, යහපත්වූ, හොඳවූ, ලක්ෂණවූ : good, beautiful

සුන්දරී, යහපත් හෝ ලක්ෂණ තැනැත්තී : good or beautiful woman

සුනෙරු, මහමෙර : the great mountain called Mahamera

සුප්‍රතිපන්න, යහපත්ලෙස පිළිපැද්දාවූ හෝ ක්‍රියාකළ : well-conducted

සුපිළිපන්, (සුප්‍රතිපන්න, බ. ව.)

සුපුල්, (සුත්ඵුල්ල, බ. ව.)

සුපුෂ්පිත, හොඳට පිපුන : well-blown (of flowers)

සුපූර්ණ, හොඳට පිරුණ : well-filled, very [full

සුමුගය, කරඬුව : casket

සුර, දෙවියා : god

සුරක්ෂිතව, ඉතා ප්‍රවේසම්කොට : very [safely

සුරත්, හොඳට රතු, ඉතාරතු : very red

සුරතුරු, දිව්‍යලෝකයේ ගහ : celestial tree

සුරපුර, දෙවියන්ගේ නුවර, දිව්‍යලෝකය : celestial city, heaven

සුරලෝකාවතීර්ණ, දිව්‍යලෝකයෙන් බැස්ස : descended from heaven

සුරාඞ්ගනාව, දිව්‍යස්ත්‍රී : goddess

සුරාසුර=සුර(සහ : and)අසුර (සුර, අසුර, බ. [ව.)

සුලභ, පහසුවෙන් ලබාගතහැකි : easy to be obtained

සුවහස, (ශතසහස්‍රය, බ. ව.)

සූක්ෂම, මුවහත් : sharp

සුත්ඵුල්ල, හොඳට පිපුනු : well-blown (of [flowers)

සූත්‍ර, නූල : thread

සූපශාස්ත්‍රය, ඉව්මගැණ ශාස්ත්‍රය : cookery

සූය්‍ර්‍ය, ඉර : sun

සූය්‍ර්‍යවංශය, ඉක්ෂ්වාකු හෙවත් ඔක්කාකරජ්ජුගෙන් පැවතඑන රජවංශය, සූය්‍ර්‍යයාගෙන් පැතඑන රජවංශය : royal dynasty descended from the king Ikshv*a*ku or Okk*a*ka, the royal race which derived its origin from the sun

සූය්‍ර්‍යාලෝකය, ඉරේ එළිය : light of the sun

සූය්‍ර්‍යෝදය, ඉර ඉහළටනැගීම, ඉරපෑයීම : [sunrise

Digitized by Google

සෙට්ඨි, සිටු, ශ්‍රේෂ්ඨී, ධනවතාණ්ට හෝ වෙළඳ සමූහයාට ප්‍රධානයා: chief of the guild of bankers or merchants, grandee

සෙන, (ශාන්ති, බ. *v.*) [quickly

සෙද, වහා, ඉතා ඉක්මණට: at once, very

සෙත්, (සේනාව, බ. *v.*)

සෙමර, ඉතා ලක්ෂණ වල්ගයක් ඇති මුව වර්ගයක්: a kind of deer (*Bos Grunniens*) which has a very beautiful tail

සෙමෙහි, ආරක්ෂාවෙහි: in the custody or safety

සෙයනාව, නිදාගැනීම: sleeping [shadow

සේ, ආකාරය, සෙවණැල්ල: manner,

සේචනයකොට, ඉස, ඉසලා: h. sprinkled

සේනාප්‍රකාරී, සේනාවට සමානවූ: like the army

සේනාව, යුධහමුදාව: army

සේවනයකරණලද, ආශ්‍රයකරණලද, ළඟ හැසුරුණ: associated, attended upon

සේවය, වැඩකිරීම, නමස්කාරකිරීම: service, worship

සේසත, (රාජලක්ෂණවූ) සුදු කුඩය: white umbrella (insignia of royalty)

සෛන්ධවයා, × අශ්වයා: horse

සොවිය, අඩසවිය, හෙල්ලය: javelin

සොඳුර, යහපත් හෝ ලක්ෂණ තැනැත්තිය: O good or beautiful one!

සොළොස, දහසය: sixteen

සෝබවා, 'සෝදවා' යනු වෙනුවට පුරාණ පැවති රූපයක්: an archaic form of 'සෝදවා' 'h. washed'

සෝවාන්ඵලය, සෝවාන් මාර්ගයට පසුව ලැබෙන විපාකසිත: state achieved after සෝවාන්මාර්ගය (the first path leading to Nirv*ana*)

සෞන්දර්යය, ලක්ෂණ, ප්‍රියස්වභාව: beauty, loveliness [good luck

සෞභාග්‍ය, ලක්ෂණ, වාසනාව: beauty,

සෞම්‍යවූ, මොළොක්වූ, සතුටුකරණ: soft mild, pleasing

හ.

හත, අත: hand

හස්තතලය, අල්ල: palm of the hand

හස්තපෝතකශබ්දය, අත්පිඩිගැසීමේ ශබ්දය: sound of clapping hands

හස්තාමලකය, (අතඹුල, බ. *v.*)

හස්ති, ඇතා: elephant [elephants

හස්තිශාලාව, ඇතුන් සිටින ගේ: stall for

හස, (හංස, බ. *v.*) [swan

හංස, එනම් උතුම් පක්ෂියෙක්: a kind of

හාත්පස්හි, වටේ: around, all round

හාත්පස්හිකොට, වටකර: h. surrounded

හාස්‍යය, සිනාව: laughter

හැමදලා, අතුගා: h. swept (with a broom)

හැසිරෙති, (සඤ්චාරණයකරති, බ. *v.*)

හික්කාභේදකොට, ඉක්කාගසා: having sobbed [fectionate

හිත, කරුණාවන්ත, ආදරවන්ත: kind, af-

හිතෛෂීන්ගේ, කරුණාව හෝ ආදරය ඇත්තන්ගේ: of those who are kind or affectionate

හිමාල, ඉන්දියාවේ උතුරු මායිමේ තිබෙන දන්නාලද ලෝකේම ඉතා ලොකු කන්ද වූ හිමාලපර්වතය: Himalaya, the highest mountain in the known world, situated on the northern boundary of India

හිමවත්කූට, හිමාලකන්දේ මුදුන: peak of the Himalaya mountain [lage

හිස්වැලිගම, එනම් ගමක්: name of a vil-

හුදක්, තනිකර: singly

හුදකලාව, තනියම: singly, alone

හෘදය, හදවත, ළපැත්ත: heart, bosom

හෘදයවස්තුව, (හෘදය, බ. *v.*)

× සාමාන්‍යයෙන් ඉන්දියාවේ සින්ධුනම් පලාතේ අශ්වයින්ට නම්: This is generally a term for horses bred in Sindhu in India.

Digitized by Google

හොත්තාවූ, දිගාවූ, වැටුනාවූ: prostrated, fell down

හොයවල්, කුඩා ගංගා: streams, rivers

හෝ, (හොයවල්, බ. ව)

අත්ඇරුණු වචන.

අඤ්ජලි, වැඳීමට එකතුකල අත්, දෝත: hands folded together, hollowed palms of the hands

අතිපාත, (බිම) වැටුන: fallen down

අධිෂ්ඨිත, නැගුනු: ridden, mounted upon

අන්ධකාරය, අඳුර: darkness

අනන, ආහාර, කෑම: food

අනුකාර, } සමාන, වැනි: resembling
අනුකාරී, }

අපර, පසු: hinder, posterior

අපරාධ, වරද: offence, fault

අභිකීර්ණ, බොහෝසේ ගැවසීගත් හෝ ඇත්තාවූ: overspread with, full of

අභිරමණය, ප්‍රීතිවීම: delighting in

අභිරාම, ආලය උපදවන, සතුටුකරණ, ලක්ෂණ: lovely, pleasing, beautiful

අභිරූඪ, හොඳට නැගුනු: well-ridden or mounted upon

අභිලක්ෂිත, මනාව එල්ලකලාවූ හෝ මැනුවාවූ: well-aimed at

අමනෝඥවූ, අවලක්ෂණ: ugly

අවබෝධකරණු, (සිතට) ඒත්තුකිරීම: convincing [abounding in

ආකීර්ණ, ගැවසීගත්, පිරුණාවූ: full of,

ආගාරික, ගේ පුරෙවිසම්කරන්නා, රක්ෂාකරන්නා: one who protects a house, store-keeper

උජ්ජ්වලවූ, බබලන: shining

උත්සව, සතුට, ප්‍රීතිවීම, මඞ්ගල්‍යය: joy, merriment, festive occasion

උතුර, උතුම්වූ: great, best

උදාරතරලෙස, මහත්ලෙස, අලඞ්කාරලෙස: greatly, grandly [ness

උන්මාද, ඔල්මාද, පිස්සු: insanity, mad-

ඒධිත, වැඩුනාවූ: grown, increased

කැල, සමූහය: multitude

කිරලා, එනම් පක්ෂියා: a bird, plover

ගදා, (ආයුධයක් ලෙස පාවිච්චිකරණ) මුගුරක් හෝ පොල්ලක්: a mace or club (used as a weapon) [pregnant

ගර්භිණීවුන, ගැප්ඇතිවූන: (they) became

ගැප්, } බඩේඉන්න දරුවා, දරුවා පිළිසිඳ
ගැබ්, } ගැනීම: child in the womb, conception

ගෘහපතියා, ගෙයි ස්වාමියා, ස්ත්‍රියක් ගෙණ ඇත්තා: householder, man who has entered marriage life [monarch

චක්‍රවර්තිරජ, මුළුලෝකයටරජ: universal

චක්‍රායුධය, චක්‍රයක (රෝදයක) ආකාරවූ ආයුධවශේෂයක්: discus

ඡායාව, සෙවණැල්ල: shadow

තාමුල, මහත්, ලොකු: large, great

තුසිතභවනය, } (තව්තිසා භවනය, බ. ව.)
තුෂිතභවනය, }

දශබලධාරී, බල දශයක් දරන්නාවූ: possessing ten powers ×

දුකසේ, අමාරුවෙන්: with difficulty

× බුදුන්ගේ ශරීරයෙහි ඡද්දන්තකුලයේ ඇතුන් දශදෙනෙකුන්ගේ ශක්තිය දරණ නිසා මෙසේ කියනලදී. බුදුන්ට තිබුනාවූ ඥානබල දශය නිසාත් එසේ කියනාතියි: this refers to the fact that Buddha physically possessed the strength of ten elephants of the *chaddanta* class. The term may also refer to the ten kinds of knowledge possessed by Him.

Digitized by Google

දෙව්, වලාකුළ : cloud

ධීරසාරවූ, ඉතා ධෛර්‍ය්‍යමත් හෝ බලසම්ප න්න : very brave or powerful

නග්නව, නිර්වස්ත්‍රව, හෙළුවෙන්: naked, nakedly [worldly passions

නික්ලේශවූ, කෙලෙස් නැත්තාවූ: h. no

ප්‍රණීතවූ, රසවත්වූ : pleasing to the palate

ප්‍රත්‍යෙකබුද්ධ, (ප්‍රත්‍යෙකබුද්ධ, බ. v.)

ප්‍රතිකාර, පිළියම්, බෙහෙත් : remedy

ප්‍රතිඵල, විපාක : result

පඤ්චරාජකකුධභාණ්ඩ, රාජලක්ෂණ වස්තු පහ [එනම් :—ශ්වේතච්ඡත්‍රය, මඟුල්කඩුව, (නලළේ බඳින) රන්පට නොහොත් රත් රන් ඔටුන්න, රන් මිරිවැඩි (රත්රන්වැඩ කළ සෙරෙප්පු) දෙක, වල්විදුනාව (චාමරය) : the five insignia of royalty (viz: white umbrella, sword, plate of gold tied round the forehead or diadem of gold, pair of sandals (inlaid with gold), and chowric]

පතාකා, කොඩිය ; flag, banner

පාදපරිචාරිකා, භාර්‍ය්‍යාව, අඹු : wife

පිටුවහල්වෙමි, පිහිටවෙමි : (I) will help

පිබිද, නින්දෙන් නැගිට : h. awoke

පෝථන, එකට ගැසීම හෝ තට්ටුකිරීම : striking together

භද්‍රකල්පය, වාසනාවන්ත නොහොත් ඉසුරුමත් කල්පය : lucky or prosperous *kalpa*

මුත්, ඇර : except

මොලක්, මොළොක්, මෘදු : soft, mild

යථෝක්ත, ඉහතින් කියනලද : aforesaid

රාජ්‍යය +, රජකම, රජුවිසින් ආණ්ඩුකරණ රට : sovereignty, kingdom

විස්මපත්, පුදුමයට පැමිණි, මවිතවූ : surprising, wonderful

වෛද්‍යාචාර්‍ය්‍යයා, වෙදා : physician [mighty

ශූර, නිර්භීත, බලසම්පන්න : brave, heroic,

සංක්ෂේපය, කුඩාකරණලද්ද : abridgment

සප්තස්වර, ස්වර හත [ඒ නම් :—1 ඍෂභ හෙවත් ගෙරි (හරකුන්ගේ) හඬ, 2 ධෛවත හෙවත් අශ්ව හඬ (හේෂාරවය), 3 ෂඩ්ජ හෙවත් මොනර හඬ (කේකානාදය), 4 ගාන්ධාර හෙවත් එළු හඬ, 5 මධ්‍යම හෙවත් කොස් ලිහිණියාගේ හඬ, 6 පඤ්චම හෙවත් පරපුටු (කොවුල්) හඬ, 7 නිෂාද හෙවත් ඇත් හඬ (කුඤ්ච නාදය)]: the five tunes or notes [viz:—1 *Ri*shabha, 2 Dhaivata, 3 Sha*d*ja, 4 Gandh*a*ra, 5 Madhyama, 6 Panchama, 7 Nish*a*da, which are respectively represented by the voice or cry of 1 cow or ox, 2 horse, 3 peacock, 4 goat, 5 curlew, 6 Indian cuckoo, 7 elephant]

සහෝදරයා, එක කුසේ උපන් පිරිමියා : uterine brother [ready

සැරසුණේය, ලෑස්තිවුණේය : (he) became

හීයවුර, ඊ කොපුව : quiver

හුදකලා, තනියම : alone

නිමි.

+ පුස්කොළපොත්හි මේ වචනය බොහෝවිට 'රජ්ජය' කියා තිබේ. මෙය වැරදි ව්‍යවහාරයක් නොවේනම් තද්භවවූ (බිඳීආවාවූ) එළුවචනයක් ලෙස සැලකියයුතුයි: In ola manuscripts this word is often spelled 'රජ්ජය.' If this is not a corruption it should be taken as a derived Elu word.

Digitized by Google

(මෙහි ඉලක්කම් කාව්‍යයේ ඉලක්කම් හා සම්බන්ධයි.)

15 වනත් ගං හෝ පැ — න
නොයුනෙව් සිදු වෙරල පැ — න
මහත් වුව ඉසුරෙ — ණ
ළඹතු නොවැ දවසරී නුවණ — න

29 රතදරිණී — නාලිය
ගමනිත් සදිසි — නාලිය
එ පුර සර — ණාලිය
කවුරු නම් හැකිවෙති ව — ණාලිය

228 එ කුමරි වසන තැ — න
රජ කුමරියො ඇනත් වෙ — න
තොම දිලෙන් රුසිරෙ — ණ
දින්දු අබියස ලූ පහන් මෙ — න

251

සුපුල් කප් තුරන් හිස නිකුත් රණ ලියක්සේ
නිමල් හසගතන් මැද කැපුන් ගඟුගතක්සේ
ලකල් තරු පිරිවරින් ගමන් ගත් සඳක් සේ
විපුල් කොණෙරගන පිරිවැරු නාලියක් සේ

252

කනා මිණිබරණ ගෙණ දරම් — නේ යා
තනා යෙහෙළි කිරි මව් සමගි — නේ යා
මනා ගුණ පබාවති එම දී — නේ යා
පණ නැඳ් මයිල් දුන සිට් නැ — නේ යා

278 ඇත් ගොව්වෝ සිය — ල
නොපණත් කෙරෙති හැම ක — ල
එ බැවින් ළන් නෑප — ල
ඉවසීම නිසි ගුණෙකි සුවිපු — ල

308

අන් ද සිනිඳු රන් කම් කළ සළු නිම — ලා
රන් ද සමග මිණිබරණින් සැර ගෙ — ලා
නන් ද සුරඹ වෙස් පබවැත්ය මන ක — ලා
නැන්ද ගෙණ උයන් කෙළියට පිටත්වෙ — ලා

309

නනවා සඳුන් පලු ගෙ උයන් පසෙහියු — ග
එනවා මලුන් මද විද නෙහෙළින් සම — ග
උනවා නුහු ගිමන් අසමින් නද පස — ග
පිණවා දනන් මන ගෙවමින් විදි ම — ග

310

නද මීහිලොල් ලිය ගී නද සුතු මිසු — රු
නද කොවුලන් හඬ පස තුරු ගොස සපි — රු
මද තල සල ලිය ලිය රැගුමැති සොඳු — රු
වැද උයනට මද රද රඟ හළ අයු — රු

311

මීඅඹ රසඹ පානය කරමින් වැගෙ — ණ
නිලඹ පැහැති පරපුටු කැල නුටු රැව් — න
සියඹ සමග තුරු හිස ගෙදන නද නද — න
එපඹ වසිගෙ නුති හී කියනෙව් ගුව — න

312

එවුයන ලිය ලියන් තුරු හිමි වලඳිමි — න
ලෙලමෙදන අතු අතින් සාමුව සුනන් ගෙ — ණ
සුපිපෙන ලන ලවන් යුත් කුසුමන් වති — න
තලවන වැන්න තිඹු සත් සුරතල් බසි — න

313

සපුනාපනා අඹ දඹ තුරු පෙළ දිලෙ — න
බිඹුනාදිනා යුත් මන සවණ පිණව — න
ගිමනාළනා ගත සුවදැහි නල හම — න
නානාවිනා නෙ වණ සොබන එවුය — න

Digitized by Google

321 පැමිණු ගියම නො ට
සුවණැති දනෝ පෙර සි ට
නු පුරුදු දීගය ට
පුරුදු කණවැත්තුම් යෙහෙකි ම ට

---

357 කැටක් ගෙණ නුබ කු ස
දුමුව නො රදැසී සිම ති ස
එ මෙන් පව් පින් රැ ස
සිදුවීම නියතය පැතූ ලෙ ස

367

හැමසත් ගොර සසර සයුරෙන් ගොඩනගන
ඇතිමත් පුත් පෙරුම් මතු බුදුබව ලබ න
පබ වත් වෙන්වුවවත් තනිවම ඉඳැ සඟ ණ
මනසත් නැවුනු ලෙස මම කියම් කෙලෙසින

---

463 යමෙක් විසුතුව ඉ ද
පතානම් රුසිරැති ල ද
අවැඩම මිස නො ම ද
වැඩක් වූයේ ඔහුට කි කල ද

464 යා දෙක නො රත ර න
සමග පැසීමෙක් නැ න
එ බැවින් ඵරත ර න
දෙදෙන සමහත් වී ඉඳිනු නැ න

---

472 ම පතා නොපැවිදි න
කරණ නැත් මෙහි වෙසෙම් න
වෙහෙසව තද ගිම න
සුළත් බඳනපු වැස්ත දුලකි න

473 කල් පසුකර මේ තෙ ක්
ම පතා ඔබ විඳින දු ක්
මස් ලොබවූ කොමෙක ක්
බලා ඉඳිනෙව් සිදු සිඳෙන තෙ ක්

---

502 දව සක් ලැගි එක ගහණ න
හිමියෙක් වෙහෙසට පැමිණෙ න
ඔහුදුක් දුරලූ මෙ දිය න
පමණක් නැති අගනෝ ඇ න

---

508 විලි නැති බස් කියන කප ට
තිමෙග කුද මිටිකාර දී බැ ට
දව ඇද පිටකර පිටත ට
ඔද සිද අරවම් සුත්නො ට

---

599 සිම්සදු ඔබ පව ර
නොමයක් රජ සිරි අත් හැ ර
අරක්කැම් මෙමග ක ර
ඉඳින බව නොම දනිම් මෙ නුව ර

600 නො දනප කළ වර ද
නො ගෙණ පොකුරම මෙන් හ ද
මෙන් සිත් කර නො ම ද
කාමකලගොත් යෙමෙක් හිමිය ද

---

604 එ කල හැම දේ ම ය
අත් කිසිවෙක් නොවේ ම ය
මා අත වරද ම ය
එයින් ඉවසනු සුදුසු මට ම ය

---

618 දුදුත් කිව්දුත් ගෙ ණ
බිලිඳුත් සහ ලදුත් ගෙ ණ
බූ ඊරද නොම ගෙ ණ
ගලෝ පෙර රජතුමෝ සත් ගු ණ

ස මා ප් ත යි.

සිද්ධිරස්තු.

Digitized by Google

Digitized by Google

එම කතුතුමා විසින් කරණලද වෙනත් පොත්පත්.

රු. ශ.

1 සිංහල ව්‍යාකරණය.—ඉංග්‍රිසීයෙන්—ලංකාවේ ආණ්ඩුව විසින් පිළිගණ සිවිල් නිලධාරීන්ගේ පාඩම්විභාගයට සැරසෙන්නන් විසින් භාවිතා කටයුතු ලෙස නියමකරණලදී. ලොකු පිටු 532 ... ... 6 00

2 කුසජාතකය (එළු පන්සීයපණස් ජාතකපොතෙන් උපුටාගන්නලදී.)—ලොකු පිටු 36 (ඉන් 13 ක් ගැටපද විවරණයයි) 0 15

පොත් 10 ක් 1 00

3 ඥානාදර්ශය.—පිටු 24 පුන් මාසික සඟරාවක්—මනුෂ්‍යයන් විසින් දතයුතු සියලු සාරවත් කරුණු මෙහි පළවේ. එක කලාපයක් 0 30

අවුරුද්දකට දායකමිල (තැපැල් වියදම් සමග) 3 00

හමාසයකට ... ... (එම) 1 50

තුන්මාසයකට ... ... (එම) 0 80

Works by the same Author.

Rs. cts.

1 Comprehensive Grammar of the Sinhalese Language, prescribed by the Ceylon Government for the Civil Service Examinations. pp. 532 ... 6 00

2 Kusa Jataka.—Ancient prose version—with a very useful Glossary. pp. 36 0 15

10 copies 1 00

3 Jn*a*nadarsaya.—A Sinhalese monthly Magazine of Art, Science, and Literature, per part 0 30

Annual Subscription (including postage) 3 00

Jnanadarsaya,

"MIRROR OF KNOWLEDGE."

A Sinhalese monthly Magazine of Art, Science, and Literature: An Encyclopædia of Universal Information, Edited by Mudaliyar A. Mendis Gunasekara of the Registrar-General's Office. Price per part 30 cts. Annual Subscription, Rs. 3 00. Parts 1 to 4 have already been issued.

Digitized by Google

ඥානාදර්ශය.

කොළඹ රෙජිස්ට්‍රාර්ජනරාල් කන්තෝරුවේ මුදලි ධානාගාරය සහ නොතාරිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ලිපිකාරධුරයෙහි උසුලන ඒ. මෙන්දිස් ගුණසේකර මුදලිතුමාගේ කර්තෘධුරයෙහිට මෙම සඟරාව මසකට වරක් සෑම මාසවල කෙළවරදී පළකරනු ලැබේ. ලොකු පිටු 24 කින් යුක්තයි. ආගම්භේද නිකායභේද ජාතිභේද ආදියෙන් තොරවූ සියලුදෙනා විසින් දතමනා සාරවත් කරුණුවලින් යුක්තව සිංහල දත් සියලුදෙනා විසින් කියවියයුතුවූ සියලුදෙනාලඟ තබාගැණීමට අතිශයෙන් යෝග්‍යවූ සඟරාවකි. මෙය යම් යම් ශාස්ත්‍රාදිය ඉගෙණ දතගැණීමට ගුරුවරයෙක් හා සමානය. දැනට පළවෙගෙණයන ගණිතශාස්ත්‍රය පිළිබඳ වාක්‍යයෙන් ගණිතශාස්ත්‍රයද 'ඉංග්‍රීසි ගුරුවරයා' යන මාතෘකාවෙන් පළවෙන වාක්‍යයෙන් ඉංග්‍රීසි භාෂාව ලියන්ට කියන්ට කථාකරන්ටද ගුරුකෙනෙකුගේ ආශ්‍රයක් නැතුව තනියම ඉගෙණගතහැක්ක. දතයුතු සියලුදේනෑණ මෙහි වාක්‍ය පළවේ. එබැවින් මේ සඟරාවේ ප්‍රයොජනය අගය මෙතෙකැයි කියනොහැක්ක. දැනට කලාප හතරක් පිටවීත්තේ. මුල කලාපදෙක විකිණී නිමවේගෙණයන බැවින් දායකවෙනු කැමැත්තන් විසින් වහාම සඟරාවට දායකවියයුතුය.

දායකමිල (තැපැල්වියදමත් සමඟ)

			රු.	ශ.
අවුරුද්දකට	...	...	3	00
හමාසයකට	...	...	1	50
තුන්මාසයකට	...	...	0	80

සඟරාව ඉල්ලාඑවන ලියුම් "කොළඹ ඥානාදර්ශය කළමනාකාරයා නමටයි" කියාද එහි පළකිරීමට එවන ලියුම් "ඥානාදර්ශය කර්තෘවෙතට ලැබියයුතු"යි කියාද පිට ලියා එවියයුතුයි.

කතුතුමාගේ තනි වියදමින් එතුමාටම අයිති අච්චු යන්ත්‍රවලින් මුද්‍රණයකරණ සඟරාවක් බැවින් මෙය බොහෝකලක් පවත්වාගැණීමට කිසිම බාධාවක් නැතිබව සලකනුමැනවි.

සඟරාවේ කළමනාකාරයා.

Digitized by Google

Digitized by Google

Digitized by Google

Digitized by Google

Digitized by Google

Digitized by Google

27245.7.5
Kusajataka kavyaya;
Widener Library 002763550

3 2044 089 107 510

Digitized by Google